

# චිත්ත චෛතසික විභාගය

# චිත්ත චෛතසික විභාගය.

පානදුරේ රන්කොත් විහාරාධිපතිව වැඩවිසූ
සිරිමුනිවර සද්ධම්මවංසපාල ශාසනධජ
**ගුණරතන තිස්සාභිධාන අමරපුර නිකායේ මහානායක**
මාහිමියාණන් වහන්සේගේ
ශිෂ්‍යවූද,
කොළඹ දෙමටගොඩ මහා විශුද්ධාරාම පිරුවන්හි
ධර්ම විනයොද්ග්‍රහණයෙහි
නියුක්තවූද

**පානදුරේ සෝමරතන**

ස්වාමි පාදයන් වහන්සේ
විසින් සම්පාදිතයි.

පානදුරේ "මොටෝට්‍රාන්සිට්" කොම්පැනියේ
ප්‍රධාන තැන්පත්
**පානදුරේ**
**ඩබ්ලියු. ලියෝ ප්‍රනාන්දු මහතාගේ**
ප්‍රිය පුත්‍රවූ
**නිධනප්‍රාප්ත "සිරිපාල" නමැති ළදරුවාට**
පින් පැමිණවීම පිණිස
එතුමාගේ ධන පරිත්‍යාගයෙන්
දිබ්බැද්දේ
**නෝමන් ද සිල්වා මහතා**
විසින්
**පානදුරේ සෝමිරස යන්ත්‍රාලයෙහි**
මුද්‍රණය කරවන ලදී.

ශ්‍රී. බු. ව. **2472**
ක්‍රි. ව. **1928**

මහාරේතුඩුවේ ගඞ්ගාරාම විහාරාධිවාසී

සාසනවංසාලඞ්කාර

කවිධජ විනයාචරිය සාසන සොධක

— අම්බලම්ගොඩ —

**දෙවානන්දාභිධාන මහානායක**

**උපසඞ්ඝරාජ මාහිමියාණන් වහන්සේ**

විසින් පිළිගන්නාලදී.

---



පාතදුරේ නිවැසි සත්ගුණවත්

**ඩබ්ලියු. ලියෝ පුනාන්දු**

මැතිතුමාණෝ.

# විඥප්තිය.

චිත්ත චෛතසිකයන්ගේ විභාගය දැනගණු කැමැත්තාවූ ධර්මකාමීන්ගේ ප්‍රයෝජනය සඳහා ගුරූපදේශයන් හා පෙළ අටුවාටීකාදියක් ඇසුරුකිරීමෙන් "චිත්ත චෛතසික විභාගය" නම්ලද මේ විශිෂ්ට ධර්ම ග්‍රන්ථය පහත නම් සඳහන්වන මවිසින් මහත් පරිශ්‍රමයෙන් ලියා සකස්කරන ලද්දේවේ. "අභිධර්මය දෙවියන්ට දේශනාකළ ධර්මයක් හෙයින් හේ මිනිසුන්ට උවමනා කරන ධර්මයක් නොවේ. අභිධර්මය ඉගෙණ ගතහොත් කොරා පිකාවේ" යනාදී දුර්මත උපදවා ජින චක්‍රයට පවා පහරවදිනා කාරණයන් නූගතුන් අතර විමති පහළකර හරින්නන්ද ඇතිවී සිටිනාබව හැලයි. මේ දේශනාව දෙවියන්ටම සාධාරණ නම්-

"අනෙනාතනත දහෙ සඬවා-උපට්ඨානං මහෙසිනො
යසඤුපසුඛාන සො ථෙරො-ආහරිත්වා මහීතලං"

යනාදීන් ප්‍රකාශිත පරිදි සැරියුත් මාහිමියෝ මේ භූලෝකයට ගෙනෙණාවේ කුමටද? ඊෂ්‍යාව පණ්ඩිතමානී බව ආදී පාප ධර්මයන්ට වසඟවූවන්ගෙන් පැනනගින එබඳු දුර්මතවලට නොරැවටීම පිණිසද උත්සාහ කටයුතු. තවද මේ විශිෂ්ටධර්මය ඉගෙණීමට හා ලොව පතළකර හැරීමටද සත්පුරුෂ නුවනැත්තෝ ප්‍රයත්නවෙති. ඒ එසේමැයි. අධම අසත්පුරුෂයෝ වූකලි ප්‍රිය නොවෙත්. නින්දද කෙරෙති. ඒ හෙතුවින් ඔව්හු කුශල ධර්මයන්හි ප්‍රමාදව අනේකවිධ දුශ්චරිතයන් රැස්කොට මේ ආත්මභාවයෙන් චුතව අපායික දුක්ඛයට භාජනවෙති. ඇතැම්හු තමා නොදත් අභිධර්මයෙන් ධර්මදේශනා කරන්ට යැමෙන් ධර්මය අධර්මය කරති. ඔව්හු ධර්මදේශනා කිරීමෙහිදී පූර්වාපර විරොධවචන යොදා ධර්ම දේශනා කරති එසේ කරනලද ධර්මදේශනා ගොම්බිඳක් මිශ්‍රවූ කිරිකළයක් වූවත් ඉවත්කළයුතුවාක් මෙන් ප්‍රයෝජනයට නොගත යුතුයි. මේ විශිෂ්ට ධර්මය දැන උගත් පඬිවරයෝ සවල්ප දෙනෙක් අද ලක්දිව ඇතැයිසිතමු. එහෙයින් මෙය සියල්ලන් විසින් ඉගෙණගනු පිණිස උත්සාහ කටයුතු.

තවද මෙම "චිත්ත චෛතසික විභාගය" නමැති ග්‍රන්ථය වනාහි කොළඹ දෙමටගොඩ මහා විශුද්ධාරාමාධිපතිව වැඩ විසූ ගරුකටයුතු ශික්ෂාකාමී ධර්ම විනයෙහි කුසල බුද්ධිමත් ආචාර්‍ය්‍ය සිරිධම්ම මහා ස්ථවිර ස්වාමි පාදයාණන් වහන්සේවෙත ධර්ම විනයෝද්ග්‍රහණය සාරතාතර ලියනලදබවත් පානදුරේ නිවැසි සරණ [illegible]හාමි සත්ගුණවත් ඩබ්ලිව් ලියෝ ප්‍රනාන්දු මහතාගේ ධන

# චිත්ත
# චෛතසික විභාගය.

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මා සම්බුද්ධස්ස.**

**තත්‍ථ වුත්තාභිධම්මත්ථා චතුධා පරමත්ථතො**
**චිත්තං චෙතසිකං රූපං නිබ්බානමිති සබ්බථා.**

අභිධර්ම සප්ත ප්‍රකරණයෙහි වදාරනලද පරම ගම්භීර අභිධර්මාර්ථයන් සැකෙවින් දක්වනු කැමති අනුරුද්ධාචාර්ය්‍ය මහා ස්වාමිපාදයෝ තත්‍ථවුත්තා යනාදි ගාථාව කීහ. ඒ අභිධර්ම සප්ත ප්‍රකරණයෙහි කුසලාදි හෙත්වාදි ත්‍රික ද්වකයන්ගේ වශයෙන් හා ස්කන්ධාදී වශයෙන් සම්ප්‍රකාරයෙන් වදාරණලද්දාවූ අභිධර්මාර්ථයෝ අවිපරීත ස්වභාවයෙන් විඥානස්කන්ධ යයි කියනලද චිත්තය, වෙදනාදිස්කන්ධත්‍රය යයි කියනලද චෛතසිකය, භූතඋපාදාය භෙදභින්න රූපස්කන්ධ යයි කියනලද රූපය, මාර්ගඵලයන්ට අරමුණුවන්නාවූ අසංඛත ධර්මයයි කියනලද නිර්වාණයයි මෙසේ සතර පරිද්දෙකින් සිව්‍යා[illegible]ය යනු එහි භාවයි. **අභිධම්මත්ථා** යන මෙහි අභිධර්මය නම්, සූත්‍රපාලියට වඩා අතිරෙකවූද විශෙෂවූද ධර්මයයි. ධම්ම යන මෙයින් විනය පාලියෙන් අන්‍ය සූත්‍රාභිධර්මවය කියනු ලැබේ

**"යො වො ආනන්ද මයා ධම්මො ච විනයො ච දෙසිතො පඤ්ඤත්තොති වුත්තං"** යනු මීට සාධක පාඨයි.

මෙහි තේරුම නම්:— ආනන්දය! මා විසින් තොපට සූත්‍රාභිධර්මසංඛ්‍යාත ධර්මයත් විනයත් දෙශනාකරන ලද්දේය පනවන ලද්දේය යනුයි. ඒ සූත්‍රාභිධර්ම පාලිවයද ආඥාවිධාන සංඛ්‍යාත භික්[illegible] පහකොට කුසලාදීවූ පවත්නා පරිදි පරමාර්ථ ධර්මයන්ම දක්වන්නේයයි දතයුතු. මෙසේ දක්වන්නාවූ ඒ සූත්‍රාභිධර්ම යන දෙවැදෑරුම් පාලි ධර්මයන් අතුරෙන් යම් ධර්මයෙක් ඉතිරි සූත්‍ර පාලි ධර්මයට වඩා අතිරෙක හා විශෙෂ වන්නේද, ඒ ධර්මය තෙමේම අභිධර්ම නම්වේ. ඉතිරි සූත්‍රපාලි ධර්මය වනාහි ධර්ම නම්වේ. කරුණු මෙසේ හෙයින් ධර්මය, අභිධර්මය, විනය, අභිවිනය යන මේ සතර දතයුතු. එයින් ධර්මය නම් සූත්‍රපිටක යයි. අභිධර්මය නම්, සප්තප්‍රකරණ යෝයි. විනය නම්, භික්ෂු භික්ෂුණී යන උභතො විභඞ්ගයයි. අභිවිනය නම්, ඛන්ධක පරිවාරයෝ යයි අර්ථ කථාවන්හි කියනලදී.

මෙහි අතිරෙක විශෙෂත්වයද, කුසලාදි වශයෙන්ද, ස්කන්ධාදි වශයෙන්ද, සඞ්ග්‍රහාදී වශයෙන්ද ඒ ඒ ආකාරයෙන් දෙසියයුතු ප්‍රකාර නිරවශෙෂ විභාග වශයෙන්ද ශුද්ධ ධර්මාධිෂ්ඨාන දෙශනාවගේ පැවතීම් වශයෙන්ද දතුයුතු

යම්හෙයකින් සර්වඥ බුදුවරයෝ මේ විජම් දෙශනාව දිව්‍යලොකයෙහිම දෙශනා කෙරෙද්ද, මනුෂ්‍යයෝ මෙබඳුවූ තෙමසක් මුළුල්ලෙහි නිරතුරුව පැවැත්වීමට යොග්‍යවූ කථාමාර්ගයක් එක් ඉරියව්වකින් මූල පටන් අවසානයට පමුණුවා ශ්‍රොතවාරයෙන් අසා දරා ගැනීමට නොමහැකිවෙත්, මෙවැනි එක මාතෘකාවකින් බැඳුනාවූ කථාමාර්ගයක් නොයෙක් ක්ෂණයන්හි නොයෙක් ජනයන්ට දෙශනා කරන්ට නොම හැකි වන්නේයයි දතයුතු.

ඇතැම් සංක්ෂෙප ටීකාචාර්යවරයෝ වනාහී විනය පෙළටද වඩා ඒ අභිධර්ම පාලියගේ අතිරෙකය සහ විශෙෂත්වය වර්ණනා කෙරෙත්. ඒ කෙවි ආචාර්ය වරයන්ගේ වර්ණනාව අට්ඨශාලිනී අට්ඨකථාව හා නොගැලපෙන්නේය ඒ අට්ඨශාලිනියෙහි ධර්ම යන නමක් ඇති දෙවැදෑරුම් සූත්‍රාභිධර්ම පාලින්ගේ මධ්‍යයෙහිම මේ අතිරෙකබව හා විශෙෂබව විචාරණය කරනලදී. විනය හා එසේ විචාරණය නොයෙදේ.

කුමක් හෙයින් ද? යතහොත්:- අසමානකිස විෂයකොට ඇති හෙයිනි. ඒ එසේමැයි. විනය තෙමේ කායවාචා අධ්‍යාචාරයන්ගේ හික්මවීම් කෘත්‍යකොට ඇත්තේය. කායවාග් අධ්‍යාචාරය හෙවත් ඉක්මවා හැසිරීම විෂයකොට ඇත්තේය. ධර්මය වනාහි ධර්මවිභාග කෘත්‍යකොට ඇත්තේයයිද ධර්මයාගේ පැවැත්ම විෂයකොට ඇත්තේයයිද දතයුතු. එසේ කෘත්‍යවිෂය වශයෙන් අසමාන කල්හිදු විනය තෙමේ සියල්ලටවඩා ජ්‍යෙෂ්ඨ වන්නේයයි ඇතැම් කෙණෙක් කියත්. විනයට නිසුකරන මහණහට පවිති ඇවතක් වන්නේයයිද ධර්මයට නිසුකරන මහණහට දුකුලා ඇවතක් වන්නේයයිද කියත්. හේ නොයෙදේ.

විනය නම්, ආඥාචක්‍රයයි; ධර්මය නම්, ධර්ම චක්‍රයයි; එයින් විනයට නිසුකරන තැනැත්තේ ශාස්තෘන් වහන්සේගේ ආඥාචක්‍රයට පහර දෙන්නේය. උන්වහන්සේ කෙරෙහි අගෞරවය මහත් වන්නේය. යම් භික්ෂුවක්හටත් ශාස්තෘන් වහන්සේ කෙරෙහි අගෞරවය ඇත්තේ වීනම් ඒ භික්ෂුවහට ධර්ම සංඝයා කෙරෙහිද, ත්‍රිශික්ෂාවන් කෙරෙහිද අගෞරවය සිද්ධවන්නේය. එහෙයින් විනයට ගැරහීමෙහි මහත්වූ පවිති ආපත්තියක් වන්නේය. සියල්ලට වඩා ප්‍රධානවන හෙයිනැයි ගොදතයුතු. අන්තය ක්‍රමයකුදු ඇත, විනය

නම, ශාසනයාගේ මුලයි. විනය නැති කල්හි ශාසනය නොසිටියයි දතයුතු. එහෙයින් ශාසනයාගේ චිරස්ථිතිය පිණිසද විනයට ගැරීමෙහි මහත් ආපත්තියක් පනවන ලද්දේයයි දතයුතු.

**“අභිධම්මෙ වුත්තා අත්ථා අභිධම්මත්ථා.”** අභිධර්ම සප්තප්‍රකරණයෙහි වදාරණලද අර්ථයෝ අභිධර්මාර්ථ නම් වෙත්.

කුමන අර්ථයකින් **පරමාර්ථ** නම් වන්නේද? යන මේ ප්‍රශ්නයට පිළිතුරු මේ වක්ෂ්‍යමානාකාරයෙන් දතයුතු. ලෝකයෙහි සම්මුති සත්‍යය, පරමාර්ථ සත්‍යයයි සත්‍යයෝ දෙදෙනෙක් වෙති. එයින් සත්ත්ව පුද්ගල ආත්ම ජීවාදි ප්‍රඥප්ති අර්ථයෝ ස්වභාව වශයෙන් අවිද්‍යමානහුම වෙත්.

ධර්ම ව්‍යවස්ථා ඥානයෙන් තොරවූ මහජනයාගේ සිතෙහි මහත් මහත්ව විද්‍යමානවූවන් මෙන් පැණෙත්. ඒ සත්ත්ව පුද්ගල ආත්ම ජීවාදී අර්ථයන්ද මහජනයා සමගිව ඒ ප්‍රඥප්ති අර්ථයන්ගේ ඒකාන්තයෙන් විද්‍යමාන බව පිළිගෙණ ඒ ඒ ආකාරයෙන් ව්‍යවහාරද කෙරෙත්. පිළිද ගනිත්. එහෙයින් ප්‍රඥප්ති අර්ථයෝ සමගිවූ මහජනයා විසින් සම්මත හෙයින් හා වාග්සත්‍යය විරති සත්‍යය යන මොවුන්ට අධිෂ්ඨානවූ හෙයින්ද සම්මුති සත්‍යයයි කියනු ලැබේ. ඒ සම්මුති සත්‍යයෙහි පිහිටාසිට මොනවට පිළිපදින්නෝ දාන සීලාදි පුණ්‍යක්‍රියා වස්තූන්ගේ ඵල විපාකවූ සියළු ලෞකික සම්පත්තීන් හා ඒ ඒ බොධිසම්භාර ධර්මයන්ද නිෂ්පාදන කෙරෙත්. දුශ්චරිත දුරාජීව මිථ්‍යාජීවාදීන්ගේ වශයෙන් මිථ්‍යා ප්‍රතිපත්ති පුරන්නෝ අපාය පූරකයෝ වෙති. සම්මුති සත්‍යය මෙසා මහත්වූ සත්‍යයකැයි දතයුතුයි. පරමාර්ථ සත්‍ය වශයෙන් බැලූකල ඒ සම්මුති සත්‍යය අසත්‍යයක්ම වේ. හේ වනාහි තෙමේ අවිද්‍යමානවූයේම මහජනයා විද්‍යමානවූවක් මෙන් ගන්වයි. විංශති සත්කාය දෘෂ්ටිය දෙසැට මිථ්‍යාදෘෂ්ටිය ත්‍රිවිධ නියත මිථ්‍යාදෘෂ්ටිය යන මොවුන්ට අධිෂ්ඨානව බාල ජනයන්ට වෘත්ත දුඃඛයෙන් නික්මෙන්නට නොදෙයි. මෙසේ සම්මුති සත්‍යය විපරීතයක්ද, මහා සාවද්‍යයක්ද වේ. පරමාර්ථ සත්‍යය වනාහි ස්වභාව සත්‍යය ආර්‍ය්‍ය සත්‍යයයි විවිධ වේ. එයින් ධම්මසඞ්ගණී ප්‍රකරණය ආදිකොට ඇති සප්තප්‍රකරණයන්හි විභාග කරනලද කුසලාදි ධර්මයෝ ස්වභාව සත්‍යය නම්වේ ඒ එසේමැයි. ඒ කුසලාදී ධර්මයෝ තුමූ ස්වභාව වශයෙන් විද්‍යමාන හෙයින් කුසල නම්වූ ස්වභාව ධර්ම කෙනෙක් ඇත්තාහුය. සුඛ වේදනාවක් ඇත්තේයයි ගන්නවුන් නොවරද්දවත්යයි දතයුතු. ඒ ස්වභාව සත්‍යය වනාහි ආර්‍ය්‍ය සත්‍යයට පැමිණ ඇතමෙක් අසත්‍යයක්ද වේමැයි. ඒ එසේමැයි. විඳගැනීම් ප්‍රභේද මාත්‍රය කාරුණ්‍ය

කොට ගෙනම වේදනාව සුඛ දුක්ඛ උපෙක්ෂායයි වදාරන ලදී. සර්‍වාකාරයෙන් සුඛවූ හෙයින් නොවදාරන ලදී. අනිත්‍යබවයයි කියන ලද නොයෙක් සියගණන් ආකාරයෙන් සියළු වෙදනාවෝ දුක්මය එපරිද්දෙන් නිරවද්‍යබව සැපවිපාකබව අර්‍ථකොට ඇති හෙයින් කුසල භාවයද අකුසලය සාරුණුකොට ගෙනම වදාරන ලද්දේය. ඒ එසේමැයි.

සියළු ත්‍රෛභූමික කුසලයයි සම්මතවූ ධර්‍මයෝ ආශ්‍රවයන් හා සහිතබව සංක්ලෙශ ධර්‍මයන්ට අරමුණුවූබව ඔඝයන්ට හිතබව යොගයන්ට හිතබව උපාදානයන්ට හිතබවයයි කියනලද වද්‍යයන් ගෙන් වැරදි සහිතවූවෝම වෙති. දුක්ඛසත්‍යවූ විපාක ධර්‍මයන් උපදවන අර්‍ථ හෙයින් ඒකාන්තයෙන් දුක්ඛවිපාකයෝම වෙති. අජ්ඣත්තත්‍රිකයද සියළු ලෞකිකයන්ගේ සම්මතය සාරුණුකොට ගෙණම වදාරන ලද්දේය. ඒ එසේමැයි.

සියළු චාතුර්භූමික ධර්‍මයෝ ඒකාන්තයෙන් ආත්මතමුදු නැත්තාහ. ආධ්‍යාත්මයෝ නම් කොහි ඇත්තාහුද? බාහ්‍යයෝම වෙති. එහෙයින් "**සබ්බාෙර පරතො පස්ස**" යි වදාරනලදි මේ ක්‍රමය සෙසු ත්‍රිකදුක ධර්‍මයන්හිද සුදුසු පරිද්දෙන් පැමිණවිය යුත්තේය. සියළු ත්‍රෛභූමික ධර්‍මයන්ගේ ඒකාන්තයෙන් දුක්බවද, තෘෂ්ණාවෙන් ඒකාන්ත දුක්ඛායූහනබවද හෙවත් දුක් රැස්කිරීම්බවද, නිර්‍වාණයාගේම දුක් නැතිකිරීම්බවද, අඞ්ගඅටක්ඇති මාර්‍ගයාගේම දුක්ඛ නිරොධ ස්ථාන නිර්‍වාණ සම්පාපක මාර්‍ග භාවයද ආර්‍ය්‍ය සත්‍යය නම්වේ. මේ ආර්‍ය්‍ය සත්‍යයම පරිසුඬ බුඞිමත් ආර්‍ය්‍යයන්ගේ ඥාන යෙහි සැලීමක් නැත්තාවූ සියලු ආකාරයෙන් පරිපූර්‍ණවූ නිෂ්පර්‍ය්‍යාය සත්‍යය හෙවත් විවිධ සත්‍යයන් අතුරෙන් මුඛ්‍ය සත්‍යය වේ. ඔවුනතුරෙන් මෙහි සම්මුති සත්‍යය හැර **පරමත්‍ථතො** යන පදය කීයේය. එහෙයින් **පරමත්‍ථතො** යනු පරමාර්‍ථ සත්‍ය වශයෙන්යයි කියනලදී. ඒ පරමත්‍ථතො යන පදයෙහි අර්‍ථය තෙම ස්වභාව යෙන් සිඞවූ අර්‍ථයද, පරිකල්පයෙන් සිඞවූ අර්‍ථයදැයි ද්විවිධවේ. එයින් යම් අර්‍ථයක් තෙම අනිකක් දැක්වීමෙන් වෙන්ව හුදෙක් වෙන් වෙන්ව තමාගේ ලක්ෂණයෙන් විද්‍යමානවූවක්ම සිඞවන්නේ වීනම් චිත්තාදී හේ අර්‍ථය තෙම සභාව සිඞනම. යම් අර්‍ථයෙක් වනාහි තමාගේ ලක්ෂණයෙන් විද්‍යමානව නොවන්නේද, විද්‍යමානවූ අර්‍ථයාගේ නොයෙක් ප්‍රවෘත්ති ආකාරයන් සාරුණුකොට ගෙන සිතින් පරිකල්පනය කොට ප්‍රතිබිම්බ සහිතකොට හෙවත් ශරීර සහිතකොට ගන්නාලදුව සිතින් නිර්‍මිතකරනලදුව සිත්හිම උප

ලබ්භ්‍යමාන වේද, හේ සත්ත්වපුද්ගලාදී අර්ථය තෙම පරිකල්ප සිද්ධාන්ත නම. ඒ විවිධ අර්ථයන් අතුරෙන් ස්වභාව සිද්ධාන්තයම පරමාර්ථ නම. ඒ එසේමැයි.

හේ ස්වභාව සිද්ධාන්තය තෙම මේ ධර්මයෙහි බුද්ධ ශබ්දයෝ වෙත් යත මේ අර්ථයි ඒකාන්තයෙන් විද්‍යමානවූ අර්ථ හෙයින් ඉතිරි පරිකල්ප සිද්ධාන්තයට වඩා අධිකවූ අර්ථයයි. එහෙයින් පරමාර්ථ නම. අන්වය ක්‍රමයකුදු ඇත.

යම් ජනකෙනෙක් මේ අර්ථය ඇත, මේ අර්ථය ලැබේයයි ගෙන විශිෂ්ට ඥානයෙන් දතයුතුවූ ඒ අර්ථයාගේ විශිෂ්ට ඥානයෙන් දැනගැනීම පිණිසද, පිරිසිඳ දතමනාවූ ඒ අර්ථයාගේ පිරිසිඳ දැනගැණීම පිණිසද, පැහැවියයුතු ඒ අර්ථයාගේ ප්‍රහාණය පිණිසද ප්‍රත්‍යක්ෂකල යුතුවූ ඒ අර්ථයාගේ ප්‍රත්‍යක්ෂකිරීම පිණිසද භාවනාකටයුතු ඒ අර්ථයාගේ භාවනා පිණිසද පිළිපදිද්ද ඒ පුද්ගලයන්ගේ තදර්ථසාධනයෙහි නොපෙරෙලෙන අර්ථ ඇති හෙයින් හෙවත් නොවරද්දවන අර්ථ හෙයින් උතුම්වූ අර්ථය පරමාර්ථ නම. ඉතිරි පරිකල්ප සිද්ධාන්තය එනාහි අවිද්‍යමාන හෙයින් ඒ අභිඥෙය්‍යාදි අර්ථය පිණිස පිළිපදින්නවුන්ට තදර්ථ සාධනයෙහි විපරීතයට පෙරලෙන්නේමවේ.

මේ සර්වඥශාසනයෙහි අභිඥෙය්‍ය, පරිඥෙය්‍ය, පහාතබ්බ' සච්ඡිකාතබ්බ, භාවෙතබ්බ යන මේ ශාසනාඞ්ගයෝ මහමෙරමෙන් අති විසාලයහ එයින් දෙසැත්තැවක්වූ පරමාර්ථ ධර්මයෝ අභිඥෙය්‍ය ධර්ම නම් වෙති. දුක්ඛසත්‍යයට අයත් ලෞකික සිත් 81 ය, ලෝභය හැර ඉතිරි චෛතසික එක්පණසය, අටවිසි රූපය යන මොවුහු පිරිසිඳ දැනගැණීම පරිඥෙය්‍ය ධර්ම නම් වෙති.

කාමතෘෂ්ණා භවතෘෂ්ණා විභවතෘෂ්ණා යන ධර්මයෝ පහාතබ්බ ධර්ම නම් වෙති. සතර ශ්‍රාමණ්‍ය ඵලය, අසඞ්ඛත ධාතු සඞ්ඛ්‍යාත නිර්වාණය යන මේ ධර්මයෝ සච්ඡිකාතබ්බ ධර්ම නම් වෙති. සම්මා දිට්ඨි ආදි මාර්ගාඞ්ග අටදෙන භාවෙතබ්බ ධර්ම නම් වෙති. මෙකී කෘත්‍යපස සිදුකිරීමෙන් මේ ශාසනයෙහි ශාසනාඞ්ගය නිමකරන ලද්දේ වේ.

කුමන අර්ථයකින් **චිත්ත** නම් වන්නේද? යන මේ ප්‍රශ්නයට පිළිතුරු මේ වක්ෂ්‍යමානාකාරයෙන් දත යුතුයි. ' **චින්තෙතීති චිත්තං** " යනු නිර්වචන හෙයින් යම් ස්වභාව ධර්මයෙක් රූපාදි අරමුණු සිතාද, එසේ හෙයින් ඒ ස්වභාව ධර්මය තෙම චිත්ත නමි. මේ වාක්‍යයෙහිද චින්තන ක්‍රියාවනම්, අනවරතයෙන් අරමුණ අපෙක්ෂා කොට ඇත්නී වෙයි. එහෙයින් අරමුණු ගැණීම අරමුණු ලැබීමම

මෙහි චින්තන ක්‍රියා යයි දතයුත්තිය. එසේ ඇතිකල්හි භවඞ්ග කාල විසංඥ කාලයන්හි චිත්තය අරමුණෙන් වෙන්වද පවතීය යන මෙසේ ලබ්ධි ඇති පුද්ගලයන්ගේ ලබ්ධිය ප්‍රතික්ෂෙප කරනලද්දේ වෙයි, ඒ චිත්තයාගේ නිශ්‍රය සමනන්තරාදී ප්‍රත්‍යයන් කරණකොට ගෙණ නාමය නොලැබ මේ චිත්තයාගේ ආරම්මණ ප්‍රත්‍යවශයෙන්ම නාමය සිද්ධයයි දත යුතුයි.

මේ චින්තනය ලක්ෂණකොට ඇති සිත කාරණකොට ගෙණ ස්පර්ශාදි සම්ප්‍රයුක්ත ධර්මයෝ අරමුණු සිතත් එසේ හෙයින් චිත්ත නම්. ඒ චිත්තය අරමුණු ගැනීම් කෘත්‍යයෙහි පූර්වඞ්ගම වූයේයයි ඒ චිත්තයෙහි එක්ව යෙදුනාවූ ධර්මයෝද අරමුණු ගන්නාහු ඒ චිත්ත යාගේ වශයෙන් අරමුණු ගනිත්යයි දතයුතුයි නොහොත් චින්තන ක්‍රියාව චිත්ත නම. හේ විස්තරකොට දක්වනු ලැබේ.

සියළුම පරමාර්ථ ධර්මයෝ ඒ ඒ ක්‍රියා මාත්‍රයෝම වෙත්. ඒ ධර්ම යන්හී ද්‍රව්‍යයක් හෝ සටහණක් හෝ ශරීරයක් හෝ නොලැබේ· ඔව්හු ප්‍රත්‍යයන් පිළිබඳ පැවතුම් ඇත්තාහුද වෙත්. ඒ ධර්මයෝ තමාගේ ශක්තියෙන් උපදින්ට පවා නොමහැකි වෙත්.

චින්තනය කිරීම හෝ ස්පර්ශ කිරීම හෝ කියනුම කිම. ඔව්හු ක්ෂණමාත්‍රයක් දරා සිටින සුළුද වෙත්. කිසිකාලෙක්හී කිසිවෙකුගේ වසයෙහි පැවතින්ට නොමහැකි වෙත්යයි දතයුතුයි. එහෙයින් ඒ ධර්මයන්හි මේ ද්‍රව්‍යය මේ ශක්තිය මේ ක්‍රියා යයි මෙසේ විභාගය නොලැබේ යයි දතයුතුයි. කාරුණු මෙසේවූ හෙයින් සියළු පර මාර්ථ පදයන්හි මේ භාවසාධන විග්‍රහයම ප්‍රධාන වශයෙන් ලැබේ. එයින් අන්‍ය කර්තෘ කරණ සාධනයෝ වනාහි පර්යාය වශයෙන්ම ලැබෙත්යයි දතයුතුයි.

මෙහිද ද්‍රව්‍යාදි වශයෙන් අභින්නවූ චින්තනයාගේ අර්ථ විශෙෂය හඟවනු පිණිස විභාග කල්පනා කිරීම් වශයෙන් භෙදකරණය පර්යාය වශයෙන් දතයුතුයි.

කෙසේ ද? යතහොත්, දරුගලගේ ශරීරය මෙනි. එසේ විභාග කිරීම ඒ ඒ ක්‍රියා සඞ්ඛ්‍යාත ධර්මයෙන් විමුක්තවූ අන්‍ය තීර්ථකායන් විසින් කල්පනා කරනලද කාරණාවූ ආත්ම ජීව සත්ව පුද්ගල යෙකුගේ සර්වප්‍රකාරයෙන් අභාවය දැක්වීම ප්‍රයෝජන කොට ඇත් තේය. ඒ එසේමැයි. ආත්මාදියක් ඇතිකල්හි භෙද රහිතවූ වස්තු වකගේ භෙදය කල්පනාකිරීමෙන් කවර ප්‍රයොජනද?

ධර්මයන්හී කරන්නෙක් හෝ කරවන්නෙක් හෝ කිසිවෙක් නැත්තේය. ලොකයෙහි ආත්මය ප්‍රධානකොට ඇත්තාවූ ක්‍රියා නිපදවන්නාවූ කර්තෘ කෙණෙක් නම් සිද්ධවන්නේය. එහෙයින්

චින්තන කෘත්‍යයෙහි තමන් ප්‍රධානවූබව දක්වනු පිණිස ඒ කර්තෘභාවය චිත්තයෙහි ආරූඪකොට "චින්තෙතීති චිත්තං" යි කියනලදී. චිත්තයාගේ බලයෙන් එහි යෙදෙන සම්ප්‍රයුක්ත ධර්මයන්ගේද ඒ චින්තන කෘත්‍යයෙහි තදනුකූල පැවැත්ම දක්වනු පිණිස නැවත චිත්තය කෙරෙහි කරණ භාවයද, ඒ සම්ප්‍රයුක්ත ධර්මයන් කෙරෙහි කර්තෘභාවයද ආරූඪකොට "චින්තෙන්ති සම්පයුත්තකා ධම්මා එතෙනාති චිත්තං" යි කියනලද්දේයයි දතයුතුයි.

තවද චිත්තං යන පදයෙහි චිත්ත ශබ්දය තෙම විසිතුරු බවය යන අර්ථය ප්‍රකාශවන්නේයයි දතයුතුයි.

ගේ වනාහි සංයුත්ත නිකායෙහි:

"දිට්ඨං වො භික්ඛවෙ චරණං නාම චිත්තන්ති, එවම්භන්තෙ, තම්පි ඛො භික්ඛවෙ චරණං චිත්තං චිත්තෙනෙව චින්තිතන්ති, තෙනාපි ඛො භික්ඛවෙ චරණෙන චිත්තෙන චිත්තඤ්ඤෙව චිත්තතරං යි ද නාහං භික්ඛවෙ අඤ්ඤං එකනිකායම්පි සමනුපස්සාමි යං එවං චිත්තං යථයිදං භික්ඛවෙ තිරච්ඡානගතා පාණා තෙපි ඛො භික්ඛවෙ තිරච්ඡානගතා පාණා චිත්තෙනෙව චින්තිතා තෙහිපි ඛො භික්ඛවෙ තිරච්ඡානගතෙහි පාණෙහි චිත්තඤ්ඤෙව චිත්තතරං" යි ද වදාරනලදී.

මේ පාඨයෙහි අභිප්‍රාය නම්:—

මහණෙනි! තොප විසින් මහජනයාට දක්වනු පිණිස කරන ලද චරණනම් සිතියම දක්නා ලද්දේද? ස්වාමිනි! එසේය, දක්නා ලද්දේයයි සැළකලාහුය. මහණෙනි! ඒ චරණ නම් සිතියම පවා, සිතින්ම සිතනලදී. මහණෙනි! ඒ චරණ නම් සිතියමටත් වඩා සිතම අතිශයින් විසිතුරුවේ මහණෙනි! මේ තිරිසන්ගත ප්‍රාණීහු යම්සේ විසිතුරුවූවාහුද, එසේ විසිතුරුවූ යම් ස්වභාවයක් ඇත්ද එබඳුවූ අන්‍ය එකම සමූහයකුදු මම සර්වඥතාඥානයෙන් නොදක්නෙමි මහණෙනි! ඒ තිරිසන්ගත ප්‍රාණීහු සිතින්ම විසිතුරු කරන ලදහ. මහණෙනි! ඒ තිරිසන්ගත සත්ත්වයන්ටත් වඩා සිතම අතිශයින් විසිතුරුවේ යනුයි.

යම් සිතියමෙක්හි විසිතුරු දිව්‍යවිමානාදි චිත්‍රකර්මයන්කොට මෙනම් මෙනම් පින්කරන්නාවූ පුද්ගලයෝ මේ මේ විමානයෙහි උපදිත්යයි දක්වමින් ගම් නියම්ගම් රාජධානීන්හි හැසිරෙත්ද, ඒ සිතියම් රූමුවට චරණ නම් චිත්‍රයයි ව්‍යවහාර කරණු ලැබේ. මෙහි චිත්තයාගේ විසිතුරුබව හෙතුකොටගෙණ හැඟීම යයි කියනලද සංඥා තොමෝ විසිතුරු වන්නීය. සංඥාවගේ විසිතුරුබව හෙතු

කොටගෙණ තෘෂ්ණා තොමෝ විසිතුරු වන්නීය. තෘෂ්ණාවගේ විසිතුරුබව හෙතුකොටගෙණ කර්මයෝ විසිතුරු වන්නාහ. දැන් චිත්තයාගේ ලක්ෂණ රස ප්‍රත්‍යුපස්ථාන පදස්ථාන යන සතර විධිය පිළිවෙලින් දක්වනු ලැබේ. එයින් චිත්තයාගේ ස්වභාවය හෙවත් ලක්ෂණය කවරේද? යන ප්‍රශ්නයට පිළිතුරුනම්;

**"ආරම්මණවිජානන ලක්ඛණං චිත්තං"** යි කී හෙයින් චිත්තය තෙම රූපාදි අරමුණු විශෙෂයෙන් දැනගැණීම ලක්ෂණකොට ඇත්තේය. ඒ එසේමැයි. චාතුර්භූමික චිත්තයාගේ රූපාදි අරමුණු විශෙෂයෙන් දැනනොගන්නා ලක්ෂණයක් නම් නැත්තේය. සියල්ල දැනගැණීම් ලක්ෂණ කොට ඇත්තේ මැයි යනුයි. චිත්තයාගේ කෘත්‍යය හෙවත් රසය කවරේද? යන ප්‍රශ්නයට පිළිතුරුනම්;

**"පුබ්බඞ්ගමරසං"** යි කී හෙයින් චිත්තය තෙම වේදනාදී චෛතසිකයන්ගේ පෙරමුනුබව කෘත්‍යයකොට ඇත්තේය. සිත චක්ෂුරාදී ද්වාරයට පැමිණි අරමුණ ප්‍රකාශකරණ අර්ථයෙන් පෙරටුව යන්නේ වෙයි. ඒ එසේමැයි. චක්ෂුර්ද්වාරයෙන් දක්ක යුතුවූ රූපාරම්මණය සිතින් දැනගණී. ශ්‍රොත්‍රද්වාරයෙන් ඇසිය යුතුවූ සද්දාරම්මණය සිතින් දැනගණී. ඝ්‍රාණද්වාරයෙන් ආඝ්‍රාණය කටයුතුවූ ගන්ධාරම්මණය සිතින් දැනගණී. ජිහ්වාද්වාරයෙන් ආශ්වාදනය කටයුතුවූ රසාරම්මණය සිතින් දැනගණී. කායද්වාරයෙන් ස්පර්ශනය කටයුතුවූ ඵොට්ඨබ්බාරම්මණය සිතින් දැනගණී. මනොද්වාරයෙන් දතයුතුවූ ධම්මාරම්මණය සිතින්ම දැනගණී.

යම්සේ චතාභි නගරරක්ෂාවෙහි නියුක්තවූ පුරුෂතෙමේ නුවර මධ්‍යයෙහිවූ සතර මංසන්ධියෙක හිඳ මේ නෙවාසික පුරුෂය, මේ ආගන්තුක පුරුෂයයි ආ ආ ජනයා පරීක්ෂා කොරේද ව්‍යවස්ථා කෙරේද මෙසේ මේ උපමා සම්පත්තිය දතයුත්තේය. එහෙයින් ද්වාරයට පැමිණි අරමුණ පරීක්ෂා කිරීමෙහි පුරෙචාරික වේනුයි. චිත්තය තෙම පූර්වඞ්ගම කෘත්‍ය ඇත්තේයයි කියනු ලැබේ යනුයි. චිත්තයාගේ වැටහීම් ආකාරය කවරේද? යන මේ ප්‍රශ්නයට පිළිතුරුනම්;

**"සන්ධාන පච්චුපට්ඨානං"** යි කී හෙයින් අනන්තර ප්‍රත්‍යවශයෙන් සංහිත වෙමින් ඉපදීම වැටහෙනාකාරය ඇත්තේය. පසු පසුව උපදිනු ලබන්නාවූ සිත් තෙමේ පළමු පළමු උපන් චිත්තය හා අතුරු නැති කොට ගැළපීමම වැටහේනුයි, හටගැණීම් ස්වභාවයට යේනුයි; "සන්ධාන පච්චුපට්ඨාන" නම් වෙයි යනුයි. චිත්තයාගේ ආසන්න කාරණය කවරේද? යන මේ ප්‍රශ්නයට පිළිතුරුනම්;

"**නාමරූප පදට්ඨානං**"යි කී හෙයින් චිත්තය තෙම නාම රූප දෙක ආසන්න කාරණා කොට ඇත්තේය. ඒ සිතට පඤ්චවොකාර භවයෙහි වනාහි නාම රූප දෙක ආසන්න කාරණා වෙයි. චතුවොකාර භවයෙහි නාමය පමණක්ම ආසන්න කාරණා වෙයි. එහෙයින් චිත්තය තෙම නාම රූප දෙක ආසන්න කාරණායයි කියනලදී යනුයි. ලක්ෂණ රස පච්චුපට්ඨාන පදට්ඨාන යන සතර කල්පනාකිරීමට පහසුවීම පිණිස මේ ගාථාදෙක පාඩම්කොට සිත තබාගත යුතුයි.

**සාමඤ්ඤංවා සභාවොවා ධම්මානං ලක්ඛණං මතං**
**කිච්චංවා තස්ස සම්පත්ති රසොති පරිදීපයෙ,**
**ඵලංවා පච්චුපට්ඨාන මුපට්ඨාන නයොපිවා**
**ආසන්න කාරණං යන්තුතං පදට්ඨාන සඤ්ඤිතං**

පරමාර්ථ ධර්මයන්ගේ සාමාන්‍ය ලක්ෂණය හෝ ස්වභාව ලක්ෂණය ලක්ෂණයයි දන්නාලදී. ඒ පරමාර්ථ ධර්මයාගේ කෘත්‍යය හෝ සම්පත්තිය රසයයි දක්වන්නේය. ඵලය හෝ ඥානයට වැටහෙනාකාරය පච්චුපට්ඨාන නම් වේ.

යම් ආසන්නවූ හෙතුවක් ඇත්තේවීනම් එය පදට්ඨානයයි සලකන ලදී. යනු එහි භාවයි. මෙහි ලක්ෂණය වනාහි සාමාන්‍ය ලක්ෂණය ස්වභාව ලක්ෂණයයි විවිධවේ. එයින් සාමාන්‍ය ලක්ෂණය නම්, සියලු පරමාර්ථ ධර්මයන්ට සාධාරණ උත්පාදස්ථිති භඞ්ග යන මොවුන්ගේ ඇතිවීම නිසත් අනිත්‍ය දුඃඛ අනාත්ම යන ත්‍රිලක්ෂණයෙන් යුක්ත නිසත්ය. ස්වභාව ලක්ෂණය නම්, පරමාර්ථ ධර්මයන්ට අයත් වීම් ක්‍රියා මාත්‍රයයි. එනම්, චිත්තයාගේ අරමුණු දැනීම් ක්‍රියාව, ස්පර්ශයාගේ හැපීම් ක්‍රියාව, වෙදනාවගේ විඳීම් ක්‍රියාව, යනාදියයි කුමක්මෙන්ද? යතහොත් වහ්නියගේ උෂ්ණත්වය මෙනි. එහි රසනම්, කෘත්‍ය රසය, සම්පත්ති රසයයි. විවිධයි. එයින් කෘත්‍ය රසය නම් ඒ ඒ ධර්මයෙන් කරණ කටයුත්තයි. කුමක්මෙන්ද? යතහොත් වහ්නියගේ දහන කෘත්‍යයමෙනි. සම්පත්ති රසය නම්, ඒ ඒ ධර්මයාගේ සම්පූර්ණතාවයයි. කුමක්මෙන්ද? යතහොත් වහ්නියගේ දිලිහීම මෙනි. ඵල යද ඵල පච්චුපට්ඨාන උපට්ඨාන පච්චුපට්ඨානයයි විවිධවේ. එයින් ඵල පච්චුපට්ඨාන නම්, මේ ධර්මය මෙනම් ඵලයක් උපදවායයි දැනගැනීමයි. කුමක්මෙන්ද? යතහොත් වහ්නියගේ ධූමය මෙනි. උපට්ඨාන පච්චුපට්ඨාන නම්, මේ ධර්මය මෙනම්

ප්‍රතිබිම්බයකැයි වැටහිමයි. කුමක්මෙන්ද? යතහොත් ගිනි දැල්ල මෙනි. පදට්ඨාන කාම්, තමාගේ ඉපදීමට අසාධාරණ හෙතුවයි. කුමක්මෙන්ද? යතහොත් ගිනිමොළවන පුරුෂයා මෙනි.

මෙතෙකින් විතක්කය කියා නිමවනලදී.

කුමන අර්ථයකින් චෛතසික නම් වන්නේද? යන මේ ප්‍රශ්නයට පිළිතුරු මේ වක්ෂ්‍යමානාකාරයෙන් දතයුතුයි. **"චෙතසි භවං තදායත්ත වුත්තිතායාති චෙතසිකං"** යනු ටීකා. හෙයින් ඒ චිත්තය හා සම්බන්ධවූ පැවතුම් ඇති හෙයින් සිතෙහි වූයේයි එසේ හෙයින් චෛතසික නම. යනු එහි භාවයි. මෙයින් ස්පර්ශය ආදිකොට ඇති ධර්ම සමූහ තෙමේ ලැබේ. මේ චෛතසික යන පදයෙහිද චිත්තය හා සම්බන්ධවූ පැවැත්ම යනු එකොත්පාදාදි සතර සම්ප්‍රයොග ලක්ෂණයෙන් සිත හා සමග එක්වූවාක්මෙන් පැවැත්මයි. මේ වචනයෙන් චිත්තයාගේ යම් ජාතියක් ඇත්තේවීනම් ඕතොමෝම ස්පර්ශාදි චෛතසිකයන්ගේ ජාතියයි චිත්තයාගේ යම් ජරාවක් ඇත්තේවීනම් ඕතොමෝම ස්පර්ශාදී චෛතසිකයන්ගේ ජරාවයි එසේම චිත්තයාගේ යම් මරණයක් ඇත්තේවීනම් එයම ස්පර්ශාදී චෛතසිකයන්ගේ මරණයයි. චිත්තයාගේ යම් ආරම්මණයක් ඇත්තේවීනම් හේම ස්පර්ශාදී චෛතසිකයන්ගේ ආරම්මණයයි. චිත්තයාගේ යම් නිශ්‍රය වස්තුවක් ඇත්තේවීනම් හේම ස්පර්ශාදී චෛතසිකයන්ගේ නිශ්‍රය වස්තුවයි. මෙසේ එක්මල් පොකුරක එක නැට්ටකින් බැඳුනාවූ පුෂ්පයන්මෙන් සිත හා එකම ජාති ආදියෙන් බැඳුනාවූ ස්පර්ශාදි ධර්මයෝ මෙහි චෛතසික නමැයි සිද්ධවූවාහු වෙති. මෙහි නැට්ට චිත්තය මෙන්ද පුෂ්පයෝ චෛතසික මෙන්ද දත යුත්තාහ. තවද මැණික්ගල චිත්තය මෙන්ද ඊට අල්ලන කන්නාඩිය චෛතසික මෙන්ද කකාරාගත් කෂායෙහි ජලය චිත්තය මෙන්ද ඒ ජලයෙහි ඇතුළත්වූ නානාවිධ බෙහෙත් යුෂ චෛතසික මෙන්ද සැලකිය යුතු. මෙසේ ඇතිකල්හි චිත්තයද ඒ ස්පර්ශාදි චෛතසිකයන් හා සමග එපරිද්දෙන්ම සම්බන්ධව පවතින්නේයි. එහෙයින් චෛතසිකයද ඵස්සිකය වෙදනිකය යනාදී වශයෙන් ඉදින් කියයුතුවන්නේ නොවේද? එසේ නොකියයුතු කුමක්හෙයින්ද? යතහොත් සිතම ප්‍රධාන හෙයිනි. එහෙයින් වදාළහ. **"මනොපුබ්බඞ්ගමා ධම්මා මනොසෙට්ඨා මනොමයා"**යි මේ බුද්ධ වචනයෙන් ඒ ස්පර්ශාදි චෛත

සිකයෝ සිතින් තොරව නොලැබෙත්යයි දක්වයි. සිත වනාහී ඒ ඇතැම් චෛතසිකයන්ගෙන් වෙන්වද පවතීමය. ඒ එසේමැයි. පඤ්චවිඥානචිත්තය විතර්කාදිවූ ඒ ඇතැම් චෛතසිකයන්ගෙන් තොරව උපදී. එහෙයින් ස්පර්ශාදි චෛතසිකයන්ගේම ඒ සිත හා සම්බන්ධ පැවැත්ම ඇතිබව කියයුත්තීය. චිත්තයාගේ ඒ චෛතසිකයන් හා සම්බන්ධව පැවැත්ම ඇතිබව නොකියයුත්තීය. ලොකයෙහි හිරියල් සාදිලිංගන් ආදි නානාවිධ වර්ණ ධාතූන් උරච්චිකොට පටකොටයනාදි වස්තුයෙහි නානා චිත්‍රකර්ම කෙරෙත්. එහි පටකොටයනාදි වස්තුයෙහි පැතිරගැනීමද ඇලී බැඳී ගැනීමද ජලයාගේම කෘත්‍යයයි. වර්ණධාතූන්ගේ කෘත්‍යය නොවේ. නොයෙක් වර්ණ දක්වීම වර්ණධාතූන්ගේම කෘත්‍යයයි. ජලයාගේ කෘත්‍යය නොවේ. ඒ උපමායෙහි ආරම්මණය රාමුපටය මෙන් දතයුතු. චිත්තය ජලයමෙන්ද චෛතසික ධර්මයෝ නානාවිධ වර්ණධාතූහු මෙන්ද දතයුත්තාහ.

මෙතෙකින් චෛතසිකය කියා නිමවනලදී.

කුමන අර්ථයකින් රූප නම් වන්නේද? යන මේ ප්‍රශ්නයට පිළිතුරු මේ වක්ෂ්‍යමානාකාරයෙන් දතයුතු. **"රූපතීති සීතුණ්හාදි විරොධිපච්චයෙහි විකාරං ආපජ්ජති ආපාදියතීතිවා රූපං"** යනු නිර්වචන හෙයින් ශීතොෂ්ණාදි විරුද්ධ ප්‍රත්‍යයන් කරණකොටගෙන වෙනසට පැමිණෙන හෙයිනුත් ඒ විරුද්ධ ප්‍රත්‍යයන් විසින් වෙනසට පමුණුවනු ලබන හෙයිනුත් රූප නම්. එහෙයින් සංයුත්තක නිකායෙහි **"රුප්පතීති ඛො භික්ඛවෙ තස්මා රූපන්ති වුච්චති"**යි වදාළේය. යම් පෘථිවි ආපස් ආදි ස්වභාවයක් තෙමේ ශීතොෂ්ණාදි විරුද්ධ ප්‍රත්‍යයන් කාරණකොටගෙන ක්ෂණ ක්ෂණයෙක්හි අතුරුදහන් වේද ඒ පෘථිවි ආපස්ආදි ස්වභාවය රූප නම්වේ යනු එහි භාවයි. කවර ප්‍රත්‍යයකින් විකාරයට පැමිණේද? යතහොත් ශීතොෂ්ණාදි විරුද්ධ ප්‍රත්‍යයන් කරණකොටගෙන විකාරයට පැමිණේ යනුයි. රුප්පති යන මේ පදය රුප්පති කුප්පති ඝට්ටීයති පීලීයති භිජ්ජතියි මහානිද්දේශයෙහි කියනලදී. මේ කියනලද්දේ රුප්පති යන පදයෙහි පිණ්ඩාර්ථයයි. ප්‍රසාදාරම්මණවූ යම් ධර්මකෙනෙක් සතලොස් චිත්තක්ෂණයක් පැවැත්තාහුද හැපීම් සහිත ස්වභාව ඇත්තාහුද වෙද්ද ඒ ප්‍රසාදාරම්මණවූ රූප ධර්මයන්ගේම පවත්නා ක්ෂණයන්හි විරුද්ධ ප්‍රත්‍යයන් හා සමග එක්වීම් නම්වේ. ස්වල්පමාත්‍ර ක්ෂණයක් දරා සිටින්නාවූ නොහැපීම් ස්වභාව ඇත්තාවූ අන්‍ය රූප

ධර්මයන්ගේ ස්ථිතික්‍ෂණයන්හි විරුද්ධ ප්‍රත්‍යයන් හා සමග එක්වී
මෙක්නම් නොවන්නේයයි දතයුතු. ඒ එසේමැයි. නොගැටීම්
ස්වභාව ඇති ඒ සූක්‍ෂ්ම රූපයන්ගේද පිටත සීතාදීන් හා සමග
එක්වීමෙක් නැත. ස්වල්පමාත්‍ර ක්‍ෂණයක් දරුසිටින්නාවූ නො
හැපීම් ස්වභාව ඇත්තාවූ අරූප ධර්මයන්ගේද සීතාදී ප්‍රත්‍යයන්
කරණකොටගෙන එක්වීමකම් කෙසේ වන්නේද නොවන්නේ
මැයි. මෙසේ ඇතිකල්හි සුඛුම රූපයන්ගේ අරූපත්වයට පැමි
ණීම ඉදින් වන්නේද? යතොහොත් නොවන්නේය. කුමක් හෙ
යින්ද? යතහොත් ඖදාරික රූපයන් හා සමාන පැවතුම් ඇති
හෙයිනි. ඒ එසේමැයි. ඒ සුඛුම රූපයෝ ඖදාරික රූපයන් හා
විකාරයට පැමිණෙන කල්හි විකාරවෙත්මයයි දතයුතු. මෙහි
එක්වීමනම් අභිමුඛපතනයට පැමිණීම හා අරමුණු කිරීමද
හැර අන්‍යොන්‍ය විරුද්ධවූ ස්ථිතියට පැමිණියාවූ ඖදාරික රූප
යන්ගේ හෝ මහා භූතයන්ගේම හෝ ඔවුනොවුන් හා ගැටීම
යයි කියනු ලැබේ එහෙයින් “රුප්පති ඝට්ටියති පීළියති”යි
කියනලදී. රුප්පනයනම් පරසේනාවගේ ප්‍රහාරයෙන් රට කැළ
ඹීමක් මෙන් කලාපාන්තරගත ධාතූන්ගේ කැළඹීම හා බිඳීමද
කියනු ලැබේ. එහෙයින් “කුප්පති භිජ්ජති”යි කියනලදී මෙහි
කුප්පති යනු කැළඹෙයි සැලෙයි යන අර්ථයි. භිජ්ජති යනු වෙන
සට පැමිණෙයි යන අර්ථයි. යම් ක්‍ෂණයෙක්හි විරුද්ධ ප්‍රත්‍යයන්
ගේ සමාගමය ලබද්ද එතැන් පටන් ඒ රූප ධර්මයෝත් විකාර
ප්‍රාප්ත වෙති: ඌනාන රූපසන්තති අධික රූපසන්තතීන්ගේ ඉප
දීමෙන් ප්‍රත්‍යය භාවයට පැමිණියාහු වෙති යනු අර්ථයි. අන්තය
ක්‍රමයකුදු ඇත. රුප්පනය වනාහී වඩ්ඪන හායන යන මොවුන්
ගේ වශයෙන් විවිධයි. ඒ දෙදෙනද කල්ප විනාසයෙහි හා
කල්පය පිහිටීමෙහිද නානා ආයුඃකල්ප සංවත්සර ඍතු මාස
රාත්‍රි දිවා යන ආදීන්ගේ පෙරළීමෙහිද ප්‍රකටවේයයි දතයුතු.
රූපය යන නාමය ගැටීම් වශයෙන් පෙරළෙන ස්වභාව ඇති
ධර්මයන්ටම කුමක්හෙයින් සිද්ධවන්නේද? ඒ රූපධර්මයන්ගේම
ද්‍රව්‍යත්වය ඇති හෙයිනි. ඒ එසේමැයි. රූපධර්මයෝ සමූහ සණ්
ඨානාදි බවට පැමිණීමෙන් ද්‍රව්‍ය සහිතයහ. එහෙයින් ඒ රූපධර්ම
යන්ගේම පෙරළීම ප්‍රත්‍යක්‍ෂ වශයෙන්ද ලොකයාට ප්‍රකටවේ.
එහෙයින් ඒ විපරීත ස්වභාව ඇති රූපයන්හිම රූපය යන නා
මය සිද්ධයයි දතයුතු. නාම ධර්මයෝ වනාහි අද්‍රව්‍ය ධර්මයෝ වෙති.
එහෙයින් ඒ නාම ධර්මයන්ගේ විකාරය ප්‍රත්‍යක්‍ෂ වශයෙන් ලොක
යාට ප්‍රකටනොවේ. ඒ ඒ රූපයන්ගේ විකාරය දැක හෝ අසා හෝ

විචාරම හෝ ඒ නාම ධර්මයන්ගේ විකාරය පරසිත් දන්නවුන් හැර ලෝකයා විසින් දැනගත යුත්තේය. එහෙයින් නාම ධර්මයන්ගේ රූපය යන නාම ලාභයක් නැත. ව්‍යවහාරය නම් ලෝකව්‍යවහාරයෙන් වෙන්ව යම් හෙයකින් සිද්ධ නොවන්නේද ලෝකව්‍යවහාරයත් ප්‍රකට කාරණයාගේ වශයෙන්ම පැවැත්තේද එහෙයින් රූප්පන විෂයෙහි සීතාදී ශබ්දයන්ගේ ගැණීමෙන් වෙන්වද ඒ නාම ධර්මයන්ගේ රූපත්වයෙහි සැක නැවැත්ම ලෝකව්‍යවහාරයෙන් ප්‍රසිද්ධයයි දතයුතු. යම්හෙයකිනුත් බ්‍රහ්මලෝකයෙහි බ්‍රහ්මයන්ගේ කායවාග් විකාරයෝද සෘද්ධිවිකුර්වනයාගේ වශයෙන් පැවැත්තාවූ නානා රූප විකාරයෝද දක්නාලැබෙත්මද ඒවිකාරයෝද එක්ආකාරයකින් රූප්පනාකාරයෝම නම් වෙද්ද එහෙයින් ඒ රූප්පනාකාරයන්ගේ වශයෙන් බ්‍රහ්මලෝකයෙහි රූපයන්ගේ රූපය යන ව්‍යවහාරයට පැමිණීම වේයයි දතයුතු නොහොත් **"රූපයතිවා අඤ්ඤෙනා සභාවෙන පකාසතීති රූපං"** තමාගේ සවභාවයෙන්ප්‍රකටවේනුයි. රූප නම් වේ. යනු එහි භාවයි ඒ එසේමැයි. අරූප ධර්මයෝ හෙවත් නාම ධර්මයෝ තමාගේසවභාවයෙන් ප්‍රකට නොවෙත්. රූපය නිශ්‍රයකර ගැනීමෙන්ම ගතයුත්තාහුය. මේ රූපය වනාහි තමාගේ සවභාවයෙන්ම ප්‍රකටයි. පඤ්චවිඥානයන් කරණකොට ගෙනද ගතයුතුයි. මේ අර්ථය ඇතිකල්හි බ්‍රහ්මලෝකයෙහි රූපයන්ගේද යථාවම රූපත්වයට පැමිණීම සිද්ධවන්නේයයි දතයුතු. යම්හෙයකින් වනාහි සීතත රූප්පති යනාදි වචනය නිදර්ශන මාත්‍රයක් වේද එහෙයින් කම් චිත්ත ආහාරයන්ගේද වශයෙන් විකාරය සම්භවයවූ හෙයිනි. එහෙයින්ම සංඥවිඥානයෝද රූපාරම්මණ රසාරම්මණයන් කරණකොටගෙනම පෙළෙහි දක්වනලදහ. සංඥචෛතසිකය රූපයම නොහගී, විඥානය රසාරම්මණයම නොදනී නිදර්ශන මාත්‍රයෙන් දෙශනාව වන්නේයි. එහෙයින් සීතාදී ශබ්දයන්ගේ ග්‍රහණය නොහැරම ඒ බ්‍රහ්මලෝකයෙහි රූපත්වයට පැමිණීම ප්‍රකාශකිරීමෙන් ප්‍රයෝජනයක් නැත්තේයයි දතයුතු.

මෙතෙක්න් රූපය කියා නිමවනලදී.

**නිබ්බාන** යන මෙහි අර්ථය මෙසේ දතයුතු. **"වානති භවා භවං ගච්ඡති එතායාතිවානං"** යනු නිර්වචනහෙයින් මේ තෘෂ්ණාව සත්වයාට භවයෙන් භවයට යැමට ඉවහල්වූ හෙයින් වාන නම්වේ. මේ වාන සඞ්ඛ්‍යාත තෘෂ්ණාව සත්වයන්ගේ සන්තාන

යෙහි යම්තාක් කල්පවතීද ඒතාක්කල් සසර සැරිසරන්නාහුය. **"තතො නික්ඛන්තං නිබ්බානං"** ඒ වාන සංඛ්‍යාත තෘෂ්ණාවෙන් නික්මුණේ නිර්වාණයයි. නොහොත් මෙහි සියලු වෘතීත දුක්ඛ සන්තාපයෝ නිවීමට කරුණුවූහෙයින් නිර්වාණනම. හේ වනාහි මාර්ගඵල චිත්තයන්ට අරමුණුවූ අසංඛත ධාතුවබව දත යුතු. මෙහි නි යන උපසර්ගයෙන් දක්වන්නේ නික්මීමය. යන මේ අර්ථයයි. හේ මෙහි මුඛ්‍ය අර්ථයවේ. දැන් ලක්ෂණාදිය කියනු ලැබේ. **සන්තිලක්ඛණං නිබ්බානං, අච්චුතිරසං, අස්සාදකරණරසංවා, අනිමිත්තපච්චුපට්ඨානං, පපඤ්චාභාව පච්චුපට්ඨානංවා"** නිර්වාණයවනාහි **සර්වසංස්කාරයන්**ගේ හා එකොළොස් වහ්නිජාලාවන්ගේ සංසිඳීම ස්වභාව ලක්ෂණකොට ඇත්තේය. චුතනොවීම්බව හෙවත් නොනස්නාබව කෘත්‍යකොට ඇත්තේය. නොහොත් ආශ්වාද කරණය කෘත්‍යකොට ඇත්තේය හ්‍රස්ව දීර්ඝාදී නිමිති රහිතබව වැටහීම්කොට ඇත්තේය. නොහොත් තෘෂ්ණා මාන දෘෂ්ටි සංඛ්‍යාත ප්‍රපඤ්චාභාවය වැටහීම්කොට ඇත්තේය නිර්වාණයාගේ ආසන්න කාරණයක් නොලැබේ. මෙහි නිර්වාණයයි කියනලද්දේ ක්ලේශස්කන්ධයන්ගේ නිරවශේෂ නිරෝධයයි. එනම්; මතු ඉපදීමට කිසිවක් ශේෂනොවී නූපදනාකාරයෙන් සිදුවන නිරෝධයයි, නිවීමයි, නොපැවැත්මයි. "නිරෝධය නිවීම නොපැවැත්ම" යන වචනයන්ගෙන් අදහස්කරන නිරෝධ තුනකි. එනම්; 1 උපන් සංස්කාර ධර්මයන්ගේ ක්ෂණයක් පාසා සිදුවන භඞ්ගය, 2 ගිනි නිවීම මැරීම යනාදීන්හි අදහස්කරන නාමරූප පරම්පරාවන්ගේ සිඳීම. 3 මතු කිසිකලෙක නූපදනාකාරයෙන් සිදුවන අනුත්පාද නිරෝධය යන මොව්හුයි. මෙයින් ක්ෂණනිරෝධය වනාහි උපන් සංස්කාරධර්මයන්ගේ බිඳී අතුරුදහන්වීමයයි කියනලද සිස්ධවෙති ඔව්හු අනිත්‍ය සම්බන්ධ කථාවෙහි අභිප්‍රෙත නිරෝධයෝයි. නිර්වාණ කථාවෙහි වනාහි කිසිකලෙක නූපදනා නියායෙන් සිදුවන නාමරූප ධර්මයන්ගේ අනුත්පාද නිරෝධයම අභිප්‍රේතවේ. මේ වනාහි පූර්වෝක්ත අභාවටය හා අතිශයින් විසදෘශවූ පරමාර්ථ වශයෙන් විද්‍යමානවූ අතීතානාගත වර්තමාන යන කාලත්‍රයෙන් මුක්තවූ සූක්ෂම ධර්මයකි. නිර්වාණය පිළිබඳ විස්තර විභාගය දැනගණු කැමතියන් විසින් නිර්වාණ විනිශ්චය නම්වූ ග්‍රන්ථය බැලියයුතු.

මෙතෙකින් නිර්වාණය කියා නිමවනලදී.

ඒ සිත විතාහි කාමාවචරය, රූපාවචරය, අරූපාවචරය, ලොකොත්තරය කියා සිව්වැදෑරුම්. එයින් කාමාවචර යනු කුමක් ද? **"කාමෙතීති කාමො"** යනු කතෘසාධන විග්‍රහහෙයින් යම් තෘෂ්ණාවක් තොමෝ කැමතිවේද? එසේහෙයින් ඒ තෘෂ්ණා තොමෝ කාමනම්. මෙයින් කාමතෘෂ්ණාව ලැබේ. **"කාමො එත්ථ ආරම්මණකරණවසෙන අවචරතීති කාමාවචරං"** මේ සූපණස් චිත්තයෙහි කාමතෘෂ්ණාව අරමුණුකිරීම් වශයෙන් හැසිරේද පවතීද එසේහෙයින් කාමාවචරනම්වේ. මෙයින් කාමතෘෂ්ණාව බැසගන්නාලද හැසිරෙන පවතින සූපණස් චිත්තය ලැබේ. නොහොත් **"කාමීයතී'ති කාමො"** යනු කර්මසාධන විග්‍රහ හෙයින් වස්තුකාමයතෙමේ කෙලශකාමය විසින් කැමතිවනු ලැබේ. එසේහෙයින් කාමනම් මෙයින් එකොළොස් කාමභූමිය ලැබේ. "කාමෙ යෙභුය්‍යෙන අවචරතීති කාමාවචරං" ඒ එකොළොස් කාමභූමියෙහි බොහෝසෙයින් ලාමකව හැසිරේද එසේහෙයින් කාමාවචර නම්වේ මෙයින් කාමභූමියෙහි පවතින හැසිරෙන සිත ලැබේ යම්සේ යුද්ධභූමියෙහි බොහෝසෙයින් හැසිරෙන්නාවූ සඞ්ගාමාවචරයයි ලබනලද නම් ඇති හස්තිරාජතෙමේ අන්තැනෙක්හි හැසිරෙන්නේ නමුදු බොහෝසේ යුද්ධභූමියෙහි හැසිරෙන හෙයින් සඞ්ගාමාවචරමයයි කියනුලැබේද එපරිද්දෙන්ම මේ කාමාවචර චිත්තයද සෙසු රූපාරූප භවයෙහි හටගන්නේ නමුදු කාමලොකයෙහි බහුල වශයෙන් හටගන්නා හෙයින් කාමාවචරමයයි කියනලද්දේය. "කාමෙ එත්ථ අවචරතීති කාමාවචරො" මේ එකොළොස් කාමභූමියෙහි වස්තුකාම කෙලශ කාමද්වය හැසිරේද එහෙයින් කාමාවචරනම්. මෙයින් එකොළොස් කාමභූමිය ලැබේ. ඒ එකොළොස් කාමභූමියෙහි පැවැත්නාවූ සිත් නිශ්‍රයවූ භූමියගේ කාමාවචර යන නාමය නිශ්‍රිතවූ සිතෙහි ආරූඪකොට කාමාවචරනම්ලද චිත්තය කියේයයි දත යුතු. එහෙයින් කියනලදමැයි;-

**"කාමොවචරතීත්‍යත්ථ-කාමෙවචරතීතිවා**
**ඨානූපචාරතො වාපි-තංකාමාවචරං භවෙ"**

**"රූපෙ පවත්තා තණ්හා රූපතණ්හා"** රූපධ්‍යාන කෙරෙහි පැවති තෘෂ්ණාව රූපතෘෂ්ණාවයි. "රූපං අවචරතිඑත්ථආරම්මණකරණවසෙනාති රූපාවචරං" මේ පසළොස් චිත්තයෙහි රූප තෘෂ්ණාව අරමුණුකිරීම් වශයෙන් පවතීද හැසිරේද එහෙයින් රූපාවචර නම්වේ. මෙයින් රූපතෘෂ්ණාව හැසිරෙන පවතින

බැසගත්තාලද චිත්තය ලැබේ. “රූපභවො රූපං” මෙයින් පසළොස් රූප භූමියම ලැබේ. “රූපෙ අවචරන්ති යෙභුය්‍යෙනාති රූපාවචරං” ඒ පසළොස් රූපභූමියෙහි බොහෝසෙයින් ලාමකව හැසිරේද එහෙයින් රූපාවචර නම්වේ. මෙයින් රූප භූමියෙහි හැසිරෙන පවතින සිත ලැබේ. “රූපං අවචරති එත්ථාති රූපාවචරං” පසළොස් රූපභූමියෙහි රූපතෘෂ්ණාව හැසිරේද එසේහෙයින් රූපාවචරනම් මෙයින් පසළොස් රූප භූමිය ලැබේ. ඒ පසළොස් රූපභූමියෙහි පැවති සිත නිශ්‍රයොප චාර වශයෙන් රූපාවචරනම්.

“අරූපෙ පවත්තා තණ්හා අරූපං” අරූපධ්‍යානයෙහි පැවති තෘෂ්ණාව අරූපනමී. මෙයින් අරූප තෘෂ්ණාව ලැබේ “අරූපං අවචරති එත්ථ ආරම්මණ කරණවසෙනාති අරූපාවචරං” මේ දෙළොස් චිත්තයෙහි අරූපතෘෂ්ණාව අරමුණු කිරීම් වශයෙන් හැසිරේද එහෙයින් අරූපාවචරනම්. මෙයින් අරූපතෘෂ්ණාව බැසගත්තාලද සිත ලැබේ. “අරූප භවො අරූපං” මෙයින් සතර අරූපභූමිය ලැබේ. “අරූපෙ අවචරති යෙභුය්‍යෙනාති අරූපාවචරං” සතර අරූප භූමියෙහි බොහෝසෙයින් හැසිරේද එහෙයින් අරූපාවචරනම මෙයින් අරූපභූමියෙහි පැවති සිත ලැබේ. “අරූපං අවචරති එත්ථාති අරූපාවචරං” මේ සතරඅරූප භූමියෙහි අරූපතෘෂ්ණාව හැසිරේද එහෙයින් අරූපාවචරනම. මෙයින් සතර අරූපභූමිය ලැබේ. ඒ අරූප භූමියෙහි පැවති සිත නිශ්‍රයොපචාර වශයෙන් අරූපාවචරනම්.

**ලොකුත්තර** යනමෙහි අර්ථය මෙසේ දතයුතු: **“ලුජ්ජන පලුජ්ජනට්ඨෙන ලොකො”** යනු ටීකාහෙයින් යථොක්ත ත්‍රෛභූමක ධර්මසමූහය ලුඳු පලුඳුවන අර්ථහෙයින් ලොකනම්වේ. එහෙයින් වදාරනලදමැයි. **“ලුජ්ජතී පලුජ්ජතීති ඛො භික්ඛවෙ තස්මා ලොකොති වුච්චති”** යි මහණෙනි! ඒකාන්තයෙන් යම් ධර්ම සමූහයක්තෙමේ බිඳෙයිද ප්‍රකාරයෙන් බිඳෙයිද එහෙයින් ඒ ධර්මසමූහයතෙම ලොකයයි කියනුලැබේ. යනු එහි භාවයි. එසේ ඇතිකල්හි නිර්වාණය තොරකොට ඇති ලොකොත්තර ධර්මයන්ගේද ලොකත්වයට පැමිණීම වන්නීය. කුමක්හෙයින්ද? යත හොත් නිර්වාණය වර්ජිතකොට ඇති ඒ ලොකොත්තර ධර්මයන්ගේද ලුඳු පලුඳුවන ධර්මවූහෙයිනි. ඔවුන්ගේ එසේ ලොකත්වයට පැමිණීමක් නොමැත්තේයි.

යම් ලෞකික ධර්මයෙක්හි නිත්‍යය ධ්‍රැවය ශාස්වතයයි මහජනයාගේ මිථ්‍යාග්‍රාහයෙක් පිහිටාද ඒ ධර්මයෙහිම ඒ මිථ්‍යාග්‍රාහයාගේ වැලැක්ම පිණිස මේ ලොක යන නාම ව්‍යවහාරය නියමකරණු ලැබේ. එහෙයින් සර්වප්‍රකාරයෙන් මිථ්‍යාග්‍රාහයෙන් මිදුනාවූ ඒ ලොකොත්තර ධර්මයන්ට ලොකත්වයට පැමිණීමක් නැතැයි කියත්. යම් ලෞකික ධර්මකෙනකුන්ගේ බිඳීම හා ප්‍රකාරයෙන් බිඳීම්ද මහජනයාට ප්‍රකටවන්නේද ඒ ධර්මයන්ගේම ලොකත්වයට පැමිණීම සිද්ධයි. එහෙයින් ලොකොත්තර ධර්මයන්ගේ ලොකත්වයෙහි ප්‍රසඞ්ගයක් නැතැයි දතයුතු. මාර්ගචිත්තය තෙම උපාදාන ස්කන්ධ සංඛ්‍යාත ලොකය කෙරෙන් එතෙරවන හෙයින්ද ඵලචිත්තය තෙම ඉන් එතෙරවූහෙයින්ද ලොකොත්තර නම්වේ. චිත්තාධිකාරයවූ හෙයින් නිර්වාණය මෙහි නොලැබේයයි දතයුතු. මෙහි එතෙරවීමනම් තෘෂ්ණාත්‍රය ග්‍රාහයෙන් මිදීමෙන් ත්‍රිවිධ ලොකයන්හි ඇතුළත්නොවූ බවමැයි. ගේවතානි ඒ ලොකොත්තර ධර්මයන්ට අධිෂ්ඨානවූවාක්මෙන් ගනුලැබේ. එහෙයින් වෙන්ව එකක්වූ සතරවෙනි අවස්ථාව භූමි නාමැයි දතයුතු.

මෙසේ චිත්තය භූමින්ගේ ප්‍රභෙදයෙන්ද හීනප්‍රණීතානුක්‍රමයෙන්ද සතරාකාරයකින් දක්වා දැන් ඒ සතරාකාර චිත්තයම නිර්දිෂ්ටක්‍රමය අනුව බෙදනුයේ පළමුකොට කාමාවචර චිත්තයද ඔවුනතුරෙහිදු හීනවූ අශෝභන චිත්තයද ඔවුනතුරෙහිදු සියල්ලන්ට හීනවූ අකුසල චිත්තයද පළමුකොට දක්වනු පිණිස "සොමනස්ස සහගතං" යනාදී වචනය කියනලදී.

1 සොමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත අසඞ්ඛාරික චිත්තය
2 සොමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත සසඞ්ඛාරික චිත්තය
3 සොමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්ත අසඞ්ඛාරික චිත්තය
4 සොමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්ත සසඞ්ඛාරික චිත්තය
5 උපෙක්ඛා සහගත දිට්ඨිගත සම්පයුත්ත අසඞ්ඛාරික චිත්තය
6 උපෙක්ඛා සහගත දිට්ඨිගත සම්පයුත්ත සසඞ්ඛාරික චිත්තය
7 උපෙක්ඛා සහගත දිට්ඨිගත විප්පයුත්ත අසඞ්ඛාරික චිත්තය
8 උපෙක්ඛා සහගත දිට්ඨිගත විප්පයුත්ත සසඞ්ඛාරික චිත්තය

මෙසේ ලොභමූලික සිත් අටදෙනෙකි.

**සොමනස්ස සහගත** යන මෙහි අර්ථය මෙසේ දතයුතු. **"සුන්දරං මනොති සුමනො"** සිතිදුවූ සිත ඇත යන අර්ථයෙන් **"සුමන"**නම් මෙයින් සිතිදුවූ සිතලැබේ. නිරවද්‍යාර්

යෙන් සුන්දරතාවය මෙහි නොයෙදෙන්නීය. නොහොත් **"සුන්දරං මනො එතස්සාතිවා සුමනො"** මේ පුද්ගලයාහට සිනිඳුවූ සිත ඇත එහෙයින් **"සුමන"**නම්. මෙයින් සිනිඳුවූ සිත ඇති පුද්ගලයා ලැබේ. **"සුමනස්ස භාවො සොමනස්සං"** ඒ සිනිඳුවූ චිත්තයාගේ නොහොත් සිනිඳුවූසිත ඇති පුද්ගලයාගේ ස්වභාවය **"සොමනස්ස"** නම්වේ. මේ වනාහි මානසික සුඛවේදනාවම නාමෙකි. මෙහි **"සුමනස්ස භාවො"** යනු ඒ සිනිඳුවූ චිත්තයෙහි නොහොත් ඒ සිනිඳුවූ සිත ඇති පුද්ගලයා කෙරෙහි සුමන යන නාමයාගේද මෙතෙම සුමනයයි දැනගන්නා බුද්ධියගේද ප්‍රවෘත්ති නිමිත්තය යන අර්ථයි. අභිධානය බුද්ධිය යනමොවුන්ගේ ප්‍රවෘත්ති නිමිත්ත භාවයයි කියනු ලැබේ. කෙසේද? යතහොත් හස්තිනාග තෙම දළනිමිත්තකොටගෙන නසනු ලැබේ යනුයි. ඒ එසේ මැයි. එහි තමාගේ දළනිමිත්තකොටගෙන එයින් යුක්ත හස්ති ද්‍රව්‍යයෙහි හනන ක්‍රියාවගේ පැවැත්ම වේද එපරිද්දෙන් මෙහිද ඒ මානසික වේදනාව නිමිත්තකොටගෙන එයින් යුක්ත සිතෙහි හෝ පුද්ගලයා කෙරෙහි හෝ නාමබුද්ධිහු පවතිත්යයි දතයුතු. **"සොමනස්සෙන සහගතං සංසට්ඨං සොමනස්ස සහගතං"** සිත සුඛවේදනාව හා එකුප්පාද එකනිරොධ එකාරම්මණ එකවත්ථුක යන සතරාකාරයෙන් යුක්තවීම සොමනස්ස සහගත නම්වේ. **"දස්සනං දිට්ඨි"** දැක්ම "දිට්ඨි"නම. ඕතොමෝ වනාහි සම්‍යග් දෘෂ්ටිය, මිථ්‍යාදෘෂ්ටිය යයි ද්විවිධවන්නීය. ඔවුනතුරෙන් මෙහි දිට්ඨි ශබ්දයෙන් මිථ්‍යාදෘෂ්ටිය හෙවත් වැරදි දැක්ම කියන ලදී. කුමක් හෙයින්ද? යතහොත් අකුසලාධිකාරයවූ හෙයිනි. **"දිට්ඨියෙව දිට්ඨිගතං"** ඒ මිථ්‍යා දර්ශනයම දිට්ඨිගත නමි. "ගූථගතං මුත්තගතං" යනාදි උදාහරණයන්හි මෙන් "ගත" ශබ්දය තද්භාවාර්ථයෙහි වැටේ **"දිට්ඨිගතෙන සමංපකාරෙහි යුත්තන්ති දිට්ඨිගත සම්පයුත්තං"** මෙහි සිත වැරදි දැක්ම හා ඉදිරිපසු නොවී සමව එකුප්පාදාදි සතරාකාරයෙන් යුක්තවීම දිට්ඨිගත සම්පයුත්ත නම්වේ. සහගත සම්පයුත්ත යන වචනවලින් යුක්තවීමය යන අර්ථය ලැබේ. මේ ශබ්ද දෙක අර්ථ වශයෙන් සමානබැව් දතයුතු.

**"සඞ්ඛරෙති චිත්තං තික්ඛභාව සඞ්ඛාත මණ්ඩන විසෙසෙන සජ්ජෙතීති සඞ්ඛාරො"** යනු වචනාර්ථයි. යම් පූර්වප්‍රයෝගයක් පසුව හටගන්නාවූ චිත්තය තියුණු බවයයි කියනලද සැරසීම් විශේෂයෙන් පිළියෙල (සකස්) කෙරේද එසේ හෙයින් ඒ පූර්

ප්‍රයොගය සඞ්ඛාර නම්වේ. "සඞ්ඛාර" යනු ඒ ඒ කටයුත්තෙහි පසුබස්නාවූ චිත්තයට රුකුල්දීම් වශයෙන් තමාගේ හෝ මේ රමාගේ හෝ පැවති පූර්වප්‍රයොගයයි. හේ පූර්වප්‍රයොගය වනාහි තමාගේ පසුව හටගන්නාවූ චිත්තයා කෙරෙන් පූර්වභාගයෙහි උපන්නාවූ සිත් පරම්පරාවෙහිද අනුක්‍රමයෙන් සිත් පරම්පරායෙහිද උපදී. එහෙයින් හේ පූර්වප්‍රයොගය කාරණකොටගෙන උපන්නාවූ පශ්චිම චිත්තයාගේ තියුණුබවයයි කියනලද සැරසීම් විශෙෂයම මෙහි කාරණූපචාර වශයෙන් සඞ්ඛාරයයි දතයුතුයි. **"සො යස්ස නත්ථි තං අසඞ්ඛාරං, තදෙව අසඞ්ඛාරිකං සඞ්ඛාරෙන සහිතං සසඞ්ඛාරිකං"** යනු නිර්වචනයි. ඒ තියුණු බවයයි කියනලද සැරසීම් විශෙෂය යම් සිතකට නැත්තේද ඒ සිත අසඞ්ඛාර නම්වේ. ඒ සිතම අසඞ්ඛාරික නම්වේ. ස්වභාවයෙන් තියුණුය යන අර්ථයි. ඒ තියුණුබවය කියනලද ආකාර විශෙෂය හා සමග උපන් සිත සසඞ්ඛාරික නම්වේ. මේ කියනලද චිත්තද්වය අතුරෙන් අසඞ්ඛාරික සිත අන්‍ය මෙහෙයීමක් නොමැතිව ස්වසංබලයෙන් උපදනා හෙයින් බලවත්වේ. සසඞ්ඛාරික සිත අන්‍ය මෙහෙයීම් සහිතව උපදනා හෙයින් ඊට වඩා මඳක් දුර්වලවේ. මේ කියනලද්දේ විභාවිනී ටීකාචාරීන්ගේ මතයයි. පරමාර්ථදීපනී ටීකාචාරීන්ගේ මතය මෙසේයි. අසඞ්ඛාරිකමෙකං සසඞ්ඛාරිකමෙකං යනමෙහි අර්ථය මෙසේ දතයුතු සඞ්ඛාරයනම්, පූර්වාභිසංස්කාරයයි. පූර්වභාගයෙහි කටයුතු සම්පාදනය කිරීම පූර්වාභිසංස්කාරයයිදතයුතු. හේවනාහිප්‍රයොගපූර්වාභිසංස්කාරය උපාය පූර්වාභිසංස්කාරයයි ද්විවිධවේ. ඔවුනතුරෙන් ප්‍රයොග පූර්වාභිසංස්කාරය නම් අණකිරීමෙන් හෝ අයැදීමෙන් හෝ තර්ජනයකොට හෝ මෙය කරවයි අන්‍යයන් විසින් කරනලද කායවාග් ප්‍රයොගයයි. උපාය පූර්වාභිසංස්කාරය නම්, ආනිශංස සලකා හෝ නොකරඉඳීම නරකයයි කියා හෝ සිත නැගිටුවීමෙන් කිරීමයි. හේ ප්‍රයොග උපාය යන සංස්කාරද්වය මෙහි සඞ්ඛාරනම්. තමාගේ පියවිනතියෙන් කරන්ට නොකැමැති චිත්තසන්තානය නොකර ඉන්ට නොදී කිරීම පිණිස තෙමේ ඒ ඒ කාර්‍යයෙහි යොදවයි. එහෙයින් ආරම්මණාදි යම් ප්‍රත්‍යසමූහයක් තෙමේ හේ ප්‍රයොග උපාය යන සංස්කාරද්වයෙන් විරහිතද හේ ප්‍රත්‍යසමූහය තෙම අසඞ්ඛාර නම් යම් ප්‍රත්‍යසමූහයක් තෙමේ ඒ සංස්කාර දෙකින් යුක්තවූයේ වේද හේ ප්‍රත්‍ය සමූහය තෙම සසංඛාර නම්. හේ නිශ්‍රය සමනන්තරාදි ප්‍රත්‍යසමූහය යම් කලෙක්හි ඒ ප්‍රයොග උපාය සංස්කාර දෙදෙනාගෙන් වෙන්ව තුබූම සිත සැ

කිලෙන්ට නොදී නැඟිටුවාද එකල්හි අසඞ්ඛාර නම්. යම්
කාලෙක්හි වනාහි ඒ සංස්කාරවයෙන් වෙන්ව තුමූම සිත නැ
ඟිටුවන්ට නොහැක්වේද ප්‍රයොග් උපාය සංස්කාරය සහාය
කොට ලැබම හැකිවේද එකල්හි හේ ප්‍රත්‍යසමූහය සසංඛාර
නම්. මෙසේ අසංඛාර සසංඛාර යනුද මේ ප්‍රත්‍යසමූහයටම
නමෙකි. චිත්තයට නම් නොවේ සිත වනාහි ප්‍රයොග උපාය
සංස්කාරයෙන් වෙන්ව සුධවූ ප්‍රත්‍ය සමූහයෙන් ක්‍ෂණත්‍රයට පැ
මිණියේ අසංඛාරික නම්. ප්‍රයොග උපාය සහිතවූ ප්‍රත්‍යසමූහ
යෙන් ක්‍ෂණත්‍රයට පැමිණියේ සසංඛාරික නම්.

මෙහි **දිට්ඨිගත විප්පයුත්ත** යනු සිත වැරැදි දැක්ම හා එකොත්පං
දෑදී සතරාකාරයෙන් යුක්තනොවීමයි. **"උදාසීනභාවෙනාපෙක්ඛ
තීති උපෙක්ඛා"** මධ්‍යස්ත භාවයෙන් අරමුණු බලානුයි උපෙක්ඛා
නම්වේ. උපෙක්ෂා වේදනාතොමෝ සුඛ සොම්නස් වේදනාවද,
දුක්ඛ දොම්නස් වෙදනාවද, නොවන්නීය. මෙකී වේදනාවයටම
මධ්‍යස්තව පවත්නා වේදනාව උපෙක්ෂා වේදනාවයයි දතයුතුයි.
නොහොත් "සුඛ දුක්ඛානං වා උපෙතායුත්තා අවිරුධා ඉක්ඛා අනු
භවනං උපෙක්ඛා" සැපදුක් උභයවේදනාවන්ට අනුකූලව විඳීම
උපෙක්ඛා නම්වේ. ඒ එසේමැයි. මේ උපෙක්ෂා වෙදනා තොමෝ
ඒ සුඛදුක් වෙදනාවන්ට අවිරුධහෙයින් අනතුරුවද උපදී. සුඛ
දුක්ඛ වෙදනාවෝ වනාහි වෙන වෙනම විරුධසබ්භාව ඇති
හෙයින් ඔවුනොවුන්ට අනතුරුව නූපදිත්. ලෑල්ලක් මතුයෙහි
සක්මන් කරණ පුද්ගලයාට උපෙක්ෂා වේදනාව උපදී. බොරළු
දමනලද බුදිරියක ඔබ්මොබ සක්මන්කරණ පුද්ගලයාට දුක්ඛ
වෙදනාවද පුලුන් බුදිරියක සක්මන්කරණ පුද්ගලයාට සුඛ වෙ
දනාවද උපදියයි දතයුතුයි. මෙකී වෙදනා අතුරෙන් සුඛ වේද
නාව හා දුක්ඛවෙදනාවද ප්‍රකටවේ. ඉතිරි උපෙක්ෂා වෙදනා
තොමෝ අප්‍රකටවන්නීය. නොහොත් **"උපපත්තිතො යුත්තිතො
ඉක්ඛති පස්සතීති උපෙක්ඛා"** සුඛ සොම්නස් දුක්ඛ දොම්නස්
වෙදනාවන්ට අවිරුධාකාරයෙන් අරමුණු දකිනුයි උපෙක්ඛා
නම්වේ. ඒ එසේමැයි. යම්සේ සොම්නස් දොම්නස් වෙදනාවෝ
අරමුණ අධික වශයෙන් දකිත්ද යම්හෙයකින් සොම්නස් වෙද
නාවෙන් යුක්තවූ පුද්ගල තෙමේ ඒ අරමුණෙන් වෙන්වීම නිමි
ත්ත කොටගෙණ විකාරප්‍රාප්තවේද දොම්නස් වෙදනාවෙන්
යුක්තවූ පුද්ගල තෙමේද ඒ අරමුණ හා සංයොගවූ කල්හි විකාර
ප්‍රාප්තවේද එපරිද්දෙන් මේ උපෙක්ෂා වෙදනා තොමෝ විපර්‍යාස

ෂයට නොපැමිණෙන්නිය. මේ වනාහි අවිරුද්ධාකාරයෙන්ම අරමුණ දකී. ආරම්මණය හා යුක්තවීම යුක්ත නොවීම හේතුකොට ගෙණ පුද්ගලයා විකාරයට නොපමුණුවායයි දතයුතුයි.

සොම්නස් උපෙක්ෂා යන වේදනා දෙක අතුරෙන් උපෙක්ෂා වේදනාව බලවත්වේ. කුමක්හෙයින්ද යතහොත් අචඤ්චල ස්වභාව හෙයිනි. අසඞ්ඛාරික සසඞ්ඛාරික චිත්තයන් දෙදෙනා අතුරෙන් අසඞ්ඛාරික චිත්තය බලවත් හෙයින් පළමුකොට දක්වනලදයි දතයුතුයි, ආයුෂ්මත් අනුරුද්ධාචාර්‍යයන් වහන්සේ ඒ ලොභ මූලික චිත්තයෙහි යෙදුනාවූ ස්පර්ශාදි ධර්මයන් නොගෙණ "සොමනස්සසහගතං" යනුවෙන් වේදනාව කරණකොටගෙණ කුමක්හෙයින් වෙසෙසන්නේද? "සොමනස්සාදයො පන-පෙ-තංවසෙන චිත්තස්ස විසෙසො" යනු විභාවිනීටීකාහෙයින් සොම්නස් වේදනාව සමහර චිත්තයක යෙදෙයි. සමහර චිත්තයක නොයෙදෙයි. සොම්නස් දොම්නස් උපෙක්ෂා වේදනායයි ප්‍රභෙද වෙයි. එසේ ප්‍රභෙදවත්වූ වේදනාවෙන්ම චිත්තයාගේ වෙනස දක්වීමමුත් ප්‍රභෙද නැත්තාවූ ස්පර්ශයෙන් චිත්තයාගේ වෙනස දක්වීම නොහැකි හෙයින් වෙයි. මේ "සොමනස්සසහගතං-පෙ-සසඞ්ඛාරිකං" යන පාඨ සමූහය අතුරෙන් "අසඞ්ඛාරික සසඞ්ඛාරික" වූ මෙහි අභිමතාර්ථයවෙයි. එහෙයින් ඒ දෙකහැර කුමක් හෙයින් අනභිමතවූ "සොමනස්සසහගතං" යනාදි වචනය යෙදූවේද? අභිමතාර්ථය නොවන්නේ නමුදු අසංඛාරිකත්වය හා සසංඛාරිකත්වය වනාහි සොමනස්සයාගේ අසංඛාරික සසංඛාරිකත්වය උපෙක්ෂාවගේ අසංඛාරික සසංඛාරිකයයි ප්‍රභෙදවන හෙයින් මේ අසංඛාරික සසංඛාරිකය සොම්නස්වේදෝ හෝ උපෙක්ෂාවේදෝ යනසැකයට කාරණාවන හෙයින් එය වලකණුපිණිස වෙයි. "දිට්ඨිගතසම්පයුත්තං" යනාදි පාඨය කුමක් හෙයින් කීයේද? මේ "දිට්ඨිගත සම්පයුත්තං" යන පාඨය දක්වීම සොමනස්සයාගේ අසංඛාරික සසංඛාරිකතෙමේ දිට්ඨිනුගේ අසංඛාරික සසංඛාරිකය විප්‍රයුක්තයාගේ අසංඛාරික සසංඛාරික වශයෙන් විප්‍රකාරවන්නේය. ඒ විප්‍රකාරයන් අතුරෙන් මෙය දෘෂ්ටියෙන් යුක්තවේදෝයි මෙය දෘෂ්ටියෙන් යුක්ත නොවේදෝයි යන සංසයක් වියයුතු හෙයින් එය වලකණු පිණිස කීයේය. ලොභ මූලික සිත් අට දෙන අතුරෙන් සොම්නස් සහගත දෘෂ්ටිවිප්‍රයුක්ත සසංඛාරික සිතබලවත්වේ. ඊටවඩා සොම්නස් සහගත දෘෂ්ටිවිප්‍රයුක්ත අසංස්කාරික සිත ඉතා බලවත්වේ. ඊට වඩා උපෙක්ෂා සහගත

දෘෂ්ටි විප්‍රයුක්ත සසංස්කාරික සිතද ඊට වඩා උපෙක්ෂා සහගත දෘෂ්ටි විප්‍රයුක්ත අසංස්කාරික සිතද ඊට වඩා සොම්නස් සහගත දෘෂ්ටි සම්ප්‍රයුක්ත සසංස්කාරික සිතද ඊට වඩා සොම්නස් සහගත දෘෂ්ටි සම්ප්‍රයුක්ත අසංස්කාරික සිතද ඊට වඩා උපෙක්ෂා සහගත දෘෂ්ටි සම්ප්‍රයුක්ත සසංස්කාරික සිතද ඊට වඩා උපෙක්ෂා සහගත දෘෂ්ටි සම්ප්‍රයුක්ත අසංස්කාරික සිතදැයි මෙසේ මේ අට වැදෑරුම් ලොභමූල චිත්තයන්ගේ අතිශයින් බලවත්බව දතයුතු.

එහෙයින් කියනලදමැයි;

**“චතුත්ථානන්තියං චිත්තං තතො අට්ඨම සත්තමං**
**දුතියං පඨමං ඡට්ඨං බලවං හොති පඤ්චමං” යි**

ලොභමූල සිත් අටදෙන ලොභ මොහ යන හෙතුද්වයකින් යුක්ත හෙයින් ද්විහෙතුකයි. නිගමන වාක්‍යය දක්වනු කැමති අනුරුද්ධ ආචාර්‍ය්‍යයන් වහන්සේ “ඉමානි අට්ඨපි ලොභසහගත චිත්තානි නාම” යනු කී “ඉමානි අට්ඨපි” යන අවයවාර්ථ නිගමනයෙහි “පි” ශබ්දය කාරණකොටගෙන අනෙකවූ ලොභ මූල සිත් සම්පිණ්ඩනය කෙරේ. ඔව්හු කවරහුදයත්; ප්‍රාණඝාත, පරුෂාවාචා, ව්‍යාපාද යන අකුශලකර්මපථ තිදෙන හැර ඉතිරි සප්තවිධ අකුශලකර්මපථයන් අතුරෙන් එකෙකි අකුශලකර්මයෙහි අට අට බැගින් සපණසෙක් වෙති. ඔව්හු ෂඩ්විධ රූපාදී ආරම්මණයන්ගේ වශයෙන් ගුණකළකල්හි 336 දෙනෙක් වෙති. ඔව්හු ඡන්ද වීර්‍ය්‍ය චිත්තයයි කියනලද ත්‍රිවිධ අධිපතීන්ගේ වශයෙන් ගුණකළකල්හි 1008 දෙනෙක් වෙති. මෙහි වීමංසාධිපතියෙන් අකුසල සම්භවයෙක් නොමැති හෙයින් හේ මෙහි අනභිමතයි. ඔව්හු කාය වාක් මනඃ යන කර්මත්‍රිකයාගේ වශයෙන් ගුණකළකල්හි 3024 දෙනෙක් වෙති. කාල දෙශාදීන්ගේ වශයෙන් ඔවුන්ගේ අනන්ත අප්‍රමාණ භාවය දතයුතු. ඒ අෂ්ටවිධ ලොභමූල චිත්තයන්හි සොම්නස් ඇතිවීමට හෙතු කවරේද? දෘෂ්ටිසම්ප්‍රයුක්ත වීමට හෙතු කවරේද ? අසංඛාරිකයාගේ ඉපදීමට හෙතු කවරේද ? උපෙක්ෂාවගේ ඉපදීමට හෙතු කවරේද ? යන මේ ප්‍රශ්න සතරට පිළිතුරු යථාක්‍රමයෙන් කියනු ලැබේ. ස්වභාව වශයෙන් කැමති අරමුණක්වීමද අනිෂ්ටාලම්බනයෙහිද ඉෂ්ටයයි කල්පනා කිරීම් වශයෙන් ඉෂ්ටාලම්බනයක්වීමද සොමනස් සහගිය සිතින් ප්‍රතිසන්ධි ඇතිබවද, නොගැඹුරු ස්වභාව ඇතිබවද යන මේ ධර්ම තිදෙන සොම්නස් ඉපදීමට හෙතුහු වෙත්. විපරීත දෘෂ්ටි ඇත්තාවූ පුද්ගලයක්හුගේ ආශ්‍රයකිරීමද, ශාස්වත දෘෂ්ටි පිළිබඳ උච්ඡෙද

දෘෂ්ටි පිළිබඳ අදහස් ඇතිබවද යනමේ ධර්මයෝ දෘෂ්ටිසම්ප්‍රයුක්ත වීමට හෙතුහුවෙත්. යොග්‍යවූ ඍතුවක්ද යොග්‍යවූ ආවාසයක්ද යොග්‍යවූභොජනයක්ද යොග්‍යවූ චීවරවස්ත්‍රාදියක්ද යොග්‍යවූමිත්‍ර යන්දයනමේපස අසංඛාරික සිත්ඉපදීමට හෙතුහුවෙත්. යහපත් මැදහත් අරමුණක් ඇතිබවද, උපෙක්‍ෂා සහගත සිතින් ප්‍රතිසන්ධි ඇතිබවද ගැඹුරු සවභාව ඇතිබවද යනමේ ධර්මයෝ තිංදන උපෙක්‍ෂාවගේ ඉපදීමට හෙතුහුවෙත්. මේ ලොභමූල චිත්තයාගේ උත්පත්තික්‍රමය විසුද්ධිමාර්ගයෙහි ඛන්ධනිද්දේශයෙහි ආනයින් දතයුතු. තදනන්තරවැ විහෙතුක සාමාන්‍යයෙන් ද්වෙෂමූල සිත් දෙදෙන දක්වනු පිණිස "දෞමනස්ස සහගතං" යනාදි වචනය කියනලදී.

දෞමනස්ස සහගත පටිඝසම්පයුත්ත අසංඛාරික චිත්තය
දෞමනස්ස සහගත පටිඝසම්පයුත්ත සසංඛාරික චිත්තය
මෙසේ ද්වෙෂමූලික සිත් දෙදෙනෙකි.

**"දුට්ඨුමනො දුමනො, දුට්ඨුමනො එතස්සාතිවා දුමනො, දුමනස්සභාවො දෞමනස්සං"** යනු නිර්වචනයි. නපුරුවූ සිත දුමන නමි. නොහොත් නපුරුවූ සිත මෝහට ඇත්තුයි හෝ "දුමන" නම්වේ. මෙයින් විපරීත සිත හෝ එයින් යුක්ත පුද්ගලයා හෝ ලැබේ.

ඒ විපරීත චිත්තයාගේ හෝ ඒ විපරීත සිතඇති පුද්ගලයාගේ ස්වභාවය දෞමනස්ස නම්. දෞමනස්ස යනු සිත පිළිබඳවූ දුක්ඛවෙදනාවට නමෙකි. ඒ දෞර්මනස් වෙදනා තොමෝ තමා හා මිශ්‍රවූ චිත්තයෙහිද ඒ චිත්තයෙන් සමන්විත පුද්ගලයා කෙරෙහිද දුමන ශබ්ද ප්‍රවෘත්තියගේද ඒ දුමනයයි දැනගන්නාබුද්ධියගේද ප්‍රවෘත්ති නිමිත්ත වන්නේයයි දතයුතු. "දෞමනස්සෙන සමං පකාරෙන යුත්තන්ති දෞමනස්ස සහගතං" ඒ දුක්ඛවෙදනාව හා ඉදිරිපසු නොවී සමවූ එකොත්පාදාදි සතරාකාරයෙන් යුක්තවීම දෞමනස්ස සහගත නම්වේ. "පටිහඤ්ඤතීති පටිඝො" යම් ද්වෙෂයෙක් අරමුණෙහි හැපේද හේ ප්‍රතිඝනම් වේ. මෙයින් ද්වෙෂය ලැබේ. හේ වනාහි උපදිනු ලබනුයේ සම්ප්‍රයුක්ත ධර්ම සංඛ්‍යාත චිත්ත චෛතසික ධර්මයන්ද සඞ්ක්ෂීණයවෙයි රූක්ෂවූවත් තාපනවූවත් කෙරේ. තමාගේ නිශ්‍රය වස්තුවදගටයි. හෘදය ප්‍රදෙශය දවන්නේයි. ඒ දෞර්මනස් වෙදනාවෙන් යුක්ත පුද්ගලයා දුර්මුඛ කෙරේ. තමාගේ ආරම්මණයද ගටන්නේය. ඒ අරමුණ පෙළමින් ගන්නේයි. එහෙයින් ප්‍රතිඝයයි කියනු ලැබේ.

"පටිඝේන සම්පයුත්තං පටිඝසම්පයුත්තං" අරමුණෙහි හැපීපවත්නාවූ ද්වේෂය හා එකොත්පාදාදි සතරාකාරයෙන් යුක්තවූ සිත ප්‍රතිඝසම්ප්‍රයුක්ත නම්වේ. අසංස්කාරික සසංස්කාරිකවශයෙනි අර්ථය පෙරසේමැයි. සොමනස්ස සහගතං අසංඛාරිකමෙකං සසංඛාරිකමෙකංයි කියයුතු තන්හි එසේ නොකියා කුමක් හෙයින් දොමනස්ස සහගතං අසංඛාරිකමෙකං සසංඛාරිකමෙකංයි කියනලද්දේද? මේ ද්වේෂමූල චිත්තය කිසිකලෙක්හි සොම්නස් උපෙක්ෂායන අන්‍ය වේදනාවක් සමග යෙදෙනබව වැළැක්ම පිණිස පළමුකොට දොමනස්ස ශබ්දය කියනලදී. දොමනස්ස සහගතං දිට්ඨිගත සම්පයුත්තං අසංඛාරිකමෙකං සසංඛාරිකමෙකංයි කියයුතු තන්හි එසේ නොකියා කුමක්හෙයින් පටිඝසම්පයුත්තංයි කියනලද්දේද? දොම්නස ප්‍රතිඝයෙන් වෙන්ව නොයෙදෙන හෙයින් දොමනස්ස සහගතං පටිඝසම්පයුත්තං යී කියනලදී. මිප්‍රකාරවූ දොම්නස් ප්‍රතිඝයන් අතුරෙහි දොම්නස නොකැමැති අරමුණු අනුභවකිරීම ලක්ෂණකොට ඇත්තාවූ වේදනාස්කන්ධයට ඇතුළත්වූ එක්තරා ධර්මයකි. ප්‍රතිඝය සැඩ ස්වභාව ඇත්තාවූ සංස්කාරස්කන්ධයට ඇතුළත්වූ එක්තරා ධර්මය කැයි මෙසේ මේධර්මදෙදෙනාගේ වෙනස දතයුතු. මේ දොම්නස් ප්‍රතිඝ දෙදෙනාගේ ඉපදීමට හේතු කවරේද? තමන්ට නොකැමැති අරමුණක් සහ නව ආඝාත වස්තූන් අතුරෙන් යම් වස්තුවක් හා ගැටීමය යන කාරණාවයෙන් මේ චිත්තය උපදී. "ඉමානි ද්වෙපි පටිඝසම්පයුත්තචිත්තානි නාම" යනු නිගමන වාක්‍යයයි.

ඉමානි ද්වෙපි යන මේ අවයවාර්ථ නිගමනයෙහි "පි" ශබ්දය කාරණකොටගෙන අනේකවූ ද්වේෂමූල සිත් පිඬුකෙරේ. ඔව්හු කවරහුද? යත් ද්විවිධ ද්වේෂමූල චිත්තයන් අතුරෙන් එකෙකි. චිත්තයෙක කාමමිථ්‍යාචාරය, අභිධ්‍යාය, මිථ්‍යාදෘෂ්ටිය යන අකුශලකර්ම තිදෙන හැර ඉතිරි අකුශලකර්මපථ සත්දෙන පවත්නා හෙයින් තුදුස්දෙනෙක් වෙති. ඔව්හු ෂඩ්විධ රූපාදි ආරම්මණයන්ගේ වශයෙන් ගුණකල කල්හි 84 දෙනෙක් වෙති. ඔව්හු ඡන්ද, චිත්ත, විරිය, යන ත්‍රිවිධ අධිපතීන්ගේ වශයෙන් ගුණකල කල්හි 252 දෙනෙක් වෙති. ඔව්හු කාය, වාක්, මනඃ යන කර්මත්‍රිකයාගේ වශයෙන් ගුණකල කල්හි 756 දෙනෙක් වෙති කාලදේශ සන්තානයන්ගේද ජනපද චක්‍රවාළයන්ගේද වශයෙන් අනේක චිත්තයෝ වෙත්. තදනන්තරවූ ද්විවිධ මෝහමූල චිත්තයන් දක්වනු පිණිස උපෙක්ඛා සහගතං යනාදි වචනය කියනලදී.

1 උපෙක්ඛා සහගත විචිකිච්ඡා සම්පයුත්ත චිත්තය
2 උපෙක්ඛා සහගත උද්ධච්ච සම්පයුත්ත චිත්තය
මෙසේ මෝහමූලික චිත්තයෝ දෙදෙනෙක් වෙති.

**"කිච්ඡති කිලමති එතායාති විකිච්ඡා, විචිනන්තස්ස විකිච්ඡා විචිකිච්ඡා, විගතා චිකිච්ඡා එතායාතිවා විචිකිච්ඡා, විචිකිච්ඡාය සම්පයුත්තං විචිකිච්ඡා සම්පයුත්තං"** යනු නිර්වචනයි. මේ සැකය කරණකොටගෙන වෙහෙසට පැමිණේයි කලාන්ත වෙයි එහෙයින් විචිකිච්ඡා නම්වේ. ධර්ම ස්වභාව සොයන්නහුගේ වෙහෙසීමට කාරණාවූ සැකය විචිකිච්ඡා නම්වේ. නොහොත් මේ සැකය කාරණකොටගෙන ඥාන නමැති පිළියමින් පහවූයේනුයි විචිකිච්ඡා නම්වේ

මෙහි බුදුන්, දහම්, සඟුන්, ත්‍රිශික්ෂා ශාසනය හවයෙන් භවයට සැරිසරා ආපූර්ව කෙළවර, භවයෙන් භවයට සැරිසරා යන්නාවූ අවර කෙළවර, පූර්වාපර දෙකෙළවර, අතීත හෙතුවෙන් ප්‍රත්‍යුත්පන්න ඵලය ප්‍රත්‍යුත්පන්න හෙතුවෙන් අනාගත ඵලය යනාදි ක්‍රමයෙන් පවත්නාවූ සංසාර ප්‍රවෘත්ති සඞ්ඛ්‍යාත ප්‍රතීත්‍ය සමුත්පාදය යන අට තැන කරන සැකයෙන් යුක්තවූසිත විචිකිච්ඡා සම්පයුත්ත නම්වේ. "උද්ධංධුනාති කම්පතීති උද්ධතං, උද්ධතස්ස භාවො උද්ධච්චං, උද්ධච්චෙන සම්පයුත්තං උද්ධච්ච සම්පයුත්තං" යනු නිර්වචනයි. යම් ස්වභාවයෙක් මත්තෙහි කම්පාවේද ඒ ස්වභාව උද්ධත නම්වේ. ඇවිස්සුනාවූ සිත හෝ එයින් යුක්ත පුද්ගලයා හෝ ලැබේ. ඒ ඇවිස්සුනාවූ චිත්තයාගේ ස්වභාවය උද්ධච්චයයි. එක අරමුණෙක නොපැවතී පැතිරෙන ගතිය දඟලන ගතියයි ඖද්ධත්‍යයෙන් හෙවත් නොසන්සුන් ගතියෙන් යුක්තවූ සිත උද්ධච්ච සම්පයුත්ත නම්වේ. මෝහමූලික චිත්තයෝ දෙදෙන මූලාන්තරයකින් හෙවත් මෝහමූලයෙන් අන්‍යවූ ලෝභ ද්වෙෂ මූලයන් නැති හෙයින් අතිශයින් අරමුණෙහි මුළාබවද වෙයි. විචිකිච්ඡා ඖද්ධත්‍යයන් හා නිරන්තරයෙන් යුක්ත බැවින් අරමුණෙහි සැලීමද වෙයි. එහෙයින් උපෙක්ෂා සහගතම වෙයි. ඒ මෝහමූලික චිත්තයාගේ කිසිකලෙකත් ස්වභාවයෙන් තියුණු බවක් නැත්තේය. අරමුණෙහි බැසගන්ට අසමර්ථ බැවින් නිශ්චය නොකළැකි වශයෙන්ද අරමුණෙහි වික්ෂිප්තවීම් වශයෙන්ද හටගන්නාවූ චිත්තයන් දෙදෙනාගේ එබඳු කෘත්‍යයෙහි ස්වභාවයෙන් තියුණු බවක් හෝ උත්සාහ කටයුතු බවක් හෝ

ශක්සේ වියයුත්තේදැයත්? නොවන්නේමැයි. එහෙයින් ඒ දෙසි
තෙහි සංස්කාර භේදයක් නැත්තේය. කුමක් හෙයින් වනාහි
මේ එකම අකුසල චිත්තය ඒ ඖද්ධත්‍යයෙන් වෙනස්කොට
"උද්ධච්ච සහගතං"යි දේශනාකළේදැයත්? වෙසෙසින් බලවත්
හෙයිනි. යම් හෙයකින් මේ ඖද්ධත්‍යය ඒ අවසාන අකුසල
සිතෙහි බලවත් වේද එහෙයින් එක්ව යෙදුනාවූ ධර්මයන් අතු
රෙහි ප්‍රධානව භවතිනුයි. මේ අවසාන අකුසල චිත්තයම ඒ
ඖද්ධත්‍යයෙන් වෙසෙසිය යුතුයි. එහෙයින් දම්සඟුණු පෙළෙහි
ඖද්ධත්‍ය සම්ප්‍රයුක්ත චිත්තයෙන් අන්‍යවූ අකුසල චිත්තයෙහි
ඖද්ධත්‍යය යෙවාපනක වශයෙන් හෙවත් "ලොභො හොති
දොසො හොති" යනාදි ක්‍රමයෙන් ලොභ ද්වේෂාදීන් මෙන් ස්වරූප
උද්ධරණය නොකොට "යෙවාපනකෙසුපි අත්ථි පටිච්ච සමුප්පන්
නා අරූපිනො ධම්මා" යනුවෙන් දේශනාකළේය. මේ අව
සාන අකුසල චිත්තයෙහි වනාහි "උද්ධච්චං හොති" යනුවෙන්
ස්වකීය ශබ්ද ස්වරූපයෙන්ම දක්වන ලද්දේයි. මෙසේ අසාධා
රණ ධර්ම ප්‍රධාන ධර්ම වශයෙන් මොහමූලික සිත විචිකිච්ඡාසම්ප්‍ර
යුක්තය උද්ධච්ච සම්ප්‍රයුක්තයයි දෙවදෑරුම් කොට කියන ලදැයි
දතයුතුයි.

"ඉමානි ද්වෙපි මොමූහ චිත්තානීනාම"යනු චූළනිගමනවාක්‍ය
යයි. ලොභ දොස මූලයෙන් වෙනස්ව මොහයෙන් මූලාවන
හෙයින් මොමූහ නම්වේ "ද්වෙපි" යන මෙහි 'පි' ශබ්දය අවුත්ත
සම්පිණ්ඩනාර්ථයි. මොහමූලිකදෙසිත දසඅකුසලයෙන් ගුණකල
කල්හි සමවිස්සෙක්වෙති. ඔව්හු රූපාදිසවැදෑරුම් ආලම්බනයන්
ගේ වශයෙන් ගුණකලකල්හි එක්සියවිස්සෙක්වෙති. ඔව්හු ඡන්ද,
චිත්ත, විරිය යන ත්‍රිවිධ අධිපතීන්ගේ වශයෙන් ගුණකලකල්හි
360දෙනෙක්වෙත්. ඔව්හු කාය, වාග්, මනඃයන කර්මත්‍රිකයාගේ වශ
යෙන් ගුණකලකල්හි 1080 සිත්වෙති. කාලදෙශාදී වශයෙන් අප්‍ර
මාණයි. මෙසේ චූලනිගමනය දක්වා මහානිගමනය දක්වනු කැ
මති අනුරුධාචාර්යයන්වහන්සේ "ඉච්චෙවං සබ්බථාපි වා දස
අකුසල චිත්තානි සමත්තානි" යනු කී. මෙසේ යථොක්ත ප්‍රකා
රයෙන් සොමනස්ස උපෙක්ඛා දිට්ඨිසම්පයොගාදි සර්වප්‍රකාර
යෙන් දොළොස් අකුසල චිත්තයෝ සමාප්තයහ. යනු එහි
භාවයි. මිත්‍රයහට ප්‍රතිපක්ෂවූ අමිත්‍රයා මෙන්ද ලොභයට ප්‍රති
පක්ෂවූ අලොභය මෙන්ද යම් ධර්මසමූහයක් තෙමේ කුසලයට
ඉඳුරා විරුද්ධවීද ඒ ධර්ම සමූහය අකුසල නම්වෙයි. ඔහුගේ ඉඳුරා

විරුද්ධ බවද සාවද්‍ය අනිෂ්ට විපාක භාවයෙන් හා ඒ කුසලය විසින් ප්‍රහාතව්‍ය භාවය ඇති හෙයින්ද දතයුත්තේය. කුසලය විනාශකරණ හෙයිනැයි නොදත යුතුයි. ඒ එසේමැයි. අකුසලයෙන් කුසලය ප්‍රහාණය නොකරණු ලැබෙයි. මහා බල ඇති හෙයින් කුසලයම ඒ අකුසලය ප්‍රහාණය කෙරෙයි. ඒ එසේමැයි. කුසලය තෙමේ මහා බල ඇත්තේය. අකුසලය තෙමේ දුර්වල වෙයි. එහෙයින් වදාළහ. "අබලානං බලීයන්ති මද්දනෙතත පරිස්සයා"යි එසේ හෙයින් කුසලයම යථොක්ත ක්‍රමයෙන් අකුසලයාගේ ප්‍රහායක ධර්මයක් වෙයි. අකුසලය තෙම කුසලයාගේ ප්‍රහායක ධර්මයක් නොවේයයි දතයුතු මන්‍දප්‍රාඥයන් සඳහා දොළොස් අකුසල චිත්තයන්ගේ විස්තර කථාව දක්වා සංක්ෂෙප රුචිකවූ තීක්ෂ්ණප්‍රාඥයන් සඳහා ඒ දොළොස් චිත්තය හකුළුවා දැක්වීම පිණිස

"අට්ඨධා ලොභමූලානි, දොසමූලානිච ද්විධා
මොහමූලානිච ද්වෙති, ද්වාදසාකුසලා සියුං"

යන මේ සංග්‍රහ ගාථාව දක්වන ලද්දී. මීට අනුගීති ගාථාවයයිද උද්දාන ගාථාවයයිද කියනු ලැබේ. **"ලොභොමූලං එතෙසන්ති ලොභමූලානි, දොසොමූලං එතෙසන්ති දොසමූලානි, මොහොයෙවමූලං එතෙසන්ති මොහමූලානි"** යනුවෙන් ලොභය මුල් කොට ඇති චිත්තය ලොභමූලිකයයිද ද්වේෂය මුල්කොට ඇති චිත්තය ද්වේෂමූලිකයයිද මොහයම මුල්කොට ඇති චිත්තය මොහමූලිකයයිද කියනු ලැබේ. තදනන්තරවැ අකුසල විපාක චිත්තය දක්වන ලදී.

1 උපෙක්ෂා සහගත චක්ෂුර්විඥානය
2 උපෙක්ෂා සහගත ශ්‍රොත්‍රවිඥානය
3 උපෙක්ෂා සහගත ඝ්‍රාණ විඥානය
4 උපෙක්ෂා සහගත ජිහ්වාවිඥානය
5 දුක්ඛ සහගත කාය විඥානය
6 උපෙක්ඛා සහගත සම්පටිච්ඡන චිත්තය
7 උපෙක්ඛා සහගත සන්තීරණ චිත්තය

යන මේ සත්දෙන අකුසල විපාක චිත්තයෝ නම්වෙති. එහි වචනාර්ථය මෙසේයි. **"චක්ඛති විඤ්ඤාණාධිට්ඨිතං හුත්වා සමවිසමං ආචික්ඛන්තං විය හොතීති චක්ඛු"** යනු නිර්වචන හෙයින් යම් රූපයක් විඥානයට ආධාරයවී සමවිසම අරමුණු

කියන්නාක්මෙන්වේද එහෙයින් හේ රූපය "චක්ඛු" නම්වේ. මෙයින් චක්ෂුඃප්‍රසාදය ලැබේ. චක්ෂුව වනාහි ශ්වේත මණ්ඩලය, කාලමණ්ඩලය, දෘෂ්ටිමණ්ඩලය කියා තෙවැදෑරුම්. එයින් ශ්වේත මණ්ඩලය නම් සුදු ඉංගිරියාවයි. කාලමණ්ඩලය නම්, කළු ඉංගිරියාවයි. දෘෂ්ටිමණ්ඩලය නම්, ප්‍රසාදය පැතිර පවත්නා ස්ථානයයි. හේ දෘෂ්ටිමණ්ඩලයෙහි ප්‍රසාද රූපය ඇත පෙර භවයෙහි රූපාසාවෙන් ජනිත කුසල කර්මයෙන් චක්ෂුඃප්‍රසාදයෙහි ඔප මට්ටමන් ගතියවිය. හේවනාහි දර්ශනයකරණ විඥානයට ආධාරවේ. "ආරම්මණං විජානාතීති විඤ්ඤාණං" යනු නිර්වචනයි. නීල පීතාදී අරමුණු විශිෂ්ටාකාරයෙන් දනිනුයි විඤ්ඤාණ නම්. මෙහි "චක්ඛු" ශබ්දය රූපවාචක බවත් "විඤ්ඤාණ" ශබ්දය චිත්තවාචක බවත් දතයුතු. "චක්ඛුස්මිං නිස්සිතං විඤ්ඤාණං චක්ඛුවිඤ්ඤාණං" යම් සේ පලොල්රුක අධිගෘහිත දෙවතාවාට පලාස දෙවතායයිද නුගරුක අධිගෘහිත දෙවතාවාට නිග්‍රොධ දෙවතායයිද කියනු ලැබේද එපරිද්දෙන්ම චක්ෂුඃප්‍රසාදය ආධාරකොට පවත්නා විඥානය "චක්ඛු විඤ්ඤාණ" නම්. මෙහි චක්ෂුඃප්‍රසාදය නිශ්‍රයවේ විඥානය නිශ්‍රිතවේ. චක්ෂුර්විඥානය ඉපදීමට හෙතු කවරහයත්; චක්ෂුඃප්‍රසාදයාගේ අසම්භේද සංඛ්‍යාතවූ නොපිරිහීමය. රූපයන්ගේ හමුබවට පැමිණීමය, ආලොකයෙන් නිශ්‍රය ප්‍රත්‍යය ලැබීමය, මනස්කාර හෙතුය යන මේ ප්‍රත්‍ය සතරක් එක්වීමෙන් සම්ප්‍රයුක්ත ධර්ම සහිතවූ ඒ චක්ෂුර්විඥානය උපදී. එහෙයින් කීහ. අභිධර්මාවතාරයෙහි;

**1 අසම්භෙදෙන චක්ඛුස්ස රූපාපාථ ගමෙනච**
**ආලොකනිස්සයෙනාපි සමනක්කාර හෙතුනා**

**2 පච්චයෙහි පනෙතෙහි සමෙතෙහි චතූහිපි**
**ජායතෙ චක්ඛු විඤ්ඤාණං සම්පයුත්තෙහි තංසහ**

මේගාථා වාචොද්ගතකොට යටකීලෙස අර්ථාවබොධයට උත්සාහ කරනු. ඔවුනතුරෙන් චක්ෂුඃප්‍රසාදය තෙම චක්ෂුර්විඥානයට නිශ්‍රය ප්‍රත්‍යය, පුරෙජාත ප්‍රත්‍යය, ඉන්ද්‍රිය ප්‍රත්‍යය, විප්‍රයුක්ත ප්‍රත්‍යය, අස්තිප්‍රත්‍යය, අවිගතප්‍රත්‍යය යන සයාකාරයකින් ප්‍රත්‍යවෙයි. රූපාරම්මණය චක්ෂුර්විඥානයට ආරම්මණ ප්‍රත්‍යය, පුරෙජාත ප්‍රත්‍යය, අස්තිප්‍රත්‍යය, අවිගතප්‍රත්‍යය යනසතරාකාරයකින් ප්‍රත්‍යයවේ. ආලොකය චක්ෂුර්විඥානයට උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙයි. මනසිකාරය චක්ෂුර්විඥානයට අනන්තර ප්‍රත්‍යය, සමනන්තර ප්‍රත්‍යය, අනන්තරූපනිශ්‍රය ප්‍රත්‍යය, නත්ථිප්‍රත්‍යය, විගත

ප්‍රත්‍යය යන පස් ආකාරයකින් ප්‍රත්‍යය වේ. චක්ෂුර්විඥානය හා සම්ප්‍රයුක්තවූ වේදනා සංඥා සංස්කාරයෝ චක්ෂුර්විඥානයට සහජාත ප්‍රත්‍යය සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති.

චක්ෂුර්විඥානය වනාහි චක්ෂුඃප්‍රසාදය ඇසුරුකොටගෙන රූපාලම්බනය දැනගැනීම ලක්ෂණකොට ඇත්තේය. රූපායතන මාත්‍රයක්ම අරමුණුකිරීම කෘත්‍යකොට ඇත්තේය රූපාලම්බනයෙහිම අභිමුඛවීම වැටහීම්කොට ඇත්තේය. රූපය අරමුණුකොට ඇති ක්‍රියාමනොධාතු ආවර්ජන චිත්තයාගේ පහවීම් ආසන්න කාරණාකොට ඇත්තේය. **"සද්දං සුණාති විඤ්ඤාණාධිට්ඨිතං හුත්වාති සොතං"** යනු නිර්වචන හෙයින් යම් රූපයක් විඥානයට ආධාරවූ හෙයින් ශබ්දය අසාද එහෙයින් ඒ රූපය ශ්‍රොත නම්වේ. මෙයින් ශ්‍රොතප්‍රශාදය ලැබේ. කර්මජ පෘථිවි ආපොදෙදෙනාගේ ඔපගතිය ප්‍රශාදයයි. පෙරභවයෙහි ශබ්දතෘෂ්ණාවෙන් ජනිත කුශලකර්මයෙන් ශ්‍රොතප්‍රශාදයෙහි ඔප මට්ටන් ගතියවිය. **"සොතසම්භිස්සිතං විඤ්ඤාණං සොතවිඤ්ඤාණං"** ශ්‍රොතප්‍රශාදය ආධාරකොට පවත්නා විඥානය 'සොතවිඤ්ඤාණ' නම. නොපිරිහුනු ශ්‍රොතප්‍රශාදය ශබ්දාලම්බණය, කන්සිදුරය, මනසිකාරය යනමේ හේතූන් සතරදෙනඑක්වූකල්හි ශ්‍රොත්‍රවිඥානය උපදී. ඒ ශ්‍රොත්‍රවිඥානය වනාහි ශ්‍රොත්‍රප්‍රශාදය ඇසුරුකොටගෙණ ශබ්දාලම්බණය දැනගැණීම ලක්ෂණකොට ඇත්තේය. ශබ්දාලම්බණ මාත්‍රයක්ම අරමුණුකිරීම කෘත්‍යකොට ඇත්තේය. ශබ්දාලම්බණයෙහිම අභිමුඛවීම වැටහීම්කොටඇත්තේය. ශබ්දාලම්බණය අරමුණුකොට ඇති ක්‍රියාමනොධාතුසංඛ්‍යාත පඤ්චද්වාරාවර්ජන චිත්තයාගේපහවීම ආසන්න කාරණාකොට ඇත්තේය. **"ඝායති ගන්ධොපාදානං කරොතීති ඝාණං"** යනු නිර්වචන හෙයින් යම් ප්‍රසාදරූපයක් ගන්ධාරම්මණය දැඩිකොට ගැණීම කෙරේද? එසේහෙයින් ඒ ප්‍රසාදරූපය ඝ්‍රාණ නම්වෙ. මෙයින් ඝ්‍රාණප්‍රසාදය ලැබේ. "ඝාණසම්භිස්සිතං විඤ්ඤාණං ඝාණ විඤ්ඤාණං" ඝ්‍රාණප්‍රශාදය ආධාරකොටගෙණ පවත්නා විඥානය ඝ්‍රාණවිඥානයයි. මේ වනාහි ඝ්‍රාණප්‍රශාදය ඇසුරුකොටගෙණ ගන්ධාරම්මණය දැනගැණීම ලක්ෂණකොට ඇත්තේය. ගන්ධාලම්බණ මාත්‍රයම අරමුණුකිරීම කෘත්‍යකොට ඇත්තේය. ගන්ධාලම්බණයෙහිම අභිමුඛවීම වැටහීම්කොට ඇත්තේය. ගන්ධාලම්බණය අරමුණුකොට ඇති ක්‍රියාමනොධාතු සංඛ්‍යාත ආවර්ජන චිත්තයාගේ පහවීම ආසන්න කාරණාකොට ඇත්තේය. නොපිරිහුණුඝ්‍රාණප්‍රසාදය, ගන්ධාලම්බණය, ගන්ධය

එලවන්නාවූ වාතය, මනසිකාරය යන හේතූන් සතරදෙනාගේ එක්වීමෙන් ඝ්‍රාණවිඥානය උපදීයයි දතයුතුයි. **"ජීවිතං අවහායතීති ජිව්හා"** යනු නිර්වචනහෙයින් යම් ප්‍රසාද ජාත්‍යක් ජීවිතෙන්ද්‍රිය පැවැත්මට නිමිත්තවූ රසය ගනීද එසේහෙයින් ඒ ප්‍රසාදය ජිව්හා නම්වේ. මෙයින් ජිව්හා ප්‍රසාදය ලැබේ. ජිව්හාප්‍රසාදය ආධාරකොටගෙණ පවත්නා විඥානය "ජිව්හා විඥාන" නම්වේ. මෙය ජිව්හා ප්‍රසාදය ඇසුරුකොට ගෙන රසාලම්බනය දැනගැනීම ලක්ෂණකොට ඇත්තේය. රසාලම්බණ මාත්‍රයම අරමුණු කිරීම කෘත්‍යකොට ඇත්තේය. රසාලම්බණයෙහිම අභිමුඛවීම වැටහීම්කොට ඇත්තේය රසාලම්බණය අරමුණුකොට ඇති ක්‍රියා මනොධාතු සඞ්ඛ්‍යාත ආවජ්ජන චිත්තයාගේ පහවීම ආසන්න කාරණාකොට ඇත්තේය. නොපිරිහුණු ජිව්හා ප්‍රසාදය, රසාලම්බණය, මුඛගතවූ ආහාරය තෙමන්නාවූ ආපොධාතු සඞ්ඛ්‍යාත කෙළය, මනසිකාරය යන මේ හේතූන් සතරදෙනාගේ එක්වීමෙන් ජිව්හා විඥානය උපදීයයි දතයුතුයි.

**"කුච්ඡිතං කායිකසුඛං ඛණතීති දුක්ඛං"** යනු නිර්වචනහෙයින් ලාමකවූ කයෙහි හටගත් සැප නැති කෙරේනුයි "දුක්ඛ"නම්වේ. මෙයින් දුක්ඛවෙදනාව ලැබේ. ඒ දුක්ඛවෙදනාවෙන් යුක්තවූ සිත "දුක්ඛ සහගත" නම්වේ. **"ආසවන්ති පවත්තන්ති එත්ථාති ආයො"** මේ ප්‍රසාද රූපයෙහි ලාමකවූ දොළොස් අකුසලචිත්තයෝ පවතින්නුයි ආය නම්වේ. **"කුච්ඡිතානං ආයොති කායො"** නිඳිතවූ දොළොස් අකුසල චිත්තයන්ගේ පැවැත්මට ස්ථානය "කාය"නම්වේ. මෙයින් කායප්‍රසාදය ලැබේ. ඒ කාය ප්‍රසාදය ආධාරකොටගෙණ පවත්නා විඥානය "කායවිඥාන" නම්වේ. මේ වනාහි කායප්‍රසාදය ඇසුරුකොට ගෙන ස්පර්ශාලම්බණය දැනගැණීම ලක්ෂණකොට ඇත්තේය. ඵොට්ඨබ්බායතන මාත්‍රයක්ම අරමුණුකිරීම කෘත්‍යකොට ඇත්තේය. ඵොට්ඨබ්බාරම්මණයෙහිම අභිමුඛවීම ඥානයට වැටහීම්කොට ඇත්තේය. ස්පර්ශාලම්බණය අරමුණුකොට ඇති ක්‍රියාමනොධාතු ආවජ්ජන චිත්තයාගේ පහවීම ආසන්නකාරණාකොට ඇත්තේය. කාය ප්‍රසාදය, ස්පර්ශාලම්බණය, කායප්‍රසාදයට නිශ්‍රයවූ පෘථිවි ධාතුය, මනසිකාරය, යන මේ හේතූන්ගේ එක්වීමෙන් කායවිඥානය උපදීයයි දතයුතු. **"පඤ්චවිඤ්ඤාණ ගහිතං රූපාදි ආරම්මණං සම්පටිච්ඡති තදාකාරප්පවත්තියාති සම්පටිච්ඡනං"** පඤ්චවිඥානයෙන් ගන්නාලද රූපාදි අරමුණු පිළිගනී

නුයි හෙවත් පිළිගන්නා ආකාරයෙන් පවතීනුයි. සම්පටිච්ඡන
නම්වේ. **"සමමාතීරෙති යථා සමපටිච්ඡිතං රූපාදි ආරම්මණං
වීමංසතීති සනතීරණං"** සම්පටිච්ඡන සිතින් ගන්නාලද රූපාදි
අරමුණු තීරණය කෙරේනුයි සන්තීරණනම්වේ. මෙහිරූපාදි අර
මුණු පිළිගන්නා ආකාරයෙන් පවත්නා සිත සම්පටිච්ඡන චිත්ත
යයිද ඒපිළිගන්නාලද අරමුණු විමසන්නාවූ ආකාරයෙන් පවත්
නා සිත සන්තීරණ චිත්තයයිද කියනුලැබේ.

කවර අර්ථයකින් විපාකනම් වෙයිදයත්? විශෙෂයෙන්
මුහුකල **අර්ථයෙන්** විපාක නම්වෙයි. විශෙෂයෙන් පැසීම හෙ
වත් මේරීම කුමක්දයත්? යම්සේ ලොකයෙහි අඹ දඹ ආදී
ඵලයන්ගේ තරුණබව හෙවත් ළපටිබව ඉක්මවා මුහුකල
බවට පැමිණීම පැසීමයයි ලෝවැස්සන් විසින් කියනු ලැබේද
එසේම මේ කුශලාකුශලයන්ගේ පැසීම දතයුතුයි. මේ අර්ථයද
සතර සමඞ්ගිතාවෙන් දත්විය යුතුයි. චෙතනා සමඞ්ගිතා, කම්ම
සමඞ්ගිතා, උපට්ඨාන සමඞ්ගිතා, විපාක සමඞ්ගිතා යන මොහු
සතර සමඞ්ගිතා නම්වෙත්. ඔවුන් අතුරෙන් පෙර ඒ ඒ කර්මයන්
රැස්කරණ කාලයෙහි කුසලාකුසල චෙතනා පිළිබඳ උත්පා
දස්ථිති භඞ්ග යන ක්ෂණත්‍රයාගේ යම් සමඞ්ගිතාවයක් (මොනවට
එකඟකරණලද සමගි බවක්) ඇතිවීද මේ චෙතනා සමඞ්ගිතා
නම්වේ. ඒ චෙතනා නොමේ නිරුද්ධවනුයේ සියලු ලෙසින්
අභාවප්‍රාප්තව(නැතිවීමට පැමිණ) නිරුද්ධ නොවෙයි. මතුවිපාක
ඉපදීමට තමාගේ සියලු ආකාරයෙන් පරිපූර්ණවූ ක්‍රියා විශෙ
ෂය ඒ චිත්තසන්තානයෙහි නිදන්කොට තබාම නිරුද්ධවෙයි.
ඒ ක්‍රියා විශෙෂයද යම් පමණ කලක් විපාක දීමට අවකාශ
නොලබාද ඒතාක්කල් කල්පලක්ෂයක් මුළුල්ලෙහිද ඒචිත්ත
සන්තානයට අනුගතවූයේම වෙයි. යම් ක්‍රියා විශෙෂයක් සඳහා
ධම්මපදයෙහි

"නහි පාපං කතං කම්මං සජ්ජුඛීරංව මුච්චති
ඩහන්තං බාලමන්වෙති භස්මාච්ඡන්නොව පාවකො"

යන මේ ගාථාව වදාළේද ඒ ගාථාව මේ අර්ථය සඳහා වදාරණ
ලදී. දෙවා ඒ ඇසිල්ලෙහි අභිනවවූ කිරි ඇඹුලක් පහරණ
තෙක් ඒ ඇසිල්ලෙහි නොමිදෙන්නාක්මෙන් (සඞ්ඝයා විසින්)
අභිනව කරණලද පාපකර්මයද කුසලකර්මයෙන් උපන් ස්කන්ධ
යන් සිටියදී ඒ ඇසිල්ලෙහිම නොමිදෙයි හෙවත් විපාක නො
දෙයි. විපාක දෙනුයේ අළුයෙන් වැසුනාවූ ගිණිදැල් නැති

අඟුරු පයින් ඇක්මවූ කල්හිම කොඳුවෙන්නේ නමුත් මදුවේ ලෑවක් අළු මැඩ සිටීමෙන් අළුරන්ව සම් මස් නහර තවා හිස් මොල දක්වා දවමින් යන්නේ යම්සේද එසේම පවිකළ සත්‍වයා දෙවෙනි තුන්වෙනි ආත්මයන්හි නරකයෙහි උපන්නහු දවමින් අනුව එයි. යනු ගාථාවේ අදහසයි. ඒ ක්‍රියා විශේෂය වෙන්ව එක් පරමාර්ථ ධර්මයකැයි කියාද ගණනට නොයයි අනුසය ධාතු මෙනැයි දතයුතු. (චිත්තසන්තානයෙහි සයනය කරන්නාවූ ඉෂ්ටානිෂ්ට ආරම්මණ ප්‍රත්‍යය ලැබීමෙන් නැගිටින්නාවූ කාමරාග ප්‍රතිඝාදි සප්තානුසය ධර්මයන්මෙන් කුසලාකුසල කර්මයෝද තමහට අවකාශලද කල්හි පැසෙනු ලබත්යයි සේයි) මේ කර්මසමඞ්ගිතා නම්වේ. ඒසන්තානගත ක්‍රියා විශේෂය වනාහි යම් කාලෙක තමහට අනුකූල ප්‍රත්‍යය ලබාද එකල්හි විපාකයට අවකාශ කරයි. කෙසේ අවකාශ කරයිදයත්? චිත්තසන්තානගත ඒ ක්‍රියා විශේෂය තෙමේ ආසන්නයෙහි මරණය ඇති සත්‍වයාට තම ආත්මය හෝ එළඹවයි. (අරමුණුවෙයි) තමාගේ නිමිත් (කර්මනිමිත්) හෝ එළඹවයි. ගති නිමිත් හෝ එළඹවයි. (අරමුණු කරවයි) ඒ මරණාසන්න සත්‍ව තෙමේද ඉදින් ඒ මනොද්වාරාපාථගතව සිටිකර්ම කර්මනිමිත් ගතිනිමිත් යන මෙයින් එකක් අරමුණුකොට සිතින් නොහැර අල්වාගණීද එකල්හි විපාකයට (ඒ කර්මවිපාකයට අවකාශ කරයි මේ උපට්ඨාන සමඞ්ගිතා නම් වේ. ඒ අරමුණ සිතින් නොමුදා අල්වාගෙන චුතවූ සත්‍වයාහට වනාහි චුතියට අනතුරුවම කර්මයයි කියනලද ඒ ක්‍රියා විශේෂය වෙන්ව සසම්ප්‍රයුක්ත ධර්මයන් සහිතවූ පරමාර්ථ ධර්ම රාශියක්ව හෙවත් ස්පර්ශාදි චෛතසිකයන්ගෙන් යුත් එක් ස්වභාව ධර්මයක්ව උපන් භවයෙහි ආයු ඇතිතාක් භවාඞ්ග කෘත්‍යයද චක්ෂුරාදි සදොරෙහි ඒ ඒ වාරයන්ට අයත් විපාක කෘත්‍යයන්ද කෙළවර චුතිකෘත්‍යයන්ද සිධකරමින් එක් භවයක් සම්පූර්ණකිරීමෙන් පැසෙනු ලබයි මේ සතර සමඞ්ගිතා අතුරෙන් චේතනා, කර්ම, උපට්ඨාන යන පළමුවන තුන් සමඞ්ගිතාවයෝ තරුණ අවස්ථා නම්වෙත්. පසුවකී විපාක සමඞ්ගිතාවූකලීමුහුකූරාගිය අවස්ථාව නමැයිදතයුතුයි. මෙසේකියනලද කරුණුහෙයින් යම් හෙයකින් විපක්ව භාවයට පැමිණෙත්ද හෙවත් මුහුකුරා යෙත්ද එහෙයින් විපාකයෝ වෙත්. මෘදු තරුණ අවස්ථාව ඉක්මවා මුහුකල අවස්ථාවයයි කියනලද විපාකභාවයට පැමිණෙත් යයි මෙසේ මෙහි අර්ථය දතයුතු.

මෙසේ මෙතෙහිකොට පෙළෙහි කුශලාකුශල කර්මජවූද කෘතත්වාත් රූපයන්ගේ හෙවත් කර්මජරූපයන්ගේ විපාක පදයෙහි නොගැණීමවේයයි දතයුතු. ඒ එසේමැයි. ඒ කෘතත්වාත් රූපයෝ කර්මසන්තානයෙන් වෙන්ව සිඩහෙයින් වෙන්ව කර්මයෙන් හටගත් ධර්මයෝමනම්වෙත්. මුහුකුරාගිය ධර්මයෝනම් නොවෙත්යයි දතයුතු. ඒ එසේමැයි. අරූපධර්මයන්ගේ සන්තතිය අනිකෙක. රූපධර්මයන්ගේ සන්තතිය අනිකෙකැයි දතයුතු. මෙසේ සප්තවිධ අකුසල විපාක චිත්තයන් දක්වා තදනන්තරවැ අෂ්ටවිධ අහේතුක කුසල විපාක චිත්තයන් දක්වනු කැමති අනුරුධාචාර්ය්‍ය මාහිමියෝ උපෙක්ඛා සහගතං කුසලවිපාකං චක්ඛුවිඤ්ඤාණං යනාදිය කීහ.

1 උපෙක්ෂා සහගත චක්ෂුර් විඥානය
2 උපෙක්ෂා සහගත ශ්‍රොත්‍ර විඥානය
3 උපෙක්ෂා සහගත ඝ්‍රාණ විඥානය
4 උපෙක්ෂා සහගත ජිහ්වා විඥානය
5 සුඛ සහගත කාය විඥානය
6 උපෙක්ෂා සහගත සම්පටිච්ඡන සිතය
7 සෞමනස්‍ය සහගත සන්තීරණ සිතය
8 උපෙක්ෂා සහගත සන්තීරණ සිතය

යන මේ අටදෙන අහේතුක කුශල විපාක චිත්තයෝ නම්වෙති.

**“සුඛයති ඛණති කාය චිත්තාබාධනති සුඛං”** යනු නිර්වචනහෙයින් කායචිත්ත දෙක්හි ආබාධ මොනවට සාරාදමන හෙයින් “සුඛ” නම්වේ. මෙයින් සුඛ වේදනාව ලැබේ. මෙහි සුඛ ශබ්දය සුඛ භාවයෙහි හෙවත් සුඛ ක්‍රියාවෙහි හැසෙයි. ඒ කායික සුඛ වේදනාවෙන් යුක්තවූ සිත “සුඛසහගත” නම්වේ. මෙයින් උපෙක්ෂා සහගත බව ප්‍රතික්ෂෙප කරනලදී සෙසු පදයන්ගේ අර්ථය පෙර කී නයින් දතයුතු. කුශල විපාක සිතෙහි උපෙක්ඛා සහගතං කුසල විපාකං යි දැක්වූවාක්මෙන් අකුසල විපාක සිතෙහිද අකුසල විපාකං යි කුමක්හෙයින් නොකියනලද්දේද? අකුසල විපාක චිත්තයන්ට මුලින් සියළු තන්හි අකුසල් සිත් දැක්වූ බැවින් ඒ ගැහෙන හෙයිනි. දෙවනු කුසල විපාකං යි කුමක් හෙයින් කියනලද්දේද? අකුසල විපාකයන්ට අනතුරුව දැක්වූ හෙයින් මුල දැක්වූ අකුසලයන්ගේම විපාකයයි සැක උපදවන හෙයිනි. කවර අර්ථයක් සඳහා අකුසලයට අනතුරුව අහේතුක චිත්තය කීයේද? එකුන් සැටක් නොහොත් අනූ එකක් චිත්ත

යන් වෙන්කොට සොභන නාමයෙන් දක්වනු පිණිස අකුශලයට අනතුරුව එසේ කියනලදී "ඉමානි අට්ඨපි කුසලවිපාකා හෙතුක චිත්තානි නාම" මේ වනාහී කුශල විපාක නාමදශීන නිගමනයයි. අකුසල විපාක නිගමනයෙහි අකුසලවිපාකා හෙතුකායයි නොයොදා මේ කුසලවිපාක නිගමනයෙහි පමණක් කුසලවිපාකා හෙතුකායයි කුමක්හෙයින් අහෙතුක ශබ්දයෙන් වෙසෙසන ලද්දේද? අකුසල විපාකය නියම් වශයෙන් අහෙතුක හෙයින් මුලින් නොදක්වනලදී. කුසල විපාකයන්හි අහෙතුක ශබ්දය යොදනලද්දේ සහේතුකයන්ගෙන් වෙන්කරගණු පිණිසයි. සම්භව ව්‍යභිචාර යන දෙයාකාරයෙන් සම්භවන්‍යායෙන් මෙසේ යෙදූයේය. අකුසල විපාකයෙහි මෙන් එක සන්තීරණයක් නොදක්වා කුමක්හෙයින් කුසලවිපාකයෙහි සන්තීරණ දෙකක් දක්වනලද්දේද? කුසල විපාක සන්තීරණය වනාහි ඉෂ්ට ඉෂ්ට මධ්‍යස්තාරම්මණ වශයෙන් උපෙක්ෂා සොමනස්ස සහගතව දෙකක් කියනලදී. එසේනම් අකුසල විපාක සන්තීරණයද අනිෂ්ට අතිෂ්ට මධ්‍යස්තාරම්මණ වශයෙන් විවිධාකාරයකින්වියයුතු නොවේද? එසේ නොවියයුතු දෞර්මනස්‍යයවූකලී ප්‍රතිඝයෙන් වෙන්ව නූපදින හෙයින් උපෙක්ෂා සහගත එක් අකුසල විපාක සන්තීරණයෙක්ම වේ. අකුසල විපාකයෙහි ඒකාන්තයෙන් අකුසල ස්වභාවවූ ප්‍රතිඝයාගේ සම්භවයක් නැතිහෙයින් චිත්තජනිකවූ ධර්මයෙක් චිත්ත ජනික ධර්මයන් කෙරෙහි නොලැබේනුයි තමා හා යෙදෙන්නට සුදුසුවූ ධර්මයක්හුගේ සම්භවයක් නැතිහෙයින් අකුසල විපාකයන් කෙරෙහි දෞර්මනස සම්භව නොවේනුයි තත් සහගතත්වය නොකියනලදී. කිසිබලවත් ශක්තිසම්පන්න පුරුෂයෙකු විසින් පෙළනු ලබන්නාවූ දුර්වල පුරුෂතෙමේ ඔහට විරෝධ වන්නට අසමර්ථවූයේ ඔහු කෙරෙහි උපෙක්ෂාවූයේම වේද එපරිද්දෙන්ම අකුශල විපාකයන් දුර්වලහෙයින් අනිෂ්ටාලම්බනයෙහිදු දෞර්මනස් වේදනාවගේ උත්පත්තිය නැත්නුයි අකුසල විපාක සන්තීරණය උපෙක්ෂාසහගත නම්වේ. කුශලා කුශල විපාක චක්ෂුර්විඥානයෝ සතරදෙන උපෙක්ෂාසහගතවීමට හේතු කවරේද? වස්තු ආලම්බනයන්ගේ හැපීම දුර්වලහෙයින් අතිෂ්ටවූද ඉෂ්ටවූද අරමුණෙහි උපෙක්ෂා සහගතවූවාහුම වෙත්. කුමක් හෙයින් චක්ඛු, සොත, ඝාණ, ජිහ්වා යන සතර උභය විපාක විඥානයන්ට නිශ්‍රයස්ථානවූ චක්ෂුරාදී ප්‍රසාදයෝ සතරදෙන රූපාදී ආලම්බනයෝ සතරදෙන යන වස්තු ආලම්බනයන්ගේ හැපීම

දුර්වලවන්නේද ? ඒ චක්ෂුර්විඥානාදී චතුර්විධ චිත්තයන්ගේ නිශ්‍රය
වස්තුවූ චක්ෂුඃප්‍රසාදාදීහු උපාදාරූපයෝම වෙත්. අරමුණුවූ රූපා
ලම්බනාදීහුද එසේම උපාදාරූපයෝම වෙත්. උපාදාරූපයක්හාද
උපාදාරූපයක්හුගේ ගැටීම ඉතාදුර්වලවේ. කුමක්මෙන්ද ? පුළුන්
පිඩක් හා පුළුන් පිඩක්හුගේ හැපීමක් මෙනි ඒ වස්තු ආලම්බන
යන්ගේ හැපීම ඉතා දුර්වලහෙයින් චක්ෂුර්විඥානාදි චිත්තයෝ
සතරදෙන සියළුප්‍රකාරයෙන්ම උපෙක්ෂා සහගත වූවාහුම වෙත්.
කායවිඥානය දුක්ඛ සුඛ සහගතව කුමක්හෙයින් උපදීද ? කාය
විඥානයට වනාහි ස්පර්ශාලම්බනයයි කියනලද මහාභූත රූපත්‍ර
යම අරමුණු වේ. එහෙයින් ඒ ස්පර්ශාලම්බනය කායප්‍රසාදයෙහි
ගැටුනේද ඒ කායප්‍රසාදය ඉක්මවා ඒ කායප්‍රසාදයාගේ නිශ්‍රය
ස්ථානවූ මහාභූත රූපයන්හි ප්‍රතිඝාතනය වේ. හෙවත් හැපේ.
භූතරූපයන් හාද භූතරූපයන්ගේ ගැටීම අතිශයින් බලවත්වේ.
කුමක්මෙන්ද ? කිණිහිර මත්තෙහි පුළුන් පිඩක් තබා කුළකින්
පහරණලද කල්හි කුළ පුළුන් පිඩ ඉක්මවා කිණිහිර වැදගත්
තාක්මෙන්ම අතිශයින්බලවත්ව හැපෙන්නේය. එහෙයින් වස්තු
ආලම්බනයන්ගේ හැපීම බලවත් බැවින් කායවිඥානය අනිෂ්ටා
ලම්බනයෙහි දුක්ඛ සහගතවේ. ඉෂ්ටාලම්බනයෙහි සුඛ සහගත
වේයයි. දතයුතු. සම්පුත්‍යෙෂන චිත්තවය වනාහි කුමක්හෙයින්
උපෙක්ෂා සහගත වන්නේද ? සම්පුත්‍යෙෂණ දෙසිත වනාහි
තමන් හා සමාන නොවූ නිශ්‍රය ඇති චක්ෂුර්විඥානාදි චිත්තයන්ට
අනතුරුව උපදී. එහෙයින් සමාන නිශ්‍රය ඇති චිත්තයකින් නො
ලත් අනන්තර ප්‍රත්‍යය ඇති බැවින් සමානවූ උපස්තම්භ ඇති
පුරුෂයක්හු කෙරෙන් පහවූ පුරුෂයකු මෙන් ඉතා බලවත්
නුවූයේ සියලු ප්‍රකාරයෙන්ම ආලම්බන රසය අනුභව කරන්ට
නොහැකිවේ. එහෙයින් සියලු ඉෂ්ටාලම්බනයෙහිද උපෙක්ෂා සහ
ගතම වෙයි.

යමකී සප්ත අකුසල විපාකයන්ට අනිෂ්ට හෙවත් නොක
මැතිවූ අරමුණු හා කුසල විපාක අටදෙනාට ඉෂ්ටවූ හෙවත්
කැමතිවූ අරමුණු ලැබෙත්නේයි. ඒ අරමුණු තීරණය කරගැනීම
හෙවත් තෝරා දැනගැණීම තමාගේ සිතට කැමතිවීනම් ඉෂ්ට
වෙයි. නොකැමැතිවීනම අනිෂ්ටවෙයි. අතිශයින් රළු පරුෂවූ අර
මුණු හෝ අතිශයින් සියුම් අරමුණු හෝ ඉෂ්ටා නිෂ්ට වශයෙන්
නොලැබේ. සංඥා විපල්ලාස චිත්තවිපල්ලාස කරණකොටගෙන
ඉෂ්ටවූ අරමුණු අනිෂ්ට වශයෙනුත් අනිෂ්ටවූ අරමුණු ඉෂ්ට වශ

ශෙත්‍රුන් ගන්නා ලැබේ. සුනඛ සූකරාදීන්ට සඤ්ඤාවිපල්ලාස වශයෙන් අසුචි මලමූත්‍ර ගෙරිකුනු ආදීවූ ප්‍රකෘතියෙන් අනිෂ්ටවූ අරමුණු ඉෂ්ට වශයෙන් ගන්නාලැබේ. ඔවුන්ට අරමුණු ලැබුණු කල්හි කුසලවිපාක චක්ඛු විඤ්ඤාණාදිය උපදිනු ලැබේ. තීර්ථක මිථ්‍යාදෘෂ්ටි ආදීන්ට බුද්ධප්‍රතිමාදී ප්‍රකෘති ඉෂ්ටාලම්බනයන් දුටු කල්හි චිත්තවිපල්ලාස වශයෙන් අනිෂ්ටාලම්බනවූඅකුසලවිපාක චක්ඛුවිඤ්ඤාණාදිය උපදී. ඇතැම් අරමුණු එක්ද්වාරයකට ඉෂ්ටාලම්බනව එක්ද්වාරයකට අනිෂ්ටාලම්බනවෙයි. ස්වර්ණමයවූ කඩු කිරිච්චි ආදී ආයුධ හා ශෛලමය ප්‍රතිමාදීහුද චක්ඛුද්වාරයට ඉෂ්ටාලම්බනව කායද්වාරයට අනිෂ්ටාලම්බනවෙයි. ස්වර්ණමයවූ ආයුධාදිය චක්ෂුද්වාරයට සහපත්වූවත් ශරීරයට ආයුධාදියෙන් පහරදුන් කල්හි දුක්ඛ වේදනාව උපදී. මලමූත්‍රාදිය චක්ෂුද්වාර ඝ්‍රාණද්වාර දෙකට අනිෂ්ටාලම්බනවූවද කායද්වාරයට ඉෂ්ටාලම්බනය වෙයි. කුමක්හෙයිනයත්; අසුචි ඉතා සියුම් බැවිනි. ශරීරයට ඉතා සුවපහස් දෙයි. ඒ අසුචිමලමූත්‍රාදිය පෘථග්ජනයන් විසින් දක්නාලද කල්හි අකුසල විපාක චක්ඛුවිඤ්ඤාණය උපදී. ඒ මලමූත්‍රාදීන්ගේ ආඝ්‍රාණයකිරීමෙන් ද්වෙෂමූලිකජවන් උපදී. ඒ අසුචි ආදී අපවිත්‍රයම සුනඛ සූකරාදීන් විසින් දක්නාලද කල්හි අකුසල විපාක චක්ඛුවිඤ්ඤාණය උපදී. ඊට අනතුරුව එහි ඇළුම් කිරීම් වශයෙන් ලොභමූලික ජවන් උපදී ඒ අසුචි මලමූත්‍රාදිය දක්නාකල්හි මාගේ ශරීරාභ්‍යන්තරයෙහිද මෙබඳු අපවිත්‍රය ඇත්තේය. එහෙයින් මාගේ ශරීරයද පිළිකුල් කටයුතුයයි මෙසේ නුවනින් යුක්තව වසන්නාවූ සත්ත්වයන්ට කාමාවචර කුසල ජවන්උපදී. ඒ අසුචි මලමූත්‍රාදිය රහතුන්විසින් දක්නාලද කල්හි අකුසල විපාක චක්ඛුවිඤ්ඤාණය ඉපිද තදනන්තරව කාමාවචරම හා ක්‍රියාජවන් උපදී. රහතුන්ට වනාහී අනිෂ්ටාලම්බනයෙහි අකුසල ජවන් හෝ ඉෂ්ටාලම්බනයෙහි කුසලජවන්හෝ නූපදී. අහේතුක කුසල විපාකයන් දක්වා තදනන්තරව අහේතුක ක්‍රියා සිත් දක්වනු කැමති අනුරුද්ධාචාර්‍ය්‍ය මාහිමියෝ "උපෙක්ඛා සහගතං පඤ්චද්වාරාවජ්ජනං" යනාදිය කීහු,

1 උපෙක්ඛා සහගත පඤ්චද්වාරාවජ්ජන චිත්තය.
2 උපෙක්ඛා සහගත මනොද්වාරාවජ්ජන චිත්තය.
3 සොමනස්ස සහගත හසිතුප්පාද චිත්තය.

යන මේ තිදෙන අහේතුක ක්‍රියා සිත් නම්වෙති.

**චක්ඛාදිපඤ්චද්වාරෙ ඝට්ටිතමාරම්මණං ආවජ්ජෙති තත්ථ ආභොගං කරොති චිත්තසන්තානං වා භවඞ්ගවසෙන පවත්තිතුං අදත්වා වීථිචිත්තභාවාය පරිණාමෙතීති පඤ්චද්වාරාවජ්ජනං"** යනු නිර්වචනයි. මෙහි **"පඤ්චද්වාරාවර්ජනය"** නම් ඇස් කන් නාසාදී පස්තැන අභිමුඛව අවුත් වැටෙන්නාවූ රූපාදී අරමුණු පස මෙනෙහි කරන්නාවූ ආකාරයෙන් හෘදය වස්තුව තුළ පවත්නා සිතකි. නොහොත් භවඞ්ග චිත්ත පරම්පරාව භවඞ්ග වශයෙන් ඉපදීමට අවකාශ නොදී වීථිචිත්තයන්ගේ ඉපදීමට පිරිනමන්නාවූ සිතකි. මේ සිත වනාහි භවාඞ්ග සඞ්ඛ්‍යාත මනොවිඤ්ඤාණ ධාතුවෙන් උපදින නුමුත් විශිෂ්ට හැඟීමක් නැති බැවින් හැඟීම් මාත්‍රයක් ඇති ධාතුවය යන අර්ථයෙන් මනොධාතුයයි කියති. විශිෂ්ට හැඟීමක් නැති බැවින්ම චක්ෂුර්විඥානාදියට මුත් මනොවිඤ්ඤාණයකට කිසිසේත් ප්‍රත්‍යය නොවේ. පඤ්චද්වාරාවර්ජන නම්වූ මනො ධාතු තොමෝ අනන්තර සමනන්තර නත්ථිවිගත අනන්තරොප නිශ්‍රය යන පස් ආකාරයකින් චක්ෂුරාදි පඤ්චවිඤ්ඤාණයන්ට උපකාරවේ මේවනාහි චක්ෂුර්විඥානාදියට පෙරමුනේ හැසිරෙමින් රූපාදිය දැනගැණීම ලක්ෂණකොට ඇත්තේය. චිත්ත පරම්පරාව රූපාදී අරමුණට නැමීම හෙවත් චිත්ත පරම්පරාව පළමු පැවති සැටියෙන් පෙරළා අනික් ආකාරයකින් නැමීම කෘත්‍යකොට ඇත්තේය. එසේබව ඥානයට වැටහීම්කොට ඇත්තේය. භවාඞ්ග සන්තතිය සිඳීම ආසන්න කාරණාකොට ඇත්තේය. පළමුකොට උපදින වීථිචිත්තයවූ හෙයින් විපාක නොව ක්‍රියා භාවය වන්නේය. ක්‍රියා සිත් වනාහි උත්සාහවත් චිත්තයෝයි. විපාක සිත් වූකලී නිරුත්සාහවත් චිත්තයෝයයි දතයුත්තාහ. **"මනොද්වාරෙ ආපාථගතං ආරම්මණං ආවජ්ජෙතීති මනොද්වාරාවජ්ජනං"** යනු නිර්වචනයි. මෙහි **"මනොද්වාරාවර්ජනය"** නම් හෘදය වස්තු ආශ්‍රයෙන් පවත්නා භවඞ්ග සන්තතියෙහි අභිමුඛව අවුත් ගැටෙන ඉෂ්ටා නිෂ්ට (යහපත් අයහපත්) අරමුණු මෙනෙහි කරන්නාවූ ආකාරයෙන් උපදින්නාවූ සිතකි. මෙයින් ක්‍රියා අහෙතුක මනොවිඤ්ඤාණ ධාතු චිත්තය ලැබේ. එම චිත්තයම චක්ෂුරාදි පඤ්චද්වාරයෙහි සන්තීරණ ජවන චිත්තයන්ගේ මධ්‍යයෙහි අරමුණු නියම්කරගැණීම් වශයෙන් උපදනා කල්හි කවර නමක් ව්‍යවහාර කරණු ලබන්නේද? රජගෙයි දොර ආරක්ෂාකරන්නාවූ දෞවාරික තෙමේ ඒ ද්වාර ආරක්ෂාකරණ කල්හි දෞවාරිකයයි කියාද ප්‍රත්‍යන්තයෙන්

ගෙණෙන්නාවූ පඬුරු ආදිය ඔසවා ගෙණ රජගෙට යන්නාවූ කල්හි පාටිහාරයයි කියාද ඔහුට ව්‍යවහාර කරන්නාක් මෙන් මෙම චිත්තය මනොද්වාරයෙහි උපදනා කල්හි මනොද්වාරාවර්ජන නමින්ද පඤ්චද්වාරයෙහි සන්තීරණ සිත විසින් ගන්නාලද අරමුණු නියමකර ගැනීම් වශයෙන් උපදනා කල්හි ව්‍යවස්ථාපන නමින්ද ව්‍යවහාර කරණු ලබත්. මේ වනාහි සාරමුණු දැනගැණීම ලක්ෂණකොට ඇත්තේය. පඤ්චද්වාරයෙහි සන්තීරණ සිතින් ගන්නාලද අරමුණ නියමකරන්නාක් මෙන් හඳුනැණීම හා මනොද්වාරයෙහි අරමුණ ආභොග කිරීමද කෘත්‍යකොට ඇත්තේය. පඤ්චද්වාර මනොද්වාරයන්හි පිළිවෙළින් ව්‍යවස්ථාපන භාවය ආවර්ජන භාවය ප්‍රත්‍යුපස්ථානකොට ඇත්තේය. ව්‍යවස්ථාපන කාලයෙහි සන්තීරණ කෘත්‍ය ඇති අහෙතුක විපාක මනොවිඤ්ඤාණ ධාතු තුන්දෙනද ආවර්ජන කාලයෙහි යම්කිසි භවාඞ්ගුපච්ඡෙදයක්දැයි යන මොවුන් අතුරෙන් එක්තරා සිතක්හුගේ පහවීම ආසන්න කාරණකොට ඇත්තේය. මේ මනොද්වාරාවර්ජන චිත්තය ශෛක්ෂ අශෛක්ෂ පෘථග්ජන යන සියල්ලන්ටම සාධාරණවේ. කියනලද පඤ්චද්වාරාවර්ජන සිත හා මනොද්වාරාවර්ජන සිතද හෘදය වස්තුව ආශ්‍රයකරගෙන පවතී. හෘදයවස්තුව දෙඹගෙඩියක් ඇතුල්කිරීමට තරම් කුහරයක් ඇති මස්ගඩුවකි. එහි අඩපතක් පමණ ලොහිත ධාතුවද පිහිටා තිබේ. ඒ ලෙය පැතිරගෙන හෘදය වස්තු රූප පරම්පරාව පවතිනබවද ඒ හෘදයවස්තු රූප ආශ්‍රයෙන් මනොධාතු මනොවිඥානධාතු සඞ්ඛ්‍යාත චිත්ත චෛතසික ධර්මයන් පහළවන බවද "අට්ඨකථා" යෙහි කියනලදී. ඔවුන්ගේ නූපදින වේලාවක්නම් නොමැත්තේය. ඊට මනොද්වාරයයි කියනුලැබේ එහි භවාඞ්ග සිත් නිරන්තරයෙන්ම උපදින්යයි දතයුතු. භවාඞ්ගසිතනම් ක්‍රියානොකරන සිතයි. එකවිට සිත්දෙකක්නූපදී. ඒ එසේමැයි. එකසිතක්ඉපද නිරුද්ධවීමෙන්ම අන්සිතක් ඉපදීම ඒසිත නිරුද්ධවීමෙන් අන්සිතක් ඉපද නිරුද්ධවීමමේ පිළිවෙළින් එකඑකබැගින් ඉපදනිරුද්ධවීම ස්වභාවකොට ඇත්තේය. පඤ්චද්වාරාවර්ජන මනොද්වාරාවර්ජනයන්ගේ දැනගැණීම සඳහා උපමාවක් කියනුලැබේ. ඒ කෙසේදයත්; එක්තරා කොස්වත්තක් මැද ගිනි අඟුරු සහිත දහයියා ගොඩක් ඇත. තදසුළං ඇතිකල්හි හාත්පස තිබෙන්නාවූ කොස්කොළ එහි වැටී ගිනි ඇවිළෙන්නේය. ඉක්බිති සුළං නැතිවී සෑමෙන් දුම් දමමින් තිබේ. එහි කොස්කොළ වැටී ගිනි ඇවිළෙන කාලය

මෙන් පඤ්චද්වාරයෙහි උපදින වීථි චිත්තයෝ දතයුත්තාහ. කොස්කොල අරමුණු මෙන් දතයුත්තාහ. දුම්දමමින් පවත්නා කාලය මෙන් භවාඞ්ග සිත දතයුතු. **"හසිතං උප්පාදෙතීති හසිතුප්පාදං"** යම් සිතක් සිනාව පහළකෙරේද හේ හසිතුප්පාද නම්වේ. මේ වනාහි බුදුන් රහතුන්ට ඖදාරික දුගීති භවයෙන් පතතියෙන් මුක්තවූ තමතමන් වහන්සේගේ ආත්ම භාව සම්පත්තිය අරමුණුවීමෙන් තුටුපහටු ආකාරය ඇතිකරවමින් උපදී. ක්ෂීණාශ්‍රවයෝ ලෞකික මහජනයා මෙන් ඇලියයුතු භාවයෙන් ඖදාරික සිනා ඉපදවියයුතු වස්තූන්හි නොම සිනාසෙත්යයි දතයුතු. හාස්‍යය වනාහි සිතය, හසිතය, විහසිතය, උපහසිතය අවහසිතය අතිහසිතය කියා සවැදෑරුම් එයින් මුහුණෙහිපවතින පීත නගත්ය සිත නම්වෙයි. මදක් දත් විවෘත කොට සිනාසීමහසිත නම්වෙයි. මිහිරි හඬින් සිනාසීම විහසිත නම්වෙයි. දෙදසරැව සැලෙනසේ සිනාසීම උපහසිත නම්වෙයි. කඳුළුධාරා වගුරුවා සිනාසීම අවහසිත නම්වෙයි. ශරීරය ඉදිරියට හෝ පසුභාගයට පෙරලා සිනාසීම අතිහසිත නම්වෙයි. මේ ක්‍රමය සුබෝධාලඞ්කාරයෙහි ඇත. මෙයින් මුල දක්වූ සිනාව බුදුන් රහතුන්ටයි. මේ හසිතොත්පාද සිත වනාහි ෂඩාලම්බනයන් දැනගැනීම ලක්ෂණකොට ඇත්තේය. රහතුන්ට සියුම්වූ අරමුණෙහි නොහොත් අස්ථිසංඛලික ප්‍රේතරූපාදීවූ හෝ අතිකුඩු අප්‍රණීතවූ හෝ අරමුණෙහි මදසිනා පහළකිරීම කෘත්‍යකොට ඇත්තේය. එසේබව ඥකයට වැටහීම්කොට ඇත්තේය. පඤ්චවොකාර භවයෙහිම උපදනාහෙයින් ඒකාන්තයෙන් හෘදයවස්තුව ආසන්න කාරණකොට ඇත්තේය. බුදුන් රහතුන්ගේ සිනා පහළ කිරීම පුහුදුන්ගේ මෙන් නොවේ. සර්වඥයන්වහන්සේගේ සුභ්‍රවර්ණවූ දන්ත රශ්මිය නික්මීමෙන් සිනාපහළ කළබව ප්‍රකාශවේ. සෙසු රහතුන් පුහුදුන්මෙන් ශබ්දකොට නොම සිනාසෙති. මේ සිත හසිතොත්පාදයයි නම්ලත් හෙයින් සිනා පහළකරණ අනික් සිතක් නැතැයි නොසිතිය යුතුවේ. සිනා පහළකරණ සිත් තෙළෙස් දෙනෙක්වෙති, එනම්; සොමනස්සසහගතලෝභමූලික අකුසල් සතරය, සොම්නස් සහගත මහා කුසල් සතරය සොම්නස් සහගත මහා ක්‍රියා සතරය, හසිතොත්පාද චිත්තය යන මොවුහුයි. එයින් සොම්නස් සහගත අකුසල් සිත් සතරය, සොම්නස් සහගත කාමාවචර කුසල් සිත් සතරය, යන අටින් පුහුදුන් සිනාසෙති. ශෛක්ෂයෝ දෘෂ්ටිවිප්‍රයුක්ත සොම්නස් සහ

ගත අකුසල් සිත් දෙකින් හා සොම්නස් සහගත කාමාවචර කුසල් සිත් සතරින්ද සිනාසෙති. අශෛක්ෂයෝ සොම්නස් සහගත කාමාවචර ක්‍රියා සිත් සතරින් හා මේ අහේතුක හසිතොත්පාද ක්‍රියා සිතින්ද සිනාසෙති. එහෙයින් කීහ

1 **"සොමනස්සයුතානඤ්ච-කුසලාකුසලානිච**
**කිරියතොපන පඤ්චච-හාසචිත්තානි තෙරස**

2 **පුථුජ්ජනා හසන්තෙත්ථ-චිත්තෙහි පන අට්ඨහි**
**ඡහි සෙක්ඛා අසෙක්ඛාච-හසන්ති පනපඤ්චහි"** යි

මේ ගාථා දෙක පාඩම් කොට සිත කබාගෙණ අර්ථය පෙර කී නයින් දතයුතුයි. මේ හසිතොත්පාද චිත්තය විචාරණ ප්‍රඥාවෙන් විරහිතය. අප්‍රණීතවූ කාමාවචර අරමුණෙහි රහතුන්ම පමණක් නොව බුදුන්වත් සොම්නස් මාත්‍රයක් උපදවමින් පහලවන්නේයයි අටුවාහි පෙණේ. එතකුදුවුවත් බුදුවරයන්ගේ සියලු කායකර්ම වචීකර්ම මනොකර්මයන් ඥානයට අනුව පවත්නාහුයි කී බැවින් ප්‍රඥාවිරහිතවූ අහේතුක හසිතොත්පාදය කෙසේ පවත්නේදැයි පරීක්ෂා කටයුතුවේ. සර්වඥ බුදුවරයන්ට වනාහි පූර්වේනිවාසඥාන අනාගතාංසඥාන සර්වඥතාඥානයන් පැවති ඊට අනුව මේ හසිතොත්පාද අහේතුක සිත පවත්නේයයි ගත් කල්හි බුදුවරයින්ගේ සියලු කායකර්මයන් ඥානය පෙරටුකොට ඥානයට අනුව පවත්නාහුය යන ප්‍රතිසම්භිදාමාර්ග පාලිය හා අටුවාමතයද ගැලපෙන්නේයි එහෙයින් අටුවායෙහි අනාගතාංසඥානාදීන්ගේ අවසානයෙහි මේ සිත උපදනේයයි කියනලදී. මෙහි වනාහි පඤ්චද්වාරාවර්ජන මනොද්වාරාවර්ජන චිත්තයෝ දෙදෙන කුමක්හෙයින් උපෙක්ෂා සහගතවෙද්ද ? පලමුකොට පෙර කිසිවිටෙක සිතක්හු විසින් අරමුණුකොට නොගන්නාලද විරූ අරමුණෙහි එක්වරක්ම පවත්නාවූ ආවර්ජන සිත්තෙමේ භවඞ්ග සන්තතිය සිඳීම් වශයෙන් හටගන්නාහෙයින් දුර්වල භවාඞ්ග ප්‍රත්‍යය ඇත්තේ හෝ සර්වප්‍රකාරයෙන් අරමුණු රසය අනුභව නොකළහැකිවේ. එහෙයින් ඉෂ්ටාදි සියළු අරමුණෙහි උපෙක්ෂා සහගතමවෙයි. **"සම්පයුත්ත හෙතු විරහතො අහෙතුකානිච තානි විපච්චන විපාකුප්පාදන කිච්ච රහිතත්තා තංතං ක්‍රිය මත්තභූතානි චිත්තානිචානි අහෙතුක ක්‍රියචිත්තානි"** සම්ප්‍රයුක්ත හෙතු නැතිහෙයින් අහෙතුකයෝද වෙත්. ඔව්හු මුහුකිරීම් කිසෙත් හා විපාක ඉපදවීම් කිසෙන් තොරවූ හෙයින් ඒ ඒ ක්‍රියාමාත්‍රවූ චිත්තයෝද වෙත්. එහෙයින් අහෙතුක ක්‍රියා චිත්ත

යෝ නම්වෙත්. මෙවුනතුරෙන් වීථිමුක්ත චිත්තයෝ කෘත්‍ය දුර්වලහෙයින්ද පඤ්චවිඤ්ඤාණයෝ නිශ්‍රයවස්තු දුර්වල හෙයින්ද සම්ප්‍රත්‍යේෂණාදිය කෘත්‍යස්ථාන දුර්වලහෙයින්ද තමාගේ උත්සාහයෙන් වෙන්ව හුදෙක් පැසීම් මාත්‍රයෙන් පවතිත්. එහෙයින් ඒ සියළු චිත්තයෝ විපාකයෝම නම්වෙති. යම් චිත්තකෙණෙක් බලවත් කෘත්‍ය ඇතිහෙයින් තමාගේ උත්සාහයෙන් පවතිත්ද අනාගතයෙහිත් විපාක ඉපදවීම පිණිස උත්සාහ සහිතවූවාහු වෙත්ද ඒ චිත්තයෝ කුසලාකුසලයෝ නම්වෙත්. යම් චිත්තකෙණෙක් මුහුකිරීම් මාත්‍රය ඉක්මවා තමාගේ උත්සාහයෙන්ම පවතිත්ද ඔවුනතුරෙහි පඤ්චද්වාරාවර්ජන මනොද්වාරාවර්ජන චිත්තයෝ දෙදෙන විපාක සන්තානය කෙරෙන් ලබනලද ප්‍රත්‍යය ඇතිහෙයින් මදක් දුර්වල බැවින්ද ඉතිරි ක්‍රියා චිත්තයෝ අනුශය රහිත ක්ෂීණාශ්‍රව සන්තානයෙහි පවත්නා හෙයින්ද සර්වප්‍රකාරයෙන් විපාක ඉපදවීමපිණිස උත්සාහරහිත වූවාහුමවෙත් එහෙයින් ඒ සියළු චිත්තයෝ ක්‍රියා චිත්තයෝ නම්වූවාහුයයි දතයුතු

**“ඉච්චෙවං සබ්බථාපි අට්ඨාරසාහෙතුක චිත්තානි සමත්තානි”** යනු මහා නිගමන වාක්‍යයි. යථොක්ත ප්‍රකාරයෙන් අහෙතුක නම්වූ අකුශල විපාක කුශල විපාක ක්‍රියා යන සර්වප්‍රකාරයෙන් අටළොසක්වූ චිත්තයෝ සමාප්තයහ. එහි “ඉච්චෙවං“ යනු ඉති එවං යි පදච්ඡේද කරනු. මේ වනාහි නිපාත සමුදායකි. පශ්චිම එව ශබ්දය පූර්වවූ ඉති ශබ්දයාගේ අර්ථ වචනයි. නොහොත් ඉච්චෙවං යනු වෙන්ව එක් නිපාතයක මෙසේ අටළොස් අහෙතුක සිත් දක්වා දැන් අහෙතුක චිත්තයන් සැකෙවින් දක්වනු සඳහා “සත්තාකුසලපාකානි” යනාදිය කියනලදී.

**සත්තාකුසලපාකානි, පුඤ්ඤපාකානි අට්ඨධා**
**ක්‍රියා චිත්තානි තීණීති, අට්ඨාරස අහෙතුකා**

අකුශල විපාක චිත්තයෝ සත්දෙනෙක. කුශල විපාක චිත්තයෝ අටවැදෑරුම් වන්නාහුය. ක්‍රියා චිත්තයෝ තුන්දෙනෙකැයි අහෙතුක චිත්තයෝ අටළොසකි.

මෙසේ කියා නිමවනලද අකුසල් සිත් දොළොස හා අහෙතුක සිත් අටළොස ශ්‍රද්ධා ස්මෘති හිරි ඔත්තප්ප ආදී කිසිම ශොභන ධර්මයක් හා සමග යෙදීමක් නැතිහෙයින් අශොභන සිත්යයි ව්‍යවහාර කරනු ලැබෙත්. මෙහි වේදනා භෙදයෙන් සුඛ සහගත

සිත් 1 දුඃඛ සහගත සිත් 1. සොම්නස් සහගත සිත් 6. දොම්නස් සහගත සිත් 2. උපෙක්ෂා සහගත සිත් 20 මේ සියල්ල පිඩුකළ විට සිත් 30කි. සම්ප්‍රයොග විප්‍රයොග භෙදයෙන් සම්ප්‍රයුක්තසිත් 8. විප්‍රයුක්ත සිත් 22. මේ දෙකොටස පිඩුකළවිටද සිත් 30 කි. අසංස්කාරික සසංස්කාරික භෙදයෙන් අසංස්කාරිකසිත් 25. සසංස්කාරික සිත් 5. මේ දෙකොටස පිඩුකළවිටද සිත් 30 කි. මෙහි චිත්ත විභාගය පහසුවනු පිණිස මොමුහ දෙසිත සහ අහෙතුක සිත් අටලොස අසංස්කාරිකයන් කොට දැක්වීමු.

## අශොභන සිත් සමතිස නිමි.

මෙසේ දොළොස් අකුශල අටළොස් අහෙතුක චිත්තයන්ගේ වශයෙන් සමතිස් චිත්තකොතෙකුන් දක්වා දැන් අකුශල අහෙතුකයන් කෙරෙන් මුක්තවූ එකුන්සැටක් නොහොත් එකානූවක් චිත්තයන්ට ශොභන යන නාම තබන පිණිස "පාපා හෙතුකමුත්තානි" යනාදී ගාථාව කියනලදී.

දැන් කාමාවචර සොභන රූපාවචර සොභන අරූපාවචර සොභන ලොකොත්තර සොභනයයි කියනලද සතරවැදෑරුම් ශොභන ධර්මයන් අතුරෙන් සියල්ලට ගියවූ සූවිසි කාමාවචර සොභන චිත්තයෝම පළමුකොට උදෙසනලද හෙයින් ඔවුන් අතුරෙහිදු අව්‍යාකෘත ධර්මයන්ට කුසල් පූර්වකොට ඇතිහෙයින් පළමුකොට කාමාවචර කුසලයද ඊට අනතුරුව ඒ කාමාවචර කුසලයන්ගේ විපාකයද ඊට අනතුරුව ඒ කාමාවචර කුසලය හා එකභූමියෙහි ඇතුළත්වූ ක්‍රියාචිත්තයද වෙත වෙතම වෙදනා ඥාන සංස්කාරයන්ගේ භෙදයෙන් අටපරිද්දකින් දක්වනු පිණිස "සොමනස්ස සහගතං ඤාණ සම්පයුත්තං" යනාදිය කියනලදී.

1 සොම්නස් සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංස්කාරික සිතය
2 සොම්නස් සහගත ඥාන සම්ප්‍රයුක්ත සසංස්කාරික සිතය
3 සොම්නස් සහගත ඥාන විප්‍රයුක්ත අසංස්කාරික සිතය
4 සොම්නස් සහගත ඥාන විප්‍රයුක්ත සසංස්කාරික සිතය
5 උපෙක්ෂා සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංස්කාරික සිතය
6 උපෙක්ෂා සහගත ඥාන සම්ප්‍රයුක්ත සසංස්කාරික සිතය
7 උපෙක්ෂා සහගත ඥාන විප්‍රයුක්ත අසංස්කාරික සිතය
8 උපෙක්ෂා සහගත ඥාන විප්‍රයුක්ත සසංස්කාරික සිතය

යන මේ අටදෙන කාමාවචර කුසල් සිත් නම් වේ.

ලෝභ සහගත චිත්තයන්හි සොමනස්ස යන වචනයෙන් දක්වන ලද්දේ සිනිඳු භාවයයි. මේ කාමාවචර කුසලාදියෙහි සොම්නස්ස යන වචනයෙන් හෘදය යහපත්ය නිරවද්‍යය යන මේ අර්ථය ලැබේ. මෙසේ මොවුන් දෙදෙනාගේ වෙනස දතයුතුයි. **“ජානාති යථාසභාවං පටිවිජ්ඣතීති ඤාණං”** යනු නිර්වචනහෙයින් යම් ස්වභාව ධර්මයක් තත්වූ ස්වභාවය ප්‍රතිවෙධ කෙරේද එසේ හෙයින් ඒ ස්වභාව ධර්මය “ඥාණ” නම්වේ. ප්‍රතිවෙධ යන මෙහි තේරුම නම් යමක ස්වභාවය තත්වූ පරිද්දෙන් විනිවිද ගොස් දැන ගැණීමයි. ලොකයෙහි විද්‍යමානවූ වෘක්ෂලතාදිය දක මේ කොස්ගහය මේ පොල්ගහය කියා දැන ගැණීම ඥානය නොවේ. හේ සංඥා චෛතසිකයවේ. යම්රූපාදියක් දැක එහි පඨවි ආපො තෙජෝ වායො වර්ණ ගන්ධ රස ඔජ යන මොවුන් ක්‍රමයෙන් දැන ගැණීම ඥානයයි දතයුතුයි. **“ඤාණෙන සමංපකාරෙන යුත්තන්ති ඤාණසම්පයුත්තං”** ඒ ඥානයහා එකොත්පාදාදි ප්‍රකාරයෙන් යුක්තවීම ඥානසම්ප්‍රයුක්ත නම්වේ. සෙස්ස පෙරකී නයින් දත යුතු. සොම්නස්වීමට හේතුනම්, යහපත් අරමුණක් ඇතිබවය, ශ්‍රද්ධාව බහුලබවය; පිරිසුදු දෘෂ්ටි ඇතිබවය, අනුසස් දක්නාබවය, ප්‍රීතිසම්බොධ්‍යාඞ්ගය ඉපදීම පිණිස පවත්නා බුද්ධානුස්මෘතිය, ධර්මානුස්මෘතිය, සඞ්ඝානුස්මෘතිය, සීලානුස්මෘතිය, ත්‍යාගානුස්මෘතිය, දෙවතානුස්මෘතිය, උපසමානුස්මෘතිය, රූක්ෂපුද්ගලයන් දුරලීමය, සිනිඳු පුද්ගලයන් සෙවනය කිරීමය, පැහැදියයුතු සූත්‍රාන්තයන් ප්‍රත්‍යවෙක්ෂා කිරීමය, ප්‍රීතිසම්බොධ්‍යඞ්ගයෙහි නැමී පවත්නා බවය, නොගැඹුරු ස්වභාව ඇතිබවය, සොම්නස් සිතින් ප්‍රතිසන්ධිය ගැණීමය යන මොව්හුයි. එහෙයින් කියනලදී.

**1 “ඉට්ඨාරම්මණතා සද්ධා-බාහුල්ලං දිට්ඨිසුද්ධිච**
**ඵලදස්සාවිතාචෙව-පීතිබොජ්ඣඞ්ග හෙතුයො**
**2 එකාදස තථාධම්මා අගම්භීර සභාවතා**
**සොමනස්සයුතාසන්ධි ඉච්චෙතෙ සුඛහෙතුයො”යි**

මේ ගාථා දෙක පාඩම්කොට සිත තබාගතයුතුයි.

උපෙක්ෂාවීමට හෙතුනම්, සොම්නස් හෙතුන්ගේ අභාවය මධ්‍යස්ථ අරමුණක්වීම, ගම්භීර ස්වභාව ඇතිබවය, උපෙක්ෂා සිත සිත් ප්‍රතිසන්ධි ගත්බවය යන මොව්හුයි. එහෙයින් කියනලදී.

**“අභාවො සුඛහෙතූනං මජ්ඣත්තාරම්මණම්පිච**
**ගම්භීරතානුපෙක්ඛා සන්ධුපෙක්ඛාය හෙතුයි”යි**

ඥානසම්ප්‍රයුක්තවීමට හෙතු නම්, නිරවද්‍ය ක්‍රියා ඇති බවය, ව්‍යාපාද රහිත රූප බ්‍රහ්ම ලොකයෙහි ඉපදීමය, ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන්ගේ මුහුකිරීමය, කෙලශයන්ගේ සංසිඳීමය, හාත්පසින් බැස විචාරණ බවය, ආධ්‍යාත්මික බාහිර වස්තූන්ගේ නිර්මල බව කිරීමය, ඉඳුරන්ගේ සමබව පිළියෙල කිරීමය, දුෂ්ප්‍රාඥ පුද්ගලයන් දුරු කිරීමය, පැණවත් පුද්ගලයන් සෙවනය කිරීමය, ගැඹුරුවූ ඥානයෙන් අවබොධ කටයුතුවූ සූත්‍රාන්තයන් ප්‍රත්‍යවෙක්ෂා කිරීමය, ප්‍රඥාවෙහි නැමුනු බවය, බුද්ධාදි ගුණානුස්මරණය කිරීම් බවය, සප්‍රාඥ ප්‍රතිසන්ධිකයෙක් බවය යන මොව්හුයි. එහෙයින් කියනලදී.

“කම්මූපපත්තිතො චෙව තථා ඉන්ද්‍රිය පාකතො
කිලෙසූප සමාධම්ම විචයස්සච හෙතුහි
සන්තධම්මෙහි බුද්ධාදි ගුණානුස්සරණෙනච
සප්පඤ්ඤ සන්ධිතොචෙව චිත්තං ඤාණයුතං සියා”යි

අසංස්කාරිකවීමට හෙතුනම්, සප්පායවූ හෙවත් කාය චිත්තයන්ගේ නොගිලන් බවට අනුකූලවූ සෘතුභොජන ආවාසාදී ප්‍රත්‍යයන් කාරණකොට ගෙන වෙයි. යනුයි. එහෙයින් කියනලදී.

“උතුභොජන ආවාස සප්පායාදීහි හෙතුහි
අසඞ්ඛාරික භාවොපි විඤ්ඤාතබ්බො විභාවිනා”යි

මොවුන් අතුරෙන් පස්වන චිත්තය අතිශයින් බලවත් බව හා සතරවන චිත්තය ඉතා දුර්වල බවද දතයුත්තේයි. “ඉමානි අට්ඨපි කාමාවචර කුසල චිත්තානි නාම” යනු නිගමනයයි අට්ඨපි යන මෙහි අපි ශබ්දය අවුත්තසම්පිණ්ඩනාර්ථයි

“කමෙන පුඤ්ඤවත්ථූහි ගොචරාධිපතීහිච
කම්මහීනාදිතොචෙව ගණෙය්‍ය නයතො විදූ”

යනුවෙන් දානාදි දශපුණ්‍යක්‍රියා වස්තූන්ගේ වශයෙන්ද රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම යන ෂඩාලම්බනයන්ගේ වශයෙන්ද ඡන්ද, චිත්ත, විරිය, වීමංස යන සතර අධිපතීන්ගේ වශයෙන්ද කායකර්ම, වචීකර්ම, මනොකර්ම යන ත්‍රිවිධ කර්මයන්ගේ වශයෙන්ද හීන, මධ්‍යම, ප්‍රණීත යන හීන ත්‍රිකයාගේ වශයෙන්ද මේ කාමාවචර කුශල චිත්තයන්ගේ ප්‍රභෙදයෝ දක්වනලදහ. කෙසේද යත්? දශ පුණ්‍යක්‍රියාවන් අතුරෙන් එකෙකි පුණ්‍යක්‍රියාවෙක්හි කුසල් සිත් අට අට බැගින් ලැබීමෙන් දශ පුණ්‍යක්‍රියායෙහි(80) චිත්ත කෙනෙක් වෙති. ඔව්හු රූපාදි අරමුණු සය අතුරෙන් එකෙකි අරමුණෙක්හි (80) බැගින් අරමුණු සයට සගුණකරත

ලද්දාහු චිත්තයෝ 480 දෙනෙක් වෙති. මොවුන් අතුරෙන් 240 ක් සිත් ඥානසම්ප්‍රයුක්ත වෙති. ඉතුරු 240 දෙන ඥානවිප්‍රයුක්ත වෙති. එයින් ඥානවිප්‍රයුක්ත චිත්තයෝ විමංසාධිපතිය හැර ඡන්දාධිපති, චිත්තාධිපති, විරියාධිපති යන තුන අතුරෙන් එකෙකි අධිපති යෙනි 240 බැගින් තුන් ගුණ කරණ ලද්දාහු චිත්තයෝ (720) ක් වෙති. ඥානසම්ප්‍රයුක්ත චිත්තයෝ සතර අධිපතීන්ගේම වශයෙන් එකෙක්හි 240 බැගින් සතර ගුණ කරන ලද්දාහු (960) ක් වෙති. කියනලද 720 ද 930 ද සංග්‍රහ කළකල්හි සිත් 1680 ක් වෙති. ඔව්හු කායකර්ම වචීකර්ම මනෝකර්මයන් අතුරෙන් එකෙකි. කර්මයෙක්හි 1680 බැගින් තුන්ගුණ කරනලද්දාහු 5040 ක් සිත් වෙති ඔව්හු හීන මධ්‍යම ප්‍රණීත භෙදයෙන් තුන් ගුණ කරනලද්දාහු 15120 ක් සිත් වෙති. කාලදෙශාදි භෙදයෙන් ප්‍රමාණ නැත. කාමාවචර කුසල නිගමනයෙහි දක්වනලද කුශල ශබ්දය වර්ණනා කටයුතු ශබ්දයකි. එහෙයින් මෙහි වචනාර්ථය වර්ණනා කරනු කැමති අර්ථකථාචාර්යයන් වහන්සේ **"කුච්ඡිතෙ පාපකෙ ධම්මෙ සලයන්ති චලයන්ති කම්පෙන්ති විද්ධංසෙන්තීති කුසලා"** යිති. තේරුම නම්, යම් චිත්තකෙනෙක් ලාමකවූ පාප ධර්මයන් තදඞ්ග ප්‍රහාණ වශයෙන් සොලවත්ද විෂ්කම්භන ප්‍රහාණ වශයෙන් කම්පා කෙරෙත්ද සමුච්ඡෙද ප්‍රහාණ වශයෙන් විනාශ කෙරෙත්ද එසේ හෙයින් ඒ චිත්තයෝ කුසල නම් වෙති යනුයි. **"පුරිමස්ස පුරිමස්ස පච්ඡිමං පච්ඡිමං අත්ථවචනං"** යනු පරිභාෂා හෙයින් පශ්චිම පශ්චිම පදය පූර්ව පූර්ව පදයාගේ අර්ථ වර්ණනාවයයි දතයුතුයි. එහෙයින් "සලයන්ති" යනමෙහි සල ධාතුවගේ චලනාර්ථය දක්වනු පිණිස චලයන්ති කියාද "චලයන්ති" යනමෙහි චල ධාතුවගේ කම්පනාර්ථය දක්වනු පිණිස කම්පෙන්ති කියාද "කම්පෙන්ති" යනමෙහි කම්ප ධාතුවගේ විධ්වංසනාර්ථය දක්වනු පිණිස විද්ධංසෙන්ති කියාද වර්ණනා කරණලදී.

කුසලයන් පිළිබඳ පහකිරීම් තුන් ආකාරයි. එනම් තදඞ්ග ප්‍රහාණය විෂ්කම්භන ප්‍රහාණය, සමුච්ඡෙද ප්‍රහාණය යන මොව්හුයි. ඒ ප්‍රහාණයෝ තිදෙන උපමා වශයෙන් දක්වනු ලැබෙත්. දිය පරඬලා ආදීයෙන් ගැවසීගත්තාවූ එක්තරා ජලාශයකට වතුර ගනු පිණිස ගියාවූ පුරුෂයෙක් කලයෙන් ජලය සොලවා දිය පරඬලාදිය ඉවත්කොට වතුර ගන්නාකල තාවකාලික වශයෙන් දිය පරඬලාදිය ඉවත්වන්නාක්මෙන්ම

කාමාවචර කුසල බලයෙන් තාවකාලික වශයෙන් අකුසල
යන්ගේ පහකිරීම දතයුතුයි. තවත් පුරුෂයෙක් ඒ ජලාශ
යෙන් වතුර ගණු පිණිස ගොස් එහිවූ දිය පරඬලා එක් රැස්
කොට දැම්මාක්මෙන්ම රූපාරූප කුසල බලයෙන් කලකට
අකුසලයන් පහකිරීම විෂ්කම්භණ ප්‍රහාණයයි දතයුතු. තවත්
පුරුෂයෙක් වතුර ගණු පිණිස ඒ ජලාශයකරා ගොස් සියළු
පරඬලාදිය මුලින් උදුරා ගිනි තැබුවාක්මෙන් මාර්ගකුසල සිතින්
අකුසලයන් සම්පූර්ණයෙන් පහකිරීම සමුච්ඡේද ප්‍රහාණයයි
දතයුතුයි. වරද සහිත ධර්මයන්ට විරුඩ හෙයින් කුසලය
නිරවද්‍ය බව ලක්ෂණකොට ඇත්තේය. පිරිසිදු බව කෘත්‍යකොට
ඇත්තේය. සැප විපාක ඇති බව ඥානයට වැටහීම්කොට
ඇත්තේය. නුවනින් මෙනෙහි කිරීම ආසන්න කාරණාකොට
ඇත්තේය. පටිප්පස්සද්ධි ප්‍රහාණය හා නිස්සරණ ප්‍රහාණය යන
මොව්හු කුසලයන් පිළිබඳ ප්‍රහාණයෝ නොවෙත්.

සෝමනස්ස සහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකමෙකං
සසඞ්ඛාරිකමෙකං යන මෙහි අදහස මෙසේයි. ලෝකයෙහි යම්
කිසිවෙක් මල්පූජාකරණු පිණිස විහාරයට ගොස් එහි පිළිම
වහන්සේ දැක ඇතිවූ පැහැදීම සෝමනස්සයයි ලොව්තුරා සර්වඥ
යන්වහන්සේගේ අචින්තනීය ගුණ සලකා විපාක සැලකීම
ඥානසම්ප්‍රයුක්ත නම්වේ. කුඩාදරුවෝ භික්ෂූන් දැක වැඳීම අසඞ්ඛා
රිකයි. දෙමව්පියන් විසින් කියා වැඳීම සසඞ්ඛාරිකයි. කර්ම
කර්මඵල අදහාගනු නොහැකිවීම ඤාණවිප්පයුත්ත නම්වේ. සෙසු
තන්හිද මේ නයින් දතයුතුයි. මේ කාමාවචර කුසලයට මහා
කුසලයයි ව්‍යවහාර කෙරෙන්. උතුම්වූ ගුණමහත්වයෙන් මහත්වූ
රූපාවචර අරූපාවචර ලෝකෝත්තර කුසලයන්ට මහාකුසල්
යයි නොදක්වා මේ කාමාවචර කුසලයට මහාකුසලයයි කුමක්
හෙයින් දක්වනලද්දේද? විපාකබොහෝ ලැබෙන හෙයින් එසේ
කියන ලදී. හේ විස්තරකොට දක්වනු ලැබේ. රූපාවචර කුසලය
වනාහි ඒ කුසලයට අයිති භූමියෙහිම විපාකදිය හැකිවෙයි.
හෙවත් ප්‍රථමධ්‍යාන කුසලාදිය ප්‍රථමධ්‍යානාදි භූමියෙහිම විපාක
දෙයි. අරූපාවචර කුසලයෝ සතරදෙන තමතමන්ට නියතවූ
එක එක භූමියෙහි විපාක දෙයි. ලෝකෝත්තර කුසල චිත්ත
යෝ සතරදෙනද තමතමන්ගේ විපාකයවූ එකෙකි විපාක
යෙක්ම උපදවයි. මෙසේ විපාක දෙන හෙයින් රූපාවචර අරූ
පාවචර ලෝකෝත්තර කුසලයන්ට මහා කුසල්යයි ව්‍යවහාර

නොකෙරෙත්. මේ කාමාවචර කුසලය වනාහි එසේ නොවෙයි. ප්‍රතිසන්ධි වශයෙන් කාමාවචර විපාකයෝ නවදෙන සප්තකාම භූමියෙහි ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති වශයෙන් උපදිති. සප්තකාම භූමියෙහිම නොව ප්‍රවෘත්ති විපාක වශයෙන් එක්තිස් භූමියෙහිම ප්‍රවෘත්ති විපාකය උපදවයි. එහෙයින්ම මේ කාමාවචර කුසලය මනුෂ්‍ය ලෝකයෙහි චක්‍රවර්තිරාජ්‍ය සම්පත්තිය එකරාජ සම්පත්තිය ක්ෂත්‍රිය මහාසාර බ්‍රාහ්මණ මහාසාර ගෘහපති මහාසාරාදි මාණ්ඩලික රාජසම්පත්තිය ප්‍රදෙශ රාජසම්පත්තිය අනෙකප්‍රකාරාදී කාමසම්පත්තිය ඒ මේ කාමාවචර කුසලයක්හට ලැබිය යුත්තේයි. මෙසේ කාමාවචර කුසලය වනාහි විපාකදීම් වශයෙන් විසය මහත්වයෙන් මහත්වෙයි. එහෙයින් මහාකුසලයයි ව්‍යවහාර කෙරෙත්.

හෙතුභූතවූ කුසලයන්ට අනතුරුව විපාක චිත්තය දක්වනු කැමති අනුරුද්ධාචාර්‍ය්‍ය මාහිමියෝ "සොමනස්ස සහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකමෙකං සසඞ්ඛාරිකමෙකං" යනාදිය කීහ.

1 සොම්නස් සහගත ඥානසම්ප්‍රයුක්ත අසංස්කාරික සිතය
2 සොම්නස් සහගත ඥානසම්ප්‍රයුක්ත සසංස්කාරික සිතය
3 සොම්නස් සහගත ඥාන විප්‍රයුක්ත අසංස්කාරික සිතය
4 සොම්නස් සහගත ඥාන විප්‍රයුක්ත සසංස්කාරික සිතය
5 උපෙක්ෂා සහගත ඥානසම්ප්‍රයුක්ත අසංස්කාරික සිතය
6 උපෙක්ෂා සහගත ඥානසම්ප්‍රයුක්ත සසංස්කාරික සිතය
7 උපෙක්ෂා සහගත ඥාන විප්‍රයුක්ත අසංස්කාරික සිතය
8 උපෙක්ෂා සහගත ඥාන විප්‍රයුක්ත සසංස්කාරික සිතය

යන මේ අටදෙන සහෙතුක කාමාවචර විපාක සිත් නම් වේ.

**"ඉමානි අට්ඨපි සහෙතුක කාමාවචර විපාකචිත්තානි නාම"** යනු නිගමන වාක්‍යයයි. අට්ඨපි යන්නෙහි "අපි" ශබ්දය අවුත්ත සම්පිණ්ඩනාර්ථයි. මේ කාමාවචර විපාක සිත් 8 දෙන රූපාදී ආරම්මණයෙන් වැඩිකළ කල්හි 48 ක් චිත්තයෝ වෙති. ඔව්නුත්ත මධ්‍යම ප්‍රණීත යන හිතත්‍රයෙන් වැඩිකළ කල්හි 144 ක් චිත්තයෝ වෙති. විපාකචිත්තයෝ දානාදී දශපුණ්‍යක්‍රියා වස්තූන්ගේ වශයෙන්ද අධිපතීන්ගේ වශයෙන්ද කාය කර්මාදීන්ගේ වශයෙන්ද නොපවතිත්. එහෙයින් ඔවුන්ගේ වශයෙන් ගණින් වැඩිකිරීමෙක් නොමැත්තේයි. **අඤ්ඤමඤ්ඤවිසදිසානං කුසලාකුසලානං පාකාති විපාකා"** යනු නිර්වචන හෙයින් ඔවුනොවුන්ට අසමානවූ කුසලාකුසලයන්ගේ පාකයෝ විපාක නම්

වෙති. මේ කාමාවචර විපාකයට මහාවිපාකයයි ව්‍යවහාර කොරෙත්. රූපාවචර අරූපාවචර ලොකොත්තර විපාකයන්ට මහා විපාකයයි නොදක්වා මේ කාමාවචර විපාකයට කුමක් හෙයින් මහාවිපාකයයි ව්‍යවහාර කරණලද්දේද? කාමාවචර විපාකය වනාහි මහාකුසලයන්ගේ විපාකය බැවින් හෙතුහුගේ නාමය ඵලයෙහි ආරොපනයකොට කාරණූපචාර වශයෙන් මහාවිපාකයයි කියනලදී. තදනන්තරව ක්‍රියාචිත්තය දක්වනු කැමති අනුරුද්ධාචාර්‍ය්‍ය ස්වාමීයෝ “සොමනස්ස සහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකමෙකං සසඞ්ඛාරිකමෙකං”යනාදිය කීහ.

1 සොම්නස් සහගත ඥානසම්ප්‍රයුක්ත අසංස්කාරික සිතය
2 සොම්නස් සහගත ඥානසම්ප්‍රයුක්ත සසංස්කාරික සිතය
3 සොම්නස් සහගත ඥාන විප්‍රයුක්ත අසංස්කාරික සිතය
4 සොම්නස් සහගත ඥාන විප්‍රයුක්ත සසංස්කාරික සිතය
5 උපෙක්ෂා සහගත ඥානසම්ප්‍රයුක්ත අසංස්කාරික සිතය
6 උපෙක්ෂා සහගත ඥානසම්ප්‍රයුක්ත සසංස්කාරික සිතය
7 උපෙක්ෂා සහගත ඥාන විප්‍රයුක්ත අසංස්කාරික සිතය
8 උපෙක්ෂා සහගත ඥාන විප්‍රයුක්ත සසංස්කාරික සිතය

යන මේ අටදෙන සහෙතුක කාමාවචර ක්‍රියා සිත් නම් වේ.

**“කරණමත්තා කිරියා”**යනු නිර්වචන හෙයින් බුදුපසේබුදු මහරහතන්වහන්සේලා ගිලන් උපස්ථානාදිය කරණකල උපදින කුසල්සිත් විපාක දෙනයක් නොලැබෙන හෙයින් කිරීම්මාත්‍රයම ක්‍රියා නම් “කිරියා එවචිත්තං කිරියා චිත්තං” ක්‍රියාවම සිත්වූයේනුයි ක්‍රියාචිත්ත නම්වෙයි. මේ ක්‍රියාසිත් වනාහි බුදුපසේබුදු මහරහතන්වහන්සේලාගේ සතන්හි උපදින බවත් ඔවුන්ගේ විපාකදෙනයක් නොමැති බවත් දතයුතුයි. මේ කාමාවචර ක්‍රියාසිත්වලට මහාක්‍රියායයි ව්‍යවහාර කෙරෙත්. මහාක්‍රියාචිත්තය වනාහී වට්ටූපච්ඡේදයකලාවූ රහතුන් කෙරෙහි උපදනා බැවින් මහාක්‍රියායයි ව්‍යවහාරකලේ නමුදු ඒ චිත්තයෝම පෘථග්ජන ශෛක්ෂ සන්තානයෙහිම උපදනාහුවීනම් ඒකාන්තයෙන් විපාක දියයුත්තේය. එහෙයින් මහා කුසලයන්ට බඳු හෙයින් මහාක්‍රියායයි ව්‍යවහාරකරනලදී. ක්‍රියාචිත්තයෝ සහෙතුක අහෙතුකයයි විප්‍රකාරයහ.

ඔවුන්ගේ ප්‍රභෙදය මේ කියනු ලබන උපමායෙන් දතයුතු බොහෝවූ ඵලහට ගන්නාවූද ඵලහට නොගන්නාවූද පුෂ්ප ඇති එක්තරා ලබු වැලක් ඇත. එහි මුල් කපන ලද්දහු නම්

අනාගතයට හටගනු ලබන ඵල නොමහට ගනීත්. එනිවූ මොස පුෂ්ප මුල් නොකපන ලද්දාහු නමුදු ඵල නොමහට ගනීත්. මෙයින් කුමක් කියන ලද්දේද? සහෙතුක ක්‍රියා චිත්තයෝ ඵල හටගන්නා පුෂ්පමෙන් පෘථග්ජන ශෛක්ෂ සන්තානයෙහි විපාක දෙන්නේය. අහෙතුක ක්‍රියා චිත්තයෝ නොමසුන් මුල් ඇති වැලෙහි හටගන්නාවූ මොස පුෂ්පය ඵල නොදෙන්නාක්මෙන් විපාක නොදෙන්නේය. නිරනුශය සන්තානකවත් රහත්නට සහෙතුක ක්‍රියා සිත් පවත්නා හෙයින් කපනලද වැලෙහි පුෂ්පය ඵල නොදෙන්නාක්මෙන් විපාක නොදෙයි. ආසෙවන ප්‍රත්‍යය රහිතවූ ආවජ්ජනද්වය සානුශය සන්තානයෙහි පවත්නේ නමුදු විපාක නොදේ.

එහෙයින් කීහු පෞරාණිකයෝ

1. **"සහෙතු රූපාරූපාච සබ්බපුඤ්ඤංවා රහතෝ**
   **වුත්තියා නඵලෙ පුප්ඵං යථා ජිණ්ණලතා ඵලං"**
2. **අනාසෙවනසා වජ්ජමයං පොථුජ්ජනස්සහි**
   **නඵලෙ වත්තමානම්පි මොඝ පුප්ඵං ඵලං යථා"** යි

මෙසේ අෂ්ට විධ කුශල විපාක ක්‍රියා චිත්තයන් දක්වා දූන් ඒ සියළු සිත් සැකෙවින් දක්වනු සඳහා "ඉච්චෙවං" ඉත්‍යාදිය කීහු. කාමාවචර විපාක ක්‍රියාවලදී සහෙතුක ශබ්දය යෙදීමටත් කුසලයෙහි නොයෙදීමටත් හෙතු කවරේද? කුසලය තමා නියම වශයෙන් සහෙතුක හෙයිනි. ඒ මේ පදය ශඨාලාන වශයෙන් කියනලදී. සහෙතුක විපාක ක්‍රියා දෙවගෙහි අහෙතුක වත් යෙදේ. කාමාවචර කුසල් සිත් අටදෙන එසේ නොයෙදේ.

**වෙදනා ඤාණ සංඛාර භෙදෙන චතුවීසති**
**සහෙතු කාමාවචර පුඤ්ඤපාක ක්‍රියා මතා**

මෙසේ කියනලද කුසල් සිත් 8 ය, විපාක සිත් 8 ය, ක්‍රියා සිත් 8 ය, යන කාම සිත් (24) ශ්‍රද්ධා ස්මෘති හිරි ඔත්තප්පාදී ශොභන චෛතසික ධර්මයන් හා යෙදෙන හෙයින් "ශොභන" සිත් යයි ව්‍යවහාර කරනු ලැබේත්.

මෙහි වෙදනා භෙදයෙන්

සොම්නස් සහගත සිත් 12 ය. උපෙක්ෂා සහගත සිත් 12 ය යන දෙකොටස පිඩුකලවිට කාම ශොභන සිත් (24) කී

සම්ප්‍රයොග විප්‍රයොග භෙදයෙන්

සම්ප්‍රයුක්ත සිත් 12 ය, විප්‍රයුක්ත සිත් 12 ය, යන දෙකොටස පිඩුකලවිටද කාම ශොභන සිත් (24) කී.

අසංස්කාරික සසංස්කාරික භෙදයෙන්

අසංස්කාරික සිත් 12 ය, සසංස්කාරික සිත් 12 ය යන දෙකොටස පිඩුකල විට්ද කාම ශොභන සිත් (24) කි.

යුග වශයෙන්

පළමුවන දෙවන සිත්දෙක (2) පළමුවන යුගනම්වේ. තුන්වන සතරවන සිත්දෙක (2) දෙවන යුගය නම්වේ. පස්වන සවන සිත් දෙක (2) තුන්වන යුගය නම්වේ. සත්වන අටවන සිත් දෙක (2) සතරවන යුගය නම්වේ මෙසේ කුසල විපාක ක්‍රියා යන තුන්කොට්සෙහිම යුග සතර බැගින් ලැබෙන හෙයින් කාම ශොභන සිත් (24) හි යුග දොළොසක් (12) වන් නාහුය.

කාම ශොභන සිත් 24 නිමි.

මෙසේ කියනලද කාමශොභන සිත් (24) හා යට කියනලද අශොභන සිත් (30) යන කාමාවචර සිත් (54) හි අකුසල් සිත් (12) කි. කුසල් සිත් (8) කි. විපාක සිත් (23) කි. ක්‍රියා සිත් (11) කි. මේ සතර කොටස පිඩුකල කල්හි කාමාවචර සිත් (54) සම්පූණීවේ.

**කාමෙ තෙවීස පාකානි, පුඤ්ඤාපුඤ්ඤානි වීසති,**
**එකාදස ක්‍රියාචෙති, චතුපඤ්ඤාස සබ්බථා.**

මෙතෙකින් කාම සිතේ විස්තර කියා නිමවනලදී.

කාමාවචර උද්දෙසයාගේ නිර්දේශය දක්වා තදනන්තරවැ සැකෙවින් කියනලද රූපාවචර චිත්තයාගේ විස්තාරක්‍රමය පැමිණියෙන් ධ්‍යානාඞ්ගයොග භෙදයෙන් පස්පරිද්දකින් බෙදා දක්වනු පිණිස විතක්ක—පෙ—සහිතං යනාදිය කීහු.

1. විතර්ක විචාර ප්‍රීති සුඛ එකාග්‍රතාසහිත ප්‍රථමධ්‍යාන කුශල සිතය.
2. විචාර ප්‍රීති සුඛ එකාග්‍රතා සහිත ද්විතීයධ්‍යාන කුසල සිතය.
3. ප්‍රීති සුඛ එකාග්‍රතා සහිත තෘතීය ධ්‍යාන කුශල සිතය.
4. සුඛ එකාග්‍රතා සහිත චතුර්ථධ්‍යාන කුශල සිතය.
5. උපෙක්ෂා එකාග්‍රතා සහිත පඤ්චමධ්‍යාන කුශල සිතය

යනමේ පස්දෙන රූපාවචර කුසල් සිත් නම්වේ. ඔවුන් අතුරෙන් යම් සවභාවයෙක් චිත්ත චෛතසික ධර්මයන් අරමුණට නන්වයිද ඒ අර්ථයෙන් විතර්ක නම්වේ. පිට්සර ගම්වැසි තෙම රජ මාලිගාව දක්නට යාමමෙනි. නුපුරුදු පිට්සර ගම්

වැසිතෙම රජ මාලිගාව දැකීමෙහි ආසාවෙන් පුරුදු මුරකරුවාත් කැටුව ගොස් රජ මාලිගාව දුටුයේය. මෙහි පිටිසර ගම්වැසියාමෙන් චිත්ත චෛතසික ධර්මද මුරකරුවාමෙන් විතර්කයද රජ මාලිගාවමෙන් ධ්‍යානයද උපමා උපමෙය වශයෙන් දතයුතුයි. ඒ විතර්කය විසින් තන්වනලද චිත්ත චෛතසික ධර්මයන් හැසිරවීම පිරිමැදීම් සවභාවය විචාරනම්වේ. මොවුන් අතුරෙන් විතර්කය යම් කිසි රථයකට බඳු දමන්නාමෙන්ද විචාරය එය පෙරලන්නා තැන්පත් කරන්නාමෙන්ද දත යුතුයි. ආරම්මණරසයෙහි චිත්ත චෛතසික ධර්මයන් පිණවීම් සවභාවය ප්‍රීති නම්වේ අරමුණෙහි සම්ප්‍රයුක්ත ධර්මයන් සුව පහස් විඳීම් සවභාවය සුඛ නාම්වේ නා නා රම්මණයන්හි වික්ෂෙපභාවයෙන් වෙනස්ව එකම අරමුණෙහි සම්ප්‍රයුක්ත ධර්මයන් එකඟ කිරීම් සවභාවය ඒකාග්‍රතා නම්වේ. දෙශනා ක්‍රමයෙන් හෝ පළමුකොට පැමිණියයුතු ධ්‍යානය බැවින් හෝ ප්‍රථම නම්වෙයි. පළමුකොට සමවැදිය යුතු හෙයින්ද ප්‍රථම නම් වේයයිද කියත්. මෙහි කියනලද විතර්කාදි අඞ්ග පසින් යුක්තව පළමුකොට උපදින සිත ප්‍රථමධ්‍යාන සිත නම්වේ. එයින් පළමුවන අඞ්ගය හැර ඉතිරි සතර අඞ්ගයෙන් යුක්තව දෙවනුව උපදින සිත ද්විතීයධ්‍යාන සිත නම්වේ. පළමුවන දෙවන අඞ්ග දෙක හැර ඉතිරි අඞ්ග තුණෙන් යුක්තව තෙවනුව උපදින සිත තෘතීය ධ්‍යාන සිත නම්වේ. පළමුවන දෙවන තුන්වන අඞ්ගත්‍රය හැර ඉතිරි අඞ්ග දෙකින් යුක්තව සතර වෙනුව උපදින සිත චතුර්ථධ්‍යාන සිත නම්වේ. උපෙක්ෂාව හා ඒකාග්‍රතාව යන අඞ්ග දෙකින් යුක්තව පස්වෙනුව උපදින සිත පඤ්චමධ්‍යාන සිත නම්වේ. (මේ පඤ්චමධ්‍යාන චිත්තයෙහි සුඛ වේදනාව නොයෙදී ඒ වෙනුවට උපෙක්ෂා වේදනාව යෙදෙන බව දතයුතුයි.) යම්සේ රෝද තට්ටු අමරාවිය ඒරියකඳ ආදී අවයව සමූහයට රථයයි ව්‍යවහාර කරන්නාක්මෙන්ම විතර්කය, විචාරය, ප්‍රීතිය, සුඛය, ඒකාග්‍රතාය යන ධර්ම සමූහයට ධ්‍යානයයි ව්‍යවහාර කරණබව දතයුතු මේ රූපාවචර ධ්‍යානයෝ කුමක අර්ථයකින් ධ්‍යාන නම් වන්නාහුද? "ආරම්මණං උපගන්ත්වා ඣායත් උපනිජ්ඣායතීති ඣානං, පච්චනීකධම්මේ ඣාපෙතීතිවා ඣානං" යනු නිර්වචන හෙයින් යම් සවභාව ධර්මයෙක් කසිණාදී අරමුණුකරා එළඹ ඒ කසිණාදි අරමුණු චින්තනය කරයිද එසේ හෙයින් ඒ සවභාව ධර්මය ධ්‍යාන නම්වේ. නො

හොත් යම් ස්වභාව ධර්මයෙක් කාමච්ඡන්දාදීවූ ප්‍රතිවිරුද්ධ ධර්මයන් දවයිද එසේ හෙයින් ඒ ස්වභාව ධර්මය ධ්‍යාන නම්වේ. මේ විවිධ අර්ථයන්හි ඒකාග්‍රතා තොමෝම සාතිශයින් යොග්‍යයයි දතයුත්තීය. ඒ ඒකාග්‍රතා තොමෝ එක් ස්වභාවයක් ඇති ආරම්මණයයි කියනලද එක් කොණක් නොහොත් එක් කොටසක් ඒ ධර්මයහට ඇත්තේය යන අර්ථයෙන් ඒකග්ගතයයි කියනලද චිත්තයාගේ එසේ ඒකාග්‍රතාව පැවැත්මෙහි අධිපති ගුණය හා යෙදීමෙන් ඒකාග්‍රතායයි කියනු ලැබේ. ඒ ඒකාග්‍රතාවම චිත්තයනාන් අරමුණෙහි විසිරයන්ට නොදී එකම අරමුණෙක්හි ප්‍රතිපක්ෂ ධර්මයන්ගේ දුරුවූ හෙයින් මොනවටද පිහිටුවයි. ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන්ගේද සමබවකොට ඒ අරමුණෙහිම ලීන උද්ධච්චයන්ගේ අභාවයට පැමිණවීමෙන් සමවද තබයි. යන අර්ථයෙන් මේ ඒකාග්‍රතාව සමාධියයිද කියනු ලැබේ. පෙළෙහි වනාහි ඒකාග්‍රතාවම අවික්ඛෙපයයිද අවිසාහාරයයිද සණ්ඨිතියයිද අවට්ඨිතියයිද දක්වනලදී. විතර්කාදීහුද ඒ ඒකාග්‍රතාවට අතිශයින් උපකාර ඇති බැවින් ධ්‍යානයයි කියනලදහ. ඒ එසේමැයි. විතර්කය තෙමේ සිත ථිනමිද්ධයාගේ වශයෙන් පසුබස්නට නොදී දැඩිව අරමුණට අභිමුඛ කෙරෙයි. ඒ එසේ මැයි. විතර්කය තෙමේ සිත අරමුණට අභිමුඛව නැංවීම ලක්ෂණකොට ඇත්තේය. හේ වනාහි ථිනමිද්ධ නීවරණයටද ඉඳුරාම විරුද්ධ ධර්මයකි. විචාරය තෙමේ සිත විචිකිච්ඡාවගේ වශයෙන් කම්පාවෙන්ට නොදී දැඩිව අරමුණෙහි ලුහුබැඳීම කෙරෙයි ඒ එසේ මැයි. විචාරය තෙමේ අරමුණෙහි සිත නැවත නැවත මැඩීම ලක්ෂණකොට ඇත්තේය. මෙය ප්‍රඥා ප්‍රතිරූපක ධර්මයකි විචාරය තෙමේ විචිකිච්ඡානීවරණයට ඉඳුරාම විරුද්ධ ධර්මයකි. ප්‍රීතියද සිත ව්‍යාපාදයාගේ වශයෙන් කලකිරෙන්ට නොදී අරමුණෙහි හාත්පස සන්තෘප්තවූවක්ම කෙරේ. ඒ එසේ මැයි. ප්‍රීතිතොමෝ අරමුණෙහි මොනවට ප්‍රිය කිරීම ලක්ෂණකොට ඇත්තීය. ප්‍රීතිය ව්‍යාපාදනීවරණයටද ඉඳුරාම විරුද්ධ ධර්මයකි එසේම සුඛයද ඒ සිත උද්ධච්චකුක්කුච්චයාගේ වශයෙන් නොසංසිඳෙන්ට නොදී අරමුණෙහි ලබනලද ආශ්වාද ඇති ධර්මයක් කොට වර්ධනය කෙරේ. ඒ එසේ මැයි සුඛය සැප ඇති බව ලක්ෂණකොට ඇත්තේය. මේ සුඛය උද්ධච්ච කුක්කුච්ච නීවරණයට ඉඳුරාම විරුද්ධ ධර්මයකැයි දතයුතු උපෙක්ෂාවද් ශාන්ත ස්වභාව ඇති බැවින් සුඛයෙහිම සංග්‍රහ කරනලදැයි

දතයුතුයි. මෙසේ අනුග්‍රහ කරන්නාවූ ඒ විතර්කාදී ධර්මයෝ ඒ
අරමුණෙහි චිත්තයාගේ මොනවට එකඟබව ඇති හෙයින්ද
වෙති. විතර්කාදී ධර්මයන් විසින් අනුග්‍රහ කරනලද ඒ එකාග්‍ර
තාවද මොනවට බලවත්වී තෙමේ කාමච්ඡන්දයාගේ වශයෙන්
නානාරම්මණයන්හි චිත්තයාගේ ඔබ්මොබ ධාවනය වළක්වා
කසිණ නිමිත්තාදිවූ ඒ අරමුණෙහි නිශ්චලව ඒ අරමුණකරා
එළඹ බලයි. එහෙයින් ඒ විතර්කාදි සියළු ධර්මයෝ එළඹ දක්නා
අර්ථයෙන්ද ධ්‍යානයයි කියනලදහ. ඒ විතර්කාදි ධර්මයන් එසේ
ස්වකීය ස්වකීය ලක්ෂණයෙන් පවත්නා කල්හි ඔවුන්ට
ප්‍රතිවිරුද්ධවූ නීවරණ ධර්මයෝ අවකාශ නොලැබ සිතෙහි
නැගිට ගන්ට නොහැකිවෙත්. ඔව්හු දවා භස්ම කරන ලද්දෝ
නාම්වෙති. එහෙයින් ඒ විතර්කාදී ධර්මයෝ ප්‍රතිවිරුද්ධ ධර්මයන්
දවන අර්ථයෙන්ද ධ්‍යානයයි කියනලදහ මේ රූපාවචර
කුසල චිත්තයෙහි කාමාවචර කුසල චිත්තයෙහිමෙන් සංස්
කාර භේදය කුමක් හෙයින් නොගන්නා ලද්දේද? මේ රූපා
වචර කුශල ධ්‍යානයද ඒකාන්තයෙන් සමථ භාවනාවෙහි
යෙදීම් වශයෙන් ලබන ලද්දේ සංස්කාරිකයයිද මාර්ගයට පැමි
ණීම වශයෙන් ලබන ලද්දේ අසංස්කාරිකයයිද කිවහැකිවේ.
මාර්ගාධිගම වශයෙන් ලබනලද ධ්‍යානයද පසු කාලයෙහි
පරිකර්ම වශයෙන්ම උපදින හෙයින් එසේ නොකියයුතුවේ.
කුමක් හෙයිනයත්, මාර්ගාධිගම වශයෙන් මාර්ග ධර්මයාගේ
ශක්තියෙන් ලබන ලද්දහුගේද මතු භාගයෙහි පරිකර්ම භාව
නා කිරීම් වශයෙන් උපදනා හෙයිනි. එසේ හෙයින් සියළුම
ධ්‍යානය පරිකර්ම භාවනා සඞ්ඛ්‍යාත පූර්වාභි සංස්කාරයෙන්
තොරව ඒ කාන්තයෙන් අධිකාරයාගේ වශයෙන් නූපදනා
හෙයින් අසංස්කාරිකය කියාද අධිකාරයෙන් වෙන්වූ ඒකාන්ත
යෙන් පරිකර්ම භාවනා සඞ්ඛ්‍යාත අභිසංස්කාරයාගේ වශයෙන්ම
නූපදනා හෙයින් සසංස්කාරිකය කියාද කිව නොහැකිවේ.
නොහොත් පූර්වාභිසංස්කාර වශයෙන්ම උපදනා ධ්‍යානයාගේ
කිසි කාලෙක අසංස්කාරික භාවයක් නොලැබේ. එහෙයින්
අසංස්කාරික කියාද ඒකාන්ත බවක් නැති හෙයින් සසංස්කාරි
කය කියාද නොකියන ලද්දේය. ලොව්තුරා සර්වඥයන්වහන්සේ
විසින් ධම්ම සඞ්ගණී ප්‍රකරණයෙහි චතුෂ්ක නය වශයෙන් වදාරා
තිබියදී මෙහි පඤ්චක නය වශයෙන් කුමක් හෙතුකොටගෙණ
කියනලද්දේද? චතුෂ්ක නය පඤ්චක නයෙහි ඇතුළත්වූ හෙයින්

එසේ කියත් ලද්දේය. එකම නයකින් නොවදාරා දෙවිධියකින් කුමක්හෙයින් වදාරන ලද්දේද? පුද්ගලාධ්‍යාශය වශයෙනි. මහා අවබෝධය ඇත්තවුන්ට චතුෂ්කනය වශයෙන්ද, මහා අවබෝධය නැත්තවුන්ට පඤ්චකනය වශයෙන්ද වදාරනලදී. "ඉමානි පඤ්චපි රූපාවචර කුසල චිත්තානි නාම" යනු නිගමන වාක්‍යයයි. පඤ්චපි යන මෙහි අපි ශබ්දය අවුත්ත සම්පිණ්ඩනාර්ථයි. චතුෂ්කක්‍රම සතරය පඤ්චකක්‍රම පසය යන නවයම ශුද්ධික නවකයයි කියනු ලැබේ. හේ වනාහි දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා දුක්ඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා සුඛා පටිපදා දන්ධාභිඤ්ඤා, සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා, යන සතර ප්‍රතිපදාවෙන් වැඩිවී සතර නවක කෙනෙක්වෙති. හේ ශුද්ධික නවකය වනාහි "පරිත්තං පරිත්තාරම්මණං, පරිත්තං අප්පමාණාරම්මණං, අප්පමාණං පරිත්තාරම්මණං අප්පමාණං අප්පමාණාරම්මණං, යන සතර ආරම්මණයෙන් වැඩිවී සතර නවක කෙනෙක්වෙති. මෙසේ ශුද්ධික නවකය, සතර ප්‍රතිපදානවකය, සතර ආරම්මණ නවකය, යන මොවුන්ගේ වශයෙන් නවකයෝ නව දෙනෙක්වෙති. මූලකී සතර ප්‍රතිපදා නවකය, සතර ආරම්මණ නවකයෙන් වැඩිවී සොළොස් නවක කෙනෙක්වෙති. මෙසේ ශුද්ධික නවකය, සතර ප්‍රතිපදා නවකය, සතර ආරම්මණ නවකය, සොළස නවකය යන සියල්ලම සංග්‍රහ කළකල්හි පස්විසි නවක කෙනෙක්වෙති. ඔවුනතුරෙන් එකෙකී නවකයෙක්හි චතුෂ්කනය පඤ්චකනය වශයෙන් නය දෙකක් දෙකක් බැගින් නය සමපණ්ණෙක්වෙති. එයින් පස්විසි නවකයෙහි චතුෂ්කනය වශයෙන් ධ්‍යාන චිත්තයෝ 100 ක්ද පඤ්චකනය වශයෙන් ධ්‍යාන චිත්තයෝ 125 ක් දැයි මෙසේ 225 ක් ධ්‍යාන චිත්තයෝවෙති. පඤ්චකනයෙහි චතුෂ්කනය ඇතුළත් හෙයින් අර්ථ වශයෙන් ධ්‍යාන චිත්තයෝ 125 දෙනෙක්වෙති

විතර්ක විචාර ප්‍රීති සුඛ ඒකාග්‍රතා සහිත ප්‍රථමධ්‍යාන විපාක සිත්ය.

විචාර ප්‍රීති සුඛ ඒකාග්‍රතා සහිත ද්විතීයධ්‍යාන විපාක සිතය

ප්‍රීති සුඛ ඒකාග්‍රතා සහිත තෘතීයද්ධ්‍යාන විපාක සිතය

සුඛ ඒකාග්‍රතා සහිත චතුර්ථද්ධ්‍යාන විපාක සිතය

උපෙක්ෂා ඒකාග්‍රතා සහිත පඤ්චමද්ධ්‍යාන විපාක සිතය

යනමේ පස්දෙන රූපාවචර විපාක සිත් නම්වේ.

විතර්කවිචාර ප්‍රීතිසුඛ ඒකාග්‍රතා සහිත ප්‍රථමධ්‍යාන ක්‍රියාසිතය

විචාර ප්‍රීති සුඛ ඒකාග්‍රතා සහිත විතීයධ්‍යාන ක්‍රියා සිතය
ප්‍රීති සුඛ ඒකාග්‍රතා සහිත තෘතීයධ්‍යාන ක්‍රියා සිතය
සුඛ ඒකාග්‍රතා සහිත චතුර්ථධ්‍යාන ක්‍රියා සිතය
උපෙක්ෂා ඒකාග්‍රතා සහිත පඤ්චමධ්‍යාන ක්‍රියා සිතය
යන මේ පස්දෙන රූපාවචර ක්‍රියා සිත් නම්වේ.

අභිඥාවට නොපැමිණි කාමකුසලය මඳුවූයේ දුර්වලවූයේ වේ. පරිත්තවූ දශීත ශ්‍රවණාදී නොයෙක් කෘත්‍ය ස්ථානයන්හිද හීනවූ ආත්ම භාවයන්හිද විපාකදේ. එහෙයින් ඒ කාමාවචර කුසලය තමා හා අසමාන විපාක නිපදවන්නේය අභිඥාවට පැමිණි මහද්ගත කුසලය වනාහි තියුණුවූයේ බලවත්වූයේවේ. මහත්වූ බ්‍රහ්මාත්ම භාවයෙහි භවඞ්ගස්ථානයන්හිම විපාකදේ. එහෙයින් මහද්ගත කුශලය සියළු කල්හිම තමා හා සමානවූම විපාක නිපදවන්නේය. එහෙයින්ම විතර්ක විචාර ප්‍රීති සුඛ ඒකාග්‍රතා සහිත ප්‍රථමධ්‍යාන විපාක සිතය යනාදි වශයෙන් විපාකයද සම්ප්‍රකාරයෙන් කුසලය හා සමානම වන්නේය. කුසලය ඊස්කල භවයට අනතුරු භවයෙහිම විපාක නිපදවන හෙයින් ඒ මහද්ගත කුශලය තමා හා සමානවූම විපාක නිපදවන්නේ යයිද කියත්. යම් හෙයකින් කුසලයම අනුශය රහිත ක්ෂීණාශ්‍රව සන්තානයෙහි පැවැත්තේ ක්‍රියාධ්‍යානය නම්වේද එහෙයින් ක්‍රියා චිත්තයද කුසලය හා සමාන මැයි දක්වයි.

**පඤ්චධාධ්‍යානභෙදෙන රූපාවචර මානසං**
**පුඤ්ඤපාකක්‍රියා භෙදා තංපඤ්චදසධා භවෙ**

මෙතෙකින් රූප සිතේ විස්තර කියා නිමවකලදී.

මෙසේ රූපාවචර චිත්තයාගේ විස්තරය දක්වා දැන් සැකෙවින් දක්වනලද අරූපාවචර චිත්තයාගේ විස්තරය දක්වනු පිණිස ආකාසානඤ්චායතන කුසල චිත්තං යනාදිය කීහු.

ආකාසානඤ්චායතන කුසල සිතය
විඤ්ඤාණඤ්චායතන කුසල සිතය
ආකිඤ්චඤ්ඤායතන කුසල සිතය
නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසල සිතය.
යන මේ සතරදෙන අරූපාවචර කුසල් සිත් නම් වේ.

ආකාසානඤ්චායතන විපාක සිතය
විඤ්ඤාණඤ්චායතන විපාක සිතය
ආකිඤ්චඤ්ඤායතන විපාක සිතය

නෙවසඤ්ඤානාසඤ්ඤායතන විපාක සිතය
යන මේ සතර දෙන අරූපාවචර විපාක සිත් නම් වේ.

ආකාසානඤ්චායතන ක්‍රියා සිතය
විඤ්ඤාණඤ්චායතන ක්‍රියා සිතය
ආකිඤ්චඤ්ඤායතන ක්‍රියා සිතය
නෙවසඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියා සිතය
යන මේ සතරදෙන අරූපාවචර ක්‍රියා සිත් නම් වේ.

මෙහි **"නාස්ස අන්තෝති අනන්තං"** ඒ ආකාස ප්‍රඥප්තියට විනාශයක් පරිච්ඡෙදයක් කෙළවරක් නැත්තේය. එසේ හෙයින් ඒ ආකාසය අනන්ත නම්වේ. මේ අර්ථ තිදෙනම මෙහි ලැබේ. මෙසේ ආකාශ ප්‍රඥප්තිය අනන්ත බැව් දතයුතුයි. **"නකසතී නවිලෙඛතී එසෝති ආකාසෝ"** සමක ලිවිය නොහැකිද ඉරිගැසිය නොහැකිද හේ ආකාස නම්වේ හේ වනාහි අජටාකාසය, පරිච්ඡින්නාකාසය, කසිණුග්ඝාටිමාකාසය, රූප පරිච්ඡෙදාකාසයයි චතුර්විධ වේ. එයින් ද්‍රව්‍ය වස්තු නැත්තාවූ නිරවුල් අහස අජටාකාශ නම්වේ. භවාග්‍රයේ පටන් එක එක ලෝකයක් පාසා මායිම්ව තිබෙන අහස පරිච්ඡින්නාකාශ නම්වේ කසිණ නිමිත්ත ඉක්මවා ලබනලද අහස කසිණුග්ඝාටිමාකාශය නම්වේ අටවිසි රූපයන්ගේ එකක් හා එකක් අතර පිහිටි අහස රූප පරිච්ඡෙදාකාශ නම්වේ. එයින් මෙහි කසිණුග්ඝාටිමාකාශය අභිප්‍රේතයි. හේ කිසුණු ඉගුළු අහස අතරක් නැත්තාවූ අජටාකාශය හා එක්වූවාක් මෙන් වේ. යෝගීහු විසින්ද අනන්තබවයෙන් භාවනා සිත් පතුරුවනු ලැබේ. එහෙයින් මේ කිසිණු ඉගුළු අහස අතරක් නැත්තේනුයි. ආකාසානන්ත නම්වේ. මෙයින් කිසිණු ඉගුළු අහස කියන ලද්දේයි. මෙහි අනන්ත බව වනාහි උත්පාදන්තවයාන්ත නැති හෙයින් හෝ අනන්තයයි මෙනෙහි කිරීම් වශයෙන් හෝ දතයුත්තීය. ඒ එසේ මැයි මේ ආකාශ ප්‍රඥප්තිහුගේ උත්පාදාන්ත සංඛ්‍යාත උත්පාදක්ෂණයද ව්‍යයාන්ත සංඛ්‍යාත භඞ්ගක්ෂණයද නොපැණෙයි. කුමක් හෙයිනයත්? අස්වභාව ධර්මයක් හෙයිනි. ස්වභාව ධර්මය වනාහි පෙර නොවී උපදිනා හෙයින්ද ඉපිද විනාසවන හෙයින්ද උත්පාදාන්ත ව්‍යයාන්ත දෙකින් පිරිසිඳිනා ලද්දේවෙයි. අස්වභාව ධර්මය එසේ පිරිසිඳිනා ලද්දේ නොවෙයි. මේ කිසුණු ඉගුළු අහස මෙනෙහි කරන්නාවූ යෝගාවචර තෙමේ ඒ ආකාසයාගේ පරිච්ඡෙද සඞ්ඛ්‍යාත

අනන්තය නොගනී. එතකුදු වුවත් රූපයෙන් වෙන්කළ මාත්‍රයක් ගැනීමෙන් අනන්තබව පැතිරවීම් ආකාරයෙන්ම පරිකර්ම මනස්කාරය පවත්වයි. එහෙයින් උත්පාදනත් ව්‍යයාන්ත නැති බැවින් අනන්ත් හෙයින් මෙතෙහි කිරීම් වශයෙන්ම මේ හිසුණු ඉගුළු අහස අනන්තයයි දතයුතුයි. මෙහි "අනන්තාකාසං"යි කියයුතු තන්හි "අග්‍යාගිතො" යනාදියෙහි මෙන් "අනන්ත" යන විශේෂණ පදයාගේ පරනිපාත වශයෙන් "ආකාසානන්ත" යයි කියනු ලැබේ. ඒ "ආකාසානන්ත"යම "ණ්‍යත්තතා භාවෙතු" යන සූත්‍රයෙන් ස්වාර්ථයෙහි භාව ප්‍රත්‍යයකොට තකාර යකාරයන් සංයෝග කොට "යවතං" යනාදිසූත්‍රයෙන් චකාරාදේශකොට "ආකාසානඤ්ච" යයි කියනු ලැබේ. යම්සේ දෙවියන්ට අධිෂ්ඨාන වස්තුව දෙවායතන සඞ්ඛ්‍යාත දෙවාලයයි කියනු ලැබේද එපරිද්දෙන් මේ අරූපාවචර චිත්තයෙහිද ඒ අනන්තාකාශයෙහි අපිණාවට පැමිණියාවූ සම්ප්‍රයුක්ත ධර්ම සහිත මේ ධ්‍යානයට අරමුණුවත් බැවින් ආධාරවන අර්ථයෙන් ඒ අනන්තවූ ආකාසයම ආයතනනුයිද කියනු ලැබේ. මෙහි ආයතන ශබ්දය ආධාරාර්ථයි. **ආකාසානඤ්චං ආයතනං අස්සාති ආකාසානඤ්චායතනං**" යනු නිර්වචනයි. කරුණු මෙසේ හෙයින් මේ ධ්‍යානයම අනන්තවූ ආකාශ ප්‍රඥප්තිය ආධාරස්ථානවත හෙයින් ආකාසානඤ්චායතන නම්වේ. මෙයින් අනන්තවූ ආකාශ ප්‍රඥප්තිය ආධාරකොට ඇති ධ්‍යානය ලැබේ. "**ආකාසානඤ්චායතනෙන සම්පයුත්තං කුසල චිත්තං ආකාසානඤ්චායතන කුසල චිත්තං**" අනන්තාකාශ ප්‍රඥප්තිය අරමුණුකොට ඇති ධ්‍යානය හා යුක්තවූ කුසල සිත ආකාසානඤ්චායතන කුසල සිත නම්වේ "විඤ්ඤාණඤ්චායතන" යන මෙහි "විඤ්ඤාණමෙව අනන්තං විඤ්ඤාණානන්තං" අනන්තවූ විඤ්ඤාණයම විඤ්ඤාණානන්ත නම් වේ. මෙයින් ප්‍රථමාරූප්‍ය විඥානය ලැබේ විඥානය වනාහි උත්පාදස්ථිති භඞ්ග වශයෙන් යුක්ත හෙයින් කුමක් හෙයින් අනන්ත නම් වන්නේද? ඒ ප්‍රථමාරූප්‍ය විඥානය උත්පාදදිවූ අවශානය ඇත්තේ නමුදු අනන්ත වශයෙන් අරමුණු කරනලද අහසෙහිම උපදින හෙයින්ද තමන් අරමුණුකොට උපන් භාවනාවගේ උත්පාදදි අන්තය නොගෙන අනන්ත වශයෙන් පැතිරීම වශයෙන් උපදනා හෙයින්ද අනන්තයයි කියනු ලැබේ. "**විඤ්ඤාණානන්තමෙව විඤ්ඤාණඤ්චං**" යනු කීහෙයින් විඤ්ඤා

ණානන්ත ශබ්දයම නිරුක්ති ක්‍රමයෙන් විඤ්ඤාණඤ්ච නම් වේ.
නොහොත් "**දුතියාරූප්ප විඤ්ඤාණෙන අඤ්චිතබ්බං පාපුණි
තබ්බන්ති විඤ්ඤාණඤ්චං**" යන නිර්වචන හෙයින් ද්විතීයා
රූප්‍ය විඥානයෙන් අරමුණු කිරීම් වශයෙන් පැමිණිය යුතුනුයි
විඤ්ඤාණඤ්ච" නම්වේ. "**විඤ්ඤාණඤ්චං ආයතනං අස්සාති
විඤ්ඤාණඤ්චායතනං**" යනු නිර්වචනයි. මේ ද්විතීයාරූප්‍ය
ධ්‍යානයට අනන්තාකාශ ප්‍රඥප්තිය අරමුණු කොට ඇති හෙයින්
විඤ්ඤාණඤ්ච නම්වූ ප්‍රථමාරූප්‍ය විඥානය ආධාරවත හෙයින්
ආයතනනුයි විඤ්ඤාණඤ්චායතන නම්වේ මෙයින් අනන්තවූ
ප්‍රථමාරූප්‍ය විඥානය ආධාරකොට ඇති ධ්‍යානය ලැබේ.
"**විඤ්ඤාණඤ්චායතනෙන සම්පයුත්තං කුසල චිත්තං විඤ්ඤා
ණඤ්චායතන කුසල චිත්තං**" අනන්තවූ ප්‍රථමාරූප්‍ය විඥානය
ආධාරකොට ඇති ධ්‍යානය හා යුක්තවූ කුසල සිත විඤ්ඤාණඤ්චා
යතන කුසල සිත නම් වේ. "ආකිඤ්චඤ්ඤායතන" යනමෙහි "**නාස්ස
කිඤ්චනං අස්සාති අකිඤ්චනං**" යනු විග්‍රහ හෙයින් මේ
ප්‍රථමාරූප්‍ය ධ්‍යාන කුසල චිත්තයාගේ ස්වල්ප මාත්‍රයකුදු
නැත්තේනුයි. අකිඤ්චන නම්වේ. යටත් පිරිසෙයින් භඞ්ග
මාත්‍රයකුදු ඒ විඤ්ඤාණයාගේ ඉතිරිව නැත්තේයයි කියන
ලද්දේවේ. භඞ්ග මාත්‍රයකුදු ඇති කල්හි ඒ චිත්තයාගේද සකි
ඤ්චනත්වය වන්නේය. "**අකිඤ්චනස්ස භාවො ආකිඤ්චඤ්ඤං**"
භඞ්ගමාත්‍රයකුදු ඉතිරි නොවූ ඒ ප්‍රථමාරූප්‍ය විඥානයාගේ
ස්වභාවය ආකිඤ්චඤ්ඤ නම් වේ. මෙයින් ප්‍රථමාරූප්‍ය විඥාන
යාගේ අභාවයයි කියනලද නාස්තිභාව ප්‍රඥප්තිය ලැබේ.
ඒ නාස්ති භාව ප්‍රඥප්තිය "නත්ථි කිංචි" යි මෙනෙහි කිරීම්
වශයෙන් ඒ නාමය ලබන්නේයයි දතයුතුයි. "**ආකිඤ්චඤ්ඤං
ආයතනං අස්සාති ආකිඤ්චඤ්ඤායතනං**" මේ ධ්‍යානයට
ප්‍රථමාරූප්‍ය විඥානයාගේ අභාවයයි කියනලද නාස්තිභාව
ප්‍රඥප්තිය ආධාරකොට ඇත්තේනුයි. ආකිඤ්චඤ්ඤායතන
නම්වේ. මෙයින් ධ්‍යානය ලැබේ. "**තෙන සම්පයුත්තං කුසල
චිත්තං ආකිඤ්චඤ්ඤායතන කුසල චිත්තං**" ඒ ප්‍රථමාරූප්‍ය
විඥානයාගේ අභාවයයි කියනලද නාස්තිභාව ප්‍රඥප්තිය
ආධාරකොට ඇති ධ්‍යානය හා යුක්තවූ කුසල සිත ආකිඤ්ච
ඤ්ඤායතන කුසල සිත නම්වේ "**නෙවසඤ්ඤානාසඤ්ඤා
යතන**" යනමෙහි **නෙවත්ථි සඤ්ඤා අස්සාති නෙව සඤ්ඤං**"
යන වාක්‍යයෙහි සම්ප්‍රයුක්ත ධර්මයන් සහිත මේ ධ්‍යානයට

ඖදාරික සංඥාවක් නොම ඇත්තේය. එහෙයින් ඒ ධ්‍යානය නෛවසඤ්ඤා නම්වේ. **"නවනත්ථි සඤ්ඤා අස්සාති නාසඤ්ඤං"** යන වාක්‍යයෙහි මේ ධ්‍යානයට සූක්ෂම සංඥාවක් නැත්තේ නොවේනුයි. නාසඤ්ඤා නම්වේ **"නෙවසඤ්ඤං ච නාසඤ්ඤං චෙතිනෙවසඤ්ඤානාසඤ්ඤං"** ඖදාරික සංඥාවක් නැතිවූ යේත් හේමය සූක්ෂම සංඥාවක් නැත්තේ නොවන්නේත් හේම නුයි. නෙවසඤ්ඤානාසඤ්ඤා නම්වේ. චතුර්ථාරූප්‍ය ධ්‍යානයට මේ නාමෙකි. වචන සොභනත්වය පිණිස මධ්‍යයෙහි දීර්ඝකොට "නෙවසඤ්ඤානාසඤ්ඤං" යි කියනලදී ඒ චතුර්ථාරූප්‍ය ධ්‍යාන යම මනායතන ධර්මායතනයන්ට ඇතුළත් හෙයින් ආයතනනුයි. "නෙවසඤ්ඤානාසඤ්ඤායතන" නම්වේ. **"තෙන සම්පයුත්තං කුසල චිත්තං නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසල චිත්තං"**, ඖදාරික සංඥාවක් නැත්තාවූ සූක්ෂම සංඥාව සහිත මනායතන ධර්මායතනයන්ට ඇතුලත්වූ ධ්‍යානය හා යුක්තවූ කුසල සිත "නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසල සිත" නම්වේ.

මේ අරූපසිත් දොළොස (12) රූපපඤ්චමධ්‍යාන චිත්ත යමෙන් උපෙක්ෂා ඒකාග්‍රතා යන අඞ්ගද්වය හා සම්ප්‍රයොගවන හෙයින් පඤ්චමධ්‍යානය යන නාමයෙන් ව්‍යවහාරවන බව දතයුතු.

**ආරම්මණප්පභෙදෙන චතුධාරූප්පමානසං**
**පුඤ්ඤපාකක්‍රියාභෙදා පුනද්වාදසධා ඨිතං**

මෙහි අරූපාවචරයෝ රූපාවචරයන්මෙන් අඞ්ග ඉකුත් නොකරති. අරමුණු ඉක්මවීම් වශයෙන් උපදිත්. මේ ආරම්මණ චතුෂ්කය වනාහි අතික්කමිතබ්බ චතුෂ්කයද ආලම්බිතබ්බ චතුෂ්කයදැයි විප්‍රකාරවේ. ඔවුනතුරෙහි ප්‍රථමාරූප්‍ය විඥාන යෙහි රූප පඤ්චමධ්‍යානයට අරමුණුවූ කසින ප්‍රතිභාග නිමිත්තයයි කියනලද අරමුණ ඉක්මවිය යුතුනම්වේ. ඒ කසිණ නිමිත්ත උගුළුවා ලබනලද්දාවූ අහස එල්බිය යුතුනම්වේ. ද්විතීයාරූප්‍ය විඥානයෙහි ප්‍රථමාරූප්‍ය විඥානයට අරමුණුවූ ආකාශාලම්බණය ඉක්ම වියයුතු නම්වේ. ප්‍රථමා රූප්‍ය විඥානය එල්බියයුතු නම්වේ. තෘතීයාරූප්‍ය විඥානයෙහි ඒ ප්‍රථමා රූප්‍ය විඥානය ඉක්මවියයුතු නම්වේ ඒ ප්‍රථමාරූප්‍ය විඥානයාගේ නාස්තිභාව ප්‍රඥප්තිය එල්බිය යුතු නම්වේ. චතුර්ථාරූප්‍ය විඥාන යෙහි ඒ නාස්තිභාව ප්‍රඥප්තිය ඉක්මවිය යුතුනම්වේ, තෘතීයා රූප්‍ය විඥානය එල්බිය යුතුනම්වේ. මහජනතෙම රජහු දක්

නාලද් දෙස් ඇතිව්ද ජීවිකා වෘත්තිය හෙතුකොටගෙණ නිශ්‍රයකොට පවත්නාක්මෙන් මේ නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානයතෙම අන් අරමුණක් ගැනීමට නැතිහෙයින් ඒ ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය දක්නාලද දෙස් ඇතිවද අරමුණු කොරේමය එහෙයින් කියනලද්මැයි.

**“ආරම්මණං කරොතෙව අඤ්ඤාභාවෙන තං ඉදං**
**දිඨදොසම්පි රාජානං වුත්තිහෙතු ජනො යථා”** යි

මෙතෙකින් අරූප සිතේ විස්තර කියා නිමවනලදී

මෙසේ ලෞකික සිත් විස්තරකොට දක්වා දැන් සැතෙවින් දක්වනලද ලොකොත්තර චිත්තය විස්තර කරණු පිණිස “සොතාපත්ති මග්ගචිත්තං” යනාදිය කීහු.

සොතාපත්ති මග්ග චිත්තය
සකදාගාමි මග්ග චිත්තය
අනාගාමි මග්ග චිත්තය
අරහත්ත මග්ග චිත්තය

යන මේ සතර දෙන ලොකොත්තර කුසල් සිත් නම්වේ.

**“සවති සන්දති අනිච්ඡිතගමනවසෙන පවත්තතීති සොතො”** යනු නිර්වචන හෙයින් නොනැවතී ගලාබසින අර්ථයෙන් සොතනම්වේ. ගඞ්ගාදීන්හි ජලප්‍රවාහය ලැබේ. හේවනාහි පටන් ගැනීමෙහි පටන් මහා සමුද්‍රය දක්වා අතර නොනවතිමින් ගලාබසී “සොතො විසාති සොතො” නිර්වාණ නමැති මහා සමුද්‍රයට නිම්න භාවයෙන් ජලප්‍රවාහයක් හා සමාන හෙයින් ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය මෙහි සොතයයි කියනු ලැබේ. “ආදිතො පජ්ජනංපාපුණනං ආපත්ති” සකෘදාගාමි ආදි අෂ්ටාඞ්ගික මාර්ගත්‍රයට ප්‍රථමයෙන් පැමිණීම ආපත්තිනම්. “සොතස්ස ආපත්ති සොතාපත්ති” අෂ්ටාඞ්ගික මාර්ගයට සකෘදාගාමි මාර්ගයන්ට ප්‍රථමයෙන් පැමිණීම සොතාපත්ති නම්වේ. නිබ්බානං මග්ගෙති, නිබ්බානත්ථිකෙහිවා මග්ගීයති, කිලෙසෙ මාරෙන්තො නිබ්බානං ගච්ඡතීතිවා මග්ගො” යම් ධර්මයක් නිර්වාණය සොයයිද නොහොත් නිවන් කැමතියන් විසින් සොයනු ලැබේද නොහොත් කෙලෙසුන් මරමින් නිවනට පැමිණේද එසේ හෙයින් ඒ ධර්මය මග්ග නම්වේ. “මග්ගෙන සම්පයුත්තං චිත්තං මග්ග චිත්තං” ඒ මාර්ගය හා යුක්තවූ සිත මග්ග චිත්ත නම්වේ. “සොතාපත්තියාලද්ධං මග්ග චිත්තං සොතා

පත්ති මග්ග චිත්තං" ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ග නමැති ජලප්‍රවාහයට පළමුකොට ප්‍රවිෂ්ටවීමෙන් ලබනලද මාර්ගය හා යුක්තවූ කුසල් සිත සොතාපත්ති මග්ග චිත්ත නම්වේ. නොහොත් ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ග නමැති ශ්‍රොතයට පළමුකොට පැමිණි පුද්ගලයා සොතාපත්ති නම්වේ. "තස්ස මග්ගො සොතාපත්ති මග්ගො" ඒ පළමුවෙනි ආර්‍ය්‍ය පුද්ගලයාගේ මාර්ගය සොතාපත්ති මග්ගනම්වේ. ඒ සොතා පත්ති මාර්ගය හා එක්ව යෙදුනාවූ කුසල් සිත සොතාපත්ති මග්ග චිත්ත නම්වේ සොතාපත්ති මාර්ගයට පැමිණීමෙන් පරස්ත්‍රී සෙවනයෙහි දෙස්නැත. පර සැපත් ගැනීමෙහි දෙස් නැත. යනාදීන් මිථ්‍යාදෘෂ්ටිය සමග යෙදී පවතින ලොභමූලික සිත් සතරද ක්ෂණ ප්‍රතිකාර විරහිත විචිකිච්ඡා සහගත සිතද යන මේ අකුසල් සිත් පස ප්‍රහීණවෙති. ක්ෂණ ප්‍රතිකාර සහිත කම් පටනොවූ විචිකිච්ඡාව ඉතිරිවේ. පරස්ත්‍රීන් ගැන උපදනා දුර්වල ලොභයද සඳර සන්තොෂයද දෘෂ්ටි විප්‍රයුක්ත සිත් සතරට අයිති බැවින් සොවාන් පුහුලාම ඒ සිත් උපදිත්.

"සකිං එකවාරං පටිසන්ධිවසෙන ඉමං මනුස්සලොකං ආගච්ඡතීති සකදාගාමී" යනු නිර්වචන හෙයින් පිළිසඳ ගැණීම් වශයෙන් මේ මිනිස් ලොවට එක්වරක් පැමිණේනුයි යන අර්ථයෙන් සකෘදාගාමි නම්වේ. "තස්ස මග්ගො සකදාගාමි මග්ගො ඒ සකෘදාගාමි පුද්ගලයාගේ මාර්ගය සකෘදාගාමි මග්ග නම්වේ. ඒ එසේ මැයි. මාර්ගස්ථ පුද්ගලයාගේ මාර්ගය නමා එක චිත්ත ක්ෂණික බැවින් මාර්ගක්ෂණයෙහි ප්‍රතිසන්ධි ගැණීම් වශයෙන් මේ මිනිස් ලොවට පැමිණීමක් නැතිහෙයින් ඵලස්ථ පුද්ගල තෙමේම ඉදින් සකෘදාගාමි නම්වේද. එසේ වත්තෙහිදු ඒ ඵලස්ථ පුද්ගලයාගේ ඊමට හෙතුවූ මාර්ගය ප්‍රථම මාර්ග තෘතීය චතුර්ථ මාර්ගයයි කියනලද අනිත් මාර්ගයන්ගෙන් වෙනස් කරනු පිණිස ඊට අයත් බවට පැමිණවීම් වශයෙන් සකෘදාගාමි මග්ගයයි කියනු ලැබේ. මේ සකෘදාගාමි මාර්ගයට හිතයින් අනාගාමි මාර්ගයද කියනු ලැබෙයි "සකදාගාමි මග්ගෙන සම්පයුත්තං චිත්තං සකදාගාමි මග්ග චිත්තං" ප්‍රති සන්ධි වශයෙන් මේ මිනිස් ලොවට වරක් පැමිණීම ඇති පුද්ගලයාගේ අෂ්ටාඞ්ගික මාර්ගයෙන් යුත් කුසල් සිත සකෘදාගාමි මග්ග චිත්ත නම්. සකෘදාගාමි මාර්ගයෙන් දෘෂ්ටි විප්‍රයුක්ත ලොභ සිත් සතරද දෙම්නස් සහගත සිත් දෙකද යන මේ සිත් සය ප්‍රහීණවෙති. සකෘදාගාමි

පුද්ගලයාහට වනාහි වෘත්තානුසාරී මහජනයාටමෙන් කෙලශයෝ නිතර නොඋපදිත්. ඇතැම් කලෙක්හි තුනී ආකාරයෙන් උපදිත්. එසේ උපදනාහු නමුදු වෘත්තානුසාරී මහජනයාටමෙන් සිත් මඩිමින් වසමින් අඳුරු කරමින් නොඋපදිත්. මාර්ග දෙකකින් ප්‍රහීණ කළහෙයින් මඳ මඳව තුනී තුනීව උපදිත්. එක බීජී ශ්‍රොතාපත්ති පුද්ගලයාහට එකම ප්‍රතිසන්ධියක් ඇතිවීමත් ශකෘදාගාමි පුද්ගලයාට දෙව්ලොව ප්‍රතිසන්ධියක්ද මිනිස්ලොව ප්‍රතිසන්ධියක්ද මෙසේ ප්‍රතිසන්ධි දෙකක් ඇතිවීමත් දෙදෙනාගේ වෙනසයි. "පටිසන්ධි වසෙන ඉමං කාමධාතුං න ආගච්ඡතීති අනාගාමී" යනු නිර්වචන හෙයින් යම් පුද්ගලයෙක් පිළිසඳ ගැණීම් වශයෙන් මේ කාමභූමියට නැවත නොපැමිණේද ඒ පුද්ගලතෙම අනාගාමි නම්වේ. ඔහුගේ මාර්ගය අනාගාමිමග්ගනම් පිළිසඳ ගැණීම් වශයෙන් මේ කාම භූමියට නැවත පැමිණීමක් නැති පුද්ගලයාගේ අෂ්ටාංගික මාර්ගයෙන් යුත් කුසල් සිත අනාගාමි මග්ග චිත්ත නම්. අනුසහගතව කාමරාග ව්‍යාපාද වශයෙන් පවත්නා දෘෂ්ටි විප්‍රයුක්ත සිත් සතරද දොම්නස් සහගත සිත් දෙකද යනමේ සිත්සය අනාගාමි මාර්ගයෙන් ප්‍රහීණවෙති. "කිලෙස සඞ්ඛාතා අරයො සංසාරචක්කස්සවා අරා කිලෙසා හතා අනෙනාති අරහ," යනුවෙන් රාගාදි කෙලශ ධර්ම නමැති සතුරන් නොහොත් සංසාර චක්‍රයාගේ කෙලෙස් නමැති දැවි ඉතිරි නොකොට වැනසූ හෙයින් අරහ නම්වේ. "තස්ස භාවො අරහත්තං" ඒ අර්හත් පුද්ගලයාගේ සවභාවය අරහත්ත නම්වේ. මේ අරහත්තයන නාමය අග්‍ර ඵලයට හෙවත් අර්හත් ඵලයට නමෙකි. "තස්ස ආගමන භූතො මග්ගො අරහත්ත මග්ගො" අර්හත් ඵලයට පැමිණීමට හෙතුවූ මාර්ගය අරහත්ත මග්ග නම්. "තෙන සම්පයුත්තං චිත්තං අරහත්ත මග්ග චිත්ත." සියළු කෙලෙසුන් කෙරෙන් දුරුවූ හෙයින් සකල ලොකවාසීන්ගේ මහැඟි පූජ සත්කාර පිළිගැණීමට සුදුසුවූ අර්හත් ඵලයට හෙතුවූ අෂ්ටාඞ්ගික මාර්ගයෙන් යුත් කුසල් සිත අරහත්ත මග්ග චිත්ත නම්. රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජායන පස අර්හත් මාර්ගයෙන් ප්‍රහීණ වේයයි දතයුතුයි. තදනන්තරව ලොකොත්තර විපාක චිත්තය සතර පරිච්ඡේදකින් බෙදා දක්වනු කැමති අනුරුද්ධාචාර්‍ය්‍ය මාහිමියෝ "සොතාපත්ති ඵලචිත්තං" යනාදිය කීහ.

1. සෝතාපත්ති ඵලසිතය
2. සකදාගාමි ඵලසිතය
3. අනාගාමි ඵලසිතය
4 අරහත්ත ඵලසිතය

යන මේ සතරදෙන ලෝකෝත්තර විපාක සිත් නම්වේ

මාර්ග චිත්තයන්හි කී නයින් සෝතාපත්ති ආදීන්ගේ අර්ථය දතයුතු. **"කාරණතො ඵලතී නිබ්බත්තතීති ඵලං"** යනු නිර්වචන හෙයින් හෙතුව නිසා හටගත් හෙයින් ඵලයයි කියනු ලැබේ. හේ වනාහි තාත්ක්ෂණික ඵලය, හෙත්වන්තර ඵලය, ලෝකෝත්තර ඵලයයි ත්‍රිප්‍රකාරවේ. ඔවුනතුරෙන් කාරණය නමැති හෙතුව හටගෙන කලප ලක්ෂ ගණනකදී වුවත් විපාක දීම තාත්ක්ෂණික ඵලය නම්වේ හෙතුව හා සමග විපාකදීම හෙත්වන්තර ඵලය නම්වේ අනමතාග්‍ර සංසාරයෙහි පටන් පෘථග්ජනයන්තුල පැවතීගෙන ආ කෙලෙශයන් සතර මාර්ගයෙන් නැපීම ලෝකෝත්තර ඵලය නම්වේ. කාමාවචරාදීන්හිමෙන් විපාක නාමයක් නොදක්වා කුමක් හෙයින් ඵල යන නාමය දක්වනලද්දේද?. විපාක නාමය දූරාසන්නවූ සියල්ල වාච්‍ය වන්නේය. ඵලනාමය ආසන්න ඵලය පමණක් වාච්‍යවේ. එහෙයින් විපාක නාමය නොදක්වා කම් චෙතනාව ඉපද එක ක්ෂණයෙහිම ඇතිවන හෙයින් මාර්ගයෙන් ඵලය ලැබීම අනතුරුව ලැබෙන හෙයින් ඵලනාමය දක්වනලදී.

මාර්ගසිත සමුච්ඡෙද ප්‍රහාණ ශක්තියෙන් යුක්තබවද ඵලසිත ප්‍රතිප්‍රශ්‍රබ්ධි ප්‍රහාණ ශක්තියෙන් යුක්තබවද දතයුතුයි.

චතුම්ගගපපභෙදෙන චතුධා කුසලං තථා
පාකංතසස ඵලත්තාති අඨධානුත්තරංමතං

ලෝකෝත්තර කුශල චිත්තය චතුර්විධ අෂ්ටාඞගික මාර්ගයන් හා සම්ප්‍රයොග භෙදයෙන් චතුර්විධවෙයි. එපරිද්දෙන් ලෝකෝත්තර විපාක චිත්තය ඒ ලෝකෝත්තර කුශල චිත්තයාගේ ඵලවූ හෙයින් චතුර්විධවේ. මෙසේ ලෝකෝත්තර චිත්තය අටවැදෑරුමැයි දන්නාලදී. කුමක් හෙයින් ඒ මාර්ග චිත්තයෝ සිව් වරක් කියයුත්තාහුද යත්? ශ්‍රොතාපත්ති මාර්ගයෙහි පළමුකොට ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයෝ මෘදුවෙති. එහෙයින් ඒ මාර්ගය තෙමෙ දෘෂ්ටි විචිකිත්සා සංයොජනයන්ම සමුච්ඡෙද කරන්ට හැකිවේ අන්‍ය කාමරාග ව්‍යාපාදයන් වනාහි තුනීකරන්ටද නොහැකිවේ. දෙවන මාර්ගයෙහි ඒ ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයෝ

මදක් ප්‍රකටවෙති. එහෙයින් ඒ මාර්ගය තෙමේ කාමරාග
ව්‍යාපාදයන් තුනීකරන්ට හැකිවේ. සමුච්ඡේද කරන්ට නො
හැක්කේමය. තෙවන මාර්ගයෙහි ඒ ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයෝ අති
ශයින් ප්‍රකටවෙති. එහෙයින් ඒ මාර්ගය තෙමේ කාමරාග ව්‍යා
පාදයන් සමුච්ඡේද කරන්ට හැකිවේ. රූපාරූප රාග මාන
උද්ධච්ච අවිජ්ජාඛ්‍යාත උද්ධම්භාගිය සංයෝජනයන් සමුච්ඡේද
කරන්ට නොහැක්කේමය. සතරවන මාර්ගයෙහි ඒ ශ්‍රද්ධාදී
ඉන්ද්‍රියයෝ අතිශයින් ව්‍යක්තතරවෙති. එහෙයින් ඒ මාර්ගය
තෙමේ රූපාරූප රාග මාන උද්ධච්ච අවිජ්ජාඛ්‍යාත උද්ධම්භාගිය
සංයෝජනයන් හා ඒ දස සංයෝජනයන්ගෙන් අන්‍ය අහිරික
අනොත්තප්පාදීවූ සියළු පාප ධර්මයන්ද සමුච්ඡේද කරන්ට
හැකිවේ. මෙසේ සිව්වරක් පවත්නාහුම හාත්පස නිමවනලද
කෘත්‍ය ඇතිවන හෙයින් ඒ මාර්ගයෝ සිව්වරක් කියයුතුවෙති.
ඒ ලෝකෝත්තර චිත්තයෙහි වනාහි කුමක් හෙයින් ක්‍රියා සිත්
නොගන්නා ලද්දාහුද? ලෝකෝත්තර ක්‍රියා චිත්තයාගේ අභාවය
හෙයිනි. කුමක් හෙයින් ඒ ලෝකෝත්තර ක්‍රියා චිත්තයාගේ
අවිද්‍යමානබව වන්නේදයත්? මාර්ග චිත්තය තමා එක් සිතක්
හුගේ ක්ෂණයට බඳු ක්ෂණයක් ඇති හෙයිනි. ඒ එසේමැයි.
ඉදින් ඒ මාර්ග චිත්තය ලෞකික කුශලයමෙන් නා නා ක්ෂණ
යන්හි පවත්නේද එකල්හි අනුශය රහිත පුද්ගලයන්ගේ
සන්තානයෙහිද පැවත ලෝකෝත්තර ක්‍රියා චිත්තයනම් වන්
නේය. ඒ ලෝකෝත්තර මාර්ග චිත්තය කුමක් හෙයින් එක
චිත්තක්ෂණිකම වන්නේදයත්? මාර්ග චිත්තය තමා මහානුභාව
හෙයිනි. කෙසේ මහානුභාව වන්නේද? ආර්ය මාර්ගයනම් වරක්
පවත්නේම තමා විසින් පැහැවියයුතු කෙලෙසුන් නැවත
නූපදනා සවභාව ඇතිබවට පමුණුවා දුරුකෙරේ. මෙ කියන
ලද්දේ ඒ ලෝකෝත්තර ආර්ය මාර්ගයාගේ එක් ආනුභාවයක.
විපාක චිත්තයද කුශල ක්‍රියා ජවනයක්මෙන් ජවන කෘත්‍ය
යෙන් යුක්තවූයේ යම් කිසි කලෙක්හි සම්වැදීමට යෝග්‍යද
කොට තමාගේ අනතුරු කාලයෙහි පමණ් උපදවයි. මේ කියන
ලද්දේ ලෝකෝත්තර මාර්ග චිත්තයාගේ දෙවන ආනුභාවයයි.
එහෙයින් ඒ මාර්ග චිත්තයාගේ කෙලශ ප්‍රහාණය පිණිසද ඉපද
වීමට කෘත්‍යයෙක් නම් නැති. සමවත පිණිසද එපරිද්දෙනි.
ඉදින් යම් කිසිවෙක් මම ඵලයට සමවදිනු පිණිස නොම
කැමතිවීමි. පෙරලත් මාර්ගයටම සමවදින්නෙමි .කියා පරිකර්ම
කරන්නේද එකල්හි පෙර එක්වරක් ඉපද නිරුද්ධවූ මාර්ග

චෙතනානුභාවයෙන් ඵලසිතම පවත්නේය. මාගී සිත නොපවත්නේය. කුමක් හෙයින්ද? යතහොත් මාගී චිත්තය නොවලැක්විය හැකි ආනුභාව ඇති හෙයිනි. මේ මාගී චිත්තයාගේ ආනුභාවය නම් කිසියම් ඡන්දයකින් හෝ වසයකින් හෝ අධ්‍යාශයකින් හෝ පරිකර්මයකින් හෝ වලක්වන්ට නොහැක්කේ මැයි. මෙතෙකින් සංක්‍ෂෙප ලොකොත්තර සිතේ විභාග කියා නිමවනලදී.

මේ දක්වා කියනලද සංක්‍ෂෙප සිත් (89) හි ජති වශයෙන් අකුසල් සිත් (12) ක්ද කුසල් සිත් (21) ක්ද විපාක සිත් (36) ක්ද ක්‍රියා සිත් (20) ක්ද භූමි වශයෙන් කාම සිත් (54) ක්ද රූප සිත් (15) ක්ද අරූප සිත් (12) ක්ද ලොකොත්තර සිත් (8) ක්ද වන්නාහුය.

ද්වාදසාකුසලානෙවං කුසලානෙකවීසති
ඡත්තිංසෙව විපාකානි ක්‍රියා චිත්තානි වීසති
චතුපඤ්ඤාසධා කාමෙ රූපෙ පන්නරසීරයෙ
චිත්තානි ද්වාදසාරූපෙ අට්ඨධානුත්තරෙ තථා

මේ සංක්‍ෂෙපනයෙහි ලැබෙන සිත් (89) යි

ලොකොත්තර සිත සමාපත්තිලාභීන්ට ධ්‍යාන සම්ප්‍රයුක්තව ලැබෙන හෙයින් එකි එකි ලොකොත්තර සිතක් ධ්‍යාන පඤ්චකයාගේ වශයෙන් පස් පස් වැදෑරුම්වේ. ඒ මෙසේයි.

1 විතර්කය, විචාරය, ප්‍රීතිය, සුඛය, ඒකාග්‍රතාය යන ධ්‍යානාඞ්ග පඤ්චකයෙන් යුක්ත පඨමජ්ඣාන සොතාපත්ති මග්ග චිත්තය.

2 විචාරය, ප්‍රීතිය, සුඛය, ඒකාග්‍රතාය යන ධ්‍යානාඞ්ග චතුෂ්කයෙන් යුක්ත දුතියජ්ඣාන සොතාපත්ති මග්ග චිත්තය.

3 ප්‍රීතිය, සුඛය, ඒකාග්‍රතාය යන ධ්‍යානාඞ්ග ත්‍රිකයෙන් යුක්ත තතියජ්ඣාන සොතාපත්ති මග්ග චිත්තය

4 සුඛය, ඒකාග්‍රතාය යන ධ්‍යානාඞ්ග ද්විකයෙන් යුක්ත චතුත්ථජ්ඣාන සොතාපත්ති මග්ග චිත්තය

5 උපෙක්‍ෂා ඒකාග්‍රතාය යන ධ්‍යානාඞ්ග ද්විකයෙන් යුක්ත පඤ්චමජ්ඣාන සොතාපත්ති මග්ග චිත්තය.

මේ ශ්‍රොතාප්‍රාප්ති මාගී සිත් 5 යි.

ඉතිරි ලොකොත්තර සිත් සතද මේ නයින් ධ්‍යානාඞ්ග සම්ප්‍රයුක්තකොට ගත්කල්හි මාගී සිත් (20) ක් හා ඵලසිත් (20) ක්ද වීමෙන් ලොකොත්තර සිත සමසතලිස් (40) ප්‍රභෙදවේ.

මේ විස්තර ක්‍රමයෙහි කාම සිත් (54) හැර ඉතිරි රූපාවචර අරූපාවචර ලොකොත්තර යන සියලුම සිත් ප්‍රථමධ්‍යානාදි ධ්‍යාන නාමයෙන් ව්‍යවහාර වන බව දතයුතු හේමෙසේයි:-

| | | | |
|---|---|---|---|
| ප්‍රථමධ්‍යාන | සිත් | 11 | යි. |
| විතියධ්‍යාන | සිත් | 11 | යි. |
| තෘතීයධ්‍යාන | සිත් | 11 | යි. |
| චතුර්ථධ්‍යාන | සිත් | 11 | යි. |
| පඤ්චමධ්‍යාන | සිත් | 23 | යි. |

මෙ ධ්‍යාන සිත් (67) සමග කාම සිත් (54) පිඩුකල කල්හි සිත් (121) ක්වේ. එයින් ප්‍රථමධ්‍යානය හා සම්ප්‍රයොගවූ කුශල විපාක ක්‍රියා වශයෙන් රූපාවචර සිත් තුනය. එසේම ප්‍රථමධ්‍යානය හා සම්ප්‍රයොගවූ මාර්ග ඵල වශයෙන් ලොකොත්තර සිත් අටය යන මේ එකොලොස්දෙන ප්‍රථමධ්‍යාන චිත්තයෝයි මේ එකොලොසෙහි ලෞකික සිත් (3) කි. ලොකොත්තර සිත් (8) කි. කුසල් සිත් (5) කි. විපාක සිත් (5) කි. ක්‍රියා සිත් (1) කි. මේ නයානුසාරයෙන් චතුර්ථධ්‍යාන සිත් එකොළස දක්වා චිත්ත පරිච්ඡේදයත් සවරූප විභාගයත් දතයුතු පඤ්චමධ්‍යානයට අරූප සිත් දොළොසද ඇතුලත්වන හෙයින් චිත්ත සඞ්ඛ්‍යාව තෙවිස්සක්වී තිබේ. ඒ තෙවිස්සෙහි ලෞකික සිත් (5) කි. ලොකොත්තර සිත් (8) කි. කුසල් සිත් (9) කි. විපාක සිත් (9) කි. ක්‍රියා සිත් (5) කි.

ඉත්ථමෙකූනනවුතිප්පභෙදං පන මානසං
එකවීසසතංචාථ විභජන්ති විචක්ඛණා.

මේ විස්තරනයෙහි ලැබෙන සිත් (121) යි.

චිත්ත සඞ්ග්‍රහ විභාගය නිමි

මෙසේ බෙදා දක්වනලද සිත නොයෙක් පැහැයෙන් යුත් එලිය නූල් වැටෙන මාණික්‍යරත්නයක්සේ පිටින් ස්පර්ශවන අරමුණු බෙලෙන් හටගන්නාවූ ඵස්සය, වෙදනාව, සංඥාව, ආදි ගති දෙපනසකින් යුක්තවනබව දතයුතු. ඒ ගති දෙපනස සිත හා එකතුව ඉපදීමය (1) සිත හා එකතුව නිරුද්ධවීමය (2) සිත හා එකතුව අරමුණු ගැනීමය (3) සිත හා සමාන නිශ්‍රය (4) යන සතර සම්ප්‍රයොග ලක්ෂණයෙන් යුක්තව සිතේ උපදින හෙයින් "චෛතසික" යෝයයි ව්‍යවහාර කරනු ලැබේත්. ඒ එසේමැයි. සිත අරමුණු දැනීම් මාත්‍රයමුත් අන් යමක් කටහැකි

ධර්මයක් නොවේ. ස්පර්ශය, විඳීමය, ඇඳිනීමය, නමා හා යෙදෙන ධර්මයන් මෙහෙයීමය, සිත එකඟ කිරීමය, යන ආදිය වනාහි "චෛතසික" ක්‍රියාවෝයි.

**එකුප්පාදනිරෝධාච, එකාලම්බනවත්ථුකා**
**චේතොයුත්තා ද්විපඤ්ඤාස, ධම්මා චෙතසිකා මතා**

මේ ගාථාවෙන් සතර සම්ප්‍රයෝගයත් චෛතසිකාර්ථයත් ස්වරූපාර්ථයත් දැක්වූහු.

ඒ දෙපනස් චෛතසික ධර්මයෝ නම්, ස්පර්ශය, වේදනාවය, සංඥාවය, චේතනාවය, ඒකාග්‍රතාවය, ජීවිතෙන්ද්‍රියය, මනසිකාරය යන මේ සත්දෙන සියලු සිත්වලම එකහෙළා යෙදෙන හෙයින් සර්ව චිත්ත සාධාරණ චෛතසිකයෝ නම්වෙත්. විතර්කය, විචාරය, අධිමෝක්ෂය, වීර්යය, ප්‍රීතිය, ඡන්දය යන මේ සදෙන සමහර සිතක පමණක් යෙදෙන හෙයින් ප්‍රකීර්ණක චෛතසිකයෝ නම්වෙත්. මෙසේ සර්වචිත්ත සාධාරණ ප්‍රකීර්ණක වශයෙන් කියනලද "චෛතසික" දෙවර්ගය කුශල ගත්‍ය එකිතර කරවනු පිණිස අකුශලයන් කෙරෙන් අන්‍යවූ කුශලයන්හිද අකුශලගත්‍ය එකිතර කරවනු පිණිස කුශලයන් කෙරෙන් අන්‍යවූ අකුශලයන්හිද යෙදෙන හෙයින් "අන්‍ය සමාන චෛතසිකයෝ" නම්වෙත්. මෝහය, අහිරිකය, අනොත්තප්පය, උද්ධච්චය ලෝභය, දිට්ඨිය, මානය, දෝසය, ඉස්සාවය මච්ඡරියය, කුක්කුච්චය, ථීනය, මිද්ධය, විචිකිච්ඡාවය යන මේ තුදුස්දෙන අකුශල චෛතසිකයෝ නම්වෙත්. සද්ධාවය සතියය හිරිය ඔත්තප්පය, අලෝභය, අදෝසය, තත්‍රමජ්ඣත්තතාවය, කායපස්සද්ධිය, චිත්තපස්සද්ධිය, කායලහුතාවය, චිත්තලහුතාවය, කායමුදුතාවය, චිත්තමුදුතාවය, කායකම්මඤ්ඤතාවය, චිත්තකම්මඤ්ඤතාවය, කායපාගුඤ්ඤතාවය, චිත්තපාගුඤ්ඤතාවය, කායුජ්ජුකතාවය, චිත්තුජ්ජුකතාවය, සම්මාවාචාවය, සම්මාකම්මන්තය, සම්මා ආජීවය, කරුණාවය, මුදිතාවය, ප්‍රඥෙන්ද්‍රියය, යනමේ පස්විසිදෙන ශෝභන චෛතසිකයෝ නම්වෙත්. මෙසේ අන්‍ය සමාන රැසට අයත් චෛතසික තෙලසය, අකුසල රැසට අයත් චෛතසික තුදුසය, ශෝභන රැසට අයත් චෛතසික පස්විස්සය යන මොවුන් අතුරෙන් ස්පර්ශය යනු කුමක්ද? "ඵුසතීති ඵස්සො" යනු කර්තෘ සාධන විග්‍රහ හෙයින් යම් ස්වභාව ධර්මයෙක් අරමුණු ස්පර්ශ කෙරේද? එහෙයින් ඒ ස්වභාවයතම ස්පර්ශයනම්. නොහොත්

**"ඵුසතීති සම්පයුත්ත ධම්මා එතෙනාතිවා ඵස්සො"** යනු කරණ සාධන විග්‍රහ හෙයින් අරමුණෙහි පවත්නාවූ සම්ප්‍රයුක්ත ධර්මයෝ වැදගැණීම් ලක්ෂණවූ ස්පර්ශය කරණකොටගෙන අරමුණු ස්පර්ශ කෙරෙත්ද එසේ හෙයින් හේ ස්පර්ශය නම්. නොහොත් **"ඵුසනමත්තංවා ඵස්සො"** යනු භාවසාධන විග්‍රහ හෙයින් ඵුසන ක්‍රියාව ස්පර්ශය නම්. මෙහි මත්ත ශබ්දය ප්‍රතිෂෙධාර්ථයි. **"ඵුසනංචෙත්ථ ආරම්මණස්ස ඉට්ඨානිට්ඨරසං ආහච්ච උපහච්ච ගහනං දට්ඨබ්බං"** යනු ටීකා හෙයින් මෙහි ස්පර්ශය නම් ආරම්මණයාගේ ඉෂ්ටා නිෂ්ට හෙවත් යහපත් අයහපත් රසය මිරිකා ගැණීමයයි දතයුතුයි. යම් හෙයකින් ආරම්මණයාගේ ඉෂ්ටානිෂ්ට රසය අනුභව කරන්නාවූ වේදනා තොමෝ පහළවන්නීද එහෙයින් **"ඵස්සපච්චයාවේදනා"** යි වදාරනලදී. හේ ස්පර්ශය තෙමේ ඇසට අරමුණුවූ රූපාරම්මණය චක්ෂුර්විඥානාදි චිත්තයන්ට ආරම්මණ ප්‍රත්‍යයෙන් උපකාරව චක්ෂු වස්තු ආදිය නිශ්‍රයකොට උපදී. නාම ධර්මයන්හි ගැටීම් කෘත්‍යයක් නැත්තේය චිත්තය රූපාරමුණක් හා සමගම අන්‍යොන්‍ය ගැටීමක් වේනම් හේ සූක්ෂමවේ. එසේ ගැටීමෙන් ඇතිවන තැලීම් මාත්‍රය ස්පර්ශයයි. ස්පර්ශය තෙමේ වේදනාව හටගැණීමට ප්‍රත්‍යවීම් අර්ථයෙන් ආරම්මණයට වැදගැන්ම ලක්ෂණකොට ඇත්තේය. මනොද්වාරයෙහි ආරම්මණ චිත්තය යන දෙදෙනාගේ හැප්පීම් කෘත්‍යකොට ඇත්තේය. ඒ එසේමැයි. මේ ස්පර්ශය තෙමේ අරමුණෙහි වැළඳ ගැන්මක් නැත්තේ නමුදු චක්ෂුඃ ප්‍රසාදය හා රූපයමෙක්ද ශ්‍රොත ප්‍රසාදය හා ශබ්දාලම්බණයමෙන්ද සිත හා අරමුණද ගැටීම කෙරෙයි නොහොත් පඤ්චද්වාරයෙහි වස්තු ආරම්මණයන්ගේ එක්වීමෙන් උපදනා හෙයින් සඞ්ඝට්ටනය සමසත්කොට ඇති ස්පර්ශ තෙම සඞ්ඝට්ටන රසයයි කියනලදී. යම්සේ එක් අත්ලක් අනික් අත්ලෙහි ගැටීම නම්, ඒ ගැටීමට විශෙෂ කාරණවූ වායොධාතු අධික රූප ධර්මයෝ වෙද්ද එපරිද්දෙන් සිත අරමුණෙහි ගැටීම තෙම ඊට විශෙෂ භූත එක් චෛතසික ධර්මය කැයි දතයුත්තේය. ත්‍රික සන්නිපාතයයි කියනලද ස්වකීය කාරණයාගේ වශයෙන් ප්‍රකාශකොට වදාළ හෙයින් ඒ ස්පර්ශය එකතුවීම වැටහීම් කාරණාකොට ඇත්තේය. ඒ එසේ මැයි මෙහි "සන්නිපාත" නම් **"චක්ඛුංච පටිච්චරූපෙච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං තිණ්ණං සඞ්ගති ඵස්සො"** යි වදාළ හෙයින් චක්ෂුඃ

ප්‍රසාදය රූපාරම්මණය චක්ෂුර්විඥානය යන තිදෙනාගේ එක්රැස් වීමයි. මේ ධර්ම තිදෙනාගේ එක්රැස්වීමෙන් පෙරපසු නොවී එකවරම ස්පර්ශය උපදනේයයි දතයුතු. යම්සේ ගිනිගලද කටුවද එකතුවූ කල්හි පෙර නොතිබූ ගිනි උපදනේවේද එපරිද්දෙන් චක්ෂුඃ ප්‍රසාදයෙහි රූපාරම්මණයක් ඝට්ටනයවූ කල්හි පෙරනොතිබූ චක්ෂුර් විඥානය උපදනේයි. මෙහි චක්ෂු ප්‍රසාදය ගිනිගල හා සමානයයිද රූපාරම්මණය ගිනි උපදවනු පිණිස ගසනලද කටුව හා සමානයයිද රූපාරම්මණයාගේ ඝට්ටනය කටුවෙන් ගැසීම හා සමානයයිද එය ඝට්ටනයවූ කල්හි පැන නගින්නාවූ ගින්දර චක්ෂුර් විඥානයාගේ ඉපදීම හා සමානයයිද උපමා උපමෙය වශයෙන් දතයුත්තේයි. නොහොත් බෙර ඇස චක්ෂුඃ ප්‍රසාදය හා සමානයයිද බෙර ඇසට ගසන්නාවූ කඩිප්පුව රූපාරම්මණය හා සමානයයිද එයින් නගින්නාවූ ශබ්දය චක්ෂුර් විඥානය හා සමානයයිද දතයුතු.

එසේ එකතුවීම් වශයෙන් ගතයුතු භාවයවැටහෙන හෙයින් සන්නිපාත සඞ්ඛ්‍යාත කාරණයාගේ වශයෙන් උපට්ඨානය මෝහට ඇක්තේනුයි. වැටහීම් අර්ථ ඇති පච්චුපට්ඨානයෙන් සන්නිපාත පච්චුපට්ඨානබව කියනලද්දීය. අභිමුඛව පතිත අරමුණු ආසන්න කාරණාකොට ඇක්තේය. මෙහි "ආපාථ" නම් ස්පර්ශයට ආසන්න කාරණය අරමුණුබවයි. නොහොත් වේදනාව ආසන්න කාරණාකොට ඇත්තේය හේ ස්පර්ශය තෙමේ අරූප ධර්මයක් නොවේද? අරූප ධර්මයෝ නොහැපීම් ස්වභාව ඇති හෙයින් කිසිවක් ස්පර්ශ නොකෙරෙත්ද? ඒ එසේ මැයි මේ ස්පර්ශය තෙමේ අරූප ධර්මයක්වූයේ නමුදු රූපාදි අරමුණෙහි වැදගැනීම් හැපීම් ආකාරයෙන් පවතින්නේය. ස්පර්ශය හා සමග එක්ව යෙදුනාවූ සම්ප්‍රයුක්ත ධර්මයන්ද අරමුණුවල හැපීම් ආකාරයෙන් පවත්වන්නේ මේ ධර්ම ශක්තියෙනැයි දතයුතු අරමුණෙහි වැදගන්නා ආකාරයෙන් උපදනාවූ ස්පර්ශය වනාහි අන්‍යතර පුරුෂයෙක් කන්නාවූ කාෂවූ ඇඹුල් වර්ගයක් කරා තමාගේ රසදිව නොපැමිණම ඇඹුලෙහි වැදීගියාක්මෙන් හැපී ගියාක්මෙන්බලා සිටින්නවුන්ට කෙළ උනායාමක්මෙන්ද පෙළනු ලබන්නාවූ අනිකක්හු දුක කරුණා බහුල පුරුෂයාගේ සිරුර කම්පාවීම මෙන්ද උස්වූ වෘක්ෂයක් මුදුනට නැගී ඒ වෘක්ෂයෙහි කුඩා අතුපතර අනුසාරයෙන්

ගමන්කරන්නාවූ පුරුෂයෙකු දැක බිම සිටින පුරුෂයාගේ පාදෙක කම්පාවීමක් වෙව්ලීමක් මෙන්ද දතයුතු.

ස්පර්ශ විභාගය නිමි.

**වෙදනාවය** යනු කුමක්ද? **"වෙදයති ආරම්මණරසං අනුභවතීති වෙදනා"** යනු නිර්වචන හෙයින් යම් ස්වභාවයක් තොමෝ රූපාදී අරමුණු රසය අනුභව කරන්නීවේද එසේ හෙයින් හේ ස්වභාවතොමෝ වෙදනානම්. මෙහි **වෙදයති** යන පදය අනුභවති යී වර්ණනාකරණලදී අප්‍රකටවූ ආරම්මණ රසය තමා හා එක්ව යෙදුනාවූ සම්ප්‍රයුක්ත ධර්මයන්ට හෝ තත් සම්බන්ධී පුද්ගලයන්ට ප්‍රකටකෙරෙයි යන අර්ථයි. **"විඤ්ඤනහිවා එතාය සත්තා සාතංවා අසාතංවා ලභන්තීති වෙදනා"** නොහොත් මේ ස්වභාව කාරණකොටගෙණ සත්වයෝතුමූ යහපත්වූ හෝ අයහපත්වූ හෝ ආරම්මණ රසය ලබත්නුයී. වෙදනා නම්. **"වෙදයිතමත්තමෙවවා එතන්ති වෙදනා"** නොහොත් මේ ස්වභාවයතෙම විදීම් මාත්‍රයමය. එසේ හෙයින් වෙදනා නම්. පෙළෙහිවනාහි **"වෙදයති වෙදයතීති ඛො භික්ඛවෙ තස්මා වෙදනාති වුච්චති"** යී වදාරනලදී. මහණෙනි යම ස්වභාව ධර්මයක් තොමෝ ඒකාන්තයෙන් ආරම්මණරසානුභවය කරන්නීවේද එසේ හෙයින් ඒ ස්වභාව ධර්මතොමෝ වෙදනාවයයි කියනු ලැබේ. යනු එහි භාවයි.

මේවෙදනා තොමෝ එක්තිස් තලයෙක්හි බොහෝ සෙයින් ප්‍රකටව ඇතිවන්නීය. කෙසේ නම් ප්‍රකටවන්නීදයත්? ලෝකයෙහි සැපය දුකය කියන්නාවූ වචනදෙක බොහෝ ප්‍රකටව පවතින්නේය. තවදසියලුම දෙනාව්‍යවහාර කරන්නාවූවචනදෙකකි. ඒ කිම වෙදයිත ධාතුවට කිමය දිව්‍ය සැපයයි කීමෙහි දිව්‍ය වෙදයිත ධාතුවට කියන්නාවූ නමෙකි. බ්‍රහම සැපයයි කීමෙහිද බ්‍රහම වෙදයිත ධාතුවට කියන්නාවූ නමෙකි. නිරය දුකයයි කීමෙහිද නිරය වෙදයිත ධාතුවට කියන්නාවූ නමෙකි. තිර්‍ය්‍යක් ප්‍රේත අසුරයන්ගේද මේ ක්‍රමයෙන් දතයුතු සුඛසොමනස්ස වෙදයිත ධාතුවෙන් යුක්තව වාසය කරන්නාවූ තැනැත්තන්ට මනුෂ්‍ය සැපයෙන් වාසය කරන්නාවූ තැනැත්තෝයයි ව්‍යවහාරකරත්. දුක්ඛ දෞර්මනස්ස වෙදයිත ධාතුවෙන් යුක්තව වාසය කරන්නවුන්ට දුප්පත් මනුෂ්‍යයෝයයි ව්‍යවහාරකරත්. සුඛ වෙදයිත ධාතුව අතුරෙන්ද සාමාන්‍ය මනුෂ්‍යයන්ට වඩා සිටු ආදී ශ්‍රෙෂ්ඨ තැනැත්තෝ බොහෝ සෙයින් සුඛ වෙදනාව

විඳිත්. සිවු ආදී මනුෂ්‍යයන්ට වඩා ප්‍රදේශ රජවරු බොහෝ සෙයින් සුඛ වේදනාව අනුභව කරන්නාහුය. ප්‍රදේශ රජවරුන්ට වඩා චක්‍රවර්ති රජුද ඔහුටවඩා චාතුර්මාරාජිකායෙහි සිටින්නාවූ සතර වරම් රජදරුවෝද ඔවුන්ට වඩා තව්තිසාදි දෙව්ලොව වාසීන්ගේ වශයෙන් දතයුතු දුක්ඛ වේදයිත ධාතුව අතුරෙන්ද මනුෂ්‍යයන්ට වඩා තිරිසන්හුද මේ ක්‍රමයෙන් අවීචියේනිරිසත්තු දක්වා බෙදා ගතයුතු. හේ වේදයිත ධාතුව චක්ෂුඃ ප්‍රසාදයෙහි ඇතිවූ කල්හි චක්ඛු සම්ඵස්සජා වේදයිත ධාතුනාමය ලැබේ. –පෙ– මනො ප්‍රසාදයෙහි පහළවූ කල්හි මනොසම්ඵස්සජා වේදයිත ධාතුයයි යන මොවුන්ගේ වශයෙන් සවැදෑරුම්වේ චක්ඛුසම්ඵස්සජා වේදයිත ධාතුවද සුඛ දුක්ඛ උපෙක්ෂා යන මොවුන්ගේ වශයෙන් තුන්වැදෑරුම්වේ. වර්ණ සංස්ථානයන් දක චක්ෂුඃ ස්පර්ශයසමග ගැටුනු කල්හි මුහුණෙහි පිනාගිය ස්වභාවක් දක්වයි එවිට ඒ තැනැත්තා සුඛ වේදයිත ධාතුවෙන් යුක්තව වාසය කරන්නාවූ තැනැත්තෙක්යයි දත ගත හැක්කේය. ශ්‍රද්ධා මෛත්‍රී ධර්මයන් සමග යෙදෙන්නාවූ සුඛ වේදයිත ධාතුවද තෘෂ්ණා රාගයන් සමග යෙදෙන්නාවූ සුඛ වේදයිත ධාතුව දැයි නොයෙක් ප්‍රභේද ඇත්තේය. මත්ස්‍යයන් ඇල්ලීමෙහි බොහෝ ප්‍රගුණ ඇති තැනැත්තන්ට ජලය මතුපිට තිබෙන්නාවූ දිය බුබුල් දැකීමෙන්ම මේ ස්ථානයෙහි මෙතම් මත්ස්‍යයෝ සිටිත්යයි දතගත හැක්කාක්මෙන් සිනාසෙන්නාවූ මුහුණු දැකීමෙන් ශරීරයතුළ පහළවී තිබෙන්නාවූ වේදයිත ධාතුව දනගත හැක්කේය. පෙර මෙම ලඞ්කාද්වීපයෙහි පිඩු සිඟමින් වඩින්නාවූ තරුණ භික්ෂූන් වහන්සේ නමක් තරුණ ස්ත්‍රියාවක් දක සිනාසී පිඩු සිඟා වැඩියේය. ඒ සිනාසීම දක්කාවූ අන්‍ය ස්ත්‍රීහුද සිනාසුනාහුය. ඒ බව දක්කාවූ ස්ත්‍රියාව මෙසේ කීවාය. ඒ භික්ෂූන්වහන්සේ මෙදින සිනාසුන බව සැබෑය එසේවී නමුත් අන්‍ය අදහසකින් නොව ඒ භික්ෂූන්වහන්සේගේ නැගණිය හා සමාන හෙයින් සිනාසුනේයයි කීවාය. එසේ කීමට හැකිවූයේ සිනාසුන මුහුණ දක්ක හෙයිනි. වර්ණ සංස්ථානයන් දක චක්ෂුඃ ස්පර්ශය සමග ගැටීමෙන් මුහුණෙහි පහළවන්නාවූ රූපකලාපයෝ මලානිකවූවාහුනම් ඒ තැනැත්තා දුක්ඛ වේදනාවෙන් යුක්තව වාසය කරන්නාවූ තැනැත්තායයි දතගත හැක්කේය. මේ කියන ලද්දේ චක්ඛු සම්ඵස්සජා වේදනාවගේ ප්‍රභේදයයි. නොයෙක්

ප්‍රභෙද ශබ්ද ඇසීමෙන් ශ්‍රොතස්පර්ශයෙහි ඇතිවන්නාවූ සුඛ දුක්ඛ වෙදයිත ධාතු දෙකද නොයෙක් ප්‍රභෙද ගඳ සුවඳ ආඝ්‍රාණයෙහිදී ඝ්‍රාණ ස්පර්ශයෙහි ඇතිවන්නාවූ සුඛ දුක්ඛ වෙදනා දෙකද නොයෙක් ප්‍රභෙදරස අනුභව කිරීමෙහි ජිහ්වා ස්පර්ශයෙහි ඇතිවන්නාවූ සුඛ දුක්ඛ වෙදනා දෙකද ස්පර්ශාරම්මණය කරණකොටගෙන කායස්පර්ශයෙහි ඇතිවන්නාවූ සුඛ දුක්ඛ වෙදනා දෙකද ඉෂ්ට අනිෂ්ට ආරම්මණයන් හෙතුකොටගෙන මනොස්පර්ශයෙහි ඇතිවන්නාවූ සුඛ දුක්ඛ වෙදනා දෙකද චක්ඛු සම්ඵස්සජා වෙදයිතධාතුවෙහිමෙන් වෙන් වෙන් වශයෙන් බෙදා දතගතයුතු. වෙදනා තොමෝ අනුභව කිරීම් වශයෙන් එකක්ම වන්නීය. ඊට උපමාවක් නම් ග්‍රීෂ්ම ඍතුයෙහි සිහිල්වූ සුඛ වෙදයිත ධාතුව බොහෝ සෙයින් කැමති වන්නාහුය. ඒ සුඛ වෙදයිත ධාතුවද සන්තානයෙහි සුඛ ස්පර්ශ ධාතුව ඇතිවූ කල්හිම ඇතිවිය හැක්කේය. සුඛ ස්පර්ශයද බාහිර සිහිල් සුළන් සිහිල් ජලය සකන්ධයෙහි ගැටුණු කල්හි සත්ව සන්තානයෙහි ඇතිවිය හැක්කේය. කයෙහි ගැටීමට ආවාවූ සිහිල් සුළං සිහිල් ජලයනම්වූ ඉෂ්ටාරම්මණයද සත්ව සන්තානයෙහි නිත්‍ය වශයෙන් සිටිය හැක්කාවූ නිත්‍ය ධර්මයක්නොවේ. සන්තානයෙහි සපිතිමාත්‍රය සමග ක්ෂණයක් ක්ෂණයක් පාසා නිරුද්ධ වන්නාවූ අනිත්‍ය ධර්මයක්මවෙයි. එහෙයින් අලුත් අලුත් වාතය අලුත් අලුත් ජලය ගැටීමෙහි සුඛ සම්ඵස්සය ඇතිවීමෙන් සුඛ වෙදනාව වර්ධනයවිය හැක්කේය ගැටීම නැතිවීගිය කල්හි සුඛසම්ඵස්ස සුඛවෙදනාවෝද නිරුද්ධවීයන්නාහුය. ඒ සුඛ වෙදනාවයයි ව්‍යවහාර කළාවූ වෙදනාවද සුඛ ස්පර්ශධාතුව ඇතිවූ කල්හිම ඇතිවිය හැක්කාවූ ප්‍රතීත්‍ය සමුත්පාද ස්වභාව නම්වේ. ඒ සුඛ ස්පර්ශධාතුවද සිහිල් සුළං සිහිල් ජලය ගැටුනු කල්හිම ඇතිවිය හැක්කාවූ ප්‍රතීත්‍ය සමුත්පාද ස්වභාව නමි. ඒ සිහිල් සුළං සිහිල් ජලයට කැමතිවී එය ලබාගැණීමට පවන් සැලීම් ආදී කෘත්‍යයන්හි නියුක්තවීම් ආදී දුක් ඇතිවෙයි 1500 ක් කෙලශයන් කරණකොටගෙනද රාගග්නි ද්වෙසග්නි යනාදීවූ එකොළොස් ගින්න කරණකොටගෙනද බොහෝකොට දැවෙමින් පවත්නාවූ මේ අනමතාග්‍ර සංසාරය ග්‍රීෂ්ම ඍතුව හා සදෘශයි.

සුඛසම්ඵස්ස සංදෙනා හා සුඛ වෙදයිත ධාතු සදෙනා ග්‍රීෂ්ම කාලයෙහි සිහිල් සුළං සිහිල් ජලයෙන් ඇතිවන්නාවූ සුඛ

සමථ්සස සුඛවේදනා හා සදෘශයි. දිව්‍ය ඓශ්වර්‍ය්‍ය මනුෂ්‍ය ඓශ්වර්‍ය්‍ය ග්‍රීෂ්ම කාලයෙහි පවන් සැලීම් ආදියට ගන්නාවූ උපකරණ හා සදෘශයි. දැනට සිටින්නාවූ මනුෂ්‍ය දිව්‍ය බ්‍රහ්ම පෘථග්ජන සත්වයෝ ඒ සුඛ වෙදනාව අනුභවකරමින් වාසය කරන්නාහු නම්වෙත් ඒ සුඛවෙදනාව නිසා නිතර දුක් උපදවන්නාවූ කර්ම රැස් කරගනිත්

සියළුම චිත්ත චෛතසික ධර්මයෝ අරමුණුරස විඳින්නාහු නොවෙත් දැයි මෙසේ චෝදනාවක් ඇත. ඊට පරිහාරය කියනු ලැබේ. සිත හා සමග යෙදෙනාවූ වෙදනාව හැර සෙසු චිත්ත චෛතසික ධර්මයෝ අරමුණුරස සෘජුව විඳින්නෝ නොවෙත් ඔව්හු තම තමන්ගේ කෘත්‍ය කරමින්ම ආරම්මණරසය එක දෙශ මාත්‍රයකින් විඳිත් වෙදනා තොමෝම වනාහි අන්‍යකෘත්‍ය රහිත හෙයින් අනුභවනකෘත්‍යයෙහි අධිපති භාවයෙන් ඊශ්වර භාවයෙන් අරමුණුරස අනුභව කරන්නීය. මෙසේ සාතිශයෙන් අරමුණු රසවිඳීමම වෙදනා නමැයි දතයුතුයි. නිදර්ශනයක් මෙසේයි. අරක්කැමියා විසින් සම්පාදනය කරනලද. සහපත් රාජ භොජනරසය රජතුමා අනුභවකර අවසානවූවායින් පසු අරක්කැමියා ඉතුරුව රාජ භොජනය අනුභවකරයි. මේ උපමාකථාවෙන් කුමක් අභිමතද? රාජභොජනය අනුභවකරන රජහුමෙන් වෙදනා තොමෝ ඒකාන්තයෙන් භොජන කෘත්‍යයෙහි ඊශ්වර භාවයෙන් අධිපතිභාවයෙන් ස්වාමිභාවයෙන් රූපාදී අරමුණුරස සම්භාරයෙන් අනුභව කරන්නීයයිද රජතුමා අනුභවකර ඉතුරුව භොජනය අනුභවකරන අරක්කැමියාමෙන් සිත හා එක්ව යෙදුනාවූ වෙදනාව හැර සෙසු චිත්ත චෛතසිකයෝ රූපාදි ආරම්මණරස එකදෙශයකින් අනුභව කරන්නාහයි මෙසේ උපමා උපමෙය වශයෙන් දතයුත්තීය. වෙදනාවගේද ලක්ෂණරස ප්‍රත්‍යුපස්ථාන පදස්ථාන යන සතර විධිය තේරුම් ගතයුතුයි එහෙයින් “**වේදයිත ලක්ඛණා වේදනා අනුභවනරසා ඉට්ඨාකාර සම්භොගරසාවා චෙතසිකඅස්සාද පච්චුපට්ඨානා පස්සද්ධි පදට්ඨානා**” යි කීහු. වෙදනා තොමෝ රූපාදි අරමුණුරස අනුභවකිරීම ලක්ෂණ කොට ඇත්තීය. ආරම්මණරස අනුභවකිරීම තොහොත් ආරම්මණයාගේ ඉෂ්ටාකාරය සම්භොගකිරීම කෘත්‍යයකොට ඇත්තීය චෛතසිකයන් (පිළිබඳ) ආශ්වාදකිරීම ප්‍රබෝධකරවීම

වැටහීම් කාරණාකොට ඇත්තීය. හිතකය සංසිඳීම ආසන්න කාරණාකොට ඇත්තීය. මේ වේදනාවට අයත් සතරාකාරවූ ලක්ෂණ රස ප්‍රත්‍යුපස්ථාන පදස්ථාන විධියයි.

හේ වනාහි සුඛ දුක්ඛ උපේක්ෂා සෝමනස්ස දෞමනස්ස යන භේදයෙන් පස් ආකාර වන්නීය. යම් යම් අරමුණු ඉඳුරන්ට ගොදුරුවීමෙන් සෝම්නස දෞම්නස උපේක්ෂාව සැප දුක විඳින්නාක්මෙන් අපට වැටහිමවේද? ඒ වනාහි වේදනා චෛතසිකයාගේ ආකාර විශේෂයක්මුත් සත්ව පුද්ගල ආත්ම ජීවයක්හුගේ ක්‍රියා විශේෂයක්නොවේ. එබැවින් වේදනා චෛතසිකය අද්‍රව්‍ය ධාතු ස්වරූපයෙක් මැයි.

## වේදනා විභාගය නිමි

සංඥව යනු කුමක්ද? "නීලාදි භේදං ආරම්මණං සඤ්ජානාති සඤ්ඤංකත්වා ජානාතීති සඤ්ඤා" යනු නිර්වචන හෙයින් යම් ස්වභාව ධර්මයක් තොමෝ නීලාදි වශයෙන් වෙනස්වූ රූපාදි ආරම්මණය සලකුණුකොට හැඳිනගන්නීවේද එසේ හෙයින් හේ ස්වභාව ධර්මතොමෝ සංඥනම්. මේ විග්‍රහයෙහි සඤ්ජානාති යනු සඤ්ඤං කත්වා ජනාති යි වර්ණනාකරණලදි. නැවත දැන ගැණීම පිණිස සලකුණු කොරේ යනු අර්ථයි.

යම් වේලාවක සංඥවෙන් හැඳින ගණිනම් ඊට ප්‍රථමයෙන් ගන්නාලද සලකුණෙන් හැඳින ගන්නේය. එයද නැවත හැඳිනගැණීම පිණිස සලකුණු කොරේමයයි දතයුතුයි ඒ එසේ මැයි ඒ සංඥතොමෝ පූර්වයෙහි ගන්නාලද සලකුණු නැවත ගැණීම පිණිස සලකුණු කරන්නීය. මෙයාකාරයෙන් සංඥව ඇතිවන ඇතිවන වාරයක් පාසා හේ ඉපදීම පිණිස නැවත නැවත සලකුණුකොට නැවත ඉපදීමෙන් ස්ථිර සංඥවට පැමිණ ජීවිතාන්තය දක්වාද අමතක නොවන්නේය. භවාන්තරයට පැමිණද සත්වයින්ට අමතක නොවන්නේය. මිථ්‍යා සංඥවට හෙවත් වරදවා හැඳින ගැණීමට පැමිණද මේ සත්වයින්ට සියල්ලදත් බුදුවරයන් විසින්ද අවබෝධකරවන්ට නොහැක්කවුන් කෙරෙයයි දතයුතුයි එහෙයින්ම ඒ සංඥ තොමෝ නැවත දැනගැණීම පිණිස සලකුණු කරන්නාවූ දැව් වඩුවන් හා සමානවන්නීය. හේ කෙසේද? යම්සේ ලී ඉරන වඩුවෝ දැළිතුලකින් හෝ පැන්සල් ඉරකින් හෝ යම් කිසි වෘක්ෂයක් සලකුණුකොට පසුව එය හැඳින ගනිත්ද එසේම

සංඥාතොමෝද ප්‍රථමයෙන් දක්ක අය නැවත හැඳින ගැණීම්ව පිළිවන් ආකාර සලකුණක් ඇතිකර ගැණීමෙන් උපදින්නීය. තවද සංඥතොමෝ යම් ඒ නිමිත්තාගේ වශයෙන් ගන්නා ලද්දාවූ හස්ති දශීක් අන්ධයන් හා සමානවන්නීය. හේ කෙසේද? එක් රජෙක් වනාහි ක්‍රීඩායෙහි නියුක්තවිය. හෙතෙම ජාත්‍යන්ධයන් වෙතට එක්තරා හස්තියෙකු ගෙන්වාතබා පින්වත්නි; තෙපි හස්තියා දනිව්දැයි. ඔවුන් අතින් විචාල කල්හි ඔව්හු හස්තියා දැනගන්නෙමුයයි එයින් එක් අන්ධයෙක් හස්තියාගේ පාදයක් අතගා හස්තිතෙමේ වනාහී වංගෙඩියක් මෙනැයි නමා වැටහිම් පරිදි දැඩිව සලකාගත්තේලු. එසේම තවත් අන්ධයෙක් හස්තියාගේ කන්පෙත්ත අතගා හස්තිතෙමේ කුල්ලක් මෙනැයි දැඩිව සලකා ගත්තේලු. එසේම තවත් අන්ධයෙක් සොඬය අතගා හස්ති තෙමේ සර්පයකු මේනැයි දැඩිව සලකා ගත්තේලු. එසේම තවත් අන්ධයෙක් නකුට අතගා හස්ති තෙමේ නඟුල් හිසක් මෙනැයි දැඩිව සලකා ගත්තේලු. එසේම තවත් අන්ධයෙක් පිට අතගා හස්ති තෙමේ කුමාගාරයක් මෙනැයි දැඩිව සලකා ගත්තේලු

පසුව රජතෙමේ පින්වත්නි හස්තිතෙම කෙබඳු දැයි ඔවුන් අතින් විචාල කල්හි ඔව්හු රජහට හස්තියාගේ සටහණ කියන්නාහු විවාදයට පැමිණියාහ. එපරිද්දෙන් සංඥතොමෝද තමහට අරමුණුවූපරිදි රූපාදි අරමුණු ඇතැම්විට වරදවා අවබොධකර ගැනීමවැටහිම් කාරණාකොට ඇත්තීය. එසේම සංඥතොමෝ තමාගේ බුද්ධියට වැටහිගිය අරමුණු ගැනීමෙහි තෘණ පුරුෂයන් කෙරෙහි මුවපොල්ලන් හා සමානවන්නීය.

හේ කෙසේද? වනාන්තරයෙහි හැල් කෙත් මැද පුරුෂයෙකුගේ ආකාරයෙන් යුත් පඹරූපයක් දක්නාලද මුවපොල්ලන්ට පුරුෂ සණ්ඨානය වැටහේ. ඔව්හු වැටහුණාවූ සණ්ඨානමාත්‍රය පුරුෂයෙකැයිගෙන මෙතෙම අපට පහර දෙන්නේයයි බියපත්ව පලායෙත්. එපරිද්දෙන් මෙ සත්වයෝද වැරදි වැටහිම හරියාකාර වටහාගන්නෝ නොමවෙත්. පෙලෙහිවනාහි "සඤ්ජානාති සඤ්ජානාතීති බො භික්ඛවෙ තස්මා සඤ්ඤාති වුච්චති" යි වදාරණලදී.

මහණෙනි! ඒකාන්තයෙන් යම් සවභාව ධර්මයක් තොමෝ නීලාදිය හැඳින ගන්නීවේද එසේ හෙයින් හේ සවභාව ධර්ම තොමෝ සංඥවයයි කියනු ලැබේ යනු එහි භාවයි. ඕ තොමෝ

වනාහි හොඳය නරකය යනාදි යම් ආදීනවයක් නොගෙණ දැකීම් වශයෙන් හැඳින ගන්නීයයිද රූපාදි ආරම්මණයන් වරදවා වටහා ගන්නාවූද මේ නාමය මේ රූපය යනාදි වශයෙන් ඇතිසැටි නොවරදවා හැඳින ගන්නාවූද නිස්සත්තනිජ්ජීව සවභාව ධර්මයක් වන්නීයයිද දතයුතුයි.

**සංඥාවිභාගය නිමි.**

චේතනා යනු කුමක්ද? **"චෙතයතීති චෙතනා"** යනු නිර්වචන හෙයින් තමා හා සමග යෙදෙන සම්ප්‍රයුක්ත ධර්මයන් අරමුණෙහි යොදවානුයි "චෙතනා නම්" රූපාදි අරමුණුවල සිතත් ඒ සමග උපන් ඵස්ස වේදනා සඤ්ඤා ආදීවූ චෛතසිකත් යොදා ඒ ඒ චිත්ත චෛතසිකයන්ට අයත් කටයුතු කරණ කරවන ශක්තිය චේතනායයි දතයුතුයි. චිත්ත චෛතසිකයන්ගේ කටයුතුනම්, චක්ෂුර් විඥානයෙන් දර්ශන කෘත්‍යය, ශ්‍රොත්‍ර විඥානයෙන් ශ්‍රවන කෘත්‍යය, ඝ්‍රාණවිඥාණයෙන් ආඝ්‍රාණ කෘත්‍යය, ආරම්මණ ස්පර්ශන ලක්ෂණකොට ඇති ඵස්ස චෛතසිකයාගේ ස්පර්ශන කෘත්‍යය, අරමුණු විඳීම් ලක්ෂණකොට ඇති වේදනා චෛතසිකයාගේ වේදනා කෘත්‍යය, අරමුණු හැඳිනීම් ලක්ෂණකොට ඇති සංඥා චෛතසිකයාගේ සංඥා කෘත්‍යය යනාදියයි. කොටින්ම කයින් වචනයෙන් සිතින් ඒ ඒ චිත්ත චෛතසිකයන්ගේ කටයුතු කරණ කරවණ ශක්තිය චේතනායයි දතයුතුයි.

දැන් ලක්ෂණාදි සතර විධිය දක්වනු ලැබේ. ඒ කෙසේද යත් **"චෙතයිත ලක්ඛණා චෙතනා, ආයූහනරසා, සංවිධාන පච්චුපට්ඨානා, සහජාත ධම්මපදට්ඨානා"** යනු වෙති. ඕතොමෝ චිත්ත චෛතසික ධර්මයන් තමන්ට අයත් අරමුණෙහිම මෙහෙයීම හෙවත් උනන්දුකිරීම ලක්ෂණකොට ඇත්තීය. චිත්ත චෛතසික ධර්මයන් විසිරයානොදී තම තමා අයත් කෘත්‍යයෙහි නිතර යොදවා ගැණීම කෘත්‍යයකොට ඇත්තීය. මේ කෘත්‍යය වනාහි කුශලාකුශල ක්‍රියා ජවන් සම්ප්‍රයුක්ත චෙතනාවටම ලැබේ. තෝ කර්මය කරවයි යනාදීන් නියොග කරන්නාක්මෙන් වේනුයි. නියෝග කිරීම් ඥානයට වැටහීම් කාරණාකොට ඇත්තීය.

ඒ එසේ මැයි. ඒ චේතනාතොමෝ ඒ අරමුණෙහි නිරතුරුව උත්සාහ කිරීම් ව්‍යාපාරයාගේ වශයෙන් පවත්නා කල්හි තත්

සම්ප්‍රයුක්ත ධර්මයෝත් තම තමාගේ කෘත්‍යය කරන්නාහු ඒ
අරමුණෙහි හෝ කෘත්‍යයෙහි එපරිද්දෙන්ම පවතිත්. එහෙ
යින්ම ඕතොමෝ ස්වකීය කෘත්‍ය පරකීය කෘත්‍ය සිද්ධකරන්
නාවූ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය මහවඩු ආදීන් හා සමානයයිද කියන
ලද්දීය.

ඒ එසේ මැයි. ප්‍රධාන ශිෂ්‍යතෙමේ අතික් බාල ශිෂ්‍යයන්
හැදෑරීමෙහි යොදවමින් තෙමේත් හදාරයි. ඒ ප්‍රධාන ශිෂ්‍යයා
හදාරන්ට පටන්ගත් කල්හි සෙසු ශිෂ්‍යයෝද හදාරති මහවඩු
ඇදුරෙක්තෙම තමතුන් වඩුකම් කරමින් අන්‍යයන්ද වඩුකම්
යෙහි යොදවයි. ඒ වඩු ඇදුරුතෙම වඩුකම් කරන්ට පටන්
ගත් කල්හි අන්‍යයෝද කෙරෙත්මය එපරිද්දෙන් ඒ චේතනා
තොමෝද තමාගේ කෘත්‍යයෙන් ආරම්මණයෙහි පවත්නී අන්‍යවූ
චිත්ත චෛතසික ධර්මයන්ද තම තමා අයත් කෘත්‍යයෙහි පවත්
වන්නීය. චේතනා තොමෝ තමාගේ කෘත්‍යය පටන්ගත්
කල්හි ඒ චේතනාව හා යෙදුනාවූ චිත්ත චෛතසික ධර්මයෝද
තම තමාගේ කෘත්‍යය පටන්ගනිත්. එහෙයින් **"සකිච්ච
පරකිච්චසාධකා ජෙට්ඨසිස්ස මහා වඩ්ඪකී ආදයො විය"** යන්
නෙන් චේතනා තොමෝ ස්වකීය කෘත්‍ය පරකීය කෘත්‍ය සාධක
ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය මහා වඩ්ඪකී ආදීන් හා සමානයයි කීයේය. සෙසු
අතවැස්සන් ඇති නමුදු ප්‍රධාන ශිෂ්‍ය තැනම ගුරුන්ට පැමිණි
භාරය ඉසිලීමට ව්‍යාවෘතවන්නාසේ සෙසු චෛතසිකයන්
ඇති නමුදු චේතනා චෛතසිකයම චිත්තානුවර්තීකවැ ආර
ම්මණ භාරය තමාට පැමිණි බරක්මෙන් උසුලමින් කම් සිද්ධිය
පිණිස ව්‍යවෘත වේ. **"සහජාත ධම්ම පදට්ඨානා"** යි කීහෙයින්
සමග උපන් චිත්ත චෛතසික ධර්මයන් ආසන්න කාරණාකොට
ඇත්තීය.

## චේතනා විභාගය නිමි.

ඒකග්ගතා" යනු කුමක්ද? "ඒකත්තාරම්මණසඞ්ඛාතො
අග්ගං කොඨාසො කොටිවා එතස්සාති ඒකග්ගං" මේ චිත්තය
හට එකම ස්වභාවයක් ඇති ආරම්මණයයි කියනලද කොට්ඨා
සයෙක් නොහොත් කෙළවරක් ඇත්තේනුයි. "ඒකග්ග" නම්
මෙහි ඒකග්ග නම් චිත්තයයි. "තස්ස භාවො ඒකග්ගතා" ඒ
එකම කොටසක් නොහොත් එක කෙළවරක් ඇති චිත්තයාගේ
ස්වභාවය තෙම "ඒකාග්‍රතා" නම්. මෙයින් ඒකාග්‍රතා චෛත

සික්ය ලැබේ. ආරම්මණය එකක්වුවද නොයෙක් ස්වභාව ඇත්තේය. එහෙයින් ඒ එකම ආරම්මණයාගේ නානා විධ ස්වභාවයන්හි වික්ෂිප්තබවට නොපැමිණ එකම ස්වභාවයෙක්හි ක්ෂණයක්ද පැවති චිත්තයාගේ යම් නිශ්චලාකාරයෙක් ඇත්තේද හේ නිශ්චලාකාරය ඒ චිත්තයෙහි එකග්ග යන නාමයාගේද එකග්ගයයි දන්නා බුද්ධියගේද ප්‍රවෘත්ති හෙතු භාවයෙන් ගණුලැබේ. එහෙයින්මඹතොමෝ නිර්වාතස්ථානයෙහිදල්වනලද ප්‍රදීපජ්වාලාවන්ගේ පැවැත්මමෙන් චිත්තයාගේ පැවැත්මයයි දතයුත්තීය. වාතය රහිත ස්ථානයෙහි පත්තුකලාවූ පහන් සිළුව නිශ්චලව හෙවත් නොසෙල්වී පැවැත්මමෙන් සිත ඒ මේ අත විසිරයානොදී එක අරමුණක නිශ්චලව පිහිටීමයයි දතයුත්තීය "එකග්ගතා පාමොක්ඛලක්ඛණා අවික්ඛෙපලක්ඛණා වා සහජාතානං සම්පිණ්ඩනරසා වූපසම පච්චුපට්ඨානා සුඛපදට්ඨානා"යි කීහෙයින් එකාග්‍රතා තොමෝ ප්‍රමුඛ බව ලක්ෂණකොට ඇත්තීය. මෙහි "පාමොක්ඛ" නම් ප්‍රධාන කමයි. මගේ ප්‍රධානකම නැත්නම් උඹලාට වැඩ වරදිනවායයි කියන්නාක්මෙනි. නොහොත් නානාරම්මණයන්හි සම්ප්‍රයුක්ත ධර්මයන් නොවිසිරීම ලක්ෂණකොට ඇත්තීය. සමග උපන් චිත්ත චෛතසික ධර්මයන් පිඩුකිරීම හෙවත් එකතුකිරීම කෘත්‍යකොට ඇත්තීය. කුමක් මෙන්ද? යත් ජලයතෙමේ ඇඟ උලා නහන කොකුම් සුණු ආදීන්ගේ පිඩුකිරීමක් මෙනැයි දතයුතුයි. යම්සේ නහනසුණු ආදියට ජලය එකතුකල කල්හි ඒ මේ අත නොවිසිරී එක්වීමට කැටිබවට පැමිණේද එමෙන් විසිර පවත්නා චිත්ත චෛතසික ධර්මයන් එකාග්‍රතා චෛතසිකයතෙම එක්වීමට කැටිවීමට පිඩුවීමට පමුණුවයි. සම්ප්‍රයුක්ත ධර්මයන් සංසිඳවීම ඥානයට වැටහීම් කාරණාකොට ඇත්තීය. බොහෝ සෙයින් සැපය ආසන්න කාරණාකොට ඇත්තීය

**එකාග්‍රතා විභාගය නිමි.**

ජීවිතෙන්ද්‍රිය යනු කුමක්ද? "ජීවන්ති සම්පයුත්තා ධම්මා එතෙනාති ජීවිතං" යම් ස්වභාවයක්කාරණකොටගෙණ යම්හෙයකින් තමා හා එක්ව යෙදුනාවූ සම්ප්‍රයුක්ත ධර්මයෝ දරාසිටිත්ද එසේ දරාසිටීමට හෙතුවන ශක්තිය "ජීවිත" නමි. චිත්ත චෛතසිකයන් ජීවත් කරණ ස්වභාවය ජීවිතයයි දතයුතුයි. "ඉන්දං ඉස්සරියභාවං කාරෙතීති ඉන්ද්‍රියං" මෙතැන්හි ඉසුරු

මත්බව් කරවානුයි "ඉන්ද්‍රිය" නම්. **"ජීවිතංච තං ඉන්ද්‍රියංචාති ජීවිතින්ද්‍රියං"** සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ ජීවනයට කරුණක් හේමය ඉන්ද්‍රියන් භේමනුයි ජීවිතේන්ද්‍රිය නමි. හේ ජීවිතෙන්ද්‍රිය වනාහි බොලව් මගෙන් වෙන්ව තොපට ජීවත්වීමක් නැත්තේය. එහෙයින් තොපගේ ජීවන කෘත්‍යයෙහි මා ඊශ්වරයෙක් කරගනිව්යයි කියන්නාක්මෙන් එක්ව උපන් චිත්ත චෛතසික ධර්මයන් අභිභවනයකොට පවත්නේය. අනන්තර ප්‍රත්‍යයෙන් චිත්ත චෛතසික ධර්මයන් නැවත නැවත හට ගැණීමට ප්‍රත්‍යයවෙයි එහෙයින් **"පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො"** යි කීහු.

සංසාර ප්‍රවෘත්තියෙහි අධිපතියා නම් ජීවිතෙන්ද්‍රියයි. එහෙයින් හේ ජීවිතෙන්ද්‍රිය පවත්නා ස්කන්ධ සන්තතීන්හි ආධිපත්‍යය හෙවත් අධිපතිබව ඇත්තේයයිද නෙළුම් මහනෙල් අනුපාලනය කරන්නාවූ ජලය මෙනැයිද කියනලදී නෙළුම් මහනෙල් දඹුතුල සිදුරු අනුවගිය ජලය ඒ නෙළුම් මහනෙල්මල් ආරක්‍ෂා කරන්නාක්මෙන් චිත්ත චෛතසික ධර්මයන් ඒ ක්‍ෂණයෙහි ආරක්‍ෂා කරවන ජීවත් කරවන ස්වභාව ධර්මය ජීවිතෙන්ද්‍රියයි කියති.

තහවුරුව පවත්නා ජීවිතෙන්ද්‍රියක් නැති නමුත් පරම්පරා වශයෙන් බැසගෙණ යන මහගඟ වතුරක් සෙයින් ක්‍ෂණ ක්‍ෂණයෙහි නැතිව ඇතිවෙමින් පෙළ සෑදී පවත්නාවූ මේ ජීවිතෙන්ද්‍රිය චිත්ත චෛතසික ධර්ම පරම්පරාව පාලනය කෙරෙමින් ස්කන්ධ පරිනිර්වාණයදක්වා පවති. ජීවිතෙන්ද්‍රියක් නොමැත්තාවූ අනින්ද්‍රිය බද්ධ ධර්මයන්හි එබඳු ප්‍රවෘත්ති ස්කන්ධ සන්තති විශෙෂයෙක් නම් නොම ඇත්තේයයි දතයුතු. ලක්‍ෂණාදිය යථාක්‍රමයෙන් දක්වනු පිණිස "සහජාත ධම්මානුපාලන ලක්ඛණං ජීවිතින්ද්‍රියං, සහජාතධම්ම පවත්තනරසං, සහජාත ධම්ම ඨපනපච්චුපට්ඨානං, යාපයිතබ්බධම්ම පදට්ඨානං" යි කියනලදී. ජීවිතෙන්ද්‍රියතෙම සමග උපන් චිත්ත චෛතසික ධර්මයන් පාලනයකිරීම ලක්‍ෂණකොට ඇත්තේය. උත්පාදක්‍ෂණයෙහි පටන් භඞ්ගක්‍ෂණය දක්වා අතර නොනවත්නා ස්වභාව සිද්ධකිරීමෙන් අනුපාලනය කරණ හෙයින් ඒ තමා හා සමග යෙදෙන්නාවූ නාමරූප ධර්මයන්ගේ පැවැත්වීම කෘත්‍ය කොට ඇත්තේය. ඒ නාම රූප ධර්මයන් උත්පාදක්‍ෂණයෙහි

පටන් භඞ්ගක්ෂණය දක්වා තැබීම ශූන්‍යට වැටහීම කාරණා කොට ඇත්තේය. අනුපාලන වශයෙන් පැවැත්වියයුතු ධර්මයෝ ජීවිතෙන්ද්‍රියාගේ ආසන්නකාරණයෝයි.

ඉදින් ඒ ජීවිතෙන්ද්‍රිය තෙමේ ඒ ධර්මයන්ගේ අනුපාලනාදිය සිද්ධකෙරේ නම් ඔවුන්ගේ නිරෝධය කෙසේවේද? එසේ ඇති කල්හි හැමකල්හි සිද්ධවියයුතු නොවේදැයි යන චෝද්‍යය සඳහා **"සන්තෙපිච අනුපාලන ලක්ඛණාදිම්හි විධානෙ අත්ථික්ඛණෙ යෙව තං තෙ ධම්මෙ අනුපාලෙති උදකං විය උප්පලාදිනි"** යනාදිය කීයේය. අනුපාලන ලක්ෂණාදි නියමය ඇති තමුදු අනුපාලනය කටයුතු ධර්මයන්ගේ හා තමාගේද විද්‍යමානක්ෂණයෙහිම ඒ ජීවිතෙන්ද්‍රියතෙම ඒ සහජාත ධර්මයන් රක්ෂා කෙරෙයි. යම්සේ දියෙහිවූ උපුල් ආදිය ජලය තිබෙනතාක් මලානිකනොවී ප්‍රාණවත්ව පවතීද එමෙන් ජීවිතෙන්ද්‍රියතෙමේද තමාගේ විද්‍යමානක්ෂණයෙහි සෙසු සම්ප්‍රයුක්ත ධර්මයන් මලානික විය නොදී ප්‍රාණවත් කෙරෙමින් පාලනය කෙරේයයි දතයුතුයි.

තමා විසින් නොඋපදවනලද ධර්මයන් කෙසේ පාලනය කෙරේදැයි යන චෝද්‍යය සඳහා **"ධාතිවියකුමාරං"** යනුවෙන් මවගේ කුසෙන් උපන් කුමරුවෙකු පසුව රක්නාවූ කිරිමවෙකුමෙනැයි කීයේයි. ඉදින් සෙසු ධර්මයන්ගේ පැවැත්ම යම්කිසි හෙතුවකින් වියයුත්තේය. ජීවිතෙන්ද්‍රියාගේ පැවැත්මට හෙතු කුමක්දැයි යන චෝද්‍යය සඳහා **"සයං පවත්තිත ධම්ම සම්බන්ධෙනෙවච පවත්තති"** යනුවෙන් තමා විසින් පවත්වන ලද ධර්ම සම්බන්ධයෙන්ම පවතීයයි කීයේය. හේ කුමක්මෙන්දැයි යන චෝද්‍යය සඳහා **"නියාමකො"** යනුවෙන් නැව් පදින්නෙකුමෙනැයි කීයේය. ඒ නැව පදින පුරුෂතෙමේද තමා විසින් පවත්වනලද නාවා සම්බන්ධයෙන්ම පවත්නේය. ඉදින් ධර්මයන්ගේ පැවැත්ම ජීවිතෙන්ද්‍රිය පිළිබඳනම් භඞ්ගක්ෂණයෙන් මත්තෙහි කුමක් හෙයින් නොපවත්වාදැයි යන චෝද්‍යය සඳහා "නාපි භඞ්ගතො උද්ධං පවත්තයති" යනුවෙන් භඞ්ගක්ෂණයෙන් මත්තෙහි නොපවත්වයි. තමාගේ හෙවත් ජීවිතෙන්ද්‍රියාගේද පැවැත්වියයුතු ධර්මයන්ගේද නැතිහෙයිනැයි කීයේය. භඞ්ගක්ෂණයෙහි කෙසේදැයි දක්වනු පිණිස **"න භඞ්ගක්ඛණෙපෙති සයං භිජ්ජමානත්තා"** යනුවෙන් ජීවිතෙන්ද්‍රිය බිඳෙනු ලබන හෙයින් භඞ්ගක්ෂණයෙහි නොතබයි. පහන් දැල්ල ක්ෂයවීමත් මෙනි. පහන් වැටියද එහිවූ ස්නෙහ සඞ්ඛ්‍යාත තෙලයද ක්ෂයවූ

කාලෑ පහන් සිළ යම්සේ පොහිබේද එමෙන් නාමා බිඳෙන හෙයින් භඞ්ගක්ෂණයෙහි ඨපනයෙක්ද නොමැත. යථොක්ත විද්‍යමානක්ෂණයෙහි ඒ ඒ කෘත්‍යය සිද්ධකරන හෙයින් අනුපාලනාදීන් විරහිතවූ ජීවිතෙන්ද්‍රියයෙක්ද නොමැත්තේය. නාම ජීවිතෙන්ද්‍රිය රූපජීවිතෙන්ද්‍රිය යන දෙදෙනා අතුරෙන් මෙහි නාම ජීවිතෙන්ද්‍රිය අභිමතයි මේ වනාහි නැවත නැවත නිරුද්ධවූයේ නමුදු චිත්තචෛතසික ධර්මයෝ ජීවිතෙන්ද්‍රියාගේ බලයෙන් ඉපද ඉපදී යෙති

## ජීවිතෙන්ද්‍රිය විභාගය නිමි.

**මනසිකාර** යනු කුමක්ද? “**මනසිං ආරම්මණං කරෙතීති මනසිකාරො**” චිත්තයෙහි අරමුණ කෙරේනුයි “මනසිකාර” නම් සිත අරමුණට හැරවීමය යන තේරුමයි. “**පුරිමමනතො විසදිසං මනං කරොතීතිපි මනසිකාරො**” පූර්ව භවාඞ්ග චිත්තයෙන් විසදෘශවූ (අසමානවූ) වීථි චිත්ත ජවන චිත්ත සංඛ්‍යාත මනස කෙරේනුයිද “මනසිකාර” නම්. හේ මනසිකාරයතෙම වනාහි වීථි පටිපාදක මනසිකාරය, ජවන පටිපාදක මනසිකාරය, ආරම්මණ පටිපාදක මනසිකාරයයි ත්‍රි ප්‍රභේදවේ. ඔවුනතුරෙන් වීථිපටිපාදක මනසිකාරය නම්, පඤ්චද්වාරාවර්ජන චිත්තයයි. එය වනාහි පඤ්චද්වාරික චිත්ත පරම්පරාව ආරම්මණයෙහි යොදවන්නේය. ජවන පටිපාදක මනසිකාරය නම්, මනොද්වාරාවර්ජන චිත්තයයි. එය වනාහි මනොද්වාරික චිත්ත පරම්පරාව අරමුණෙහි යොදවන්නේය. ඒ මනසිකාරයෝ දෙදෙන කුසලාකුසල වීථි සම්පාදක අවස්ථාවෙහිද කුසලාකුසල ජවන සම්පාදක අවස්ථාවෙහිද යොනිසො මනසිකාරය අයොනිසො මනසිකාරයයි ව්‍යවහාරයට පැමිණේ. ආරම්මණ පටිපාදක මනසිකාරය නාම්, සම්ප්‍රයුක්ත ධර්මයන් අරමුණෙහි යෙදවීමයි. මේ ආරම්මණ පටිපාදක මනසිකාරය මෙහි අදහස් කරකලදී. වීථිපටිපාදක ජවනපටිපාදක මනසිකාරයෝ දෙදෙන මෙහි අභිප්‍රාය නොකරන ලද්දහුයි. ආරම්මණ පටිපාදක මනසිකාරය වනාහි චිත්තයක් චිත්තයක් පාසා යොදවන්නේය. වීථියෙන් වීථියටද ජවනයෙන් ජවනයටද චිත්ත ප්‍රතිපාදකයක් ඇත.

ඒ සියලු ප්‍රතිපාදනය මෙම මනසිකාරත්‍රයෙන්වේ. මනසිකාරයාගේ ලක්ෂණාදියද යථාක්‍රමයෙන් දක්වනු ලැබේ. **"සොචෙතසො ආරම්මණෙ සමන්නාහාර ලක්ඛණො, ආරම්මණෙ සංයොජන රසො, ආරම්මණාභිමුඛභාව පච්චුපට්ඨානො, ආරම්මණ පදට්ඨානො"** යේ මනසිකාරය තෙමේ සිතට අරමුණු එළවාලීම ලක්ෂණකොට ඇත්තේය. සවිඩව අශ්වයන් මෙහෙයන්නාවූ රිය සැරියෙක්මෙන් චිත්ත චෛතසික ධර්මයන් අරමුණෙහි එකට යෙදවීම කෘත්‍යකොට ඇත්තේය. අරමුණෙහි යෙදීම් වශයෙන් ඒව අභිමුඛවීම ඥානයට වැටනිම් කාරණාකොට ඇත්තේය. අරමුණ ආසන්න කාරණාකොට ඇත්තේය.

**මනසිකාර විභාගය නිමි.**

**ඵස්ස**-පෙ-මනසිකාරය යන සර්ව චිත්ත සාධාරණයෝ සත්දෙන සැකෙවින් එකුන් අනූවක්වූද විස්තරයෙන් එකසිය විසි එකක්වූද සියලු සිත්වලම යෙදෙති

**විතර්කය** යනු කුමක්ද? **"ආරම්මණං විතක්කෙති සම්පයුත්ත ධම්මෙ අභිනිරොපෙතීති විතක්කො"** යම් ස්වභාවයෙක් චිත්ත චෛතසික ධර්මයන් අරමුණට නංවයිද ඒ අර්ථයෙන් යේ ස්වභාවය විතර්කය නමැයි දතයුතු. එය අරමුණට නගින කල්හි තත් සම්ප්‍රයුක්ත ධර්මයෝද ඒ අරමුණට නැගෙත් එකල්හි ඒ විතර්කය තෙමේම චිත්ත චෛතසික ධර්මයන් අරමුණට නන්වන්නේ නම් වන්නේය. මෙසේ මෙතෙහිකොට (විතර්කය විසින් නැංවීමක්මෙන්) විතර්කයතෙම තමා හා යෙදුන චිත්ත චෛතසික ධර්මයන් අරමුණෙහි ආරූඪකිරීම ලක්ෂණකොට ඇත්තේයයි කියනලදී පිටිසර ග්‍රාමවාසී පුරුෂයෙක්තෙම රජගෙදර දකින්ට යාමමෙනි. යම්සේ නුපුරුදු පිටිසර ග්‍රාමවාසී පුරුෂයෙක්තෙම රජගෙදර දැකීමෙහි ආසාවෙන් පුරුදු මුරකරුවාන් කැටුව ගොස් රජ ගෙදර දුටුයේද එමෙන් විතර්කය ඇසුරුකොට අවශේෂ චිත්ත චෛතසික ධර්මයෝත් අරමුණට නැගෙත්යයි දතයුතු මෙහි පිටිසර මනුෂ්‍යයා නම් චිත්ත චෛතසික ධර්මයි. මුරකරුවානම් විතර්කයයි. මෙසේ උපමා උපමෙය වශයෙන් දතයුතු ඉදින් එසේ විතර්කය නිසා සිත අරමුණට නගිනේවීනම් විතර්ක රහිත සිත අරමුණට කෙසේ නගිනේද? යත් යම් විතර්කයෙක්හුගේ බලයෙන් ඒ සිත අරමුණට නගීද එබඳු විතර්කයක් දෙපස් විඥානයෙහි හා ද්විතීය ධ්‍යානාදි

යෙහි ස්වභාවයෙන් නූපදනා හෙයිනුත් භාවනා බලයෙන් නූපදනා හෙයිනුත් නොලැබෙන්නේ නොවේද? ඒ එසේමැයි දෙපස් විඥ්ඥාණය හැර අවිතර්ක සිත් සපණසද සවිතර්ක චිත්ත සන්තානයෙහි විතර්කය හා සමඟ පැවති පුරුදු බලයෙන් අරමුණට නගින හෙයින් විතර්කය විසින් අරමුණට නන්වන ලද්දේමවේ ඒ එසේ මැයි. යම්සේ පිටිසර මිනිහා රජගෙයි හැසිරීම පුරුදුවූ හෙයින් ඒ මුරකරුවාගෙන් තොරවද සැක නැතිව රජගෙට ප්‍රවිෂ්ටවේද එපරිද්දෙන්ම සවිතර්ක චිත්තයාගේ සන්තානයෙහි නිරතුරු හටගත් පරිචයෙන් විතර්කයෙන් තොරවද අවිතර්ක සිත අරමුණට නගී. මෙහි "පරිචය" යනු සන්තානයෙහි හටගත් චිත්ත භාවනා සඞ්ඛ්‍යාත පුරුද්දයි. ඒ එසේ මැයි. සන්තානයෙහි නිතර හටගන්නා විතර්කයාගේ වශයෙන්ම සිත අරමුණට නැගීම බොහෝකල් පුරුදුවන ලද්දේවෙයි. ඒ පුරුද්ද කරණකොටගෙණ ඇතැම් කලෙක්හි ඒ සිත විතර්කය නැතිවද ඒ අරමුණෙහි හටගන්නීමැයි. යම්සේ ඥාණසම්ප්‍රයුක්තව සම්මර්ශනය කිරීම් වශයෙන් බොහෝකල් පුරුදු කරණලද්දාවූ ඒ සිත ඇතැම් කලෙක්හි ඥාණවිප්‍රයුක්තවත් සම්මර්ශනය කිරීම් වශයෙන් හටගනීද යම්සේ කෙලෙස් සහිතව පැවති සිත සම්ප්‍රකාරයෙන් කොලෙස් රහිතවූයේ තමුදු ඒ කෙලශ පරිචය හෙතුකොටගෙණ කෙලශයන්ගේ වාසනාව වශයෙන් හටගනීද එපරිද්දෙන් දතයුතුයි. අන්‍යාය ක්‍රමයකුදු ඇත. අවිතර්ක දෙපස් විඥ්ඥාණය වස්තු ආරම්මණයන්ගේ ගැටීම් වශයෙන් අරමුණට නැගෙයි. ද්විතීයධ්‍යානාදීහුද උපචාර භාවනා වශයෙන් අරමුණට නැගෙති.

සිත වනාහි අරමුණට නැගේමැයි. ඒ චිත්තයාගේ වනාහි ප්‍රධාන යහළුවානම් මනසිකාරයයි. ඒ මනසිකාරය නැතිකල්හි සිත පස්ස අල්ලන්නෙක් රහිත ඔරුවක්මෙන් යම් ඒ අරමුණක්ගෙණ පවතින්නේය මෙසේ පඤ්ච විඥ්ඥාණය මනසිකාර සහායයාවිත මාගේ අරමුණු දැනගැණීම් බලයෙන්ම අරමුණට නැගෙයි. අකුසලයට පැමිණ වනාහි සිතද ලොභාදීහුද අරමුණට නැගීමෙහි බලවත්මවෙත්. එහෙයින් "**පාප**සම් **රමතෙමනො**" යි කියනලදී.

ද්විතීයධ්‍යාන චිත්තාදීහුද මනසිකාර වීර්‍ය සමෘති යන මොවුන්ගේ වශයෙන් අරමුණට නැගෙත්. විතර්කය වනාහි ඒ

ඒ ආකාරයෙන් කල්පනාකොට අර්ථ සහිත ධර්මයන් අරමුණට නැගීමෙහි අතිශයින් මොනවට බලවතුන් කෙරෙයි. මෙසේ ඒ ඒ කෘත්‍යයෙහි අන්‍යයන්ට වඩා සාතිශය උත්සාහවත් බැවින්ම මේ ධර්මයතෙම විතර්කයයි කියනලදී. අන්‍යවූද අරූප ධර්මයෝ අරමුණු සහිත සවභාව ඇති බැවින් අරමුණට නොනැගෙත්ද? කුමක් හෙයින් මේ සවභාවයම විතර්කයයි කියනලද්දේ දැයි මෙසේ චොදනාවක් ඇත. අන්‍ය ධර්මයන්ගේ වනාහි අරමුණටනැගීම කෘත්‍යයාගේ අතර යෙදීම්වශයෙන්ම සිද්ධයි. මේ විතර්කයට වනාහි මෙයින් අන්‍යවූ කෘත්‍යයෙක් නම් නැත්තේය. එහෙයින් මේ විතර්කයම එසේ කියනලදී විතර්කයාගේ ලක්ෂණාදියද යථාක්‍රමයෙන් දක්වනු පිණිස **"ආරම්මණෙ චිත්තස්ස අභිනිරොපනලක්ඛණො විතක්කො ආහනන පරියාහනන රසො ආරම්මණෙ චිත්තස්ස ආනයන පච්චුපට්ඨානො ආපාථගතවිසයපදට්ඨානො"** යි කීහු. විතර්කය තෙම අරමුණෙහි සිත නැන්වීම ලක්ෂණකොට ඇත්තේය. යොගාවචරයා අරමුණු පෙරල පෙරලා බැලීම (අරමුණ තලා පොඩි කරණ සවභාව) කෘත්‍යයකොට ඇත්තේය. සිත අරමුණකරා ගෙණයාම් සවභාව වැටහීම් කාරණාකොට ඇත්තේය චාරාභිමුඛව වැටුනු ආරම්මණය ආසන්නකාරණාකොට ඇත්තේය.

තවද උපමා වශයෙන් විතර්කය ඝණ්ටාරයකට ගැසූ පහරක්මෙන්ද අහසට නැගෙනු කැමති පක්ෂියෙකුගේ පියා පැහැරීමක්මෙන්ද පියුමක්බලාබස්නා බඹරෙකුගේ පහත්වීමක් මෙන්ද ලෝබඳුනක් මදිනකල ඒ බඳුන එක් අතකින් අල්වා ගැනීමක්මෙන්ද සම්ප්‍රයුක්ත චිත්තය අරමුණට නන්වන සවභාව විතර්කයයි දතයුතු මිට පරනාමධෙයක්ද ඇත්තේයි. ධ්‍යාන මාර්ගී චිත්ත ක්ෂණයන්ට "අර්පණා" සිතයයි කියන්නේ මේ විතර්කය ප්‍රධාන වන හෙයිනි.

**විතර්ක විභාගය නිමි.**

විචාරය යනු කුමක්ද? **"ආරම්මණෙ විචාරෙතීති විචාරො"** විතර්කය විසින් නන්වනලද අරමුණෙහි සවභාව අවබොධවන තුරු එහි චිත්ත චෛතසික ධර්මයන් හසුරුවන සවභාව "විචාරය" නමි. **"සවයං ආරම්මණානුමජ්ජන ලක්ඛණො, ආරම්මණෙ සහජාත ධම්මානුයොජනරසො, චිත්තස්ස අනුප්පබන්ධ පච්චුපට්ඨානො, ආපාථගත විසය පදට්ඨානො"** ඒ මෙ

විචාරය තෙම සඤ්චාරයට ගැසූ පහරින් පසුව නගිනා හුම්කාර ශබ්දය මෙන්ද පියාපත් පැහැර අහසට නැගි පක්ෂියාගේ පියාපත් නිශ්චලව තබාගෙන අහස යාමක් මෙන්ද පියුම මත්තට බට බඹරාගේ පියුම් මත්තෙහි නිශ්චල හැසිරීම මෙන්ද ලෝ බඳුන මදිනා පුරුෂයාගේ එක් අතකින් මැදීම මෙන්ද සම්ප්‍රයුක්ත චිත්තය ලැබගත් අරමුණ පිරිමැදීම ලක්ෂණකොට ඇත්තේය. අරමුණෙහි සහජාත ධර්මයන් අනුකූලව යෙදවීම කෘත්‍යකොට ඇත්තේය. අරමුණෙහි චිත්තයාගේ නොසිඳීමක් මෙන් පැවැත්ම වැටහීම්කොට ඇත්තේය. ච්‍රාභිමුඛයට පැමිණි අරමුණු ආසන්න කාරණාකොට ඇත්තේය. එනම් රූපාදීවූ අරමුණුයි.

**විචාර විභාගය නිමි.**

අධිමොක්ෂය යනු කුමක්ද? "**අධිමුච්චනං අධිමොක්ඛො**" නිශ්චය කිරීම අධිමොක්ෂය නම්. ආරම්මණයෙහි එහෙමයෙ අරමයෙ කියා හටගත් සංසපිතය හෙවත් සැලීම අභිනවනය කොට පක්ෂ පාතනවයෙන් මිදීම් වශයෙන් චිත්තයාගේ පැවැත්ම යයි කියනලදී. මේ අධිමොක්ෂයාගේ බලයෙන් අරමුණෙහි චිත්තය නිශ්චල වන්නේය. එසේ හෙයින් ඉන්ද්‍රඛීලයක් මෙනැයි කියනලදී. සිව් දිගින් හමන පවනින් නොසෙල්විය හැකි නගරද්වාරයෙහි එලිපත සවිකරතුබූ ඉන්ද්‍රඛීලයක්මෙන් අරමුණෙහි සසම්ප්‍රයුක්ත චිත්තය ස්ථිරවශයෙන් පිහිටවීම ස්වභාවකොට ඇති නොහොත් නිශ්චයකොට පවත්වන චෛතසික ධර්මයකි. අධිමොක්ෂයාගේ ලක්ෂණාදී සතර විධිය දක්වනු පිණිස "**සන්නිට්ඨාන ලක්ඛණො අධිමොක්ඛො අසංසප්පන රසො, නිච්ඡය පච්චුපට්ඨානො, සන්නිට්ඨෙය්‍ය ධම්ම පදට්ඨානො**" යි කීහු, අධිමොක්ෂ චෛතසිකය තෙම මෙහෙමයෙ අරමයෙ කියා ලැබගත් අරමුණ විනිශ්චයකර ගැණීම හෙවත් සනිටුහන්කර ගැණීම ලක්ෂණකොට ඇත්තේය. නිශ්චලභාවය හෙවත් නොදුගලුවීම කෘත්‍යකොට ඇත්තේය. අරමුණු විනිශ්චය වැටහීම් කාරණාකොට ඇත්තේය. (එලයයි) විනිශ්චය කටයුතුවූ ආරම්මණධර්මය ආසන්න කාරණාකොට ඇත්තේය.

**අධිමොක්ෂ විභාගය නිමි.**

වීර්‍ය්‍යය යනු කුමක්ද? "**වීරස්ස භාවො වීරියං, ඊරිතං කම්මං වා වීරියං, විධිනා ඊරෙතබ්බං පවත්තෙතබ්බන්ති වා වීරියං**" වීර්‍ය්‍යවන්ත පුරුෂයාගේ ස්වභාවය හෝ උත්සාහවත්

පුරුෂයාගේ ස්වභාවය තෙමේ වීර්ය නම්වේ. නොහොත් වීර පුරුෂයන්ගේ කර්මය වීර්ය නම්වේ. මෙහි වීරපුරුෂයා නම් උත්සාහයෙන් යුක්තවූ පුරුෂයායි විධිවූ පරිද්දෙන් පැවැත්විය යුතු අර්ථයෙන් හෝ වීර්ය නම්වේ. වීර්යතෙම උපස්තම්භන ලක්ෂණ වන්නේය. නොහොත් වෑයම් කිරීම උත්සාහකිරීම ලක්ෂණකොට ඇත්තේය. යම්සේ දිරූ ගෘහයක් අන්‍යවූ කණුවකින් ආධාර ලැබ සිටීද එපරිද්දෙන්ම යොගාවචර තෙමේ වීර්යයාගේ උපස්තම්භනයෙන් උපස්තම්භනය කරනලදුව සියලු කුශලධර්මයන් කෙරෙන් නොපිරිහෙයි. එහෙයින් නාගසෙන ස්ථවිරයන් වහන්සේ මෙසේ කීසේක. මහරජාණෙනි පුරුෂයෙක්තෙම ගෙය එක් අතකට නැමී වැටෙන කල්හි යම්සේ අනික් කරුවකින් ආධාර කරන්නේවේද මෙසේ උපස්තම්භනය ඇතිකල ඒ වැටෙන ගෙය නොවැටෙන්නේය.

මහරජාණෙනි ! එපරිද්දෙන්ම වීර්යතෙම උපස්තම්භන ලක්ෂණවන්නේය. වීර්යයෙන් උපස්තම්භිතවූ සියලු කුශල ධර්මයෝ නොපිරිහෙන්නාහුයයි කීසේක. මෙසෙයින් වීර්යයාගේ උපස්තම්භන ලක්ෂණබව දතයුතු වීර්යතෙම තමන් සමග උපදනා චිත්තචෛතසික ධර්මයන්ට අරමුණු ගැන්මෙහි පසුබස්නට ඉඩනොදී අනුබලදීම රැකුල්දීම් කෘත්‍යයකොට ඇත්තේය. සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ නොපසුබටබව වැටහීම් කාරණකොට ඇත්තේය. කලකිරියයුතු කරුණු ආසන්න කාරණකොට ඇත්තේය. නොහොත් වීර්ය ඇතිවීමට හෙතු සථාවස්තු ඇසීම ආසන්නකාරණකොට ඇත්තේය. නොහොත් වීර්යාරම්භ වස්තූන් ආසන්න කාරණකොට ඇත්තේවේ.

මෙහි වීර්යාරම්භ වස්තු අෂ්ටකය නම්, (1) නවකර්මයක් කරන්ට තිබේයයි ප්‍රමාදනොවී නවකර්මය කරමින්ම සධර්මයෙහි හැසිරෙන්නෙමියි වීර්යවත්වීමය (2) නවකර්මයකොට වෙහෙසුනෙමියි ප්‍රමාදනොවී නවකර්ම වෙහෙස පිටම සධර්මයෙහි හැසිරෙන්නෙමියි වීර්යවත්වීමය (3) ගමනක්යන්ට තිබේයයි ප්‍රමාදනොවී ගමන යමින්ම සධර්මයෙහි හැසිරෙන්නෙමියි වීර්යවත් වීමය (4) ගමන්කොට වෙහෙසුනෙමියි ප්‍රමාදනොවී ගමන් වෙහෙස පිටම සධර්මයෙහි හැසිරෙන්නෙමියි වීර්යවත් වීමය. (5) බඩගින්න ඇත්තෙමියි ප්‍රමාදනොවී බඩගින්න පිටම සධර්මයෙහි හැසිරෙන්නෙමියි වීර්යවත්වීමය. (6) බත් මහින් මත්වීමියි ප්‍රමාදනොවී බත්මත පිටම සධර්මයෙහි හැසි

රෙන්නෙමියි වීය්‍යීවන්වීමය (7) ගිලන් කමක් ඇත්තෙමියි ප්‍රමාදනොවී ගිලන්කමපිටම සධර්මයෙහි හැසිරෙන්නෙමියි වීය්‍යීවත්වීමය. (8) ගිලන්කමින් නැගී අලුතයයි ප්‍රමාදනොවී ගිලන් කමින් නැගී අලුතම සධර්මයෙහි හැසිරෙන්නෙමියි වීය්‍යී වන්වීමය. යනාමොංචිහුයි.

**වීය්‍යී විභාගය නිමි.**

**ප්‍රීතිය** යනුකුමක්ද? **"පීණයතිකාය චිත්තං තප්පෙති වඩ්ඪෙතීති පීති"** යනු නිර්වචනහෙයින් කාය චිත්තද්වය ප්‍රිණනය කරන්නාවූ තර්පණය කරන්නාවූ වර්ධනයකරන්නාවූ ධර්මස්වභාව තොමෝ ප්‍රීති නම්. **"සා සම්පියායන ලක්ඛණා, කාය චිත්ත පීණන රසා, ඵරණ රසාවා, ඔදග්ගි පච්චුපට්ඨානා, පාමොජ්ජ පදට්ඨානා"** යනු කී හෙයින් ඒ ප්‍රීති තොමෝ දුගියෙක්හට මහත් නිධානයක් ලැබුන කලක්මෙන් ඉෂ්ටාලම්බණ ප්‍රතිලාභයෙහි තමා හා සම්ප්‍රයුක්ත ධර්මයන් පිණවීම ලක්ෂණකොට ඇත්තීය. නාමකය හා සිත පිණවීම තර්පණයකිරීම වර්ධනයකිරීම කෘත්‍යකොට ඇත්තීය. නොහොත් ප්‍රණීත චිත්තජ රූපයන් ගෙන් රූපකය ව්‍යාප්තකිරීම හෙවත් පැතිරවීම කෘත්‍යකොට ඇත්තීය. ඔද වැඩිබව වැටහීම් කාරණකොට ඇත්තීය ප්‍රමොද්‍යය ආසන්න කාරණකොට ඇත්තීය ප්‍රීති තොමෝ ඛුද්දිකාදි වශයෙන් පඤ්ච ප්‍රභෙද වන්නීය. ඒ කෙසේද? යත්.

**ඛුද්දිකා ඛණිකා පීත් පීති ඔක්කන්තිකාපිච**
**උබ්බෙගා ඵරණා පීති පීති පඤ්චවිධා භාව**

මේ ගාථාව පාඩම්කොට සිත තබාගතයුතු. ප්‍රීති තොමෝ ඛුද්දික පීතිය, ඛණික පීතිය, ඔක්කන්තික පීතිය, උබ්බෙග පීතිය ඵරණ පීතියයයි පස්වැදෑරුම් වන්නීය. ඔවුනතුරෙන් සියළු ශරීරයෙහි ලොමු ඩැහැගැනීම ඛුද්දික පීති නම්. ක්ෂණයක් ක්ෂණයක් පාසා විදුලියක්මෙන් ඇතිවෙමින් පවත්නාවූ ප්‍රීතිය ඛණික පීතිනම්. සමුද්‍රවෙරළේ රැළ කැඩි කැඩී යන්නාක්මෙන් ශරීරයෙහි ඇතිව නිරුධවන්නාවූ ප්‍රීතිය ඔක්කන්තික පීතියයි. ශරීරය උඩට නැගී අහසෙහි ඉගිල්ලවනතරම බලවත්ව ඇතිවන්නාවූ ප්‍රීතිය උබ්බෙග පීතිනම් වාතයෙන් පිරීගිය සම්භයි යක්සේද මහ වතුරෙන් පිරීගිය පර්වත කුක්ෂියක්සේද සියළු ශරීරය පුම්බවා ගැනීම ඵරණ පීතියයි මෙහි කියනලද උද්වෙග ප්‍රීතිය උපන් තැනැත්තාගේ රූපකාය සැහැල්ලු වීමෙන් අහසට පවා නැගී කැමති තැනට ගමන්කල හැකිවේ.

**ප්‍රීති විභාගය නිමි.**

ඡන්දය යනු කුමක්ද? "ඡන්දනං ඡන්දො" යනු නිර්වචන
නෙයින් අරමුණු කැමතිවීම ඡන්දනම්. ආශාව ප්‍රාර්ථනාව
ඕනෑකමයයි කියනලද්දේවේ. ඡන්දය තෙමේ කත්තුකාමතා
ඡන්දය, තෘෂ්ණා ඡන්දයයි විප්‍රකාරවේ. එයින් කත්තුකාමතා
ඡන්දයනම්, යම් කටයුත්තක් කරනු කැමති බවයි. තෘෂ්ණා
ච්ඡන්දය නම් රූපාදී වශයෙන් යම් අරමුණක් ලැබ එහි ඇලීම්
වශයෙන් පවත්නා කැමැත්තයි. කුශල පක්ෂයෙහි උපන්නේ
කත්තුකාමතා ඡන්දනම්වෙයි. අකුශල පක්ෂයෙහි උපන්නේ
තෘෂ්ණාච්ඡන්දනම්වෙයි. මහනිල් මලෙහි විද්‍යමාන ජලයමෙන්
කත්තුකාමතා ඡන්දයද කොහොල්ලවල ඇලෙන්නාවූ මැස්සා
මෙන් තෘෂ්ණාච්ඡන්දයද උපමා උපමේය වශයෙන් දතයුතු.
මෙසේ මොවුන් දෙදෙනාගේ වෙනස දතයුතු. මෙහි කත්තු
කාමතා ඡන්දය අභිප්‍රේතයි.

හේ වනාහි අරමුණු කැමති වන්නේ නමුදු තෘෂ්ණාවමෙන්
අශ්වාදනය කිරීම් ඇලීම් වශයෙන් කැමති නොවන්නේයි.
යම්කින්යම්කින්වනාහි ප්‍රයෝජනඇත්තේවේද? ඒ ඒ අර්ථය සිද්ධ
කරනුකැමති වශයෙන්මකැමතිවන්නේයි යම්සේ රජහුගේ ධනුර්
රයෝ හෙවත් දුනුශිල්පයෙහිදක්ෂවූවෝ ධනයෙන් හා යසසින්ද
ප්‍රයෝජනවූවාහු රජහුගේ විරුද්ධ සතුරන්ට විදීම් වශයෙන්
අත්හැරිය යුතුවූද බොහෝ ඊතල කැමති වෙත්මද එපරිද්
දෙන්ම මේ ඡන්දය තෙමේද අනන්ට විසදියයුතුවූ හෙවත්
පරිත්‍යාග කටයුතුවූ ධනවස්තූද තමාට නොලබනලද ධනවස්තූද
ලබන්ට කැමති වන්නේය ලබනලද ධනවස්තූද රක්ෂාකරන්
ටත් කැමති වන්නේය. මේ ඡන්දය තෘෂ්ණාවට වඩා අධිපති
භාවයට පැමිණියාවූ බලවත්වූ ශක්තිමත්වූ ධර්මයක් නිසා
ඡන්දාධිපති ඡන්දිද්ධිපාද කෘත්‍යයන්පවා සිද්ධකෙරෙයි.

ඉදින් මේ ඡන්දයතෙම තෘෂ්ණාව හා සමාන බල ඇත්තේ
වන්නේ නම් තෘෂ්ණාවගේ භයානයෙහි සිටියාවූ මේ සත්වයෝ
තෘෂ්ණාවෙන් දැඩිසේ ගන්නාලද ධන භොග රාජ්‍ය සැප හා
දිව්‍ය බ්‍රහ්ම සම්පත්ද හැරදමා ව්‍යතීත දුඃඛයෙන් එතරවන්ට
නොමහැකිවන්නාහුයයි දතයුත ඒ ඡන්දයතෙම අරමුණු කරන
කැමති බව ලක්ෂණකොට ඇත්තේය. අරමුණු සෙවීම් කෘත්‍ය
කොට ඇත්තේය. ආරම්මණයෙන් පයෝජනවත්බව වැටහීම්
කොට ඇත්තේය. ඡන්දයාගේ ආසන්න කාරණයද මෙයමවේ.
මෙය වනාහි තෘෂ්ණාවට ඉඳුරාම ප්‍රතිපක්ෂ ධර්මයකැයි දතයුතු.

**ඡන්ද විභාගය නිමි**

"සොභනා සොභනෙසු චිත්තෙසු පකිරන්තීති පකිණ්ණකා" යනු කීහෙයින් අටවෙනි චෛතසිකය පටන් මේ ධර්මදෙන සොභන අසොභන සිත්හි විවිධාකාරයෙන් විසිර පවත්නා හෙයින් පැතිරීගිය හෙයින් ප්‍රකීර්ණක චෛතසිකයයි කියනු ලැබෙත්. මේ තෙලෙසම එක්කොටගෙණ අන්‍ය සමාන චෛතසිකයයි කියනි කුමක් හෙයිනයත්, "අඤ්ඤැව අඤ්ඤැව අඤ්ඤැ" යනු වනැ සමාස හෙයින් සොභනයන් කෙරෙන් අන්‍ය අසොභන චිත්තයෝද අසොභනයන් කෙරෙන් අන්‍ය සොභන චිත්තයෝද අන්‍ය නම් උද්ධච්ච ශ්‍රද්ධාදීන් මෙන් ඒකාන්ත අකුසල ස්වභාව හෝ කුශල ස්වභාව හෝ නැතුව කුසල් අකුසල්යයි කියනලද ඔවුනොවුන්ට සමාන හෙයින් අන්‍ය සමානයයි කියනුලැබෙති මේ අන්‍යසමාන තෙලෙස සොභන අසොභන දෙපක්ෂයෙහිම යෙදේ.

**මොහය** යනු කුමක්ද? **"මුය්හතීති මොහො"** යම් ස්වභාවයෙක් අරමුණෙහි මුළාවෙයි නම් ඒ ස්වභාවයතෙම මොහනම් නොහොත් **"මුය්හන්ති සත්තා එතෙනාතිවා මොහො,"** මේ ස්වභාවය කරණකොටගෙන සත්වයෝ මුළාවෙද්ද එසේ සත්වයන්ගේ මුළාවීමට කරුණුවූ හෙයින් ඒ ස්වභාවයතෙම මොහනම්. නොහොත් **"මුය්හනමත්තංවා මොහො"** මුළාවීම මාත්‍රය මොහනම්. චතුරංග සමන්නාගත අන්ධකාරයෙහි සිටින්නෙකුට කිසි අරමුණක් නොපෙණෙන්නාක්මෙන්ම මුළුමනින් සියළු යහපත වසාදමා චිත්තයාගේ අඳුරුබව කිරීම යයි කියනලදී. නොදැනීමය මුළාවීමය මෝඩකමය යනාදි නම් වලින් කියන්නේ මේ ධර්මයයි. දෙතිස් කුණපයෙන් හටගත් ශරීර ඇති ස්ත්‍රී පුරුෂයන් ඔවුනොවුන් දැකීමේදී සියලු යස ඉසුරු ජීවිතය පවා හැර ඒ ස්ත්‍රී පුරුෂයන් අත්පත් කරගැණීම් ආශාකිරීම් ආදි වශයෙන් උපදින සිතේ මේ මොහය ඇත්තේය.

ඒ මොහය ඒ දෙතිස් කුණපයන්ගේ ඇති පිළිකුල් ස්වභාව මුවහකොට සසම්ප්‍රයුක්ත සිතට නැත්තක් පෙන්වන හෙයින් මොහය කෙබඳු ධර්මයක්දැයි සිතාගතයුතු. ඒ මොහයතෙම පාප පක්ෂයට පැමිණ ඥානයමෙන් ක්‍රියා කෙරේයයි දතයුතු. එහෙයින්ම මේ මොහයතෙම පෙලෙහි මිථ්‍යා ඥානයයි කියන ලදී. අට්ඨකථාවන්හිද මිථ්‍යාඥාන යනු පාප ක්‍රියාවන්හි උපාය චින්තා වශයෙන් පැවතියාවූ මොහයයි කියනලදී. මොහය

තෙම් වනාහි අප්‍රත්පත්ති මොහය මිථ්‍යා ප්‍රතිපත්ති මොහයයි දෙවදෑරුම්. එයින් කල්‍යාණ පක්ෂයෙහි නොදැනීම අප්‍රතිපත්ති මොහයයි පාප පක්ෂයට පැමිණ ඥානය මෙන් ඉදිරිපත්ව ක්‍රියා කිරීම මිථ්‍යා ප්‍රතිපත්ති මොහයයි එහෙයින්ම පාප පක්ෂයට පැමිණ ඥානයමෙන් ක්‍රියා කරන ධර්ම පසකි. එනම් මොහය, ලොභය, දිට්ඨිය, විතර්කය, විචාරය, යන මොව්හුයි. හිතද ඥානයට හුරුබැවින් සිත හා සම්ග සදෙනෙකි. එහෙයින් කියනලදමැයි.

**"මොහො ලොභො දිට්ඨිච-විතක්කො විචාරොපිච**
**චිත්තංචෙති ඉමෙ ධම්මා පාපසම්ඤ්ඤාණචාරිනො"** යි

මෙකී ධර්මයන්ගෙන් යුක්තවූවන්ට පැණවනනයෝයයි ප්‍රශංසා කෙරෙති. ඒ මේ ධර්මයෝ සියලු සත්ත්වයන් කෙරෙහි ඥානගතික නොවෙත්. ඥානය හා මිශ්‍රවීම ලැබම් ඥානගතික වෙත්. ඒ ධර්ම සදෙන කාරණාකොටගෙන ප්‍රකෘතියෙන් විඥ සවභාව ඇක්තවුන් කෙරෙහිද ශ්‍රැත පයර්‍යාප්තියෙන් සමන් විතවූවන් කෙරෙහිද පාප ක්‍රියාවන්හි ඒ ඒ උපාය ඇති කිරීම් වශයෙන් අකුශල කර්මයන්හි දක්ෂ භාවයද ප්‍රතිබල භාවයද ඇති කරන්නේයි.

මොහයතෙමේ ධර්ම වශයෙන් සොතාපත්ති මාර්ගයට පූර්ව භාගවූ ගොත්‍ර භූ චිත්තය දක්වාද පුද්ගල වශයෙන් අනාගාමි පුද්ගලයා දක්වාද භූමි වශයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය දක්වාද ව්‍යාප්තව පවතී. එසේම මොහයතෙම සියලු දුකට මුල්වූ කාරණා වන්නේයයිද සියලු භය උපද්‍රව ඇති කරන්නේයයිද දුක්ඛ සත්‍යාදී සියලු ධර්මයන් මුවාකොට අන්ධකාර කරන්නේයයිද පරලොව්හි බලු සිවල් ආදී තිරිසන් යොනිවල උපදවන්නේයයිද සියලු අකුසලයන්ට මුල්වන්නේයයිද දතයුතුයි. දැන් ලක්ෂණාදි සතර විධිය දක්වනු ලැබේ **චිත්තස්ස අන්ධභාව ලක්ඛණො මොහො, අඤ්ඤාණ ලක්ඛණොවා, ආරම්මණසභාව පටිච්ඡාදන රසො, අන්ධභාව පච්චුපට්ඨානො, අයොනිසො මනසිකාර පදට්ඨානො"** ඒ මොහයතෙම වනාහි චිත්තයාගේ ධර්ම සවභාව තත්වූ පරිද්දෙන් නොදක්ම ලක්ෂණකොට ඇත්තේය. නොහොත් නොදැනීම ලක්ෂණකොට ඇත්තේය. අර

මුණු ස්වභාව වැසීම කෘත්‍යකොට ඇත්තේය. අන්ධකාරය විදර්ශනා ඥානයට වැටහීම්කොට ඇත්තේය. අනුපායයෙන් මෙනෙහි කිරීම ආසන්න කාරණාකොට ඇත්තේය.

**මෝහ විභාගය නිමි.**

**අහිරිකය** යනු කුමක්ද? **"නහිරියතී කායදුච්චරිතාදීහි නලජ්ජතී නජිගුච්ඡතීති අහිරිකො"** යනු නිර්වචන හෙයින් යම් ස්වභාවයෙක් කාය දුශ්චරිතාදිය කෙරෙන් ලජ්ජා නොවේද පිළිකුල් නොකෙරේද එසේ හෙයින් ඒ ස්වභාවය අහිරිකනම්වේ. මෙයින් පුද්ගලයා හෝ ධර්මසමූහය ලැබේ. **"අහිරිකස්ස භාවො අහිරිකං"** පුද්ගලයාගේ හෝ චිත්තයාගේ හෝ සම්ප්‍රයුක්ත ධර්ම සමුදායගේ හෝ ස්වභාවය "අහිරික" නම්. එය පාප ක්‍රියාවන් එළඹ සිටිකල්හි හිරියට අවකාශනොදී පාප ක්‍රියාවන්හි කැමැත්ත ඇතිකෙරේ. මේ අහිරික චෛතසිකය ග්‍රාම සූකරයාමෙනි.

අසුචියෙන් පිළිකුල් නොකරන ගම්හුරෙකු මෙන් කෙලෙස් නමැති අසූචියට පිළිකුල් නොවීම අහිරික චෛතසිකය හෙතු කොටගෙණවේ. දැන් අහිරික චෛතසිකයාගේ ලක්ෂණාදී සතර විධිය දක්වනු ලැබේ

**"කාය දුච්චරිතාදීහි අජිගුච්ඡන ලක්ඛණං අහිරිකං අලජ්ජනාකාරෙන පාපානං කරණරසං, පාපතො අසංකොචන පච්චුපට්ඨානං, අත්ත අගාරව පදට්ඨානං."** ඒ අහිරික චෛතසිකය වනාහි කාය දුශ්චරිතාදිය හෙතුකොටගෙණ පිළිකුල් නොකිරීම ලක්ෂණකොට ඇත්තේය. ලජ්ජා නොවීම් ආකාරයෙන් පව්කිරීම කෘත්‍යකොට ඇත්තේය. පවකෙරෙන් නොහැකිළීම පවට හැරීම විදර්ශනා ඥානයට වැටහීම්කොට ඇත්තේය ආත්ම අගෞරවය ආසන්න කාරණාකොට ඇත්තේය. මේ වනාහි තමාම අරමුණුකොට පවත්නාවූ ධර්මයකි.

**අහිරික විභාගය නිමි.**

**අනොත්තප්පය** යනු කුමක්ද? **"න ඔත්තප්පතීති අනොත්තප්පං"** යනු නිර්වචන හෙයින් යම් ධර්ම සමූහයෙක් කාය දුශ්චරිතාදිය කෙරෙන් ත්‍රාස නොවේද එසේ හෙයින් ඒ ධර්ම සමූහය අනොත්තප්පනම්වේ එය පාප ක්‍රියාවන් එළඹ සිටිකල්හි ඔත්තප්පයට අවකාශනොදී හිත පාප ක්‍රියාවන්හි භය නැතිකොට පවතින්නේය මේ අනොත්තප්ප චෛතසිකය

පළගැටියාමෙනි. ගින්නට බියනොවන පළගැටියෙකුමෙන් කාය දුශ්චරිතාදියට බියනොවීම අනොත්තප්ප චෛතසිකය කාරණාකොට ගෙණවේ

**අනොත්තප්ප විභාගය නිමි.**

**උද්ධච්චය** යනු කුමක්ද? "**උද්ධරතීති උද්ධතං**" යනු නිර්වචන හෙයින් අරමුණෙහි නිතර ඉදිරෙන්නාවූ ධර්මය උද්ධත නම්වේ මෙයින් චිත්තය ලැබේ. "උද්ධතස්ස භාවො උද්ධච්චං" නොසන්සුන් චිත්තයාගේ හෝ තත් සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ හෝ සව්භාවයතෙම උද්ධච්චනම්වේ. අළුගොඩකට ගල්ගැසූ කල්හි ඒ භස්ම රජස් විසිරී භ්‍රමණයවෙමින් පවත්නා කලක්මෙන්ද ගල්ලැල්ලක් උඩ කරකැවෙන බඹරයක් මෙන්ද චිත්ත චෛතසික ධර්මයන්ගේ එක අරමුණක තැන්පත් බවක් නැතිව දූගලීම් සවභාවය උද්ධච්චයයි. අශ්වයන් දමනය කරන්නාවූ සාරථි තෙමේ අසුපිට ආරූඪවී කැමති දිශාවකටයන්ට ඉඩහැර ඉක්බිති ළඟට හිරිහැරකොට තමාගේ වශඟයටගනී. මෙයින් කුමක් අභිමතද? යතහොත් යම් කිසි අරමුණෙක දූගලීම් ආකාරයෙන් පවත්නා උද්ධච්චය අශ්වයාට කැමති දිශාවකට යන්ටදීම හා සමානයි. එකාග්‍රතා තොමෝ පසුව අශ්වයාට හිරිහැරකොට තමාගේ වශඟයට ගන්නාක් හා සමාන වන්නීය.

උද්ධච්ච චෛතසිකයාගේ ලක්ෂණාදි සතර විධිය නම්. "**චේතසො වූපසම ලක්ඛණං උද්ධච්චං, අනවට්ඨානරසං, භන්තත්ත, පච්චුපට්ඨානං, අයොනිසොමනසිකාර පදට්ඨානං**" යනුයි. උද්ධච්චය වනාහි වාත ප්‍රහාරයෙන් සැලෙන ජලයක් මෙන් චිත්තයාගේ නොසන්සිඳීම ලක්ෂණකොට ඇත්තේය. වාත ප්‍රහාරයෙන් සැලෙන ධ්වජපතාකයක්මෙන් එක් අරමුණෙක්හි නොපිහිටීම කෘත්‍යකොට ඇත්තේය. පහණකින් ගැසීමෙන් අහසට නැගි අළු රැසක්මෙන් භ්‍රාන්තවීම් ආකාරය ඥානයට වැටහීම්කොට ඇත්තේය අනුපාය හෙයින් මෙනෙහි කිරීම ආසන්න කාරණකොට ඇත්තේය. උද්ධච්චයතෙම තමා විසින් ගන්නාලද ආකාරයෙනිම සිට භ්‍රමණයවෙයි එක අරමුණෙක්හිම සැලීම් වශයෙන් පවතී.

**උද්ධච්ච විභාගය නිමි.**

**ලොභය** යනු කුමක්ද? **“ලුබ්භතීති ලොභො”** යනු නිශ්‍රිත හෙයින් යම් ස්වභාව ධර්මයෙක් රූපාදී අරමුණෙහි ලග්න වේද? එසේ හෙයින් ඒ ස්වභාව ධර්මය ලොභ නම්වේ. **“ලුබ්භනති සම්පයුත්ත ධම්මා එතෙනාති වා ලොභො”** නොහොත් ලොභය හෙතුකොටගෙණ තත් සම්ප්‍රයුක්ත ස්පර්ශාදි ධර්මයෝ හෝ ඒ ලොභයෙන් යුක්ත පුද්ගලයෝ හෝ අරමුණෙහි ගිජුවෙද්ද එසේ හෙයින් ලොභයනම්වේ. නොහොත් **“ලුබ්භනමත්තං වා ලොභො”** ගිජුවීම් මාත්‍රය ලොභයනම්වේ.

මෙහි ලොභය නම්, රූපය කෙරෙහි ඇලීමය, ශබ්දය කෙරෙහි ඇලීමය, ගන්ධය කෙරෙහි ඇලීමය, රසය කෙරෙහි ඇලීමය, ස්පර්ශය කෙරෙහි ඇලීමය, සිතිවිලි ධර්මකෙරෙහි ඇලීමයයි කියනලද සවැදෑරුම් අරමුණෙහි විශෙෂයෙන් ඇලීමයයි දතයුතුයි.

වඳුරන් අල්වන පුරුෂයෙකුගේ පුවරුකඩ ගා තබනලද ලාටු උගුලෙහි අත්පා ආදි කීපපලක් බැඳීයන්නාවූ වඳුරෙකු මෙනි. මෙහි ලාටු උගුලමෙන් රූපාදී අරමුණුද අත්පාආදි කීපපලක් ඇලීමමෙන් චක්ෂුරාදි ෂඩ්ද්වාරයන් ඇසුරුකොට උපදනා රූප තෘෂ්ණාදී වශයෙන් ප්‍රභෙද සවැදෑරුම් ලොභයද දතයුතුයි

ලොභ චෛතසිකයාගේ ලක්ෂණාදි සතර විධිය නම්, **“ආරම්මණග්ගහණලක්ඛණො ලොභො ආරම්මණාභිසඞ්ගරසො අපරිච්චාග පච්චුපට්ඨානො සංයොජනියෙසු ධම්මෙසු අස්සාද පදට්ඨානො”** යනුයි. ඒ ලොභය වනාහි මක්කාටං ලෙපයක් මෙන් මෙය මාගේයයි තෘෂ්ණාභිනිවෙස වශයෙන් ඇතුලත්ව අරමුණ අත්නොහැර දැඩිසේ තරයේ ගැණීම ලක්ෂණකොට ඇත්තේය. රත්වූ කබලක්හි දමනලද මස්පෙත්ත එකාබද්ධ වන්නාක්මෙන් අරමුණෙහි විශෙෂයෙන් ඇලීම කෘත්‍යකොට ඇත්තේය. තෙල් මිශ්‍ර සායමක්මෙන් අත්නොහැරීම නොහොත් මුදවාලිය නොහැකිබව ඥානයට වැටහීම්කොට ඇත්තේය සංයොජනයන්ට ප්‍රත්‍යවූ ත්‍රෛභූමක ධර්මයන් කෙරෙහි ආශ්වාද වශයෙන් දර්ශනය ආසන්න කාරණාකොට ඇත්තේය ලොභය අභිනන්දන පරිග්‍රහණ වශයෙන් විවිධවේ. එයින් ක්‍රීඩා කිරීම් ආදිය දැක සතුටුවීම් වශයෙන් පවත්නා ලොභය අභිනන්දන ලොභය නම්වේ. අනුන් සන්තක වස්තුව තමා අයත්කරගැණීම් වශයෙන් පවත්නා ලොභය පරිග්‍රහණ ලොභය නම්වේ. මිට තෘෂ්ණාවයයිද කියනුලැබේ.

හේ කාම භව විභවයයි ත්‍රිවිධවේ. එය රූපතණ්හාදි සයෙන් සඞ්ග්‍රහකළ කල්හි 18 කි. කාලත්‍රයෙන් වැඩිකලවිට 54 කි අජ්ඣත්ත බහිද්ධා වශයෙන් වැඩිවී 108 දෙනෙකි. යම්කිසි සැඩපහර කට අසුවූ තෘණාදිය මහා සමුද්‍රයට ගෙන යන්නාක්මෙන් තෘෂ්ණා නමැති ඔසය කරණකොටගෙණ සත්වයෝ සතර අපායට ගෙනයන්නාහුයයි දතයුතුයි.

**ලොභ විභාගය නිමි.**

**දෘෂ්ටිය යනු කුමක්ද? "දස්සනං දිට්ඨි"** දෘෂ්ටිය නම් සද්ධර්මයෙහි අල්ප ශ්‍රැත පුද්ගලයන් ඇසුරුකිරීම යහපත් ධර්මයන් ශ්‍රවණය නොකිරීම යන ආදිය හෙතුකොටගෙණ ලොකය දෙවියෙකු විසින් මවනලද්දේය යන අසත්‍ය මතය අනුව සීමාව ඉක්මවා අධිකව කල්පනා කිරීමයයි කියනලද අභිධාවනයෙන් යම් කිසි දෙවියෙක් විසින් නොමවන ලද්දේ නම් මහා මෙරු පර්වත මහා පෘථිවි චන්ද්‍ර සූර්ය නක්ෂත්‍ර තාරකාදි විශිෂ්ට ලොකාවයවයන් විද්‍යමානවිය නොහැකි බැවින් මහානුභාව සම්පන්න දෙවියෙකුගේ මැවීමෙන්ම පහලවූයේය අන්‍යහෙයකින් පහල වූයේ නොවේයයි එකාන්ත හෙතුව හැර ප්‍රතිරූපක හෙතුයෙහි එල්බගෙන හටගන්නාවූ වැරදි දැක්මයි. ඇස්බැන්දුම් කරණ පුරුෂයා කැට කැබලිති ආදිය රන්රුවන්කොට පෙන්වන්නාක්මෙන් සසම්ප්‍රයුක්ත චිත්තයට අරමුණු සවභාව පෙරලා පෙන්වීම දෘෂ්ටිනම්වේ. ඥාන දෘෂ්ටි යන දෙකම අරමුණු දැන ගැණීම ලක්ෂණකොට ඇත්තේය. නුමුත් ඥානය අරමුණේ ඇත්තාවූ ඇති සැටිය දැනගණී. දෘෂ්ටිය ඇති සවභාව හැර වරදවා දනගණී

මෙසේ මේ ධර්ම දෙදෙනාගේ වෙනස දතගතයුතුයි. දෘෂ්ටි චෛතසිකය පිස්සිගේ පලාමල්ලවැනිය. පලාමල්ලෙහි ලැබුනු ලැබුනු දේ දමාගන්නාක්මෙන්ම දෘෂ්ටි චෛතසිකය ලත් ලත් ලබ්ධීන් ධාරගණීයි. තවද නාස්තික අක්‍රිය අහෙතුකයයි දෘෂ්ටිත්‍රයක් ඇත. එයින් කුශලාකුශල කර්ම හා ඵලය නැතැයි විශ්වාසකිරීම නාස්තික දෘෂ්ටිනම්. කුශල ක්‍රියාවක් අකුශල ක්‍රියාවක් නැත්තේයයි ගැණීම අක්‍රිය දෘෂ්ටිනම්. හෙතුබලයෙන් හටනොගත්තේ අහෙතුක නම් නාස්තික දෘෂ්ටියෙන් කර්ම විපාකයද අක්‍රිය දෘෂ්ටියෙන් කර්මයද අහෙතුක දෘෂ්ටියෙන් කර්මය හා ඵලයද ප්‍රතිබාහනය කෙරෙයි. දෘෂ්ටි චෛත

ඨියාගේ ලක්ෂණාදි සතරවිධියනම්, **"අයොනිසො අභිනිවෙසලක්ඛණා දිට්ඨි, පරාමාසරසා, මිච්ඡාභිනිවෙස පච්චුපට්ඨානා අරියානං අදස්සන කාමතාදිපදට්ඨානා"** යනුයි.

දෘෂ්ටි තොමෝ අරමුණ අයොග්‍ය කාරණා වශයෙන් ඇතුල් කරගැනීම් ලක්ෂණකොට ඇත්තීය. අනිත්‍යාදි වශයෙන් අන්‍යවූ නිත්‍යාදි වශයෙන් ගැණිම කෘත්‍යකොට ඇත්තීය. විපරීත වශයෙන් අරමුණු ගැණීම වැටහීම් කාරණාකොට ඇත්තීය. ආර්‍යයන් නොදක්ම කැමතිවීම් ආදිය ආසන්න කාරණාකොට ඇත්තීය. මේ දෘෂ්ටිය වනාහි සියලු වද්‍යයන් කෙරෙන් අතිශයින් මහා සාවද්‍යවූ ධර්මයකැයි දතයුතුයි.

**දෘෂ්ටි විභාගය නිමි.**

**මානය** යනු කුමක්ද? **"මඤ්ඤනං මානො"** යනු නිරුවත හෙයින් සෙස්සන්ට වඩා මම අතිශය උත්තමයෙක් වෙමැයි යනාදී ක්‍රමයෙන් හැඟීම මානනම්. එය සෙය්‍ය සදිස හීන වශයෙන් ත්‍රිවිධයි. මම උතුමෙකැයි ප්‍රශස්තයෙකැයි හැඟීම සෙය්‍යමානයයි. ලොව ඇතිනාක් උතුමන්ට ඓශ්වර්‍යාදියෙන් මමත් සමානයයි හැඟීම සදිසමානයයි. අනික් අයටවඩා මම ඓශ්වර්‍යාදියෙන් හීනයෙමි. නුඹුන් ඔවුන්ට මම නොබාමියි හැඟීම හීනමානයයි මේ මේ ආකාරයෙන් උපදනා සිත්හි තුන් ආකාරවූ මාන චෛතසිකය ලැබේ.

එය සෙය්‍යස්ස සෙය්‍ය සෙය්‍යස්සසදිස සෙය්‍යස්සහීන යනාදීන්ගේ වශයෙන් නවවිධවේ එනම්, උත්තමයාටත් උතුම්ය, උත්තමයාට සමානය, උත්තමයාට හීනය, සමානයාටත් උතුම්ය සමානයාට සමානය, සමානයාට හීනය, හීනයාට උතුම්ය, හීනයාට සමානය හීනයාට හීනය, යනමොව්හුයි.

සීලවන්තයන් අතුරෙන් මම උතුම් සීලවන්තයෙක් වෙමැයි ප්‍රඥාවන්තයන් අතුරෙන් මම උසස් කෙනෙක් වෙමැයි පින් කරන්නවුන් අතුරෙන් මම වැඩියක් පින්කරන්නෙක් වෙමැයි යනාදි වශයෙන් මානය උපදනේයි මෙය රහතන් වහන්සේ අහින් මාර්ගඥානයෙන් මූලොත්පාටනා වශයෙන් ප්‍රහීනකරන් නේය. අතිරික්ත මාර්ගත්‍රයේදී පවතී.

මාන චෛතසිකයාගේ ලක්ෂණාදි සතර විධිය නම්, **'උණ්ණතිලක්ඛණොමානො සම්පග්ගහණරසො, කෙතුකම්‍යතා පච්චුපට්ඨානො දිට්ඨිවිප්පයුත්ත ලොභ පදට්ඨානො"** යනුයි,

ඒ මානය තෙමේ තමාම උතුම්මෙකැයි ගැණීම ලක්ෂණකොට ඇත්තේය. උන්නති වශයෙන් තමා හෝ සම්ප්‍රයුක්ත ධර්මයන් හෝ අතිශයින් ගැණීම කෘත්‍යකොට ඇත්තේය. උස්වූවකට නැගූ ධ්වජයක්මෙන් කරණු කැමතිබව වැටහීම් කාරණා කොට ඇත්තේය. දෘෂ්ටියෙන් වීපිය යුතුවූ ලෝභය ආසන්න කාරණාකොට ඇත්තේය.

"**සම්පග්ගහණරසො**" යනුමෙහි වීර්‍ය්‍යයමෙන් ඒ ඒ කෘත්‍ය සාධනයෙහි අතිශයින් උත්සාහ කිරීම වශයෙන් නොව හිත යාගේ ආත්මය නීචකොට ගැණීමද සම්පග්ගහණ වශයෙන්ම යයි දතයුතුයි "**කේතුකම්‍යතා** පච්චුපට්ඨානො" යන මෙහි උස්ව නගනලද ධ්වජය කෙතුයයි කියනුලැබේ.

මෙහි වනාහි යම් සිතක්තෙමේ තමා ධ්වජයක්මෙන් උසස් වීම් ආදී ස්වභාව කැමතිවේද ඒ සිත කෙතුකාම්‍ය නම්වෙයි. යම් ධර්මයක්හුගේ වශයෙන් ඒ සිත කෙතුක්මය නම්වේද ඔ තොමෝ කෙතුකම්‍යතා නම්වෙයි මමයයි හැඟීම් වශයෙන් හටගන්නා හෙයින් මානයත් දෘෂ්ටිය හා සදෘශ හටගැන්ම ඇත්තීය. එහෙයින් කෙශර සිංහ රාජයෝ දෙදෙනෙකු එක් ගල්ගුහාවෙක්හි නොවසන්නාක්මෙන් දෘෂ්ටි මානයෝ දෙදෙන එක් සිතෙක්හි නොමහටගණීත්. එහෙයින් මානය තෙමේ දෘෂ්ටි විප්‍රයුක්ත චිත්තයෙහි හැමකල්හි නූපදින්නේ නමුදු දෘෂ්ටි සම්ප්‍රයුක්ත චිත්තයෙහි නියමයෙන් නොඋපදනා හෙයින් "දිට්ඨිවිප්පයුත්ත ලොභ පදට්ඨානො" යි කීයේය.

තවද මානයතෙමේ ධර්මසමූහය ගැණීමෙහි බලවත්ව තමා උසස් කිරීම් වශයෙන් හටගණී. දෘෂ්ටි තොමෝ එක එක ධර්මයද නිත්‍යාදී ආකාරයෙන් ගණිමින් ගටගණී. මානය ආත්ම සෙනහය ඇසුරුකොට ඇත්තේය දෘෂ්ටිතොමෝ ආත්ම කලමළානු යෝගය ඇසුරුකොට ඇත්තීය. මේ දෘෂ්ටි මාන දෙදෙනාගේ වෙනසී. මාන නමැති අකුශල ධර්මය කුශල ධර්මයට ප්‍රත්‍යයවේ.

**මාන විභාගය නිමි.**

**ද්වේෂය** යනු කුමක්ද? "**දුස්සතීති දොසො**" යනු නිර්වචන හෙයින් යම් ස්වභාව ධර්මයෙක් අරමුණෙහි දූෂ්‍යවේද ඒ ස්වභාව ධර්මය ද්වේෂයයි. "**සො චණ්ඩිකකලක්ඛණො, විසප්පන රසො, නිස්සයදහනරසොවා, දූසන පච්චුපට්ඨානො ආඝාත**

**වත්ථු පදට්ඨානො**" ඒ ද්වේෂය තොමෝ සැඩ පරුෂ බැව් ලක්ෂණ කොට ඇත්තේය කුමක්මෙන්ද? යතහොත්, කැම කැබලිති ආදියෙන් පහළ ආශිර්විෂයකුමෙනි. අනිටුරූප ඉපදවීම් වශයෙන් ශරීරය කම්පාවීම කෘත්‍යකොට ඇත්තේය. කුමක් මෙන්ද? යත හොත් විෂ පැතිරීමක්මෙනි. නොහොත් තමාගේ නිශ්‍රයවූ හෘදය වස්තුව කෘත්‍යකොට ඇත්තේය. කුමක්මෙන්ද? යතහොත් ලැව්ගින්නක්මෙනි තමාද අනුන්ද දූෂ්‍ය කරණ ආකාරයෙන් ඥාතයට වැටහීම් කාරණාකොට ඇත්තේය

කුමක්මෙන්ද? යතහොත් ලබනලද අවකාශ ඇති සතුරෙකුමෙනි. නව ආඝාත වස්තූන් ආසන්න කාරණාකොට ඇත්තේය මෙහි ආඝාතවස්තුහුනම්, තමන් පිළිබඳ තුනක් හා තමන්ගේ මිත්‍රයා පිළිබඳව එසේම තුනක් හා තමන්ගේ සතුරා පිළිබඳ තුනක්දැයි මෙසේ නවවිධවේ. අස්ථාන කොපයද මිට එකතුකලවිට ආඝාත වස්තු දසයෙක්වේ

මෙහි ආඝාතවස්තු දසය අතුරෙන් එකක් ද්වේෂය ඇතිවීමට ආසන්න කාරණාවන්නේය. ආරම්මණයෙහි ඉදිරිපත්වන ද්වේෂය, පසුබස්නා ද්වේෂය, තැවීම් දැවීම් ස්වභාවයෙන් යුක් ද්වේෂය යන මොවුන්ගේ වශයෙන් නොයෙක් ප්‍රභෙදයි. මේ වනාහි ප්‍රීතියට ඉඳුරා විරුද්ධ ධර්මයකි.

**ද්වෙෂ විභාගය නිමි.**

**ඊර්ෂ්‍යාව** යනු කුමක්ද? "**ඉස්සතීති ඉස්සා**" යනු නිර්වචන හෙයින් අනුන්ගේ සම්පත්තිය නොඉවසානුයි ඊර්ෂ්‍යා නම්වේ. හේ වනාහි අනුන්ගේ සම්පත්තිය දැකීමෙන් හා අනුන්ට සම්පත්තිය තිබේයයි දැන ගැණීමෙන්ද සිතීමෙන්ද නොඉවසයි. අකමැතිවෙයි. ඊර්ෂ්‍යාවගේ ලක්ෂණාදි සතර විධිය නම්, "**පරසම්පත්ති උසූයනලක්ඛණා ඉස්සා, පරසම්පත්තියාඑව අනභිරතිරසා, තතො විමුඛභාව පච්චුපට්ඨානා, පරසම්පත්ති පදට්ඨානා**" යනුයි. ඊර්ෂ්‍යා තොමෝ වනාහි පූර්වෝපචිත කුශල කර්ම වේගයෙන් හා ප්‍රත්‍යුත්පන්න භවයෙහි (වර්තමාන කාලයෙහි) ඥානවීර්ය්‍ය බලයෙන් මෙරමා විසින් ලබනලද සම්පත්තිය දැක හෝ අසා එය නොඉවසීම නොරිස්සීම ලක්ෂණකොට ඇත්තීය. අලස්ව නිකම්ව අසවල් මනුෂ්‍යයා මේ මේ ගුණය උත්සාහය නිසා මෙතම මෙනම් සම්පත්තියට පදවියට තනතුරට පැමිණි

යේයයි අසා දැක සිතා ඊට අරුචිය නොඇලීම ඝෘනාය (සම්පත්තිය) ඇත්තීය. ඒ සම්පත්තියගේ විපත්තිය විනාශය කැමති වීම වැටනිම් කාරණාකොට ඇත්තීය. පරසම්පත්තිය ආසන්න කාරණාකොට ඇත්තීය. එහෙයින් කියනලද මැයි.

**“ඉස්සා නලසිඛා සෙසං හදයෙ ජලතිධතෙ**
**නෙව විඤ්ඤති පාමොජ්ජං සම්බුද්ධාදීහි සෙවිතං”**

එහි අභිප්‍රාය නම්, මේ ලොකයෙහි යම් කෙනෙකුන්ගේ සිත්හි ඊර්ෂ්‍යා නමැති වහ්නි සිඛාව (ගිනිසිල) දිලේද බබලයිද ඔව්හු බුඩාදීන් විසින් සෙවනය කරනලද ප්‍රමොද්‍ය රසය නොවිඳින් යනුයි. වෙෂයෙන් නොරව පවතින ඊර්ෂ්‍යාවෙන් ප්‍රීතියක් නොම හටගණී. මෙය අනුන්ගේ යසඉසුරු සම්පත්තිය නොරිස්සීම් නොඉවසීම් ආකාරයෙන් තමන්ගේ සිතේ පහළ වන නිස්සාර නිජ්ජීව ධර්මස්වභාවකි.

**ඊර්ෂ්‍යා විභාගය නිමි.**

**මච්ඡරිය** යනු කුමක්ද? **“මච්ඡරයි අත්තසම්පත්තිං නිගුහතීති මච්ඡෙරො”** යනු නිර්වචන හෙයින් යම් පුද්ගලයෙක් තමසම්පත්තිය සඟවාද එසේ හෙයින් ඒ පුද්ගලයතෙම මච්ජර නම් වේ. මෙයින් පුද්ගලයා ලැබේ. “මච්ඡරස්ස භාවො මච්ඡරියං” තම සම්පත්තිය සඟවන්නාවූ පුද්ගලයාගේ ස්වභාවය මච්ජරිය නම්වේ.

මෙයින් මච්ජරිය චෛතසිකය ලැබේ. මේ ඓශ්වර්‍ය්‍යය අනිකෙකුට නොවේවා මටම වේවායි පැවැත්තාවූ ස්වභාව හෝ මේ ආශ්චර්‍ය්‍යය මටම වේවා අනුන්ට නොවේවායි සම්ප්‍රයුක්ත චිත්තය පවත්වන ස්වභාව ධර්මය මච්ජරිය නම්වේ. හේ වනාහි තමා විසින් ලබනලද සම්පත්ති ලැබියයුතු සම්පත්ති යන මොවුන්ගේ වශයෙන් විවිධවේ.

ඔවුනතුරෙන් ස්වභාව වශයෙන් ලබනලද සම්පත්තියෙහි වනාහි එය අනුන් හා සාධාරණවීම හෝ යම්කිසි කාරණයකින් තමාසතු නොවී අනුන් සන්තක වනබව දැක හෝ අසා හෝ සිතා හෝ නොසතුටු සිත් ඇත්තේය. ලැබියයුතු සම්පත්තියෙහිද අසවල් නම් දෙශයෙහි හෝ කාලයෙහි හෝ මෙතම් සම්පත්තියක් ලැබෙන්නේයයි අසා හෝ සිතා හෝ එය තෙමේම ලබන්ට කැමති වෙයි. සෙස්සෝ ලබන්නාහුයයි අසා හෝ සිතා හෝ නොසතුටු සිත් ඇත්තේවෙයි.

එහෙයින් මච්ඡරිය චෛතසිකය තෙම ලබන ලද්දාවූද ලැබියයුතුවූද තම ආවාසාදී සම්පත්තීන්ගේ සැඟවීම ලක්ෂණ කොට ඇත්තේයයි කියනලදි. ඒ සම්පත්තීන්ගේම අනුන් හා සාධාරණවීම නොඉවසීම් කෘත්‍යකොට ඇත්තේය. තම සම්පත්තීන්ගේ අනුන් හා සාධාරණ බව නුරුස්නා කාරයෙන් සිත හැකිළීම ඥානයට වැටහීම් කාරණාකොට ඇත්තේය. තමාගේ ආවාසාදි සම්පත් ආසන්න කාරණාකොට ඇත්තේය. මච්ඡරිය වනාහි ආවාස මච්ඡරිය, කුලමච්ඡරිය, ලාභමච්ඡරිය, වණ්ණ මච්ඡරිය, ධම්මමච්ඡරියයයි පඤ්ච ප්‍රකාරවේ. ඊර්ෂ්‍යා මාත්සර්‍ය්‍ය යන් අතුරෙන් ඊර්ෂ්‍යාතොමෝ පරසම්පත් අරමුණුකොට උපදින්නීය. මාත්සර්‍ය්‍ය තෙම තමසම්පත් අරමුණුකොට උපදී. මෙසේ මේ ධර්ම දෙදෙනාගේ වෙනස දතයුතුයි. මොව්හු දෙදෙන එක්ව නූපදිත්.

**මච්ඡරිය විභාගය නිමි.**

**කුක්කුච්චය** යනු කුමක්ද? **කුච්ඡිතං කතං කුකතං"** නිඃසිතවූ ගැරහියයුතුවූ පිළිකුල් කටයුතුවූ කළ නොකළ දුශ්චරිත සුචරිත කර්මය කුකත නම් වේ. නොකරනලද සුචරිතයටත් ලෝකයා කුකතයයි ව්‍යවහාර කෙරෙත්. යම්සේ වනාහි පෘථිවි කසිණය අරමුණුකොට ඇති ධ්‍යානය පෘථිවී කසිණනම්වේද එපරිද්දෙන් නිඃසිතවූ කරනලද දුශ්චරිතයන් හා තත් සහචරිතබවයෙන් නොකරනලද සුචරිතයන් අරමුණුකොට උපන් විපිළිසරවූ චිත්තෝත්පාදය ඵලූපචාර වශයෙන් කුකතයයි ගතයුතුයි. "කුකතස්ස භාවො කුක්කුච්චං" කරනලද|නොකරනලද දුශ්චරිත සුචරිතයන් අරමුණුකොට ඇති විපිළිසර භාවයෙන් යුක්ත චිත්තෝත්පාදයාගේ ස්වභාවය තෙම කුක්කුච්චනම් වේ. හේ වනාහි කතකුක්කුච්චය, අකතකුක්කුච්චයයි ද්විවිධවේ. එයින් කත කුක්කුච්චය නම්, මම අකුසල් නොකෙළෙමියි තැවීමයි. අකතකුක්කුච්චය නම් මම කුසල් නොකෙළෙමියි තැවීමයි. තවද යථාව කුක්කුච්චය, අයථාව කුක්කුච්චයයි ද්විවිධවේ.

කුක්කුච්ච චෛතසිකයාගේ ලක්ෂණාදි සතර විධිය නම් **"කතාකතානුසොචන ලක්ඛණං කුක්කුච්චං, පච්ඡානුතාපරසං, විප්පටිසාර පච්චුපට්ඨානං' කතාකත සුචරිත දුච්චරිත පදට්ඨානං"** යනුයි. ඒ කුක්කුච්ච චෛතසිකය තෙම කළ නොකළාවූ දුශ්චරිතයන් හා සුචරිතයන් අනුව සොකකිරීම ලක්ෂ

ණකොට ඇත්තේය. කරනලද නොකරනලද සුචරිත දුශ්චරිතයන් සම්බන්ධ පසුතැවීම කෘත්‍යකොට ඇත්තේය. විපිළිසරවීම් ප්‍රත්‍යුපස්ථාන (ඵල) කොට ඇත්තේය. කරනලද නොකරනලද සුචරිත දුශ්චරිතයන් ආසන්න කාරණකොට ඇත්තේය මෙහි “කතාකතානුසෝචනය” යනු මාවිසින් යහපතක් නොකරන ලද්දේය යනාදීන් කළ නොකළ දුශ්චරිත සුචරිතයෙහි නැවත නැවත තැවීමයි. මා විසින් පෙර යහපත් කර්මයක් නොකරන ලද්දේය දැන් මෙතැන් පටන් කරමැයි හටගත් කුශල පාක්ෂික වීර්‍ය්‍යයම කතාකතානුසෝචනය නොවෙයි. **“විරූපං සරණං විප්පටිසාරො”** යනු නිර්වචන හෙයින් කළ නොකළ දුශ්චරිත සුචරිතදෙක සම්බන්ධව නැවත නැවත සෝකකිරීම් වශයෙන් විරූපව සිහිකිරීම විපිළිසරවීම නම් වේ. ඒ එසේමැයි කල් නොකළ දෙයෙහි සෝකකිරීම අනභිවෘද්ධිය ඇතිකරණ හෙයින් විරූපව සිහිකිරීම නම්වේ ඒ විපිළිසරවීම අනුන් අයත්බවට හෙතුවන හෙයින් දාසබවක් බඳුයයි දතයුතුයි. යම්සේ වනාහි දාසබවක් ඇතිකල්හි දාසතෙමේ අනුන් අයත්වේද එපරිද්දෙන්ම කුක්කුච්චය ඇතිකල්හි එයින් යුක්ත පුද්ගල තෙමේ තමාගේ ස්වභාවයෙන් කුශලයෙහි පවතින්ට නොහැකි වෙයි. නොහොත් කළ නොකළ දුශ්චරිත සුචරිතයන්හි සෝකකිරීම් වශයෙන් අයත්කොට ඇතිබැවින් ඒදෙක වශයෙන්වූ කුකුස කරණකොටගෙණ එයින් යුක්තාවූනුයි දාසබවක් බඳුවෙයි.

**කුක්කුච්ච විභාගය නිමි.**

**ථීනය** යනු කුමක්ද? **“ථීයති චිත්තං මන්දං මන්දං කත්වා අභෙජ්ඣාතනරතීති ථීනං”** යනු නිර්වචන හෙයින් යම් ධර්මස්වභාවයෙක් චිත්තයාගේ අරමුණු ගැන්මෙහි බලවත්භාවය මඳ මඳ කොට පසුබැස්ම කෙරේද එසේ හෙයින් ඒ ධර්මස්වභාවය ථීන නම් චිත්තයාගේ දුර්වලභාවය මන්දෝත්සාහි බව හැකිලීම පසුබැස්ම අකර්මක්ෂම භාවය හෙවත් කටයුතුනට යොග්‍යනැති බව ථීනයයි දතයුතුයි. ථීන චෛතසිකයාගේ ලක්ෂණාදි සතර විධිය නම්, **අනුස්සාහන ලක්ඛණං ථීනං, විරිය විනොදන රසං, සංසීදන පච්චුපට්ඨානං, අයොනිසොමනසිකාර පදට්ඨානං”** යනුයි. ථීනය තෙම උත්සාහ රහිතබව හැකිළීම් බව පසුබැසීම් බව අකර්මක්ෂමභාවය හෙවත් කර්මයට නොපොහොනා බව ලක්ෂණකොට ඇත්තේය වීර්‍ය්‍යය පහකිරීම දුරුකිරීම

කෘත්‍යකොට ඇත්තේය. තමා හා යෙදෙන්නාවූ සම්ප්‍රයුක්ත ධර්මයන් පසුබැස්සීම ඥානයට වැටහීම්කොට ඇත්තේය. අනුපාය හෙයින් මෙනෙහි කිරීම ආසන්න කාරණකොට ඇත්තේය. මේ වනාහි සිත කුශල ධර්මයන්හි හකුළුවයි පසුබස්වයි.

**ථීන විභාගය නිමි.**

**මිද්ධය** යනු කුමක්ද? **"මෙධති චෙතසිකො ධම්මො අකම්මඤ්ඤභාවෙන භාවා විහිංසතීති මිද්ධං"** යනු නිර්වචන හෙයින් යම් ස්වභාව ධර්මයෙක් චෛතසික ධර්මයන් කර්මයට නොපොහොනවුන්කොට හිංසා කෙරේද එසේ හෙයින් ඒ ස්වභාව ධර්මය මිද්ධ නමි. ඒ එසේමැයි. අරමුණෙහි පැතිරීම් වශයෙන් ඒ ඒ ඊයෂිං පළු මොනවට දරා පවත්වනු ලබන සම්ප්‍රයුක්ත ධර්මයන් මුගුරකින් තලන්නාක්මෙන් ඒ ඒ අරමුණ කෙරෙන් හකුළුවා ඊයෂිං පළුද දරන්ට අසමර්ථවූවන්කොට ථීනය සිත මැඩ පවත්වයි. මිද්ධය කුශල පක්ෂයන්හි චෛතසික ධර්මයන් ඒ ඒ කටයුත්තෙහි යොදවන්ට නොදී පසුබැස්ම කෙරෙයි. මිද්ධ චෛතසිකයාගේ ලක්ෂණාදි සතරවිධිය නම් **"අකම්මඤ්ඤතා ලක්ඛණං මිද්ධං, ඔහනනරසං, ලීනතා පච්චුපට්ඨානං, අයොනිසොමනසිකාර පදට්ඨානං"** යනුයි. මිද්ධය තෙමේ චෛතසිකයන්ගේ අකර්මණ්‍ය භාවය හෙවත් කර්මයට නොපොහෝනා බව ලක්ෂණකොට ඇත්තේය. සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ බැඳීම කෘත්‍යකොට ඇත්තේය. අරමුණෙහි හැකිලීම් ස්වභාවය ඥානයට වැටහීම්කොට ඇත්තේය. කුශලධර්මයන්හි නොඇලීමයයි කියනලද අරතියද අධිකුසලයවූ සමථවිදර්ශනාවෙහි යෙදීමෙහි අලසබවයයි කියනලද තන්ද්‍රියද ඇඟ මැලිකිරීමයයි කියනලද විජම්භිතාවද යනාදි ධර්ම නුනුවතින් මෙනෙහි කිරීම ආසන්න කාරණකොට ඇත්තේය.

**මිද්ධ විභාගය නිමි.**

**විචිකිච්ඡා** යනු කුමක්ද? **"විකිච්ඡිතුං දුක්කරතාය විගතා චිකිච්ඡා එතායාති විචිකිච්ඡා, සභාවං විචිනන්තො කිච්ඡති කිලමති එතායාතිවා විචිකිච්ඡා"** යනු නිර්වචන හෙයින් ඥාණ නමැති ඖෂධයෙන් පිළියම්කරන්ට දුෂ්කරබැවින් ඥානයෙන් තොරවූ ගත්ය විචිකිච්ඡාව නම්වේ. නොහොත් ස්වභාව ලක්ෂණය සොයමින් මේ සැකය කරණකොටගෙණ චිත්ත චෛතසික ධර්මයෝ පරිශ්‍රම දරත්නුයි. වෙහෙසට පත්වෙත්නුයි. විචිකිච්ඡා,

නම්වේ. හේරුඹනම් සුව නොකළහැකි ලෙඩක් මෙන් චිත්ත චෛතසිකයන්ට අරමුණ නිශ්චය කොට නොදතහැකි ස්වභාව විචිකිච්ඡාවයි. මේ සැකයෙන් පීඩිතවූ සසම්ප්‍රයුක්ත චිත්තයට නුවණ නමැති පිළියමින් ප්‍රයෝජන නොවේ. විචිකිච්ඡා තොමෝ නීවරණ විචිකිච්ඡාය ප්‍රතිරූපක විචිකිච්ඡායයි ද්විප්‍රකාර වන්නීය. ඔවුන් අතුරෙන් බුද්ධාදී අටතැන්හි උපදනා සැකය නීවරණභූත විචිකිච්ඡා නම්වේ. එයින් පිටත් ධර්මපදයන්හි අසර්වඥවූ සියල්ලවුන්ට ඒ කන්දේ මේ කන්දේ අරකන්දේ කියා උපදනාවූ සැකය ප්‍රතිරූපක විචිකිච්ඡා නම්වේ. එය වනාහි කුසල්ද අකුසල්ද වේ. ක්ෂීණාශ්‍රවයන්ට උපදනාවූ විචිකිච්ඡා තොමෝ ක්‍රියා අව්‍යාකෘත වන්නීයයි දතයුතුයි. මෙතැන්හි ඒකාන්තයෙන් අකුසල්වූ නීවරණ විචිකිච්ඡාව අභිමතයි. දැන් විචිකිච්ඡා චෛතසිකයාගේ ලක්ෂණාදිය දක්වනුලැබේ. එනම්:- "සංසය ලක්ඛණා විචිකිච්ඡා, කම්පනරසා, අනිච්ඡය පච්චුපට්ඨානා, අනේකංස ගාහපච්චුපට්ඨානාවා අයොනිසෝමනසිකාර පදට්ඨානා" යනුයි. ඒ විචිකිච්ඡා තොමෝ අරමුණෙහි සැකකිරීම ලක්ෂණකොට ඇත්තීය. අරමුණෙහි කම්පාවීම කෘත්‍යකොට ඇත්තීය. දෙමංසන්ධියක් හමුව යායුතු මාර්ගය කවරේදැයි නිශ්චය කරගත නොහැකියෙකු මෙන් ඒ ඒ අරමුණ ඇතිසැටි විනිශ්චය කරගනු නොහැකි බව ඥානයට වැටහීම් කාරණාකොට ඇත්තීය නොහොත් නොයෙක් අරමුණු ගැණීම වැටහීම් කාරණාකොට ඇත්තීය. නුනුවනින් මෙනෙහි කිරීම ආසන්න කාරණාකොට ඇත්තීය.

### විචිකිච්ඡා විභාගය නිමි.

**"සද්දහන්ති සද්ධා"** යම් ස්වභාවයක් තොමෝ බුද්ධගුණාදිය දරාද එසේ හෙයින් ඒ ස්වභාවය තොමෝ ශ්‍රද්ධානම් වේ. යම්සේ පිරිසුදුවූ ප්‍රසන්නවූ නොකැළඹුනාවූ බොරනොවූ ගඞ්ගා ජලය චන්ද්‍ර සූර්‍ය්‍ය තාරකාවන්ගේ ඡායා තමාකෙරෙහි යහපත් කොට පිහිටුවාගණීද වේද එපරිද්දෙන් ඒ ශ්‍රද්ධා තොමෝද බුද්ධ ගුණාදිය යථාපත්කොට තමා කෙරෙහි දරාගන්නීය. පිහිටුවා ගන්නීය බුද්ධාදිවූ ඇදහියයුතු වස්තූන්හි චිත්ත චෛතසිකයන්ගේ නොකිලිටි ආකාරයෙන් පවත්නාවූ ශ්‍රද්ධාවම මෙහි අභිප්‍රේතයි. එයින් අන්‍යවූ තීර්ථකයන් කෙරෙහි හෝ තීර්ථක ධර්මයන් කෙරෙහි හෝ නොපැහැදියයුතු වස්තූන්හි පැහැදීම් වශයෙන් ඇදහීම් වශයෙන් පවත්නීද හේ තොමෝ වනාහි (ඔකප්පන ශ්‍රද්ධා ප්‍රතිරූපකවූ) වරදවා විශ්වාසකිරීම් සඞ්ඛ්‍යාතවූ මිථ්‍යා

අධිමොක්ෂ චෛතසිකයයි. යම්සේ මනුෂ්‍යයෝ හස්තය නැති
කල්හි සප්ත රත්නයන් දැකත් ගන්ට නොහැකි වෙත්ද ධනය
නැති කල්හි ඔවුන්ට සියළු භොගයෝ සමෘද්ධ නොවෙත්ද බීජ
නැතිකල්හි ශස්‍යාදීහු සමෘද්ධ නොවෙත්ද එසේ ශ්‍රද්ධාහස්තය
නැතිකල්හි ශ්‍රද්ධාධනය නැති කල්හි ශ්‍රද්ධාබීජය නැති කල්හි
පුණ්‍යක්‍රියා වස්තුහුද සමෘද්ධ නොවෙත්. එහෙයින් ඒ ශ්‍රද්ධාතොමෝ
හස්තයක් ධනයක් බීජයක් හා සමානයයි දක්වනලදි. "සද්ධා
හත්ථො මහානාම අරිය සාවකො-සද්ධ විත්තං පුරිසස්සසෙට්ඨං
සද්ධාබීජං තපොවුට්ඨි" යනාදිය මෙහි සාධක වචනයි. ඒ ශ්‍රද්ධා
වගේ ලක්ෂණාදි සතරවිධිය නම්, **සද්දහන ලක්ඛණා සද්ධා,
සම්පසාදනරසා, අකාලුස්සිය පච්චුපට්ඨානා, සද්ධෙය්‍ය වත්ථු
පදට්ඨානා"** යනුයි. ශ්‍රද්ධාතොමෝ බුදුන් දහම් සඟුන් හා කර්ම
කර්ම ඵලයන් ඇදහීම ලක්ෂණකොට ඇත්තීය. චිත්ත චෛත
සිකයන්ගේ නොපැහැදීම් ගතිය හැරදැමීම කෘත්‍යය කොට
ඇත්තීය. යොගාවචරයාට චිත්ත චෛතසික ධර්මයන්ගේ නො
කිලිටි ආකාරයෙන් ඥානයට වැටහීම්කොට ඇත්තීය. රත්න
ත්‍රය හා කර්මයද කර්මඵලයද යන ඇදහියයුතු වස්තු ආසන්න
කාරණාකොට ඇත්තීය

**ශ්‍රද්ධා විභාගය නිමි.**

**සතිය** යනු කුමක්ද? **සරතීති සති, සරනහි සම්පයුත්ත
ධම්මා එතායාතිවා සති, සරණමත්තමෙවවා එසාති සති'**
යනු නිර්වචන හෙයින් යම් ධර්ම ස්වභාවයක් තොමෝ සිහිකරාද
එසේ හෙයින් ඒ ධර්මස්වභාවය තොමෝ සතිනම් වන්නීය. නො
හොත් මේ ධර්මජාතිය කාරණකොටගෙණ සම්ප්‍රයුක්ත ධර්මයෝ
සිහිකරත්. එසේ හෙයින් සතිනම් වේ. නොහොත් මෝතො
මෝ සිහිකිරීම් මාත්‍රයම වන්නීය එසේ හෙයින් සති නම් වේ.
මෙහි සතිය නම් සිහිකිරීමයි. සක්විති රජුගේ භාණ්ඩාගාරික
අමාත්‍යතෙම සියලු කුදු මහත් කටයුතු සිහිකරන්නාක් මෙන්
බුද්ධාදි ඉෂ්ටාලම්බනය සසම්ප්‍රයුක්ත චිත්තයට සිහිකරවන්නාවූ
ස්වභාව ධර්මයයි. ඒ සතිය අසංමොහයෙහි අධිපති හෙයින් සති
න්ද්‍රියවිය කුසලාරමුණ මනාව සිහිකරණ බැවින් සම්මාසතිය
විය. මුළාව මඩින බැවින් සතිබලයවිය. ඒ සමෘතිය වනාහී
සම්ප්‍රයුක්ත ධර්මයන් සිහිකරවීම ස්වභාවකොට ඇති අපිලාපන
ලක්ෂණද උපගණ්හන ලක්ෂණද වේ. එයින් අපිලාපන ලක්ෂ
ණවූ සිහිය කෙසේද? යම්සේ සක්විති රජුගේ භාණ්ඩාගාරික

අමාත්‍යතෙම දසවිධරත්නය ආරක්‍ෂා කරමින් සක්විති රජුට සවස උදය යස පිරිවර සිහිකරවන්නේද එපරිද්දෙන්ම උපදින්නාවූ ස්මෘතිය කුශල ධර්මයන් සිහිකරවයි. අපිලාපන ලක්‍ෂණවූ සිහිය මෙබඳුයයි දතයුතු. අනතුරුව උපගණ්හන ලක්‍ෂණ සිහිය කෙසේද? යම්සේ සක්විති රජුගේ පිණිස් පරිනායක රත්නය රජුහට අහිතයන්ද හිතෛෂීන්ද දැන අහිතයන් පහකෙරේද හිතෛෂීන් සමීපයට ගනීයිද එපරිද්දෙන්ම ස්මෘතිය හිතාහිත ධර්මයන්ගේ ගතිය මනාකොට සොයා මේ කාය දුශ්චරිතාදීවූ ධර්මයෝ අහිතයෝයයි අහිත ධර්මයන් පහකෙරෙයි. මේ කාය සුචරිතාදී ධර්මයෝ හිතයෝයයි හිත ධර්මයන් සමීපයට ගණියි. උපගණ්හන ලක්‍ෂණවූ සිහිය මෙබඳුයයි දතයුතු.

ඒ සිහිය වනාහි සම්‍යක් ස්මෘතිය මිථ්‍යාස්මෘතියයි විවිධවේ ඔවුන් අතුරෙන් මෙතැන්හි සම්‍යක් ස්මෘතිය අභිප්‍රේතයි. ඉතිරිවූ මිථ්‍යා ස්මෘතිය ස්මෘති චෛතසිකය නොවේ. මිථ්‍යා ස්මෘතිය නම් කරන ලද්දාවූද කළයුතුවූද පාපකර්මයන් පමා නැතිව අරමුණු කිරීම් වශයෙන් පැවතියාවූ ස්මෘති ප්‍රතිරූපකවූ (සමානවූ) අකුසල චිත්තොත්පාද මාත්‍රයෙක් වේ. යම්හෙයකින් මේ ස්මෘතිතොමෝ වනාහී සියලු අකුශල ධර්මයන් හා යොදවාගන්නට හැකිවේද එහෙයින් ස්මෘති චෛතසිකය රජහුගේ සියලු කෘත්‍යයන්හි නියුක්ත මහාමාත්‍යයෙකු මෙන් සර්වාර්ථසිද්ධියට කාරණාවන්නේයයි වදාරනලදී. සති චෛතසිකයාගේ ලක්‍ෂණාදි සතර විධිය දක්වනු ලැබේ. **"අපිලාපන ලක්ඛණා සති, අසම්මොහනරසා, ආරක්ඛපච්චුපට්ඨානා, විසයාභිමුඛීභාව පච්චුපට්ඨානා වා, ථිරසඤ්ඤා පදට්ඨානා, කායාදි සතිපට්ඨාන පදට්ඨානා වා"** ස්මෘතිතොමෝ නොඉල්පීම හෙවත් අරමුණ ඊ ශබලව තැබීම ලක්‍ෂණකොට ඇත්තීය. මුළානොවීම කෘත්‍යකොට ඇත්තීය. චිත්තය ප්‍රවේසම් කරන නිසා මුරකාරයෙක් මෙන් වැටහීම් කාරණාකොට ඇත්තීය. ස්ථිරවූ සංඥාව ආසන්න කාරණාකොට ඇත්තීය. ඒ ස්මෘතිතොමෝ අරමුණෙහි දැඩිව පිහිටන හෙයින් එසිකාස්තම්භයක් හෙවත් ගමේ ඉමට සවිකරනලද කණුවක් මෙන්ද චක්‍ෂුර්ද්වාරාදීයෙහි ලොභ වෙෂාදී අකුශල ධර්මයන්ට ඇතුල්වෙන්ට ඉඩනොදී ආරක්‍ෂා කරන හෙයින් දොරටුපාලයෙක් මෙන්ද දතයුත්තීය. පළමුකොට සංඥාව ස්ථිරව උපන්කල්හි පසුව සිහිය පිහිටන බැවින් "ථිරසඤ්ඤා පදට්ඨානා" යි කියේයි. එසේ ඇතිකල්හි ස්මෘති

සංඥාවන්ගේ වෙනස කිමයත්? පළමුකොට සංඥාව පළමුවෙන් ගන්නාලද අරමුණ අඳුනයි. නොගන්නාලද අරමුණ නැවත ප්‍රත්‍යභිඥානයට (පසුව සලකුණක් ගැනීමට) උපකාරවූ නිමිත්තක් කෙරෙයි. පළමුකොට නොගන්නාලද අරමුණෙහි සංඥාකෘත්‍යය අප්‍රධානවෙයි සමෘතිය වනාහි පළමුකොට නොගන්නාලද අරමුණද සිහි කෙරෙයි. ගන්නාලද අරමුණත් සිහි කෙරෙයි. නොගන්නාලද අරමුණෙහි සමෘති කෘත්‍යය අප්‍රධාන වෙයි යන මෙපමණක් වෙනසි.

**සමෘති විභාගය නිමි.**

**හිරි** යනු කුමක්ද? **“කාය දුච්චරිතාදීහි හිරීයතීති හිරි”** කාය දුශ්චරිතාදී හෙතුවෙන් ජිගුප්සා කෙරේනුයි පිළිකුල් කෙරේනුයි හිරිනම්. ඒ වනාහි ප්‍රාණඝාතාදි අකුශල ධර්මයන් අසුචියක් මෙන් සලකා පිළිකුල් කෙරෙයි. තමාගේ ආත්මය ගරු කොට උපදි මිථ්‍යාචාරයෙන් වෙන් වන්නාවූ කුල කුමාරිකාවක්මෙන් දතයුතු. ලජ්ජාවිය යුත්තෙහි ලජ්ජා නොවීමද ලජ්ජා නොවිය යුත්තෙහි ලජ්ජාවීමද හිරි ප්‍රතිරූපක ධර්මයකි. ඒ හිරි චෛතසිකය නොවේ. ආත්මය ගරුකොට උපදින්නාවූ හිරි චෛතසිකය ජාති-වය සූරභාව බහුශ්‍රැතභාව යන සතර සලකා උපදවයි. ඒ කෙසේද? මේ පව්කිරීම නම්, උතුම් ජාති ඇත්තවුන්ගේ ක්‍රියාවක් නොවෙයි ලාමක ජාති ඇත්තවුන්ගේ ක්‍රියාවකි. මාවැනි යහපත් ජාති ඇත්තෙකුට මෙබඳු පව්කම් කරන්නට නොවටියයි ජාතිය සලකා සතුන් නැසීමාදිය නොකරණ පුද්ගලයා ලජ්ජාව උපදවයි. පව්කම් කිරීමතම්, කිසිවක් නොදන්නාවූ ළදරුවන් විසින් කරණු ලබන ක්‍රියාවකි. මාවැනි වැඩිසිටියෙකුට මේ පව්කම් කිරීම සුදුසු නොවේයයි වයස සලකා පව් නොකරණ පුද්ගලයාද ලජ්ජාව උපදවයි. පව්කිරීම නම් දුබලස්වභාව ඇත්තවුන්ගේ ක්‍රියාවක් වෙයි. සූරභාවය ඇත්තවුන්ගේ ක්‍රියාවක් නොවෙයි මාවැනි සූරභාවය ඇත්තෙකුට මෙබඳු පව්කම් කරන්නට නොවටියයි සූරභාවය සලකා සතුන් නැසීමාදිය නොකරණ පුද්ගලයා ලජ්ජාව උපදවයි පව්කිරීම නම්, නුවණමදවුන්ගේ ක්‍රියාවක් වෙයි පණ්ඩිතයන්ගේ ක්‍රියාවක් නොවෙයි මාවැනි පණ්ඩිත බහුශ්‍රැතයෙකුට මෙබඳු ක්‍රියා කරන්ට නොවටියයි බහුශ්‍රැත භාවය සලකා පව් නොකරන්නාවූ පුද්ගලතෙම ලජ්ජාව උපදවයි. මෙසේ ආධ්‍යාත්මය ගරු කොට උපදින්නාවූ ලජ්ජාව කාරණා සතරකින් උපදවන ආකාරය දතයුතුයි උපදවාද තමාගේ සිතෙහි ලජ්ජාව පිහිටුවා පව්කම් නොකරයි.

තවද ජාතිමහත්වය ශාස්තෘමහත්වය දායාද මහත්වය සබ්‍රහ්මචාරී මහත්වය අරමුණුකරගෙණද හිරිය උපදවා පව්නොකරයි. මෙසේ කාරණා අටක් අරමුණු කරගෙණ හිරිය හෙවත් ලජ්ජාව උපදවා පව්නොකරයි. හිරි චෛතසිකයාගේ ලක්ෂණාදි සතර විධිය දක්වනු ලැබේ. **"පාපතො ජිගුච්ඡන ලක්ඛණා හිරි ලජ්ජනා කාරෙන පාපානං අකරණ රසා පාපතො සඞ්කොචන පච්චුපට්ඨානා, අත්තගාරව පදට්ඨානා"** ඒ හිරිතොමෝ පාපය කෙරෙන් පිළිකුල් කිරීම ලක්ෂණකොට ඇත්තීය. ලජ්ජාවීම් ආකාරයෙන් පව්නොකිරීම කෘත්‍යකොට ඇත්තීය. පාපය කෙරෙන් සිත හැකිළීම් ආකාරය විදශීනා ඥානයට වැටහීම් කාරණාකොට ඇත්තීය. ආත්ම ගෞරවය ආසන්න කාරණාකොට ඇත්තීය. මේ හිරිය හෙවත් ලජ්ජාව ලෝකයා පිරිසුදු කරන්නාවූ ධර්මයකි. මීට ලෝකපාලක ධර්මයයිද දෙවධර්මයයිද ශුක්ල ධර්මයයිද කියනු ලැබේ.

**හිරි විභාගය නිමි.**

**ඔත්තප්ප** යනු කුමක්ද? **කායදුච්චරිතාදීහි ඔත්තප්පතීති ඔත්තප්පං"** යම් ස්වභාව ධර්මයක් කාය දුශ්චරිතාදී හේතුවෙන් ත්‍රාසනවේනම් එසේ හෙයින් ඒ ස්වභාව ධර්මය ඔත්තප්ප නමි. ඒ වනාහි අකුශල ධර්ම ගින්නක්මෙන් සලකා භයවෙයි. මෙරමා ගරුකරගෙන දුශ්චරිතයෙන් වෙන්වන්නාවූ වෛශ්‍යාවක්මෙන් දතයුතුයි බාහිරවූ අපායාදිය ගරුකොට උපදින්නේ ඔත්තප්ප යයි එය කෙසේනම් උපදීද? ඉදින් නුඹ පව්කරන්නෙහි නම් සිව්පිරිස මැද නින්දාවට පැමිණියේ වන්නෙහිය.

**ගරහිස්සන්ති තං විඤ්ඤූ අසුචිං නාගරිකො යථා**
**වජ්ජිතො සීලවන්තෙහි කථං භික්ඛු කරිස්සසි.**

මෙහි තේරුම නම්, නුවර වැසි මනුෂ්‍යයෙක් අසුචි පිළිකුල් කරන්නාක්මෙන් ඥාණවන්තයෝ ඒ පාපයට නින්දා කරන්නාහුය සිල්වතුන් විසින් ඒ පාපය දුරුකරණ ලද්දේය මහණ නුඹ ඒ පාපය කෙසේ කරන්නෙහිදැයි මෙසේ සලකන්නාවූ පුද්ගලතෙම බැහැර උපන්නාවූ ඔත්තප්පයෙන් පව්කම් නොකරයි මෙසේ බාහිරවූ අපායාදිය ගරුකොට උපන්නේ ඔත්තප්පයයි දතයුතුයි දැන් ලක්ෂණාදි සතරවිධිය දක්වනු ලැබේ. **"පාපතො උත්තාසලක්ඛණං ඔත්තප්පං, උත්තාසාකාරෙන**

**පාපානං අකරණ රසං, පාපතො සඞ්කොචන පච්චුපට්ඨානං, පරගාරව පදට්ඨානං"** ඔත්තප්පයතෙම පාපය කෙරෙන් තැතිගැණීම ලක්‍ෂණකොට ඇත්තේය තැතිගැණීම් ආකාරයෙන් පව් නොකිරීම කෘත්‍යකොට ඇත්තේය පාපයකෙරෙන් සිත හැකිළීම් ආකාරය විදර්‍ශනා ඥානයට වැටහීම් කාරණාකොට ඇත්තේය අනුන්ට ගෞරව කිරීම ආසන්න කාරණාකොට ඇත්තේය බියවිය යුත්තෙහි බිය නොවීමද බිය නොවිය යුත්තෙහි බියවීමද ඔත්තප්ප ප්‍රතිරූපක ධර්‍මයකි මේ ඔත්තප්ප චෛතසිකය නොවේ මිට ලොක පාලක ධර්‍මයයිද දෙව ධර්‍මයයිද ශුකල ධර්‍මයයිද කියනු ලැබේ

**ඔත්තප්ප විභාගය නිමි.**

අලොභ යනු කුමක්ද? **"අලුබ්භනං අලොභො"** රූපාදී ෂඩ්ප්‍රකාර අරමුණුවල නොඇලීම අලොභ නමි. "ලොභ පටිපක්ඛො අලොභො" රූපාදී සවැදෑරුම් අරමුණුවල ඇලීමයයි කියනලද ලොභයට ප්‍රතිපක්‍ෂවූයේ අලොභනම් වෙයි. යම්සේ ලොභය තමහට හිතවූ ආරම්මණයන්හි ලග්නවීම් ආකාර යෙන් පවතීද එබඳුවූ ආරම්මණයන්හි පැවති ලොභය විධ්වංශකයකොට ලොභයට හෙතුවූ භවභොග සම්පත් අසුචියක්සේ අත්හැරදමා කිසියම් නෛෂ්ක්‍රම්‍ය ධාතුවක්ව පවතීයයි දත යුතුයි. දැන් අලොභ චෛතසිකයාගේ ලක්‍ෂණාදී සතර විධිය දක්වනු ලැබේ. **"ආරම්මණෙ චිත්තස්ස අගෙධ ලක්ඛණො අලොභො, අලග්ගභාව ලක්ඛණොවා, අපරිග්ගහරසො, අනල්ලීනභාව පච්චුපට්ඨානො, පහීණලොභ පදට්ඨානො"** ලොභ චෛතසිකය තෙම අරමුණෙහි චිත්තයාගේ නොඇලීම් ස්වභාව ලක්‍ෂණකොට ඇත්තේය නෙලුම්පතෙහි තිබෙන දිය බිඳුව මෙනි. අනෙහිතිබෙන රසදිය බිඳුව මෙනැයිද, දත යුතුයි. මගේවස්තුවයයි පරිග්‍රහණය නොකිරීම කෘත්‍යකොට ඇත්තේය. රාගාදි කෙලෙසුන්ගෙන් මිදුනු රහත් භික්‍ෂුවක් මෙනි. නොඇලෙනු කැමතිබව විදර්‍ශනා ඥානයට වැටහීම් කාරණාකොට ඇත්තේය. අසුචියෙහි වැටුනු පුරුෂයෙක් මෙනි. ප්‍රහීණ කරනලද ලොභය ආසන්න කාරණාකොට ඇත්තේය. අලොභය හෙතුකොටගෙණ ජාතිදුක සංසිදේ. එසේම නිරොගිකම්ට හා භොග ලැබීමටත් ප්‍රත්‍යය වන්නේය තවද අලොභය හෙතුකොටගෙණ සංස්කාර ධර්‍මයන් අනිත්‍ය වශයෙන් දර්‍ශනයවේයයි දතයුතුයි.

**අලොභ විභාගය නිමි.**

**අද්වේෂ** යනු කුමක්ද? **"අදුස්සනං අදොසො"** චිත්තයාගේ සෞම්‍යගතිය හෙවත් මෘදුගතිය අද්වේෂ නමි. තමහට අහිතවූ සත්ත්වයන් දැක කිපීමයයි කියනලද ද්වේෂයට විරුද්ධවූයේ අද්වේෂ නමි. ද්වේෂය තමහට අහිතවූ ආරම්මණයන්හි දූෂ්‍යවීම් ආකාර යෙන් පවතී. එබඳු අරමුණුවල පැවති ද්වේෂය විධ්වංශනය කොට දුටු දුටු සත්ත්වයන් විෂයෙහිකොට පූර්ණ චන්ද්‍රකාන්තියක්සේ සෞම්‍ය සිත් සතන් උපදවා එක් අව්‍යාපාද ධාතුවක්ව පවතී යයි දතයුතුයි.

අද්වේෂ චෛතසිකයාගේ ලක්ෂණාදි සතර විධිය දක්වනු ලැබේ. **"චිත්තස්ස අචණ්ඩික්කලක්ඛණො අදොසො, අවිරොධ ලක්ඛණොවා, ආඝාත විනයරසො, පරිළාහ විනයරසොවා සොම්මභාව පච්චුපට්ඨානො පසිනදොස පදට්ඨානො"** අද්වේෂ තෙම නොරළුබව හෙවත් සැඩපරුෂ නොවීම ලක්ෂණකොට ඇත්තේය. නොහොත් විරුද්ධ නොවනබව ලක්ෂණකොට ඇත් තේය. ඒ ඒ ක්‍රියාවට අනුකූල මිත්‍රයෙක් මෙනි. වෛරය සංසි ඳීම කෘත්‍යකොට ඇත්තේය. නොහොත් චිත්ත චෛතසිකයන් ගේ දැහය පහකිරීම කෘත්‍යකොට ඇත්තේය. ගොසීසනම් චන්දනා ලෙපයක් මෙනි. සෞම්‍යභාවය වැටහීම්කොට ඇත් තේය. පහකරනලද ද්වේෂය ආසන්නකොට ඇත්තේය.

**අද්වේෂ විභාගය නිමි.**

**තත්‍රමජ්ඣත්තතා** යනු කුමක්ද? **"මජ්ඣෙ ඨිතො අත්තාස භාවො යස්සාති මජ්ඣත්තො"** ඊත උඩිච්ච යන දෙපරිදි විෂම පාර්ශ්වයන්ගේ මධ්‍යයෙහි පිහිටි ස්වභාව ඇති පුද්ගලතෙම මජ්ඣ ත්ත නමි. **"තස්සභාවො මජ්ඣත්තතා"** මධ්‍යයෙහි පිහිටි ස්වභාව ඇති පුද්ගලයාගේ ස්වභාවය මජ්ඣත්තතා නමි. මැදහත් ගති යයි. මෙයින් චෛතසිකය ලැබේ. **"තෙසු ධම්මෙසුමජ්ඣත්ත තා තත්‍ර මජ්ඣත්ත**තා" ඒ තමා හා සම්ප්‍රයුක්තවූ සමව පැවැත් තාවූ චිත්තචෛතසික ධර්මයන් කෙරෙහි මැදහත්ව හටගන්නා හෙයින් තත්‍ර මජ්ඣත්තතායයි කියනුලැබේ. එය වනාහි සමව යන්නාවූ අසුන් දෙදෙනකු බලන්නාවූ සාරථියෙක් මෙනි. ශීඝ්‍රව අසුන් දෙදෙනකු යෙදූ රථයෙහි සාරථියා ඒ අසුන් දෙන්නා සමව යනකල මැදහත්ව බලන්නාක්මෙන් අරමුණෙහි සමව යෙදෙන චිත්ත චෛතසිකයන් මැදහත්ව බැලීම තත්‍රම ජ්ඣත්තතා නමි. මෙහි දක්වූ රියදුරුතෙම රියෙහි අසුන් නො

යොදන්නේය. රිය පැදුම මෙහෙහි කරන්නෝය. එහෙයින්
මෙය මනසිකාරයට විශෙෂවිය. මෙසේ මනසිකාරය රියෙහි
අසුන්යොදන රියැදුරෙකුමෙන් සම්ප්‍රයුක්ත ධර්මයන් ඒ ඒ කෘත්‍ය
සම්පාදනයෙහි යොදන්නේ රියෙහි යෙදූ අසුන් සමග ගමන්යන
කල්හි මධ්‍යස්ථව හිඳිනා රථාචාය්‍ය්‍යෙකු මෙන් මජ්ඣත්තතා නම්
ඒ තත්‍ර මජ්ඣත්තතා චෛතසිකයාගේ ලක්‍ෂණාදි සතර විධිය
දක්වනු ලැබේ. **චිතත චෛතසිකානං සමවාහිත ලක්ඛණා
තත්‍ර මජ්ඣත්තතා, පක්ඛපාතුපච්ඡෙදන රසා, මජ්ඣත්ත භාව
පච්චුපට්ඨානා, යොනිසොමනසිකාර පදට්ඨානා"** ඒ තත්‍රමජ්ඣ
ත්තතා තොමෝ තමා හා සැපියයුතු චිත්ත චෛතසික ධර්මයන්
ස්වකීය කෘත්‍යයන්හි සමව පැවතීම ලක්‍ෂණකොට ඇත්තීය.
පක්‍ෂපාතබව සිඳීම් කෘත්‍යකොට ඇත්තීය. මධ්‍යස්ථබව වැටහීම්
කාරණකොට ඇත්තීය. යොනිසොමනස්කාරය ආසන්න කාර
ණකොට ඇත්තීය. ෂඩඞ්ගොපෙක්‍ෂාදි දසවිධ උපෙක්‍ෂාවකට
ඒ ඒ චිත්තාවස්ථාවන්ගේ සැටියට ප්‍රභෙදවන්නේ මේ තත්‍රමධ්‍ය
ස්ථතාවයි. ඒ උපෙක්‍ෂා දසය නම්, ඡලඞ්ගුපෙක්ඛා, බ්‍රහ්මවිහාරු
පෙක්ඛා, බොජ්ඣඞ්ගුපෙක්ඛා, විරියුපෙක්ඛා, සඞ්ඛාරුපෙක්ඛා,
වෙදනුපෙක්ඛා, විපස්සනුපෙක්ඛා, තත්‍ර මජ්ඣත්තුපෙක්ඛා, ඣානු
පෙක්ඛා, පාරිසුද්ධුපෙක්ඛා යන මොව්හුයි. ඔවුනතුරෙන් රහතු
න්ගේ ඉෂ්ටානිෂ්ට ආරම්මණයන් සංදුර මුණගැසීමෙහි සෞම්න
ස්‍යත් දෞර්මනස්‍යත් නූපදවා මධ්‍යස්ථවීම ඡලඞ්ගුපෙක්ඛා නම්.
සියළු සත්ත්වයෝ කර්මයම ස්වකීය වස්තුකොට ඇත්තෝයයි මධ්‍ය
ස්ථ නිරීක්‍ෂණය බ්‍රහ්ම විහාරුපෙක්ඛා නම්. "උපෙක්ඛා සම්බො
ජ්ඣඞ්ගං භාවෙති" යනාදි වශයෙන් ආ සහජාත ධර්මයන් කෙ
රෙහි පවත්නා මධ්‍යස්ථ නිරීක්‍ෂණය බොජ්ඣඞ්ගුපෙක්ඛා නම්.
නොපසුබට වීය්‍ය්‍යයෙන් වීය්‍ය්‍යකිරීම විරියුපෙක්ඛා නම්. සංස්
කාරයන්ගේ මධ්‍යස්ථ නිරීක්‍ෂණය සඞ්ඛාරුපෙක්ඛා නම්. අභිධ
ර්මාර්ථ සංග්‍රහයෙහි ආ අදුක්ඛම සුඛ වේදනාව වෙදනුපෙක්ඛා
නම්. සහජාත ධර්මයන් සමව පවත්වන චෛතසිකය තත්‍රමජ්
ඣත්තුපෙක්ඛා නම්. **"උපෙක්ඛකො ච විහරති"** යි ධ්‍යාන විභ
ඞ්ගයෙහි ආ ප්‍රණීතතර තෘතීයද්ධ්‍යාන සුඛයෙහි මධ්‍යස්ථවීම
ඣානුපෙක්ඛා නම්. චතුර්ථධ්‍යාන උපෙක්‍ෂාව පාරිසුද්ධුපෙක්ඛා
නම්. මෙහි ස්වරූප වශයෙන් ඡලඞ්ගුපෙක්ඛා, බ්‍රහ්මවිහාරුපෙ
ක්ඛා, බොජ්ඣඞ්ගුපෙක්ඛා, තත්‍ර මජ්ඣත්තුපෙක්ඛා, ඣානුපෙක්ඛා,
පාරිසුද්ධුපෙක්ඛා යන සතන්හි තත්‍ර මජ්ඣත්තතා චෛතසිකය
ලැබේ. සඞ්ඛාරුපෙක්ඛා, විපස්සනුපෙක්ඛා යන දෙතැන්හි ප්‍රඥ

තා" මිදුතසක්ඛන්ධයාගේ කර්මයෙහි යෝග්‍ය ගතිය චිත්තකම්මඤ්ඤතා නම්. මොව්හු දෙදෙන යමෙකුගේ සතන්හි දුර්වල වේද ඔවුන්ගේ සිත පුණ්‍යකර්මයන්හි උවමනා පරිද්දෙන් තබාගන්ට නොපිළිවන් වේ. කුමක්මෙන්ද? යතහොත් උඩුහුලංගට දැමූ දහයියාමිටක් මෙනි. යම් කෙනෙකුන්ට බලවත්වේද ඔවුන්ගේ සිත පුණ්‍යකර්මයන්හි නොවිසිර පවත්නේයි. කෙසේදයත් උඩුහුලංගට දමනලද රන්කඳක් මෙනි. මොව්හුවනාහි කාය චිත්තයන්ගේ අයෝග්‍ය ස්වභාව ඇතිකරන නීවරණාදී කෙලශයන්ට ප්‍රතිපක්ෂ වන්නාහ සංකෙලශ ධර්මයන්ගේ පහවීමෙන් පැහැදියයුතු වස්තූන් කෙරෙහි පැහැදීම ඇතිකරන්නාහ. ශුද්ධ කරගන්නාලද ස්වර්ණය කණක කටක නූපුරාදි අභිමත ආභරණ කර්මයට සුදුසු වන්නාක්මෙන් මේ ධර්මයන්ගේ වශයෙන් චතුර්විධ නාමස්කන්ධය ඒ ඒ අරමුණු ගැණීමට යෝග්‍යවේයයි දතයුතු.

කායකම්මඤ්ඤතා චිත්තකම්මඤ්ඤතා විභාගය නිමි

**කායපාගුඤ්ඤතා චිත්තපාගුඤ්ඤතා** යනු කුමක්ද? "**කායස්ස පාගුඤ්ඤ භාවො කායපාගුඤ්ඤතා**" මනාසේ පාඩම් කරන ලද ග්‍රන්ථය පාඩම්කිරීමට හැකිවන්නාසේ වේදනාදි ස්කන්ධත්‍රයාගේ අරමුණු ගැණීමෙහි ප්‍රගුණගතිය චිත්තපාගුඤ්ඤතා නම් වේ. යම් කෙණෙකුන්ට මේ ධර්මදෙක දුර්වලවේද ඔවුන්ගේ සිත පුණ්‍යකර්මයන්හි විශෙෂයෙන් කම්පාවේ. කෙසේදයත්? ගැඹුරු වතුරෙහි දමනලද වාතරයක් මෙනි. යම් කෙණෙකුන්ට බලවත්වේද ඔවුන්ගේ සිත පුණ්‍යකර්මයන්හි කම්පා නොවේ. කෙසේදයත්? ගැඹුරු ජලයෙහි දමනලද කිඹුලෙක් මෙනි. මොව්හුවනාහි කායචිත්තයන්ගේ ගිලන්භාව ඇතිකරන අශ්‍රද්ධාදි කෙලශ ධර්මයන්ට ප්‍රතිපක්ෂ ධර්මයෝයයි දතයුතු.

කායපාගුඤ්ඤතා චිත්තපාගුඤ්ඤතා විභාගය නිමි

**කායුජ්ජුකතා චිත්තුජ්ජුකතා** යනුකුමක්ද? '**කායස්ස උජ්ජුකභාවො කායුජ්ජුකතා**'' වෙදනාදි ස්කන්ධත්‍රයාගේ ඇදනැති ගතිය කායුජ්ජුකතා නම්වේ. "**චිත්තස්ස උජ්ජුකභාවොචිත්තුජ්ජුකතා**'' චිත්තයාගේ ඇදනැති ගතිය චිත්තුජ්ජුකතා නම් වේ. යම කෙණෙකුන්ට මේ ධර්ම දෙක දුර්වලවේද ඔවුන්ගේ සිත පුණ්‍යකර්මයන්හි විෂමගතික වන්නේයි. වෙරි මරනාගේ මාර්ගයෙහි ගමන්කරන පුරුෂයෙකු මෙන් කිසිකලෙක පහන්වන්

නේය. කිසිකලෙක උඩඟුවන්නේය යම් කෙනෙකුන්ට බල වත්වේද ඔවුන්ගේ සිත කියනලද අඳුමට වෙනස් ආකාරයෙන් උපදනේය. මොව්හු උකානි කායචිත්තයන්ගේ ඇදබව ඇති කරන්නාවූ මායා සාඨෙය්‍යාදීන්ට ප්‍රතිපක්ෂ ධර්මයෝයයි දතයුතු.

කායුජ්ජුකතා චිත්තුජ්ජුකතා විභාගය නිමි.

ශ්‍රද්ධාව පටන් චිත්තුජ්ජුකතාව දක්වා මේ චෛතසිකයෝ එකුන්විසි (19) දෙන සංක්ෂෙපයෙන් එකුන් සැටක් (59) වූද විස්තරයෙන් එකානූවක් (89) වූද මුළු සොභන සිත්වලම එක හෙළා යෙදෙන හෙයින් "ශොභන සාධාරණයෝ" නම් වෙත්.

**සම්මාවාචා** යනු කුමක්ද? "**සම්මා වදන්ති එතායාතිසම්මා වාචා**" පාපවිරමණාකාරයෙන් චිත්ත ප්‍රවෘත්තිය කරණකොට ගෙණ චතුර්විධ වාග් සුචරිත බෙණෙත් නම් ඒ කිණීමට කාරණාවූ යථෝක්ත චිත්තප්‍රවෘත්තිය සම්මාවාචා නම්. ඕ තොමෝ කථාසම්මාවාචා, චේතනා සම්මාවාචා, විරති සම්ම වාචායයි ත්‍රිවිධ වන්නීය. ඔවුනතුරෙන් අභිධර්ම ප්‍රතිසංයුක්ත සුභාෂිත වචන සමුට්ඨාපික (උපදවන්නාවූ) කුශලක්‍රියා චේතනාදෙක චේතනා සම්මාවාචා නම්. ලොව්තුරා සර්වඥයන් වහන්සේ විසින් වදාළ ධර්මය හා දෙමව්පියාදීන් විසින් දෙනලද අභිවෘද්ධි හෙතුවවන සුභාෂිත වචන නමැයි දතයුතුයි. විරති සම්මාවාචා තොමෝ සමාදාන විරති, අධිට්ඨාන විරති, සම්පත්ත විරතියයි තුන්ආකාර වන්නීය. "**මුසාවාද වෙරමණී**" යනාදී වශයෙන් ඒ ඒ ශික්ෂා පද සමාදන්ව වැලකීම සමාදාන විරති නම්වේ. මුසාවාදාදීන් කෙරෙන් වලකිමියි ඉටාගැණීම අධිට්ඨාන විරති නම්වේ. ඒ දෙවිධිය නැතුව මේ දුශ්චරිතය නොකටයුතුයයි ආදීනව සලකා එයින් වැලකීම සම්පත්ත විරති නම්වේ. මුසාවාදාදීන් කෙරෙන් මෙකී තුන් ආකාරයෙන් වලකින්නාහට පාපවිරමණාකාරයෙන් යම් පැවැත්මක්වේද සේ විරති සම්මාවාචා නම්. මෙය නම් සම්මාවාචා චෛතසිකයයි මේ ධර්මයාගේ ලක්ෂණාදි සතර විධිය දක්වනු පිණිස "**වචී දුච්චරිත වත්ථූනං අවීතික්කම ලක්ඛණා සම්මාවාචා, වචී දුච්චරිත වත්ථුතො සංකොචන රසා, තස්ස අකිරිය පච්චුපට්ඨානා සද්ධාහි රොත්තප්ප අප්පිච්ඡතාදී ගුණ පදට්ඨානා**" යි කීහු. සම්මාවාචා චෛතසිකය වාග් දුශ්චරිත වස්තූන්ගේ නොඉක්මවීම ලක්ෂණකොට ඇත්තීය. වාග්

දුශ්චරිත වස්තුව කෙරෙන් චිත්තයාගේ හැකිළීම කෘත්‍යකොට ඇත්තීය. වාග් දුශ්චරිතයාගේ කිරීමක් නැති ලෙස වැළකීම් කාරණාකොට ඇත්තීය. මම බොරුකියන බව ලොකයා දැන ගත්තුනම් ලොකයෙන් ලැබෙන්නාවූ සත්කාරාදීයෙන් පිරිහෙන්නෙම් වේදැයි සිතා බොරු කීමාදීයෙන් වළකින තැනැත්තාට නොව කිසි ලාභාදියක් අපෙක්ෂා නොකොට ඒ ඒ දුශ්චරිතයෙන් වළකින තැනැත්තාටම මේ ධර්මය ලැබේ.

සම්මාවාචා විභාගය නිමි.

**සම්‍යග් කර්මාන්ත** යන කුමක්ද? ජීවිකාවෘත්තිය පිණිස නො පවත්නාවූ ප්‍රාණඝාතාදී මිථ්‍යාකර්මාන්තයෙන් සසම්ප්‍රයුක්ත චිත්තය වළක්වන ස්වභාව ධර්මය සම්‍යග් කර්මාන්තයයි. හේවනාහි ක්‍රියා සම්‍යග් කර්මාන්තය, චේතනා සම්‍යග් කර්මාන්තය, විරති සම්‍යග් කර්මාන්තයයි තුන් ආකාරවේ. නිරවද්‍ය කර්මක්‍රියා කරන්නහුගේ යම් කායික ක්‍රියාවක් ඇත්නම් හේ ක්‍රියා සම්‍යග් කර්මාන්තනම්. ඒ පුද්ගලයාගේ සතන්තුළ ඒ කායික ක්‍රියාව ඇති කරවන චේතනා තොමෝ චේතනා සම්‍යග් කර්මාන්ත නම්. පාණාතිපාතාදීන් කෙරෙන් මූලකී තුන් ආකාරයෙන් වැළකීම විරති සම්‍යග් කර්මාන්ත නමි. විරති සම්‍යග් කර්මාන්තයනම් සම්මා කම්මන්ත චෛතසිකයයි. මේ ධර්මයාගේ ලක්ෂණාදි සතරවිධය දක්වනු පිණිස "**කායදුච්චරිත වත්ථූනං අවීතික්කම ලක්ඛණො සම්මා කම්මන්තො, කාය දුච්චරිත වත්ථුතො සංකොචන රසො, තස්ස අකිරිය පච්චුපට්ඨානො, සද්ධාහිරොත්තප්ප අප්පිච්ඡතා දිගුණපදට්ඨානො**" යි කීහු. සම්‍යග් කර්මාන්ත චෛතසිකය කාය දුශ්චරිත වස්තූන්ගේ නොඉක්මවීම ලක්ෂණකොට ඇත්තේය. කාය දුශ්චරිත වස්තුව කෙරෙන් චිත්තයාගේ හැකිළීම කෘත්‍යකොට ඇත්තේය. ඒ කාය දුශ්චරිතයාගේ කිරීමක් නැති ලෙස වැළකීම් කාරණාකොට ඇත්තේය. සද්ධා හිරිඔත්තප්ප අප්පිච්ඡතා යනාදී ගුණයම ආසන්න කාරණාකොට ඇත්තේය. මම සත්වඝාතනය කරණබව ලොකයා දැනගත්තුනම් මාගේ ලාභ සත්කාරාදිය නැතිවේයයි සිතා දුශ්චරිතයෙන් වළකින තැනැත්තාට නොව සතර අපායදුකට හයින්ම ප්‍රාණඝාතාදියෙන් වළකින තැනැත්තාට මේ ධර්මය ලැබේ.

සම්‍යග් කර්මාන්ත විභාගය නිමි.

**සම්‍යග් ආජීවය යනු කුමක්ද? "සම්මා ආජීවනති ජීවිතං
පවත්තෙන්ති එතෙනාති සම්මාආජීවො"** මේ ස්වභාවය කරණ
කොටගෙන යහපත්ව ජීවිකා වෘත්තිය පවත්වත් එසේ ජීවිකා
වෘත්තිය පිණිස කරුණුවූ හෙයින් සම්‍යග් ආජීව නම්වේ. හේ
වනාහි වියඞ් සම්‍යග් ආජීවය, විරති සම්‍යග් ආජීවයයි ද්විවිධ වේ.
ඔවුනතුරෙන් ප්‍රකෘති වශයෙන් නිරවද්‍ය කෘෂිකර්මාදියෙන් හෝ
පිණ්ඩපාතාදියෙන් හෝ උත්සාහකොට ජීවත්වන්නවුන්ගේ
උපස්ථාන බලසඞ්ඛ්‍යාත වියඞ්යක්වේද හේ වියඞ් සම්‍යග් ආජීව
නම්වේ. ආජීවශුද්ධිය බලා තමාගේ ආජීව ශීලයට විපත්තිකාර
ණාවූ කාය වාග් දුශ්චරිතාදිය දුරුකරන්නවුන්ගේ පාපවිරම
ණාකාරයෙන් යම් පැවැත්මක් ඇද්ද හේ විරති සම්‍යග් ආජීව
නම්වේ. මේ විරති සම්‍යග් ආජීවය නම් මෙහි දක්වූ සම්‍යග්
ආජීව චෛතසිකයයි. යථොක්ත සම්මාවාචා සම්මා කම්මන්ත
චෛතසිකයෝ දෙදෙන ජීවිකාවෘත්තිය අපෙක්ෂා නොකර
චතුර්විධ වාග් දුශ්චරිතයෙන් හා ත්‍රිවිධ කාය දුශ්චරිතයෙන්ද
වළක්ත්. සම්මා ආජීව චෛතසිකයාගේ ලක්ෂණාදි සතරවිධිය
දක්වනු පිණිස **"තිවිධ කාය දුච්චරිත චතුබ්බිධ වචීදුච්චරිත
වත්ථූනං අවීතික්කමලක්ඛණො සම්මාආජීවො තතොඑව සං
කොචන රසො, තෙසං දුච්චරිතානං අකිරිය පච්චුපට්ඨානො
සද්ධාහිරොත්තප්ප අප්පිච්ඡතාදි ගුණ පදට්ඨානො"** යි කීහු.
සම්‍යගාජීව චෛතසිකය තෙම ත්‍රිවිධ කාය දුශ්චරිත හා චතුර්
විධ වාග්දුශ්චරිත වස්තූන්ගේ නොඉක්මවීම ලක්ෂණකොට ඇත්
තේය. ඒ දුශ්චරිතය කෙරෙන්ම චිත්තයාගේ හැකිළීම කෘත්‍ය
කොට ඇත්තේය. ඒ සප්තවිධ දුශ්චරිතයන්ගේ කිරීමක් නැති
ලෙස වැටහීම් කාරණාකොට ඇත්තේය. සද්ධා හිරිඔත්තප්ප
අප්පිච්ඡතා යනාදී ගුණධර්මයන් ආසන්න කාරණකොට ඇත්
තේය. තවද මේ විරතිත්‍රය අතුරෙන් එකක් එකක් සම්පත්ත
විරති, සමාදාන විරති, සමුච්ඡේද විරතියයි තුන් තුන් ආකාරවේ
ප්‍රාණඝාතාදී ඒ ඒ ශික්ෂාපද සමාදන් නොවූ අයට හෝ සමාද
න්වූ අයට හෝ ඒ ශික්ෂාපද බලාපොරොත්තු නැතුව හිරිඔතප්
බලයෙන්ම ඉදිරියට පැමිණි සතුන්මැරීම් ආදියෙන් වැළකීම
සම්පත්ත විරතියයි. මේ සම්පත්ත විරතිතොමෝ ප්‍රත්‍යුත්පන්න
කාරණාව අරමුණුකරගෙණ පවත්නීය. ඒ එසේමැයි. පඤ්ච
ශික්ෂාපදයෝ ප්‍රත්‍යුත්පන්නාරම්මණයෝ වෙත්යයි වදාරන ලදී.
යම් ඒ සමාදන්වනලද හෝ අධිෂ්ඨාන කරනලද හෝ ශික්ෂාපද

හොඳට ආරක්ෂා කරමියි සම්ප්‍රාප්ත වස්තුව නොඉක්මවන්නා හට හෝ උපන් විරතිය සමාදාන විරතියයි. නේවනාහි ප්‍රත්‍යුත්පන්නවූද අනාගතවූද විරති අපේක්ෂා කරයි. සොතාපන්න ආර්‍ය්‍ය පුද්ගලයන්ට මාර්ගක්ෂණයෙහිදී ඒ ඒ දුශ්චරිතාදීන්ගේ ප්‍රත්‍යය මූලෝච්ඡින්න කිරීම සමුච්ඡේද විරතියයි. මෙය නිර්වාණය අරමුණුකොට පවතී. ඵල විරතියද මෙහිම සංග්‍රහකරන ලද්දීයයි දතයුතුයි. ලෞකික විරතීනු ජීවිතෙන්ද්‍රියාදී විතික්කමිතබ්බ වස්තූන් අරමුණුකොට පාණාතිපාතාදි විරමිතබ්බ වස්තූන් දුරු කෙරෙත්යයි දතයුතුයි.

සම්මා ආජීව විභාගය නිමි.

**කරුණා** යනු කුමක්ද? **"පරදුක්ඛෙ සති කාරුණිකානං හදයඛෙදං කරොතීති කරුණා, කිණාති වා පරදුක්ඛං හිංසතීති කරුණා, කිරීයති දුක්ඛිතෙසු පසාරීයතීති වා කරුණා"** යනු කිච්චත හෙයින් අනුන්ට දුකක් ඇතිවූකල කාරුණිකයන්ගේ හෘදය කම්පාව උපදවානුයි කරුණා නම්වේ. නොහොත් මෙරමාගේ දුක අහක් කෙරේනුයි කරුණා නම්වේ. නොහොත් දුඃඛිතවූවන් කෙරෙහි ප්‍රසාරණය කෙරේනුයි. කරුණා නම්වේ.

මේ ධර්මයාගේ ලක්ෂණාදි සතර විධියනම් **"පරදුක්ඛාපනයනාකාරප්පවත්ති ලක්ඛණා කරුණා, පරදුක්ඛාසහන රසා, අවිහිංසා පච්චුපට්ඨානා, දුක්ඛාභිභූතානං අනාථභාව දස්සන පදට්ඨානා"** යනුයි. කරුණා තොමෝ අනුන්ගේ දුක අහක් කිරීම් ආකාරයෙන් තමන්ගේ සිත්හි පැවැත්ම ලක්ෂණකොට ඇත්තීය. අනුන්ගේ දුක නොඉවසීම කෘත්‍යකොට ඇත්තීය. සත්ත්වහිංසා නොකිරීම ඥාතයට වැටහීම්කොට ඇත්තීය. දුකින් පෙළෙන්නවුන්ගේ අසරණබව දැක්ම ආසන්න කාරණකොට ඇත්තීය. විහිංසාව සංසිඳවීම කරුණාවගේ සම්පත්තියයිද, සොකය හටගැණීම විපත්තියයිද දතයුතුයි. සොකය වනාහි කරුණා ප්‍රතිරූපයෙන් සත්ත්වයන් රවටන්නේය. මේ තොමෝ අනන්ත දුඃඛිත සත්ත්ව ප්‍රඥප්තිය අරමුණුකොට පවත්නීයයි දතයුතුයි.

කරුණා විභාගය නිමි.

මුදිතා යනු කුමක්ද? **"පරසම්පත්තිං දිස්වා මොදන්ති එතායාති මුදිතා"** මේ ස්වභාවය හෙතුකොටගෙන මෙරමාගේ සම්පත් දක සත්ත්වයෝ හෝ සම්ප්‍රයුක්ත ධර්මයෝ සතුටු වෙත්නුයි මුදිතා නම් වේ. මේ ධර්මයාගේ ලක්ෂණාදි සතර විධිය නම් **"සත්තෙසු පමොදන ලක්ඛණා මුදිතා, අනිස්සායන රසා අරති විඝාත පච්චුපට්ඨානා, සත්තානං සම්පත්ති දස්සන පදට්ඨානා"** යනුයි. මුදිතා තොමෝ සත්ත්වයන් කෙරෙහි සතුටුවීම ලක්ෂණකොට ඇත්තීය. ඊර්ෂ්‍යා නොකිරීම කෘත්‍යකොට ඇත්තීය. ගෙහසිත ප්‍රීතිය නැතිකිරීම ඥානයට වැටහීම්කොට ඇත්තීය. සත්ත්වයන්ගේ සම්පත් දැකීම ආසන්න කාරණාකොට ඇත්තීය. මුදිතාවගේ සම්පත්තිය නම්, ගෙහසිත ප්‍රීතිය නැසීමයි. විපත්තියනම්, තෘෂ්ණා සන්තොෂය හටගැන්මයි. මෝතොමෝ අනන්ත සුඛිත සත්ත්ව ප්‍රඥප්තිය අරමුණුකොට උපදින්නීයයි දතයුතු.

මුදිතා විභාගය නිමි.

ප්‍රඥාව යනු කුමක්ද? **"අනිච්චාදි සාමඤ්ඤ ලක්ඛණං ඵුසනාදි සභාව ලක්ඛණං පකාරෙන ජානාති අවබුජ්ඣතීති පඤ්ඤා"** සිතේ හටගන්නාවූ යම් ස්වභාවයක් තොමෝ සියළු සඞ්ඛත ධර්මයන්ට සාධාරණවූ අනිත්‍යාදි ත්‍රිලක්ෂණ සංඛ්‍යාත සාමාන්‍ය ලක්ෂණය ස්පර්ශකිරීම්ආදී ස්වභාව ලක්ෂණය නොයෙක් ආකාරයෙන් දැනගනීද එසේ හෙයින් ඒ ස්වභාව තොමෝ ප්‍රඥා නම්වේ. **පජානන ලක්ඛණෙ ඉන්දට්ඨං කාරෙන්ති ඉන්ද්‍රියං පඤ්ඤා, එව ඉන්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං"** අරමුණු ස්වභාව දැනීම් ලක්ෂණයෙහි අධිපති බව කරන හෙයින් පඤ්ඤින්ද්‍රියය විය. අමොහය ධම්මවිචය සම්මාදිට්ඨිය යනාදී නම්ද මිට පර්යායයි. දැනීම වනාහි සංඥාවෙන් දැනීමය, විඥානයෙන් දැනීමය, ප්‍රඥාවෙන් දැනීමයයි තුන් ආකාර වේ. එයින් සංඥාව නීලාදි වර්ණයන් හඳුනායි. ඉන් මත්තෙහි අනිත්‍යාදි ත්‍රිලක්ෂණය දැනගන්ට පොහොසක් නොවේ. විඥානය නීලාදිවර්ණ හැඳිනීම සහ අනිත්‍යාදි ත්‍රිලක්ෂණයන් දැනගනී. එතකුදු වුවත් මත්තෙහි වීර්‍ය්‍යවඩා මාර්ගාධිගමය කරන්ට පොහොසත් නොවේ. ප්‍රඥාව එසේනොව හැඳිනීමද අනිත්‍යාදි ත්‍රිලක්ෂණයද මාර්ගයට පැමිණීමද සිද්ධකෙරේ. ඒ ප්‍රඥාවගේ ලක්ෂණාදි සතර විධියනම්. "යථාසභාව පටිවෙධ ලක්ඛණා පඤ්ඤා, යථාසභාව පටිච්ඡාදක මොහන්ධකාර විද්ධංසනරසා, අසම්මොහ පච්චුපට්ඨානා, සමාධි පදට්ඨානා"

යනුයි. ප්‍රඥාතොමෝ ස්වභාව ධර්මයන් අවිපරීතව දැන ගැණීම ලක්‍ෂණකොට ඇත්තීය. යථාස්වභාවය වසන්නාවූ මෝහාන්ධකාරය දුරුකිරීම කෘත්‍යකොට ඇත්තීය. අරමුණෙහි නුමුලාවීම ඥානයට වැටහීම්කොට ඇත්තීය. සමාධිය ආසන්නකාරණකොට ඇත්තීය. "පඤ්ඤාභාස සමොභාසො නාමත්‍ථි" යනු කීහෙයින් ප්‍රඥාලෝකය හා සමානවූ ආලෝකයෙක් නම් තවත් නොමැතියි. විදිනලද ඊය යකඩ ලෑලි හිතනි සිදුරු කරගෙන යන්නාක් මෙන් ඒ ඒ ධර්මයන් විනිවිද ගොස් දැන ගන්නා ස්වභාවයකි.

ප්‍රඥා විභාගය නිමි.

මෙතෙකින් පානදුරේ රන්කොත් විහාරවාසී **පානදුරේ සෝමරතන** ස්වාමි පාදයන් වහන්සේ විසින් සම්පාදිත චිත්ත චෛතසික විභාගය නිමියේය.

නිබ්බාන පච්චයො හොතු.

--ශ්‍රී--

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු